

# අමරුශතකය

# අමරු ශතකය

# अमरुशतकम

# अमरुशतकम्

# අමරු ශතකය

# අමරුශතකය

අනුවාදක:

පණ්ඩිත

**කේ ඩී. කුලතිලක**

මුද්‍රණය හා ප්‍රකාශය:

නුගේගොඩ

**මොඩන් පොත් සමාගම**

# පෙරවදන

අමරුශතකයෙහි කතෘ ගේ නාමය පෙරදිග පඬුවනට මහ ගැටළුවෙකි. එක් එක්කෙනා එක් එක් මත දරන බැවිනි. **රවිචන්ද්‍රයෝ** § "**අමරු**" යන නාමය ද **අර්ජුන වර්මදෙවයෝ** ‡ "**අමරුක**" යන නාමය ද තමන් ගේ ටීකාවන්හි සඳහන් කෙරෙති. **රුද්‍රමදෙව කුමාරයෝ** තම ටීකාවෙහි අග ද **වේමභූපාලයෝ** ආරම්භ ශ්ලෝකයෙක්හි ද † "**අමරුක**" නාමය දක්වති, **ක්ෂේමේන්ද්‍රයෝ** කවිකණ්ඨාභරණයෙහි "**අමරක**" නාමය දෙයි, **අමරුක, අම්‍රුක, අමර** යනු ද සෙසු නාමයෝ වෙති. නියම නාමය අමරු යන්න ම වේ යනු අප අදහසි. "**අමරුශතකය**" යන්න ම එයට දෙස් දෙයි.

මොහු සම්බන්ධ ජන කථාවෙක් වෙයි. **මාධවයන් ගේ "ශංකරදික්විජය"** නම් ගත්හි මෙසේය **එය දැක්වෙනු** යේ. ශාරීරික සූත්‍රයන් ගේ ටීකාචාර්‍ය ශඞ්කරාචාර්‍යයෝ දික් විජය යාත්‍රාවෙහි යෙදෙන සමයෙහි දිනෙක බරණැසට

---

§ කුරුතෝ'මරුශත ටීකාං ඥනානන්දඃ කලාධරෝ විඥඃ
(රවිචන්ද්‍රයන් ගේ කාමද ටීකාව)

‡ අමරුක කවිත්ව ඩමරුක නාදෙන විනිහ්නුතා න සඤ්චරති. (අර්ජුන ගේ රසිකසංජීවිනී ටීකාව)

† අමරුකශතමිදමිඵං සවබුද්ධි විභවාත් රසාබ්ධි තත්වඥඃ (රුද්‍රමදෙවකුමාර)

‖ අමරුක කවිනා රචිතාං ශෘඞ්ගාර රසාත්මිකාං ශත ශ්ලෝකීම් (වේම භූපාල ශෘංගාරදීපිකා ටීකාව)

පැමිණියහ. එහි **මණ්ඩනමිශ්‍ර** නම් මීමාංසාචාර්යයෙක් විය. ඔහු හා **ශංකරාචාර්යයන්** අතර එහි දී වාදයෙක් වී. ශංකරාචාර්යයෝ මණ්ඩනමිශ්‍රයනට වඩා වියත් කෙනෙකි. එබැවින් වාදයෙහි ලා දිනුම ශංකරයන් වෙත ම යන බව දත්හ. භාරතිය. **භාරතිය** මණ්ඩනමිශ්‍රයන ගේ බිරිඳ වේ. හෝ අනිකක නොව සරසවිය ගේ අවතාරයෙකි. භාරතිය තම හිමියාට වන පරාජයෙන් ඔහු ගලවනු වස් ඉදිරිපත්ව තමා හා වාදයකට එනසේ අභියෝගයක් කළහ. ඔහු ද තම කැමැත්ත දුන්හ ඒ අභියෝගයට. තමාට වඩා හැම පසින්ම ශංකරාචාර්යයන් උගතකු බව දත් හෝ තොමෝ කාම්සතරින් ඔහු පරදනුවස් ඒ සම්බන්ධ ප්‍රශ්න විචාළාය. ශංකරාචාර්යයෝ බාලවිය පටන් ම බඹසරවත රකින්නෙකි. එහෙයින් ඔහුට කාම්සතර සම්බන්ධ මද වූ ද දැනුමෙක් නොවේ. එබැවින් ඔහුට වූයේ උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ පෑමටය. පැනයනට පිළිතුරු නො දුනහොත් ඉතිරියකාගෙන් වන පැරදුම ඔහු ගේ උගත්කම හැනා පතළ යසසට මහම කැළලෙකි. කෙ සේ හෝ පිළිතුරු සැපයුව බොරු බඹසර රැකි කපටියෙක යන ලොකාපවාදයට ලක් වේ. බාලවිය පටන් බඹසරවත රැකියෙක් කෙසේ කාම්සතර පිළිබඳ කරුණු දන්නේ වේ ද ? එබැවින් ඈගේ පැනයනට පිළිතුරු සැපයීමට මසක් කල් අයැදියහ. හෝ ද පිළිගත්තු ඒ ඇරියුම. ඉන්පසු ඔහු නම්ද ගංතෙර අසවූ වනයකට ගොස් එහි වූ එක් රුක් සිදුරෙකැ තම නිර්ජීව ශරීරය තබා එය මසක් මුළුල්ලේම රක්නට තම ශිෂ්‍යයනට නියමකොට අන් මළ සිරුරක් සොයනුවස් ගමන් ගතු. භාග්‍යයකට මෙන් එරට රජ වූ **අමරුක** නම් රජ මරණයට පත්ව සිරුර ආදාහන කරනුවස් චිතකයෙකැ තබා තිබිණි. ශංකාරාචාර්යයෝ තම ආත්මය ඒ මළසිරුරට ප්‍රවෙශ කළෝ. මෙහිලා අන් මතයෙක් ද වේ. මසක් කල් ගත් ඔහු අහසින් ගමන් කරන කල බූව දඩයමට ආ **අමරුක** නම් එරට රජ අභාග්‍යයෙකින් මරපත්ව ඒ සොවින් හඬා වැළපෙන ඇතුළු පුර අඟනන් විසින් පිරිවරන ලද සිරුර එහි වූ රුකක්මුල

දූකා යොග බලයෙන් තම ආත්මය එයට ඇතුළු කළෝය යනුය ඒ මතය. පණ ලත් සිරුර දුටු පුරඟනෝ ද මැතියෝ ද ඉමහත් සතුටට හා පුදුමයට පත්වූවෝ දිව්‍ය බලයෙකින් රජ පණලත්හ යි සිතා මාළිගයට පැමිණ වූහ. ශංකරාචාර්යයෝ නව සිරුරට පත්වූවෝ සිය ගණන් ඇතුළු පුර ඟනන් හා කෙළිදෙලෙන් කල් ගෙවමින් මද කලෙකින් ම කම්සතර හදරා නියම දිනයෙහි මණ්ඩනමිශ්‍රයන් ගේ බිරිඳ හා වාද කොට ඈ වාදයෙන් පැරැදවූහ. ඉක්බිති තම කිසය නිමාවූයෙන් ආත්මය යළි තම සිරුරට ප්‍රවෙශ කළහ. රාජ පුරුෂයෝ රජ පුනර්ජීවය ලත් කල ශංකරාචාර්යයන් ගේ සිරුර සොයා එය විනාශ කළහ යනු ද මතයෙක් වේ. ඔහු අමරුක රජ ගේ සිරුරෙහි වෙසෙන කල වසයින් (වාත්‍සයායන) ඉසියා ගේ කාමකලාව මොනොවට ප්‍රගුණ කොට ඒ ගැන ගතක් ද කළහ. ඒ අනෙකක් නොවැ මේ අමරුශතකයලු.

රවිචන්ද්‍රයෝ තමා ගේ **'කාමද'** නම් ටීකායෙහි මෙයට වෙනස් අයුරෙකින් මෙපුවත ගෙනැර පාති ඒ මෙසේ වේ.

හගවත් ශංකරාචාර්යයෝ දික්විජය අයුරෙන් කාශ්මිර යට ගියෝය. එහි වූ සභාසදයෝ සිරිඟර රස වැනුමක් කරනුවට ඔහුට ආරාධනයක් කළහ. ''ඉදින් කිවියා ශෘංගාරියකු වූව ලොව රසමය වෙයි' යන අදහස නිසා අමරු නම් රජ ගේ මළ සිරුරට යොග බලයෙන් පිවිස සිය ගණන් අඟනන් හා ක්‍රීඩා කොට පසුදින උදය ඔවුන් ගේ ආරාධනය ඉටු කළෝ. පිසුනයෝ මොහු කපටි බ්‍රහ්මචාරියෙකැයි ගැරහූහ. ඉක්බිති මෙහි ශාන්ත රසය ප්‍රකාශ කළහයි ජන කථාවෙක් වේ යනුය එහි අදහස. අමරු ගේ සිරුරට පිවිසි ශංකරාචාර්යයන් මේ අමරුශතකය කළ බවය මේ ජන කථාවෙන් හැඟෙනුයේ.

අමරුශතකයට ටීකාවක් ලියූ දෙවශංකරයෝ ද අමරු ශතකය ශංකර කෘතියක් බව මෙසේ සඳහන් කෙරෙති තම ටීකාවෙහි. ''ක්ව මෙ මන්ද බුද්ධිඃ ක්ව ච රසමයං ශංකර වචස්තථාපි ව්‍යාඛ්‍යාතුං තරල මනසඃ ශංකර කෘතිම්.'' මා ගේ මඳ නුවණ කොහි ද? රසවත් ශංකර බස කොහි ද? (එසේවුව ද) ශංකර කෘතිය ව්‍යාඛ්‍යාන කරනුවට චපල සිතෙක් වේ යනු එහි අදහසි.

මෙගත ගැන විස්තරයක් කරණ තම නො සඳහන් එක් ලෙඛකයෙක් මෙයට වෙනස් මතයක් පළ කෙරෙයි. ඒ මෙසේ වේ. ශංකරාචාර්යයෝ දික් විජයයෙහි යෙදෙන සම යෙහි වරෙක කාශ්මීරයෙහි අමරු රජ ගේ මාළිගයට ගියහ. එරජ නිතොරම තම ඇතුළු පුර වෙසෙන රූමත් සිය ගණන් ඉතිරි දනා හා සමග කම් සැපෙහිම ඇලී ගැලී වෙසෙත්නෙකි ශංකරාචාර්යයෝ බ්‍රහ්මචාර්යයෙකි. මෙ දුටු ඔහුට රජ කම් සැපෙන් මුදා ලොවුතුරු අදහස්හි පිහිටු වීමට අදහසෙක් විය. මෙසේ අදහස් කොට රජ හා සාකච්ඡාවක යෙදී සිටිය දී කාමකලාව සම්බන්ධ විස්තරයක් කරන ලෙස ඇරයුමක් වී ශංකරාචාර්යයෝ ද එයට පසු නොබා එය පිළිගෙන කම්සතර පිළිබඳ විස්තරයක් කළහ. ඒ මේ අමරුවයි. සභාවෙහි වූවෝ මේයසා ඔහුට ගැරවූහු. බාලවිය පටන් බඹසරවත රැකි තැනැත්තකු බැවිනි මෙබඳු ගැරහුමට ලක්වූයේ – එ ගැරහුම නො ඉවසියහැකි වූ ඔහු යොග බලයෙන් රජ සිරුරට පිවිස මෙගතෙහි ඇති ශාන්ත රසය රජ ගේ මුවෙන් ම ප්‍රකාශකරවූ. තමාගෙන් කියැවුණු ශාන්ත රසය ගබ්කොට ඇති වදන් ඇසූ රජ කාමපාශයන් බිඳහැර ලොවුතුරු සුවයෙහි අදහස් පහළ කරගති එයැසූ අවටසිටියෝ ද එ අදහස් ම පහළකර ගත්හු.

කතුවරයා හා ඔහු ගේ ගත ගැන යට දක්වූ සියල්ලම ජනකථාවෝ වෙති. රවිචන්ද්‍රයෝ එය ජනකථාවෙකැයි (කිම්බදන්ති) තම කාමද නම් ටීකායෙහි සඳහන් කෙරෙති.

මේ හැම කථාවෙකින් ම කියැවුණේ අමරු ගේ මළ සිරුරට හෝ ජීවශරීරයට පිවිසි ශංකරාචාර්යයන් විසින් අමරුශත කය කරන ලද බවය. එහෙයින් එගැන මඳක් පිරික්සමු.

වාත්ස්‍යායන ප්‍රෝදිත ශාස්ත්‍රජාතං
තදිය භාෂ්‍යං ච විලෝක්‍ය සම්‍යක්
ස්වයං ව්‍යධත්තාභිනවාර්‍ථ ගර්භං
නිබන්ධමේකං නෘපවේශධාරී

(ශංකර දික්විජය 10 – 18)

"වසයින් විසින් දක්වන ලද කම් සුතුරු ද එහි භාෂ්‍යය ද මොනොවට පිරික්සා රජවෙස් ගත් ශංකරාචාර්යයෝ නව අරුතැති මෙගත කළෝ" යනු ශ්ලෝකයෙහි අදහසි. මෙය කරන ලද්දේ මණ්ඩනමිශ්‍රයන් ගේ බිරිය වූ භාරතියය විසන් කම්සතර පිළිබඳ ශංකරයන් ගෙන් අසන ලද පැනයනට පිළිතුරු සපයනු සඳහාය. ඈ විචාළ පැන ශංකර දික්විජය නම් ග්‍රන්ථයෙහි ම මෙසේ දැක්වේ.

කලාඃ කියන්ත්‍යෝ වද පුෂ්පධන්වනඃ
කිමාත්මිකාඃ කිංච පදං සමාශ්‍රිතාඃ
පූර්වේ ච පක්ෂෙ කථමන්‍යථා ස්ථිතිඃ
කථං යුවත්‍යාං කථමේව පූරුෂේ

(ශංකර දික්විජය 9 – 69)

මල්දුන්නා ගේ කලා කොපමණ ද ? යනාදී විසින් අසන ලද පැනයනට එක ද පිළිතුරෙක් වත් නො වේ. අමරුශතකයෙහි. රජවෙස් ගත් ශංකර කම්සතර පිළිබඳ ගතෙක් කරන ලද නම් ඒ අමරුව නොවැ අනෙකක් විය යුතුය. අමරුවෙහි කාමකලාව ගැන කිසිම දෙයක් නො සඳහන් බැවිනි. එබඳු ගතක් ද වූහයි අපි නොසිතමු. පෙරින් දක්වන ලද තොරතුරුවල ගතයුතු කිසි හරයෙක් නො වේ. අමරු නම් කිසියම් පඬුවකු විසින් මෙගත කරන ලද බවය පිළිගත යුතු සත්‍යය.

## අමරු කිවියාගේ ජීවන සමය

පෙරින් දක්වූයේ ජනකථා අනුව කිවියා පිළිබඳ තොරතුරු හා ගතකැරුමට හේතුවද වේ. මේ ගත්කරුගේ ජීවන සමයය ද අන් සමහර කිවියන්ගේ මෙන් තිරලෙස පැවසීමට මෙගතින් හෝ අන් ගතෙකින් ප්‍රමාණවත් ශාක්ෂි නො ලැබේ. වැලි එකෙක් වේ. **අමරු** පෙරදිග වූ බොහෝ පඬුවනට ප්‍රිය කෙනෙකි උහුගේ පැදි බොහෝ පඬිවරු තම ගත්හි බහා ගත්හු සමහරු ඔහු උසස් ලෙස වැනූහ. එයින් මොහුගේ ජීවන සමය අනුමානයෙන් සිතාගත හැක්කේය. **ආචාර්ය ආනන්දවර්ධනයෝ ධ්වන්‍යාලෝකයෙහි** අමරු ගැන මෙසේ කියති.

"මුක්තකෙෂු ප්‍රබන්ධෙෂ්විව රසබන්ධාභිනිවෙශිනඃ කවයො දෘශ්‍යන්තෙ යථාහ්‍යමරුකස්‍ය කවෙර්මුක්තකාඃ ශෘංගාර රසස්‍යන්දිනඃ ප්‍රබන්ධායමානාඃ ප්‍රසිද්ධා එව"

ආනන්දවර්ධනයන් ගේ ජීවන සමය ක්‍රි: ව: නවවන සියවසෙහි වේ. අමරු ගැන ඔහුගේ වර්ණනාවෙන් හැඟෙණුයේ නවවන සියවසෙහි වූ කිවියන් අතරෙහි අමරුගේ මුක්තක කාව්‍යය සෙසු කිවියනගේ කාව්‍යයනට නො දෙවන තැනක් දරූ බවය. එසේම ආනන්දවර්ධනයනට පෙර අමරු සිටිබවද පසක්ව **වාමනාචාර්යයෝ** ආනන්දවර්ධනයනට පෙර සිටියෙකි ඔහුගේ ජීවන සමය අටවන සියවස වේ. ඔහු "දෘෂ්වෛකාසන සංස්ථිතෙ ................ සා බාලා වය ප්‍රගල්භ............සුතනු ජගීහි මානම්.......... යන ශ්ලොක තුන (19, 34, 39) ගත්කරුගේ නම නො දක්වා **කාව්‍යාලංකාර** සූත්‍ර වෘත්තියෙහි සඳහන් කෙරෙති. ඒ අමරු ශතකයෙහි ශ්ලොකයෝ වෙති. එයින් වාමනටත් පෙර අමරුගේ ජීවන සමය බව ස්ඵුටය

අමරුශතකයෙහි මඞ්ගලාචරණ ශ්ලොකයෙහි "ලොභ භ්‍රමද් භ්‍රම විභ්‍රම භෘත් . ........... යන ශබ්ද සංහතියට සම 'වදන සෞරභ ලොභ පරිභ්‍රමද් භ්‍රමර සංභ්‍රම............ යන ශබ්ද සංහතියෙක් **ශිශුපාලවධ මහාකාව්‍යයෙහි** (රසගී 14) දක්නට ලැබේ.

එසේම සුභාෂිතාවලියෙහි මෙහි පහත දැක්වෙන ශ්ලෝකය අමරුගේ යැයි සඳහන් කෙරෙයි. (මෙය අප සත්‍යයෙහි නොවේ.)

සුරත විරතෞ ව්‍රීඩාවේශ ශ්‍රමශ්ලථ හස්තයා
රහසි ගලිතං තත්වස්‍රං ප්‍රාප්තුං න පාරිතමංශුකම්
රතිරස ජඩෛරඞ්ගෛරඞ්ගං පිධාතුමශක්තයා
ප්‍රියතම තනෞ සම්බාධිගීර්ණං ප්‍රවිෂ්ටමධෘෂ්ටයා

(සුභාෂිතාවලී පිටර්සන් 2106)

මෙහි භාවය සම මාඝ ශ්ලෝකයෙක් මෙසේ වේ.

උත්තරීය විනයාත් ත්‍රපමාණාං
රුන්ධතී කිල තදීක්ෂණ මාර්ගම්
ආවරිෂ්ට විකටේන විවෝඪුර්-
වක්ෂසෛවකුචමණ්ඩලමන්‍යා

(ශිශුපාලවධ 10-42)

මේ සාම්‍ය සැලකූ එක් අමරුශතක ශෝධකයෙක් අමරු මාඝයන්ගේ අදහස් ගතැයි සලකා අමරු මාඝයනට පසුවූවෙකැයි කියයි ඔහුගේ මතය සත්වන සියවසෙහි මුල මාඝ ද මැද භාරවි ද අග අමරුද වුයු බවය. පැදියක දෙකක වචනවල සාම්‍යය හෝ අදහස්වල සාම්‍යය සලකා මෙබඳු නිගමනයකට බැසීම නුසුදුසුය. සුභාෂිතාවලයෙහි දැක්වෙන ශ්ලෝකය අමරුගේ ද යන්නත් සැක සහිතය. එකෙක් එක් පැදියක් අසවලාගේ යැයි කියයි අනිකෙක් එම පැදිය වෙන පඬුවකුගේ යැයි කියයි. ජීවන සමයයත් සම්බන්ධව මෙබඳු වෙනස් මත වෙයි. එසේ කල නිවරද නිගමනයක් කෙසේ නම් වේද? අපි ඒ ශ්ලෝකය අමරුගේමැ යැයි මදකට සලකමු. අමරු මාඝ ශ්ලෝකයේ ඡායාව ගත්හය කියතොත් ඒ අයුරෙන්ම මාඝ අමරුගේ ශ්ලෝක ඡායාව ගත්හයි කිය නො හැකිද? කවරහුද මෙහි සත්‍යය දන්නෝ? කුමක් හෝ සත්‍ය වේවා. මෙකරුණු ගැන සලකා බලන කල අමරු සත් වන සියවසෙහි වූවෙකැයි යනු සිතාගත හැක්කේ ය.

## අමරුශතකයේ ටීකාකාරයන්

මෙගතට කරන ලද ටීකාවෝ බොහොවකි. එයින් **අර්ජුනවර්මදෙව, වෙමභූපාල, රුද්‍රමදෙවකුමාර** යන මොවුන්ගේ ටීකාත්‍රය මුල්තැන ගනියි. **රවිචන්ද්‍රයන්ගේ** කාමද'' ටීකාව ද **රාමානන්දනාථයන් ගේ** ''සරලාක්‍ෂර' යද **කොකසම්භවයන් ගේ** ''නිෂ්ටංකිතාශය''ද **චතුර්භුජයන්ගේ** ''භාවචින්තාමණිය''ද **සූර්යදාසයන් ගේ** ''ශෘංගාරතරඞ්ගිණිය''ද අමරුවට ම සැපයුණු ටීකාවෝ වෙති. තවද **ශෙෂරාජකෘෂ්ණ, නන්දලාල්, ශංකරාචාර්‍ය, වෙංකටවරද, හරිහරභට්ට, දෙවශඞ්කරභට්ට, ඝොෂ්සිඤුරෙන්ද්‍ර** යන මොවුන්ගේ ටීකාද සමග ටීකා සතලිසක් පමණ මෙයට වෙතියි **ශාස්ත්‍රාචාර්‍ය දේ** මහතා ඔහුගේ **"අපේ උරුමය"** නම් ගතෙහි දෙවන කොටසෙහි සඳහන් කෙරේ.

## අමරුව සංග්‍රහ කවෙක් ද?

විද්‍යාකරගේ සුභාෂිතරත්නකොෂයේ පෙරවදනෙහි ආචාර්‍ය ඩී ඩී කොසම්බි අමරුශතකය එක් කිවියකු විසින් රචිත ග්‍රන්ථයක් නොව කිවිවරයන් බෝ දෙනෙකු ගේ ශ්ලොක එක්තැන්කොට සංග්‍රහ කරන ලද්දෙකැයි යෙති. එහි නොවේ මදවූද සැබවෙක්. එයට විරුද්ධව කිය හැකි කරුණු බොහො වේ ශතක කාව්‍ය ග්‍රන්ථයක් වනාහි සාමාන්‍යයෙන් එක් කිවියකු ගේ කෘතියක්ම වේ. මෙගත කතාවක් පැදියට නහන ලද්දෙක් නොවේ. එසේ නම් එහි එකතුවෙක් වේ. එසේම එක් එක් ශ්ලොකය වෙන් වෙන්ව පවතී හෙවත් මුක්තක ශෙලාකයෝ වෙති. එහෙයින් මෙයට අනුන්ගේ ශෙලාකයන් ද බැහීමට අමාරු නොවේ. මෙහි එක් එක් ශ්ලොකය පෙම් හැඟුම්හි වැද ගත් හමුවක් හෝ සියුම් හැඟුම් කෙමෙන් වැඩෙන අපුරු විදහාපාන සිත්තමක් බඳුය මෙහි එක්තරා එකාබද්ධයක් හා සම්බන්ධතාවයක් ද අමරුවටම ආවේනික පද ඝටනා හා පැහැදිලි බව ද ආදියෙන් මෙය එක් අයෙකුගේම කෘතියක් බව වැටහේ.

පළමුවෙන් මෙගත ගැන සඳහන් කරන්නේ නවවන සියවසේ සිටි ආනන්දවර්ධනයෝය. ඔහු අමරුගේ මුක්තක රස වැගිරෙතියි සූහ. දසවන සියවසෙහි අග කොටසෙහි රචිත දශරූපකකාරයෝ ද අමරු ශ්ලෝක උද්ධරණය කළහ. අර්ජුන 'අමරුකවෙඃ ප්‍රසාර් ශ්ලෝකාන් ශතම්' යැයි ලියූ රුද්‍රම "අමරුශතකම්"යි පැවසී. වෙම "අමරුක කවිනා රචිතං ශෘංගාර රසාත්මිකාං ශත ශ්ලෝකිං"යයි ලිවී. රුද්‍රට ගේ ශෘංගාරතිලක ශොධක ආචාර්ය පිෂල් (Dr Pischel) නම පෙරවදනෙහි අමරුශතකය ශෘංගාර තිලකා මෙන් පෙම් හැඟුම් විතර කරන්නේයැයි පැවසී. මෙසාරුණුම පමණ නො මෙගත අමරුගෙ බවට?

**ශෘඞ්ගාරය**

අමරුව කැමි රසයට ම බැඳුණෙකි සකු කිවියෝ රස අතුරින් කැමි රසයට ඉමහත් සැලකිමක් දක්වූහ. ගාථාසප්තශතිය, ආර්‍යාසප්තසතිය, අමරුශතකය, ශෘංගාර ශතකය, බිල්හණගේ චෞරපඤ්චශිකාව, කාලිදාසගේ පුෂ්ප බාණවිලාසය හා ශෘංගාරතිලකය, †රුද්‍රගේ ශෘංගාරතිලකය යන ගත්හු සිරිහර රසයටම බැඳුණෝ වෙති. මහා කව් ගත්හි හා නළුගත්හි ද සිරිහර රසයට ඇරුණු ශ්ලෝකයෝ වෙති. එහෙත් එගත් බොහොවකම දක්වෙනුයේ රජගේ ඇතුළු පුරය සම්බන්ධ පවත්වේ. මෙහි ඉහතින් දක්වූ ගත්හි දක්වෙන්නේ සාමාන්‍ය ජනයා අතර ඇති වන කැමි රසයයි. මෙයින් අදහස් කළේ එ දෙපසෙහි කැමිරසයෙහි වෙනසක් ඇති බව නොවේ වැඩියක් ම එකල කිවියන් රජදරුවන් සම්බන්ධව ම ගත් රැසැවුණු බැවින් එගත්හි දක්වෙන කැමිරසය ඔවුන් සම්බන්ධ වූවෙකි.

ශෘංගාර රස රතිය නම් ස්ථායි භාවයෙන් පහළවේ. රතිය යනු ඇල්ම යන අරුතැති පදයෙකි. පුම්තිරින් දෙදෙනෙකුතුළ ඇතිවන ඇල්ම-ආශාව රතිය වේ.. එය මෙසේ දක්වති පැරණියෝ.

---

† රුද්‍රට යනු මතයෙකි.

1. සම්පන්නෛශ්වර්‍ය සුඛයොරශෙෂ ගුණ යුක්තයොඃ
නව යෞවනයොඃ ශ්ලාඝ්‍ය ප්‍රකෘත්‍යොඃ ශ්ලාඝ්‍ය
රූපයොඃ

2. නාරී පුරුෂයොස්තුල්‍යා පරස්පර විභාවිතා
ස්පෘහාශ්වයා විත්‍යා වෘත්ති රතිරිත්‍යභිධියතෙ

ස්ත්‍රී පුරුෂ දෙදෙනකු කෙරෙහි හටගන්නා අනුරාග වෘද්ධිය **ශෘංගාර** නම්. "ශෘංග කාමොද්‍රෙකම් සෘච්ඡති අනෙන (ශෘංග + සෘ + අන්) ශෘංගාරඃ" යනු ශෘංගාර යන පෙදෙහි විග්‍රහයි. මේ ශෘංගාරය සංභොග හා විප්‍රලම්භ යනුයෙන් දෙ අයුරෙක් වේ. ඔවුනොවුන් කෙරෙහි අනුරාගයෙන් ඇතිවන සමාගමය සංභොගයයි. වරක් එක් වූ දෙදෙනකු යම් කිසි හේතුවෙකින් වියෝගයෙක් වේ ද එය විප්‍රලම්භයයි. **ධනඤ්ජයෝ** මෙය අයෝග විප්‍රයෝග සංභොග යැයි ශෘංගාරය ත්‍රිවිධ කොට දක්වති.

**මුක්තක**

අමරුව මුක්තක කාව්‍යයෙකි. පෙර හෝ පසු හෝ අන් පැදියක් හා සබඳයට නොයන පැදිය මුක්තක ගණයට වැටේ. එසින් කීහ.

"මුක්තකං ශ්ලොක එවෛකශ්චමත්කාරක්‍ෂමඃ සතාම්"

මුක්තකය පාඨකයාගේ චමත්කාරය ඇතිකරන එක් ම ශ්ලෝකයෙකි. මෙය සාමාන්‍ය කිවියකු විසින් නොව උසස් වැටහීම් ඇති නුවණැතියකු විසින්ම කළ යුත්තෙකි. මුල සිට අගතෙක් රසයෙන් යුක්ත වියයුතු බැවිනි. මහා කාව්‍ය ඛණ්ඩ කාව්‍යාදීන්ගේ අතරින් පතර මුක්තක පද්‍යයෝ විද්‍යමාන වෙති. එහෙත් ගාථාසප්තශති, ආර්‍ය්‍යා සප්තශතී හා අමරුශතකය ආදි ග්‍රන්ථයෝ එසේ නොවෙත්. ඒ ගත් මුළුමනින් ම මුක්තකයන් ගෙන්ම බැඳුණේ වේ. කථාවක් පද්‍යයට නැගී ගතෙකැ පාඨකයා එහි කථා රසය ම සලකා බලයි. එහෙත් අමරුව වැනි මුක්තක ගත්වල කථා රසයෙක් නොවේ. එහි ලා පාඨකයා

සලකන්නේ එක්එක් පද්‍යයෙහි ඇති රසය ම වේ. ''පූර්වා පර නිරපෙක්ෂෙණාපි යෙන රසචර්වණා ක්‍රියතෙ තදෙව මුක්තකම්'' යැයි ආනන්දවර්ධනයන් කීයේ එහෙයිනි. මෙ බඳු කවි බඳින්නා මහ කිවියෙකි. එහෙයින් අමරුව මහ කිවියකු අතින් නිපැයුණෙක් ද නො එසේ වූව සාමාන්‍ය කිවියකු අතින් නිපැයුණෙක් ද යන නිගමනයට බැසීමට අමරුව කියවන පාඨකයාට අපහසු නොවේ

සංස්කෘත මුක්තක ග්‍රන්ථ නීති, ශෘංගාර, ශාන්ති හෙවත් වෛරාග්‍ය යන කරුණු තුන ඇසුරු කොට බැඳුණේ වේ භර්තෘහරි මෙ කරුණු තුනට තෙගතෙක් ම බඳින ලදී. **නීතිශතකය, ශෘංගාරශතකය, වෛරාග්‍ය ශතකය** ඒ තෙ ගත වේ. නීතිය ගැන බැඳුණු ගත්හි ජීවනයට ඇවැසි ගැඹුරු අදහස් කිවි බසින් පළට කෙරෙයි ධනය ඇති නැති දෙකල්හි එකම මිනිසාට සමාජයෙහි දෙ අයුරෙකින් සලකන බව භර්තෘහරි දක් වන්නේ මෙසේය.

තානීන්ද්‍රියාණි සකලානි තදෙව කර්ම
සා බුද්ධිරප්‍රතිහතා වචනං තදෙව
අර්ථෝෂ්මණා විරහිතඃ පුරුෂඃ ස එව
ත්වන්‍යඃ ක්ෂණෙන භවතීති විචිත්‍ර මෙතත්

එහි අදහස ග. ආඩීපාල ගුණසේන මහතාණෝ මෙසේ කියති සිංහල පැදියෙන්.

දනැතිකල තුබු අත් පා කැරුම් හා කතාවක්
තිබුණු නුවණ හා අත් සැම දූමත් එසේ ඇත්
එනමුදු දන රස්නෙත් සුන් වූවොත් ඒ තැනැත්තා
අනෙකකුසෙ තැකෙයි හා මේ සමාජේ අදෙමැයි!.

ශාන්ති නොහොත් වෛරාග්‍ය මුක්තකයන් ගෙන් දිවියෙහි නොතිර බව දූහැම් කල්පනා හා සසරෙහි දුක් ඈ කරුණු දක්වේ. සසර දුක දුකැ මෙලොව ඇති හැම දෙයෙකැ ආසා සිඳ ඒ සසර දුක නසනුවට බවුත්හි

යෙදුම මනාග යනු භර්තෘහරි තම වෛරාග්‍යශතකයෙහි මෙසේ දක්වයි.

ආයුඃ කල්ලෝල ලෝලං කතිපම දිවස ස්ථායිනී යෞවන ශ්‍රී·
රර්ථාඃ සංකල්ප කල්පා ඝන සමය තඩිද්විභ්‍රමා භෝග පූරාඃ
කණ්ඨා ශ්ලේෂෝප ගුඪං තදපි ච නචිරං යත් ප්‍රියාභිඃ
ප්‍රණීතං
බ්‍රහ්මණ්‍යාසක්ත චිත්තා භවත භවභයාම්භෝධිපාරං තරීතුම්.

එහි අදහස මෙසේ වේ.

තරඟ ලෙස සැලේමැයි දිවි නො දික්වේ යොවුන් බව
ලොසැප විදුලියක් සේ සම්පතුත් වේ සිතුම් මත්
ගෙල වැලඳ ගැනීමත් බෝ කලක් නැ ලඳුන් ගේ
එයින බව හැරුම් වස් නිත් බවුත්හි යෙදෙත්වා

(ග. ආර්‍යපාල ගුණසේන)

## අමරුගේ මුක්තක

කැමි රසයටම ඇරුණු මුක්තක ශෘංගාර **මුක්තක** නම්. ඒ මුක්තක ග්‍රන්ථ ගණයට ගාථාසප්තශතී, ආර්‍යා සප්තශතී, ශෘංගාරශතකය, ශෘංගාරතිලකය, අමරුශතකය, චෞරපඤ්චශිකා යන ග්‍රන්ථයෝ අයත් වෙති **හාල ගෝවර්ධනාචාර්ය** හා **භර්තෘහරිගේ** මුක්තක පරපුරට ම අමරුගේ මුක්තක වැටේ **ආනන්දවර්ධනයෝ** ඔහු ගේ මුක්තක උසස් ලෙස වැනූහ **අභිනව ගුප්තයෝ** අමරුගේ ශ්ලෝකයක් ශ්ලෝක සියයක් සම යැයි ශූහු. රස පිහිටවීමෙහි මහ ම සමත් බවෙක් වේ අමරුට. එය කවි සාමර්ථ්‍යයෙන් අයත් වූවෙකි. ශබ්දය අර්ථය හා කවි සාමර්ථ්‍යය යන තුනෙන් මුල දෙක සියලු කිවියනට සම වේ. තෘතීයය භිත්තශක්තික යැයි **සෝමදේව** සූරීහු කියත්. අමරුගේ කවි සාමර්ථ්‍යය ඉතා උසස් බවට මෙ ගත දෙස් දෙයි මුක්තක කාව්‍යයන් ගැන ගෝවර්ධනයෝ මෙසේ කියති.

අඛලිත ශබ්දාලංකෘතිරනුකූලාස්ඛලිතපද නිවෙශාපි
අභිසාරිකෙව රමයති සූක්තිඃ සොත්කර්ෂ ශෘංගාරා

වාගාඩම්බර රහිත අර්ථාලංකාරයෙන් කෝමල පද ඝටනාවෙන් යුත් උත්කර්ෂ ශෘංගාර රසාන්විත උක්තිය අබරණ හඬ නො උපදවා හිමියා විසින් කියන ලද තැනට යන රතියෙන් පරිපුෂ්ට අබිසරු ලියක මෙන් සිත් අලවයි යනුය මෙහි අදහස. ඒ එසේමය අමරුගේ පද්‍යයන්හි වාගාඩම්බරයෙක් නොවේ. මදකට හෝ වාගාඩම්බර යැයි කිය හැක්කේ පළමුවන ශ්ලෝකයේ සතර වන පාදයට පමණය. මොහු ගේ එක් එක් ශ්ලෝකයෙක් එක් එක් චිත්‍රයෙකි. ඒ ශ්ලොක අර්ථාලංකාර යෙන් යුත් මොළොක් පද ගැලපීමෙකින් යුක්ත වේ. මොහු ගේ ශෛලිය ඍජුය. සරලය. ප්‍රණයයෙහි වෙන් වෙන් අවස්ථා පෙන්වා දෙයි.

## ගාථා සප්තශතී හා අමරුශතකය

ගාථා සප්තශතිය **ශාතවාහන** නම් අපර නාමයක් ඇති හාලගේ කෘත්‍යයෙකි. මෙය සංග්‍රහ ග්‍රන්ථයෙකි. හාල ක්‍රි: ව; පළමුවන සියවසෙහි වූවෙකැයි කියති. දකුණු දිග වූ ප්‍රතිෂ්ඨාන පුරය ඔහුගේ රජදහන විය ගාථා සප්තශතියෙහි සමහර ගාථාවන්ගේ අදහසට සම නොහොත් එහි ඡායාව දක්වෙන ශ්ලෝක අමරුවෙහි වේ. එයින් කීපයක් මෙහිලා දක්වමි.

අවිඅපසුත්තඅ විනිමීලිඅච්ඡදෙ සුහ අමජ්ඣ ඔආසම්
ගණ්ඩ පරිඋම්බණා පුලඉඅ අඞ්ගණ පුණො චිරා ඉස්සම්

(ගාථා 1–20)

ශූන්‍යං වාසගෘහං විලෝක්‍ය ශයනාදුත්ථාය කිඤ්චිච්ඡනෛර්
නිද්‍රාව්‍යාජමුපාගතස්‍ය සුචිරං නිර්වර්ණ්‍ය පත්‍යුර්මුඛම්
විශ්‍රබ්ධං පරිචුම්බ්‍ය ජාතපුලකාමාලෝක්‍ය ගණ්ඩස්ථලීං
ලජ්ජානම්‍රමුඛී ප්‍රියෙණ හසතා බාලාචිරං චුම්බිතා

(අමරු 82)

පණ්අ කුවිඅාණ දෙන්ණ වි අලිඅපසුත්තාණ මාණඉල්ලාණම්
නිච්චල නිරුද්ධ ණීසාස දිණ්ණ කණ්ණාණ කො මල්ලො
(ගාථා 1-27)

අණ්ණොණ්ණ කඩක්ඛන්තර පෙසිඅ මෙලීණ
දිට්ඨි පසරාණම්
දෙව්විඅ මණ්ණෙ ක අහණ්ඩණා ඉ සම්හං පහසි ආ ඉං
(ගාථා 7-99)

මේ දෙකෙහි ඡායාව අමරුගේ මේ ශ්ලෝකයෙහි වේ.

එකස්මින් ශයනෙ පරාඞ්මුඛතයා වීතොත්තරං තාම්‍යතො-
රන්‍යොන්‍යං හෘදයස්ථිතෙප්‍යනුනයෙ සංරක්‍ෂතොගෞරවම්
දම්පත්‍යොඃ ශනකෛරපාඞ්ග වලනාන්මිශ්‍රී භවච්චක්‍ෂුෂො
භිග්නො මානකලිඃ සහාස රභසං ව්‍යාසක්ත කණ්ඨග්‍රහඃ
(අමරු 23)

අච්ඡීත්‍ර තා ඵඉසසං දෙහි වි හත්ථෙහි වි තස්සි දිට්ඨෙ
අඞ්ගං කලම්බ කුසුමං ව පුලඉඅං කහණ්ණු ඪක්කිස්සම්
(ගාථා 4-14)

භ්‍රූභඞ්ග රචිතෙපි දෘෂ්ටිරධිකං සොත්කණ්ඨමුද්වීක්‍ෂතෙ
රුද්ධායාමපි වාචි සස්මිතමිදං දග්ධානනං ජායතෙ
කාර්ක්‍ශ්‍යං ගමිතෙපි චෙතසි තනූ රොමාඤ්චමා ලම්බතෙ
දෘෂ්ටෙ නිර්වහණං භවිෂ්‍යති කථං මානස්‍ය තස්මින් ජනෙ
(අමරු 28)

පසිඅ පිච කා කුවිආ සුඅණු තුමං පරඅණම්මි කො කොවෙ
කොහු පරො නාථ තුමං කිස අපුණ්ණාණ මෙ සත්ති
(ගාථා 4-84)

මෙයට ඉතාම සම එකෙකි මේ ශ්ලෝකය

බාලෙ, නාථ, විමුඤ්ච මානිනි රුෂං, රොෂාන්මයා කිංකෘතම්
ඛෙදෙස්මාසු, නමෙපරාධ්‍යති භවාන් සර්වෙ'පරාධා මයි,
තත් කිං රොදිෂි ගද්ගදෙනවචසා, කස්‍යාග්‍රතො රුද්‍යතෙ,
නන්වෙතන්මම, කා තවාස්මි, දයිතා, නාස්මීත්‍යතොරුද්‍යතෙ
(අමරු 57)

ජං තණ්ණු ආඅඞ්ඪ සා තුහ කඒණ කිං ජේණ පුච්ඡසි හසන්තො
අහ ගිම්හෙ මහ පඅඊ එව්වං හණ්ණි උණ්ණ ඔරුණ්ණා

(ගාථා 7–11)

අඞ්ගානාමතිතානවං කුත ඉදං කසමාදකම්පාදිදං
මුග්ධෙ! පාණ්ඩු කපොලමානනමිති ප්‍රාණෙශ්වරෙ පෘච්ඡති
තන්ව්‍යා සර්වමිදං සවභාවත ඉති ව්‍යාහෘත්‍ය පක්ෂ්මාන්තර-
ව්‍යාපී වාෂ්පභරස්තයා වලිතයා නිඃශ්වස්‍ය මුක්තො'න්‍යතඃ

(අමරු 50)

## ආශ්‍රීසප්තශතී හා අමරුශතකය

ආශ්‍රී සප්තශතිය ගාථා සප්තශතියේ ශෛලියම අනුව රචිත ශෘංගාර මුක්තක කාව්‍යයෙකි. දෙගන්හි සමාන වූ අදහස් බොහොමයකි. ශෘංගාරයෙහි සැඟවිය යුතු හා ප්‍රකාශ කටයුතු වූ ද යම් කරුණු අරභයා ගාථාසප්ත ශතිය බැඳිණි ද එ අනුව ම ගත් මගෙකිනි ආශ්‍රීසප්ත ශතිය බැඳුණේ. එහි සඵලතාවයෙක් වී ද නොවී දැයි පාඨකයෝ ම දනිත්. මෙහි කතුවරයා ගොවර්ධනාචාර්යයෝ වෙති. සිරිහර රස පබැඳුම්හි ඔහු මහ සපත්හු යැයි ජයදේවයෝ කියති. මෙගතය ඔහු ගේ සිරිහර රස වැගෙන ගත. ඔහුගේ ජීවන සමය එකොළොස්වන සිය වසය යනු ඉතිහාසඥ මතයයි. එසේ නම් ආශ්‍රීසප්ත ශතිය අමරුශතකයට පසු රචිතයෙකි. අමරුගේ ජීවන සමය හත්වන හෝ අටවන සියවස බැව්නි. ආශ්‍රීසප්ත ශතිය සංස්කෘත මුක්තක ග්‍රන්ථයන්හි ලා විශෙෂ ස්ථාන යෙක් දරයි අකාරාදි අක්ෂර පටිපාටිය අනුව ශ්ලෝක යන් පිළියෙළ කැරුම මෙහි විශේෂ ලක්ෂණයෙකි. මෙහි හා අමරුවෙහි සමතැන් නොහොත් සම අදහස් වෙයි. එබඳු තැන් කිහිපයෙක් මෙසේ වේ.

ආශ්‍රීමෙහි නායකයෙක් ස්ත්‍රියගේ අධරය මෙසේ වනයි

එකො හරඃ ප්‍රියාධර ගුණවෙදී දිව්‍යෂදෙ'පරෙ මූඪාඃ
විෂමමෘතං වා සම්මිති යඃ පශ්‍යන් ගරලමේව පපෞ

(ආශ්‍රී 182)

යම් මෙහෙසුරෙක් විස හා අමා සමයැයි දක්තේ විස පානය කෙළේ ද එබඳු එක් සිවයෙක් ම ඉතිරියගේ අධරයෙහි ගුණ දති සෙසු දෙවියෝ අඥයෝය. (දෙවියෝ අමාව පිණිස කිරි සයුර කැලඹූහ. සත්‍රිය ගේ අධරය අමාවට වඩා මිහිරය )

අමරු සත්‍රිය ගේ අධරය ගැන මෙසේ කියයි.

සංදෂ්ටෝ'ධර පල්ලවෙ සචකිතං හස්තාග්‍රමාධූන්වති
මා මා මුඤ්ච ශඨේති කොපවචනෛරානර්තිත භ්‍රූලතා
සීත්කාරාඤ්චිත ලොචනා සරභසං යෛශ්චුම්බිතා මානිනී
ප්‍රාප්තං තෛරමෘතං ශ්‍රමාය මථිතො මූඪෛඃ සුරෛඃ සාගර

(අමරු 36)

"මා අතහරු නො එසේ වුව තට පයින් පහර දෙමි"යි කිපුණු නායිකාවක් නායකයකුට කියති.

එය මෙසේ දක්වති. ගොවර්ධනයෝ.

කුපිතාං චරණ ප්‍රහර භයෙන මුඤ්චාමි න බලු චණ්ඩි ත්වාම්
අලිරනිල චපල කිසලය තාඩන සභතො ලතාං භජතෙ.

(ආර්යාසප්තශතී 184)

වැලෙක සුළඟින් ලෙලෙන ලා දළුයෙන් පහර ලත් බමරා වැල අත් නො හරියි. එසේ ම රළු තැනැත්තිය! තිගේ පා පහරට බියෙන් මම කිපුණු තී අත් නො හරිමි. ගොවර්ධනයන් ගේ පා පහර දූඛිය. අමරු එය ප්‍රණය රසයෙන් තෙත් කොට මෙසේ දක්වයි

සාලක්තකෙන නව කොමල පල්ලවෙන
පාදෙන නූපුරවතා මදනාලසෙන
යස්තාඩ්‍යතෙ දයිතයා ප්‍රණයාපරාධාත්
සො'ඞ්ගීකෘතො භගවතා මකරධ්වජෙන

(අමරු 116)

නොහොත්,

සාලක්තකං ශතදලාධික කාන්තිරම්‍යං
රාත්‍රෞ සවධාම නිකරාරුණ නූපුරාඪ්‍යම්
ක්ෂිප්තං භෘශං කුපිතයා තරලායතාක්ෂ්‍යා
සෞභාග්‍ය චිහ්නමිව මූර්ධ්නි පදං විරේජේ

(අමරු 128)

## චෞරපඤ්චශිකා හා අමරුශතකය

**චෞර පඤ්චශිකාව** හෙවත් චෞර සුරත පඤ්ච ශිකාව අමරුව ඉදිරිපිට තබාගෙන රචිතයෙකැයි නිච නිවරද යැයි හඟිමි. එපමණට ම අමරුව අනුගමනය කළ ගතෙකි එය එහි ශ්ලෝක පණසෙකි. කතුවරයා **බිල්හණ** නමැත්තෙකි. ඔහුගේ ජීවන සමය තෙළෙස් වන සියවස වේ. කාශ්මීරයෙහි කොණමුඛය ඔහු ගේ ජන්ම භූමියයි. පියා **ජ්‍යෙෂ්ඨකලශ** නම් තැනැත්තෙකි. මව **නාගදේවී** නමු

විදෙසකට යාමට සැරසෙන නායකයකුගේ ඒ ගමන නායිකාව විසින් වැළැක් වූ අයුරු නායකයා ගේ බසින්ම බිල්හණ මෙසේ ගෙන හැර පායි.

අද්‍යාපි තාං ගමනමිත්‍යුදිතං මදීයං
ශ්‍රුත්වෛව භීරු හරිණීමිව චඤ්චලාක්ෂීම්
වාචඃ ස්ඛලද්විගලදශ්‍රුජලාකුලාක්ෂීං
සඤ්චින්තයාමි ගුරුශෝක විනම්‍රවක්ත්‍රාම්

මේ දසාව ගැන අමරු ගේ කීම මෙසේ වේ.

ප්‍රහරවිරතෞ මධ්‍යෙ වාහ්නස්තතො’පි පරෙණ වා
කිමුත සකලෙ යාතෙ වාහ්නි ප්‍රිය! ත්වමිහෛෂ්‍යසි
ඉති දිනශත ප්‍රාප්‍යං දෙශං ප්‍රියස්‍ය යියාසතො
හරති ගමනං බාලාලාපෛඃ සවාෂ්පගලජ්ජලෛඃ

(අමරු 12)

නොහොත්,

කාන්තේ කථඤ්චිද් ගදිත ප්‍රයාණේ
ක්‍ෂණ විනම්‍රා විරහාර්දිතාඞ්ගී
තතස්තමාලොක්‍ය කදා’ගතො’සි
න්‍යාලිඞ්ග්‍ය මුග්ධා මුදමාසසාද

(අමරු 158)

අපරාධවත් නායකයාට නායිකාව ගේ කටයුතු සංභොගාවස්ථාවෙහි දයිතාවගේ දයිතයා කෙරෙහි පැවැත් ම දයිත දයිතාවන් ගේ වැනුම් යන මේ කරුණුවලදී අමරුගේ ප්‍රභාව බිල්හණ ගේ මුක්තවල වෙයි.

## අමරුවේ රස

අමරුව කැමි රසයෙන් යුත් මුක්තක ගණයට අයත් කාව්‍යයක් බව පෙරින් දැක්විණි. මෙය කැමි රසයටම බැඳුණු ගතක් වුව ද අන් රස ද නැත්තේ නො වේ. එහෙත් මෙහි මුඛ්‍ය රසය කැමි රසයමය. ගතෙහි ආශීර්වාදාත්මක දෙවන පැදියට පවා අමරු සිරිහර රසය කාවයි. ශරාග්නිය නව අපරාධයක් කළ කාමියෙකි. එනම් පසුගිය රැය අන් අඟනක වෙත විසුවෙකි පසු දින අසුරඟනන් කරා විත් ඔවුනගේ අත් හා කෙහෙ ගත් කල අතින් ගසා දුරු කළහ. ඉක්බිති වැළඳ ගැනුමට අදහස් කෙළේය. එයට ද ඉඩ නොදුන්හ. ඔවුහු යළි හද ප්‍රණාමය කළ ද ඔහු දෙසවත් නොබැලූහ. මෙහි තිපුර ජයෙන් වීර රසය ද ප්‍රකාශ වේ. “සාශ්‍රුනෙත්‍රොත් පලාභිඃ” යන්නෙන් ඒ අසුරඟනන් තම හිමියා ගැන හටගත් සොවින් කරුණා රසය ද දැක්වේ.

අමරුවෙහි දැක්වෙන එක් එක් පැදියක් පෙම පිළිබඳ එක් එක් සිතුවමෙකි වහා වෙනස්වන භාව භාව හැඟුම් හා අවස්ථා මිහිරි කව් බසින් මනාව දක්වා තිබේ බොහෝ පැදිවලින් නාත්‍යානුසාරී දශීනයෝ ද දැක්වෙති අමරු ගේ එක් ශ්ලෝකයක් ශ්ලෝක සියයක්

බඳු යැයි භරත ටීකාකරු කියයි. ඔහුගේ ඒ කියමන සෙසු පඬුවෝ ද පිළිගනිති. මෙහි චිත්‍රානුසාරීව පෙන්වන ප්‍රේමය නිකෙලෙස් තත්ත්වයෙකින් හා පැසුණු බුද්ධියෙකින් ඇතිවන පිරිසිදු පෙමෙහි පටන් හුදු කාමුක තණ්හාව දක්වා කෙමෙන් වෙනස්වන අයුරු දක්වා තිබේ. එහෙයින් ප්‍රේමයට කරන ආත්මපූජාව, පෙම්වතකු ගේ පෙම පිළිබඳ මඳවූ ද සැකයක් පෙම්වතියට ඇතිවන කල ඉන් ඇයගේ හදත ඇතිවන වේදනාව, එවිට එයින් ඇයට ඇතිවන ඉසි සින, සසගින් ඇතිවන ඉමහත් සතුට හා හැඟුම්, පෙම් දෙලෙන් නැලවී පසුව ඉන් වියොවට පත්කල දිවියෙහි ඇති විරසබව, පුරුෂයකුට පෙම්වතියන් කිපදෙනකු ඇතිකල එකියක හා සහවාසයෙහි දී ඇයට හටගත් සොම්නස් හා පෙම අනිකකුට පෙම්කරනවිට නැතිවී ඉක්බිති හටගන්නා වේදනාව නායකයා ගේ එයට ගෙනහැර පාන මුසාබස් යන මේ සියල්ල මෙහි දැක්වේ

පුරුෂයා වරින් වර ස්ත්‍රිය සොයා එයි. ඈට මහත් සේ අදර පායි. ඉතිරිය ඔහුට දෙස් කියන එය නොඉවසා නිදෙස් බවට කරුණු ගෙනහැර පා ඇයට අමරණීය ප්‍රේමයක් ඇති බව හඟවයි. එයටත් වඩා ඉතිරියගේ හද පෑරෙනුයේ පෙම්වතා අන් ලියක කෙරේ වැස සමහම් (සංභොග ලකුණු ද ඇතිව පසු දින උදය දුක් වෙමින් සිටින එකියක කරා පැමිණීමය. (අමරු 17, 20, 60) එබඳු දයිතාවක් මෙසේ කියයි "පෙර අපි දෙදෙනා එක් සිරුරක් වීමු. ඉක්බිති ඔබ පෙම්වතා විය. මම පෙම්වතිය වීමි. දැන් ඔබ මාගේ බරුවාය. (භර්තෘ) මම ඔබේ කලත්‍රය. (කලත්‍ර) මෙය මෙබඳු දූය ඉවසා ගෙන සිටින විදුරු බඳු දැඩිවූ පණෙහි පලය වේ." මෙය කොපමණ සොවට කලකිරුමට පත්වූවක ගේ කිමෙක් ද? මෙයින් පෙම්වතකු විසින් හැර දමන ලද පෙම්වතියට තම දිවිය තමාට සාපයක්ව බරක්ව පවත්නා බව නොහැගේ ද? "හදවත් එක්වූ විට මනාව සාදන ලද කූඩුවෙන් පලාවූකොට ප්‍රේමය පැනයයි. නැති වූ දෙය ගැන

දුක් විඳිමට දුබලයා. එය තනිකර දමයි.'' අපර දිග තිවියකුගේ කිසිම සත්‍යය මෙයින් හා අමරු ගේ සෙසු පැදිවලින් අපට පෙන්වා දෙයි

අමරුයෙහි ඉතිරිය ගැන පවසන වෙසෙයි ලකුණෙක් නොහොත් වෙසෙසි ගුණයෙක් වේ. එනම් එහි දක් වෙන හැම කතක් ම තිරගති ඇත්තියක වීමය. සකු ගත්හි නිතර දක්නට ලැබෙන්නේ දුබල චපල කුරිරු ගති ඇති ලියෝ වෙති. අමරුවෙහි එබඳු ස්ත්‍රීහු නො වෙති. පොරොන්දු බිඳින්නේ පුරුෂයා වේ. මෙහි දැක්වෙන වැඩි දෙනෙක් ම ශඨ නායකයෝ වෙති.

සංස්කෘත ග්‍රන්ථයන්හි ශෘංගාර කාව්‍ය සංභොග හා විප්‍රලම්භ යැයි ද්විප්‍රකාර කොට දැක්වේ එයින් පළමු වන කොටසෙහි සංභොගය සම්බන්ධ වර්ණනා වේ. ප්‍රේම යෙහි විවිධ අවස්ථා එහි විස්තර වෙයි. මෘදු ගති ඇති ශිෂ්ටයෝ එහි දැක්වෙන සමහර චිත්‍ර වැඩි වැනුමෙකින් යුත් ඒවා යැයි ද කලාත්මක ඉම ඉක්මුණු ඒවා යැයිද කියත් එහෙත් දිවිය පිළිබඳ කරුණුවලට මුහුණ පා එවැනි නීති රීති නොතකන අයෙක් ''ශාරිරිකව විඳිය හැකි ඉතාමත් උසස් ප්‍රීතිය සංභෝගයෙන් ඇතිවේ'' යන ඉංග්‍රීසි කවියාගේ අදහසට එකඟව මේ චිත්‍ර ඉතා උසස් සේ සලකති

''අපරාධවත් නායකයා තමා ළඟට එන කල මේ මේ බස් පවසවයි යෙහෙළියෝ එක් නායිකාවකට ඉගැන් වූහ. හෝ ද ඉගැන් වූ බස් පමණක් ඔහුට කියා යළි අනඟා ගේ රිසිය ලෙස පැවතුමට පටන් ගතු. මේ පෙමෙහි සහජ වූ මනහර ක්‍රමයෙකි.'' (අමරු 48)

මේ සංභොග ශෘංගාරයට එක් නිදසුනෙකි. විවිධත් වයෙන් පියකරු බවෙන් යුත් මේ චිත්‍ර උසස් කලාත්මක බවට හිමිකම් කියයි මෙ ගත මේ වර්ගයේ මෙයට පසු පහළ වූ ග්‍රන්ථයනට ආදර්ශයෙක් විය. එහෙයි මෙ කව අනුගමනයෙන් පසුව පහළ වූ මේ වර්ගයේ සමහර කාව්‍ය

මෙහි වන උසස් බව ප්‍රියභාවය යන දෙපසින් ම පිරිහී කාමුක හැඟිම් අවුස්සන නොමනා සිරිත් විරිත් විදහා පාන පිළිකුල් චිත්‍ර හඳුන්වන පහත් කලා තත්ත්වයට වැටී ඇත. තරුණ තරුණියන්ගේ ස්වභාවික රක්‍ෂාව කාමයෙහි ඇලී ගැලී විසීම පමණෙකැයි මෙගත්කරුවන් සිතුවාසේය ඔවුනගේ ගත් එමගට හැරවීමට හේතුව.

සංභොග ශෘංගාරයට අමරුයෙහි දක්වෙන අත් පැදියක අදහස ද මෙහිලා දක්වනු රිසියෙමි

"හිමියා යහන් පත් කල නෙරිය ලිහිණි. ලිහිල් මෙවුලෙහි රැඳී වන නිතඹෙහි පිහිටිය. යෙහෙළිය, මා දතුයේ මෙපමණය. ඔහුගේ ගත් පහස්හි ලා මොහු කවරෙක් ද? මම කවරක් ද? රතිය කුමක් දැයි යනු මදෙකුදු මට කෙසේ හෝ සිහියට නො ඈවේය" (අමරු 101) මෙහි මෙබඳු වූ ශ්ලෝක බොහොවෙති. සමහර පඬුවන ගේ අදහස මෙගතේ වූ මෙබඳු ශ්ලෝක නිසා ගතෙන් වැඩි කොටසක් ශිෂ්ට සම්මත කාව්‍ය ලෙස නො පිළිගත හැකි බවය. "අපරදිග විකෘතශිල්පී ලිඩ්ගික ස්ව භාවයත්, කාමුක සබඳකම් හා නොමනා ගති පැවතුම් යනාදියත් මෙනෙහි කරන මෙහි ශිෂ්ටත්වයක් පවත්නේ වේ" යනු මේ ගැන **මහාචාර්ය කෞසම්බි ගේ** මතය වේ. 3, 16, 19, 21, 25, 36, 37, 40 යන මේ ශ්ලෝක සංභොග ශෘංගාරයට අයත් ශ්ලෝකයන්ගෙන් කීපයෙක් වේ.

දෙවන කොට විප්‍රලම්භ යයි. එය අයෝග, ප්‍රණය මාන, ඊර්ෂ්‍යාමාන, ප්‍රවාස විප්‍රලම්භ යැයි සතර ආකාර වේ.

1. පෙම්වතුන් දෙදෙනාට එක්වීමට යම් අවසරයෙක් නොවේ ද නොහොත් කාර්‍යපූරණයට පෙර යම් ප්‍රේමයෙක් වේ ද එය **අයෝග** යයි.

2. පෙම්වතුනගේ හදිසි මතභෙදයෙකින් හටගත් කෝප යෙකින් නොහොත් ප්‍රණයකලහයෙකින් ඇතිවන විරහය ප්‍රණයමානයයි.

3. පෙම්වතා ගේ චපල ගතිය හේතුවෙන් ඇතිවන විරහ වේදනාව ඊර්ෂ්‍යාමානයයි.

4 පෙම්වතා විදෙසකට හෝ ගමනක් හෝ කියවිට මද කලෙකට ඇති වන විරහය ප්‍රවාස විප්‍රලම්භයයි.

1. මෙගතෙහි විප්‍රලම්භයට අයත් ශ්ලෝක තුනෙකි. 4, 63, 100 යන ශ්ලෝකය ඒ. ඉන් එකකින් (4) තුරුණුවියකගේ හදක හටගත් පෙම කවියා දක්වන්නේ ඇගේ බැල්ම වර්ණනා කරමිනි. ඒ මෙසේය. "එම්බා සොඳුරිය අද තෝ ආලස්‍යයෙන් වලිත වූ ප්‍රෙමයෙන් සිනිඳු වූ, වරින් වර අඩක් පියන ලද, ලජ්ජාව හේතු කොට ඇසිපිය නොහෙලන දෙනෙතින් හෘදය ගත රති අදහස කියාපාන්නාක් මෙන් කවරකු දෙස බලා ද"? තව එකකින් (100) එක් නායකයෙක් තම නායිකාව වැළඳ ගැනුමට මෙතෙක් ඉඩ නොලදින් ඇයගේ ගෙය අසලින් යාම පවා ඔහුට පරම සුවයක් බව පවසයි. ඉතිරිය කෙරේ පැවැති දැඩි පෙම මෙයින් හැගේ. අනිකෙන් (63) කවියා සිත්තම් කරන්නේ තුරුණුවියකගේ දුක්මුසු විලාසයෙකි. ඇයට තම පෙම හැඟවුමට දැඩි ආසාවෙකි. එයට මඟෙක් නොවේ. ඇයට දූතියක යවා පෙම්වතා හා එක්වීම ද කල නොහැක්කෙකි. දූතියක කෙරෙහි විස්වසෙක් නොවේ. තමා ම ගොස් පෙම්වතා සොයා යාම බැරි දෙයෙකි. ලෝකයා අනුන්ගේ සිදුරු සොයන්නෝ වෙති තමා ගැන සැකක් සිතා අවමනක් කල එය ඉවසිය නොහැකිවේ.

එහෙයින් හෝ කිරිමවට මෙසේ කියයි.

"මැණියෙනි මට යෙහෙළියන් කෙරෙහි විශ්වාය යෙක් නැත. මා අදහස දන්නා අය ඇති බැවින් මහිමිාස දෙස බැලීමට ද ලජ්ජා වෙමි ගෝවැස්සෝ මෙරමා ඉගි දන්නෝය. එබැවින් එහි යෑමට ද අපොහොසත් මි. ඉතින් මම කවරකු ගේ පිහිට සොයා යම් ද? අනුරාග ගින්න මගේ හදතුළ දිරුවේය." මෙයින් ඈ කිරිමවගේ පිහිට

සෙවූ බවය හැඟෙන්නේ. අනුරාග භින්න හදතුල දිරැවේය යන්නෙන් පෙමට තොවිල්ලක් වූ හද පෙමට මිනීවල වීය යන අදහස දෙයි. නවවන සංජ්වර නම් අවස්ථාවට ඈ පත්වූ බව ඇගේ මේ සියමනෙන් හැගේ

2. අමරුවෙහි ඇති ප්‍රණයමාන විප්‍රලම්භය හඟවන ශ්ලෝකයන්ගේ කීපයෙකි 8, 15, 20, 23, 24, 29, 42, 60 යන ශ්ලෝක. ප්‍රණය කලහයෙන්හටගත් කෝපයෙන් වන වියොව ප්‍රණයමානයයි. එක් නායිකාවක් තමා වෙත පත් නායකයාට ඒ වේලාවට හටගත් ක්‍රීඩා කෝපයෙන් ඔහුට යන්නට කියයි. හේ දූකි ලයැත්තෙකි. එ බස කනහෙත් ම හේ ඇට කිසිවක් නොකියා ම ඈ හැරදමා යෙයි එසේ ගිය හිමියා ගැන පුදුමයට පත් විය ඒ නායිකාව. එයටත් වඩා ඈ පුදුමයට පත්වූයේ ඇගේ විලිලජ්ජා නැති හදවත ගැනය. ඒ තමා හැර ගියහුගේ නැවත පැමිණීම පුල පුලා සිටි බැවිනි (15) අනිකක් තමා ගේ පාද ප්‍රණාමය කරන පෙම්වතා ඉන් වලකා කපටියෙකැයි ඔහුට නින්දා කෙරෙයි. මෙයින් දෙම්නසට පත් හේ ඈ හැරදමායි. ඈයට වූයේ මහ දුකෙකි. දෙ අත් ලය මත තබා දුක් සුසුමක් හෙලා, කඳුළු පිරි දෙනෙතින් යෙහෙළිය දෙස බලයි. (20) අනික් රමණීය චිත්‍රයෙක් මෙසේ වේ. අඹු සැමි දෙදෙනෙක් යහන් පත්හ. පණුවියගුරෙකින් හෝ වෙන අන් කිසි කරුණෙකින් දෙදෙනා අතර නොසතුටෙක් විය. එයින් දෙදෙනා එකිනෙකාට පිටුපා හොත්හු. මුනිවතම රැකියා මිස උතුරු පිළිතුරෙක් නොවී දෙදෙනා අතර. වැඩි වේලාවක් එලෙස සිටුමට ඔවුනගේ සිත් ඔවුනට ඉඩ නොදෙයි. එකිනෙකා ගේ සිත අනිකාට කතාකරනුවටම බල කෙරෙයි. ආත්ම ගෞරවයට නින්දාවෙක යන බිය නිසා එකෙක්වත් පළමුව කතාවට නොබසී. එහෙත් ඒකෙක් අනිකා දෙස ගෙල හරවා බැලීය. දෙවැන්නාද

එවිටම අනිකා දෙස බැලී දෙදෙනා ගේ නෙත් එකවට ගැටුණිය. ඉක්බිති කුමන මානයෙක්ද සිනා පහළ වූ දෙදෙනා එකිනෙකා වැළඳ ගත්හු (23)

3. ඊර්ෂ්‍යාමාන විප්‍රලම්භයට ශ්ලෝක රාශියෙක 6, 7. 9, 18, 26, 57, 76, ඉන් කිපයෙකි. පෙම්වතුන් දෙදෙනකු සම්බන්ධ විශ්මය ගෙන දෙන රමණීය දෙබසෙක් මෙසේ වේ. පෙම්වතා පෙම්වතියට "බාලෙ" යනුයෙන් අමතයි. හෝ දෙයි. පිළිතුරු "කිම නාථය" යනුයෙන් "තිගේ කෝපය දුරලව" යනුවෙන් නායකයා කී බසට "මා කෝපයෙන් කුමක් කළේ දැ"යි හෝ පිළිවිසියි. "ඇයි මට දුක් දුන්නා නොවෙ ද"? "හා වැරදිකාරිය මමයි ඔබ අත වරදෙක් නොවේ." "එසේ නම් ඇයි අඬන්නේ"? "කාගේ ඉදිරියේ ද මා ඇඬුයේ" "ඇයි මා ඉදිරියේ නොවෙද"? ඔබ මාගේ කවරහුද ඔබ ඉදිරියේ අඬන්ට" "මාගේ දයිතාව නොවැ"? "අහෝ එසේ නොවන නිසයි මා අඬන්නෙ" (57) මෙහි දුක් වෙන නායිකාව ඛණ්ඩිතාවකි දයිතයා අනිකක හා ඇළුම්කරන බව ඈ හොඳටම දනී. ඈ එය දන්නා බව පෙම්වතා ද නොදන්නේ නොවේ. එහෙත් එබඳු දෙයක් නැත්තකු මෙන් ඈ වෙත ගොස් චාටු බසින් ඈ තුටු කැරුමට සිතුවද හෝ ඔහුට දුන්නේ මරු පහරෙකි එහෙයින් නිහඬවූයේ තමාගේ නොහීර පෙමට ඔහුගේ පෙම්වතිය දෙන දඬුවම එක් පෙම්වතෙක් මෙසේ ඉව සයි නායිකාව අපරාධවත් නායකයා තමා වෙත ආ කල තම මොලොක් දෙ අතින් ඔහු අල්ලා ඇදගෙන යයි නිවෙස තුළට. එසේ ගෙන ගොස් යෙහෙළියන් ඉදිරියෙහි "ඔබ යළි එහි යෙහිදැයි"යි යෙමින් සිනාසෙන නායකයාට කෙළි පියුම් ආදියෙන් පහර දෙයි කෝපයට පත් පෙම්වතිය තම අමනාපය නායකයාට දක්වා ඔහු දුකට හෙළන්නේ කොපමණ චතුරාකාරයෙන් ද? මෙන්න එයට නිදසුනක්. එක් දයිතාවක් අපරාදවත් දයිතයා

තම නිවෙසට එන බව දුරදීම දැක ඔහුට සැලකිල්ලට මෙන් පෙරමගට යෙයි පෙම්වතා සිතුයේ ඔහුට ගරු කිරිමක්ම ඈ කළේ කියා. ඇයගේ අදහස අනිකෙකි. ඔහු හා එක් අසුනෙක හිදීම වැළක්වීමය ඒ අදහස ඉක්බිති මැළඳ ගැනුම් නවතනු වස් ඔහුට බුලත් විට සපයන අයුරෙන් එහි මෙහි යෙයි. ඉක්බිති ''මෙහි එව මෙය කරව'' යනාදී නියෝග දෙමින් පිරිවර දන යම් යම් මෙහෙවරෙහි යොදවන අයුරෙන් ඔහු හා කතාවට අවසරයෙක් නොතබයි. තමා කළ වරදට පළිගත් බව පෙම්වතාට හොඳට වැටහුණේය. (18)

4 ප්‍රවාසවිප්‍රලම්භය දක්වන ශ්ලෝක කිපයෙක 10, 12, 35, 54, 61, 76, 158, 163 යන මේ ශ්ලෝක. එයින් 158 හා 163 මත්තට වන (භාවී ප්‍රවාස)= විප්‍රලම්භය දක්වයි. විදෙස් ගත සැමියාගෙන් වෙන්ව කලක් ගතවූ යුවතියක ගේ හැඟුම් අමරුයෙහි චමත්කාර ලෙස මෙසේ දැක්වේ. එක් යුවතියකගේ හිමියා කිසියම් කරුණක් උදෙසා අන් රටකට ගියේය. කලක් ගතවිය අද ඔහු පැමිණෙන දිනය වේ. බිරිඳට තම හිමියා දැක්මට සීමා රහිත ආශාවෙකි. නො ඉවසිලිමත් හේ තොමෝ පෙනෙන තෙක් මානයේ මග ඇස් දල්වා බලයි. නො දකියි හිමියා. පෙරමගදී හමුවන අදහසින් යෙයි මගෙහි මඳ දුරක් ඈතට. එහෙත් හිමියා හමු නොවේ සන්ධ්‍යාව ගෙවී වටින් පිටින් අඳුර පැතිරෙයි. අඳුර නිසා බියපත් හේ ශෝකයෙන් හරිතව ආපසු ගෙදර ඒමට පියවරක් ආපසු තබයි. යළි ගෙල හරවා 'හිමියා එනවාදැ යි බලයි. (76) තම එකියක් විදෙසකට යාමට අදහස් කළ හිමි මුවගට සිනහ ගෙන දෙන අයුරෙන් දක්වන්නේ මෙසේය. හිමියා දන්වයි බිරිඳට තමා විදෙසකට යන බව. ඉක්බිති හේ හිමි වුවනට දෙනෙත් යවා මෙසේ කියයි. එය අපි කටවහරට යොදමු. "හැබෑටම ඔයා ගියේ කවදාද? නොහොත් ගිහින් ආවේ කවදා

දූ''යි යෙමින් ඉමහත් සතුටෙන් හිමියා වැලඳ ගතියි. මොන යාමෙක් ද ඔහුට? එයින් ම ගමන නැවතුණි. (158). අතිකක් විදෙස් ගමන මෙසේ නවතයි "ඔබ යන්ට අදහස් කළ ගමන සපිරම නම් යනු මැනවි. එහෙත් දෙතුන් පියවරක් ගොස් ආපසු හැරෙන්න ඒ මට ඔබ මුහුණ බලනු සඳහාය. මෙසසර දිවියෙහි තිර බවෙක් නොවේ. ඔබ හා මා යළි එක්වෙතියි කාවර කුට කියහැකිද? (163) මෙබඳු රසවත් කිම් හා ශොභන චිත්‍ර මෙගත පුරාම වෙයි.

**අපගේ සත්‍යය හා සතුතිය**

අප ගේ සත්‍යය පදගත අරුතෙකි. මෙය ලිවීමට රසික සංජීවිනිය හා ශෘංගාරදීපිකාව යන ටීකා දෙක පමණෙකි අපට පිහිට වූයේ. එයිනුත් ශෘංගාරදීපිකාව බෙහෙවින් උපකාර විය. 131 – 163 දක්වා වූ ශ්ලෝක තෙතිසට ටීකාවෙක් නොවී. අපගේ දැනුම පමණින් ඒවාට අරුත් පැවැසීමු. අප සත්‍යය සම්පූර්ණයෙන් නිදෙස් සත්‍යයෙකැයි අපි නොකියමු. මහපඬුවනට ද වරදිතොත් අප වැන්නවුන් ගැන කියනුම කවරේද? මෙහි පෙර වදනලිවීමේදී ශොධක කාවශෙලශදහන ත්‍රිපාංවි සූරිහු ගේ හින්දි පෙරවදනින් ද ආචාර්ය සී. ආර්. දේවධරයන්ගේ ඉංග්‍රිසි පෙර වදනින් ද කරුණු උපුටා ගත් බව සඳහන් කරන්නේ එමහතුනට ඉමහත් ගෞරවයක් දක්වමිනි. පෙරවදනට කරුණු සපයා දුන් ප්‍රසිද්ධ කවිකයකු හා ලෙඛකයකු වන අප හිතමිත් සී. ජස්ටින් විජයවඩන මහතාණන්ට ද මෙගත පළකළ නුගේගොඩ මොඩන් පොත් සමාගමේ අයිතිකාර අධ්‍යක්‍ෂ මහතාණන්ට ද අපගේ අවඞක සතුතිය හිමිවන්නේය.

1969. 1. 16
මාතර,
වල්ගම.

# अमरुशतकम्

# අමරුශතකය

1 ජ්‍යාකෘෂ්ටිබද්ධ ඛටකාමුඛ * පාණිපෘෂ්ඨ –
ප්‍රේඞ්ඛන් නඛාංශුචය සංවලිතො’ම්බිකායාඃ ‡
ත්වාං පාතු මඤ්ජරිත පල්ලව කර්ණපූර –
ලොභ භ්‍රමද්භ්‍රමර විභ්‍රමභෘත් කටාක්ෂඃ

**ශ**ත අරඹන කිවියා තම කාව්‍යයෙහි නිර්විඝ්න සමාප්තිය සඳහා ඉටුදෙවි නැමැද ආසී පවසනු වස් “ජ්‍යාකෘෂ්ට බද්ධ” යනාදි පැදිය දක්වයි. “අම්බිකායාඃ කටාක්ෂඃ ත්වාං පාතු” යනු මෙහි කිරියකරු පද සබඳයි.

ජ්‍යාකෘෂ්ට බද්ධ, දුනුදිය ඇදුමෙන් බඳනා ලද; ඛටකාමුඛ පාණිපෘෂ්ඨ, ඛටකාමුඛ නම් අත්පිටුහි; ප්‍රේඞ්ඛත්, සැලෙන; නඛාංශුචය, නියරස් සුමුහෙන්; සංවලිත, දවටුණු; අම්බිකායාඃ, උමඟන ගේ; මඤ්ජරිත, පිපෙන මල් කැකුළු ඇති; පල්ලව කර්ණපූර, පලුකන් අබරණෙහි; ලොභ, ලොබින්; භ්‍රමත්, බමණ; භ්‍රමරවිභ්‍රම භෘත්, බමර විලස් දරන; කටාක්ෂඃ, නෙතග බැල්ම; ත්වාම්, තා; පාතු, රකිවා !

වසන්තතිලකා වෘත්තය යි

**අදහස:**

දුනුදිය ඇදීමේ දී පිහිටන ඛටකාමුඛ හස්තමුද්‍රාවෙහි අත් පිටු මත වැටී සැලෙන නියරස් සමූහයෙන් මිශ්‍ර උමාව ගේ නෙත්කොන් බැල්ම තා සියලු උවදුරෙන් රකිවා!

---

* කටකාමුඛ; ඛටිකාමුඛ; ‡ මෘඩාන්‍යාඃ

**විස්තර**

ඛටකාමුඛය ධනුර්වේදයෙහි දක්වෙන හස්ත මුද්‍රා විශෙෂ යෙකි. එහෙත් මෙහි දක්වෙනුයේ දේවිය ගේ ලාස්‍ය නැටුමෙහි ලා අත පිහිටන අයුරු වේ. නැටුමෙහි අත යම් තැනෙක ද නෙත ද එහි ම වේ. නෙත යම් තැනෙක ද සිත ද එහි ම වේ. අත එ අත මෙ අත යෙයි. නෙත ද එ අනුව ම යෙයි. යාම් ඊම් විසින් කැරෙන මේ ටිංගිනි (නෙත් තරු) චලනයට කලාදතුවෝ කටාක්ෂ යැ යි යෙති. දේවිය ගේ ඛටකාමුඛ හස්ත පාෂාණයෙහි තියරස් සැලෙයි. නෙතග බැල්ම අතට දුන් කල ටිංගිනිය තියරස් හා මුසු වේ. එවිට නෙත් තරුව දේවිය ගේ කන පැළැඳි පුෂ්ප මඤ්ජරියෙහි සුවඳට සැපත් බමන බමරකු ගේ විලස් ගනී. බමරු නෙත් තරුව යි. පුෂ්ප මඤ්ජරිය තියරස යි. පල්ලවය අත්පිටුව යි.

කටාක්ෂය සිත, අසිත, සිතාසිත යැ යි ත්‍රිවිධ වේ. මෙහි නෙත් තරුව බමර විලස් ගත් හෙයින් අසිත කටාක්ෂය වේ.

අර්ජුනවර්මදෙවයෝ ඛටකාමුඛය මෙසේ විස්තර කෙරෙති.

1 අස්‍යා එව යදා මූෂෙටරූර්ධ්වො’ඞ්ගුෂ්ඨඃ ප්‍රයුජ්‍යතෙ
ස්තකං ශිඛරො නාම තදා ශ්‍රෙයඃ ප්‍රයොක්තෘනිඃ

2 ශිඛරස්‍යෙව හස්තස්‍ය යදාඞ්ගුෂ්ඨ නිපීඩිතා
ප්‍රදෙශිනි භවෙද්වක්‍රා කපිත්ථො ජායතෙ තදා

3 උත්ක්ෂිප්තා ච යදා වක්‍රානාමිකා සකනීයසී
එතස්‍යෛව කපිත්ථස්‍ය තදා ස්‍යාත් ඛටකාමුඛඃ

යම් කලෙක අත් මිටෙහි මත මහපටැඟිල්ල යොදා ද එකල එය ශිඛර නම් හස්තය වේ.

යම් කලෙක ශිඛර හස්තයේ ම මහපටැඟිල්ල පෙළා දබරැඟිල්ල වක් වේ ද එකල එය කපිත්ථ නම් වේ.

යම් කලෙක සුළැඟිල්ල සමඟ රතැඟිල්ල වක් ව මතු වේ ද එකල ඒ කපිත්ථ මුද්‍රාව ම ඛටකාමුඛය වේ.

2 ක්ෂිප්තො හස්තාවලග්නඃ ප්‍රසභමභිහතො' –
ප්‍යාදදනො'ංශුකාන්තං
ගෘහ්ණන් කෙශෙෂ්වපාස්තශ්චරණ
නිපතිතො නෙක්ෂිතඃ සංභ්‍රමෙණ
ආලිඞ්ගන්‍යො' වධූතස්ත්‍රිපුර යුවතිභිඃ
සාශ්‍රුනෙත්‍රොත්පලාභිඃ
කාමීවාර්ද්‍රාපරාධඃ ස දහතු දුරිතං
ශාම්භවො වඃ ශරාග්නිඃ

සාශ්‍රුනෙත්‍රොත්පලාභිඃ, කඳුළු සහිත නෙතුපුලැති; ත්‍රිපුර යුවතිභිඃ, ත්‍රිපුර නම් දිතියා ගේ යුවතියන් විසින්; ආර්ද්‍ර+ අපරාධඃ, නව අපරාධවත්; කාමීව, කාමියකු බඳු; (යඃ ශරාග්නිඃ, යම් හී ගින්නක්) හස්ත+අවලග්නඃ, අතෙහි ලැගුණේ; ක්ෂිප්තඃ, හරනා ලද ද; අංශුකාන්තම්, (හැඳි) වත් කෙලවර; ආදදනඃ අපි, ගන්නා ලද්දේ ද (අපි ශබ්ද සමුච්චාර්ථයෙහි ය); ප්‍රසභම්, වහා; අභිහතඃ, තළන ලද්දේ ද; කෙශෙෂු, කෙස්හි; ගෘහ්ණන්, ගන්නේ; අපාස්තඃ, දුරු කරන ලද්දේ ද; චරණ නිපතිතඃ, දෙපාහි වැටුණේ; සංභ්‍රමෙණ, බැමුම් සහිත බැවින්; න+ඊක්ෂිතඃ, නො බලන ලද ද; (කෙනෙක් සංභ්‍රමෙණ යන්න ආලිඞ්ගන්‍යඃ යන්නට වෙසෙසුන් කොට අරුත් කියති.) ආලිඞ්ගන්‍යඃ, වැළඳ ගන්නේ; අවධූතඃ, බැහැර ලන ලද ද (තල්ලු කර දුරු කරන ලද ද); සඃ සරාග්නිඃ, ඒ හීයෙන් නැගි ගින්න; වඃ, තොප ගේ; දුරිතම්, උවදුරු; දහතු, දවා වා.

ස්‍රග්ධරා වෘත්තය යි

**අදහස :**

මෙහෙසුරු විසින් ත්‍රිපුර දවනු වස් යවන ලද හීයෙන් පහළ වූ අලුත වරදක් කළ කාමුකයකු බඳු යම් ගින්නක් ත්‍රිපුර යුවතියන් ගේ අතෙහි ගත් කල ඔවුන් විසින් බැහැර ලන ලද ද හැඳි වතෙහි කොනක් ගත් කල එයට ගසා දුර ලන ලද ද කෙස්හි ගත් සඳ එසේ ම දුර හරනා ලද ද දෙපතුල

ළඟ වැටුණු කල කලබල විසින් එ දෙසවත් නො බලන ලද ද ඇඟ වැළඳ ගත් සඳ දෙ අතින් ම ඉවත ලන ලද ද ඒ ගිත්න තොප ගේ උවදුරු දුර හරීවා.

3 ආලොලාමලකාවලිං විලුලිතාං බිභ්‍රච්චලත් කුණ්ඩලං
කිඤ්චිත් මෘෂ්ට විශෙෂකං තනුතරෛඃ*
ස්වෙදාම්භසාං ශීකරෛඃ
තන්ව්‍යා යත් සුරතාන්ත තාන්ත නයනං
වක්ත්‍රං රතිව්‍යත්‍යයෙ
තත් ත්වාං පාතු චිරාය කිං හරිහර-
ස්කන්ධාදිභිර්දෛවතෛඃ ‡

රතිව්‍යත්‍යයෙ, විපරිත රතියෙහි දී; ආලොල, චංචල; අමල, පිරිසිදු; විලුලිතාම්, අවුල් වූ; අලකාවලීම්, කියඹු ඇති; චලත්, සැලෙන; කුණ්ඩලාම්, කොඩොල්; බිභ්‍රත්, දරන; තනුතරෛඃ, ඉතා සියුම් වූ; සෙවදාම්භසාං ශීකරෛඃ, සෝ දිය පොදින්; කිඤ්චිත්, මඳක්; මෘෂ්ට, මැකුණු; විශෙෂකම්, තිලක ඇති; සුරතාන්ත, රතිය අවසනැ; තාන්ත, මැළවුණු; නයනම්, නෙතැති; තන්ව්‍යාඃ, තුනුවග ගේ; යත් වක්ත්‍රම්, යම් වතෙක් වේ ද; තත්, ඒ මුහුණ; ත්වාම්, තා; චිරාය, බෝ කලක්; පාතු, රකීවා; හරි, වෙනු; හර, මෙහෙසුරු; ස්කන්දාදිභිඃ, කඳ කුමර ඈ; දෛවතෛඃ, දෙවියන් ගෙන්; කිම්, කවර පලෙක් ද?
ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි.

**පලමුවෙන් ම පර පුරුෂයකු කෙරෙහි අනුරාගවත් නාසි කාවකාව ඈ ගේ යෙහෙළියක් මෙසේ කියයි:**

4 අලසවලිතෛඃ ප්‍රෙමාර්ද්‍රාර්ද්‍රෛ ර්මුහුර්මුකුලිකෘතෛඃ
ක්ෂණමභිමුඛෛ ර්ලජ්ජා ලොලෛර්
නිමෙෂ පරාඞ්මුඛෛඃ
හෘදය නිහිතං භාවාකූතං වමද්භිරිවෙක්ෂණෛඃ
කථය සුකෘති කො'යං මුග්ධෙ ත්වයාද්‍ය විලොක්‍යතෙ

* සෙවදාම්භසාං ජාලකෛඃ ‡ හරිහර බ්‍රහ්මාදිභිර්දෛවතෛඃ

(හෙ) මුග්ධෙ, (එම්බා) සොඳුරිය; ත්වයා, තී විසින්; අද්‍ය, අද; අලසවලිතෛඃ, ලැසි බැවින් සරස් කළ (ආලස්‍යයෙන් තිරස් කෘත); ප්‍රෙමාර්ද්‍රාර්ද්‍රෛඃ, පෙමින් සිනිඳු; මුහුඃ මුහුඃ, වරින් වර; මුකුලීකෘතෛඃ, අඬවල් කරන ලද (මදක් වසන ලද); ක්‍ෂණම්, වහා; අභිමුඛෛඃ, අබිමුව පත්; ලජ්ජා ලොලෛඃ, විලියෙන් සැලෙන; නිමෙෂ පරාඞ්මුඛෛඃ, ඇසිපිය නො පහළ; ඊක්‍ෂණෛඃ, දෘෂ්ටීන් ගෙන්; හෘදය නිහිතම්, හද තුළ වූ; භාවාකූතම්, රති අදහස; වමද්භිඃ ඉව, (බැහැරට) දමන්නාක් මෙන්; අයං කඃ සුකෘති. මේ කුමන පින් රුසෙක්; විලොක්‍යතෙ (ඉති), බලනු ලැබේ දැ යි; කථය, කියව.

හරිණී වෘත්තය යි

5 අඞ්ගුල්‍යග්‍ර නඛෙන වාෂ්ප සලිලං *
වික්‍ෂිප්‍ය වික්‍ෂිප්‍ය කිං
තූෂ්ණීං රොදිෂි කොපනෙ බහුතරං
ඵූත්කෘත්‍ය රොදිෂ්‍යසි
යස්‍යාස්තෙ පිශුනොපදෙශ වචනෛ
ර්මානෙ' ති භූමිං ගතෙ
නිර්විණ්ණො' නුනයං ප්‍රතිප්‍රියතමො
මධ්‍යස්ථතාමෙෂ්‍යති

(හෙ) කොපනෙ, (එම්බා) කිපෙන සුළු තැනැත්තිය; අඞ්ගුලි + අග්‍රනඛෙන, නිය'ගින්; වාෂ්පසලිලම්, කඳුළු; වික්‍ෂිප්‍ය වික්‍ෂිප්‍ය, පිස දමමින්; තූෂ්ණීං කිං රොදිෂි, නිහඬව මඳ මඳ ව හඬහි (කිං යනු අල්පාර්ථ යි); (යදා, යම්තාක් කල්) යස්‍යාඃ තෙ, යම් බඳු වූ ති ගේ; මානෙ, මානය; පිශුන + උපදෙශ වචනෛඃ, කේලමුත් ගේ උවදෙස් බසින්; අතිභූමිං ගතෙ, හිම ඉක්මවා ගිය කල; ප්‍රියතමඃ, ප්‍රියයා; නිර්විණ්ණඃ, කල කිරුණේ; අනුනයං ප්‍රති, පැතුමෙන්; මධ්‍යස්ථාං + එෂ්‍යති,

* නික්‍ෂිප්‍ය නික්‍ෂිප්‍ය

මැදහත් බවට එන්නේ ද; (තද, ඒ තාක් කල්) බහුතරම්, බොහෝ සේ; ථූත්කෘත්‍ය, ථූත් යන හඬ ඇති කොට; රොදිෂ්‍යසි, හඬන්නෙහි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි.

**යෙහෙළියක් නායිකාව හමියෙහි නායකයාට මෙ සේ කියයි :**

6 දත්තො’ස්‍යාඃ ප්‍රණයස්ත්වයෛව *
භවතෛවෙයං චිරං ලාලිතා
දෛවාදද්‍ය කිල ත්වමෙව කෘතවානස්‍යා
නවං විප්‍රියම්
මන්‍යු ‡ ර්දුඃසහ එව යාත්‍යුපශමං නො
සාන්ත්වවාදෛඃ ස්ඵුටං
හෙ නිස්ත්‍රිංශ! විමුක්ත කණ්ඨකරුණං
තාවත්සඛී රොදිතු

(හෙ නායක, එම්බා නායකය) ත්වයා එව, ඔබ විසින් ම; අස්‍යාඃ, මැයට; ප්‍රණයඃ, සනාව (ආදරය); දත්තඃ, දෙන ලදී; භවතා එව, භවත්හු විසින් ම; අයම්, මෝ තොමෝ; ලාලිතා, අදරින් රක්නා ලදු (ලාලනය කරන ලදු); ත්වං එව, ඔබ ම; අද්‍ය, අද; අස්‍යාඃ, මැයට; නවං විප්‍රියම්, නව අපිරියක්; කෘතවාන් කිල, කළහු (කිල යනු වාර්තායෙහි); මන්‍යුඃ, මානයෙන් උපන් දුක් වෙසෙස (කොප යෙයි ද යෙති); දුඃසහ එව, නො ඉවසිය හැක්කේ ම ය. (එෂ යන පාඨ විසින් එෂඃ මන්‍යුඃ මේ දුක යැ යි අරුත් බිණිය යුතු.) සාන්ත්ව වාදෛඃ, සැනසිලි බසින්; නො උපශමංයාති, (ඒ දුක) සංසිඳුමට නො යෙයි; ස්ඵුටම්, (එය) පැහැදිලි ය. (නො උපශමං යාති ඉති ස්ඵුටම්, නො සන්සිඳෙනි යි යනු පැහැදිලි ය. මෙලෙසින් ද

* භවතා සෙයං, භවතා චෙයම් ‡ දුඃසහ එෂ

අරුත් දිය හැක.) (තසමාත්, එහෙයින්) හෙ නිසත්‍රිංශ, එබෝ කුළුණු රහිතය; විමුක්ත කණ්ඨ කරුණාමි තාවත්, මිදුණු, ගෙලැ කුලුණ තෙක්; මම සඛී, මා යෙහෙළිය; රොදතු හඬාවා.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**වරින් වර හික්මවන ලද ද දැඩ ඊෂ්‍යාවෙන් මානය දුරු නො කළ මනස්විනියකට ඇ ගේ ප්‍රධාන යෙහෙළිය මෙසේ කියයි:**

7 ලිඛන්නාසෙන භූමිං වහිරවනතඃ ප්‍රාණ දයිතො
නිරාහාරාඃ සඛ්‍යඃ සතත රුදිතොච්ඡූන නයනාඃ
පරිත්‍යක්තං සර්වං හසිත පඨිතං පඤ්ජර ශුකෛ -
ස්තවාවස්ථා චෙයං විසෘජ කඨිනෙ මානමධුනා

(හෙ) කඨිනෙ, (එබෝ) රළු ගති ඇත්තිය; (තව, ති ගේ) ප්‍රාණදයිතඃ, පෙම්වතා; බහි, පිටත (මිදුලේ); අවනතඃ, හිස නමා ගත්තේ (නත මුවැතියේ); භූමිම්, බිම; ලිඛත් + ආසෙත, ඉරි අඳිමින් සිටියි; සඛ්‍යඃ, (ති ගේ) යෙහෙළියෝ; නිරාහාරාඃ, අහර නො ගත්තෝ; සතත, නිතර; රුදිත, හැඬීම නිසා; උච්ඡූන නයනාඃ, ඉදිමුණු නෙතැත්තියෝ ය; පඤ්ජර ශුකෛඃ, මැදිරිවල ගිරවුන් විසින්; සර්වම්, සියලු; හසිත පඨිතම්, සිනා පාඨ; පරිත්‍යක්තම්, දුරලන ලදී. (එහෙත්) ඉයං තව අවස්ථා, මේ ති ගේ තත්ත්වය යි. (ති ගේ ගතිය තව ම වෙතස් නො වී යූ සේ යි. ඉයම් යනුයෙන් ස්ථානිශය සනානා පය හඟවයි ) අධුනා (අපි), දැන්වත්; මානම්, මත; විසෘජ, හරු.

ශිඛරිණී වෘත්තය යි

**අන්‍ය සත්‍රීන් හා රමණය කරන නායකයකු කෙරෙහි කලකිරුණු නායිකාවකට ඇ ගේ යෙහෙළියක ගේ කීමක් :**

8 නාශ්‍යඃ* මුග්ධ ශඨා හරන්ති රමණං
තිෂ්ඨන්ති නො වාරිතා-
ස්තත් කිං තාම්‍යසි කිං ච රෝදිෂි §
මූඪා තාසාං ප්‍රියං මා කෘථාඃ
කාන්තඃ කෙලි රුචිර්යුවා සහෘදයස්තා
දෘක් † පතිඃ කාතරෙ
කිං නො බර්බර කර්කශෛඃ ‡ ප්‍රිය
ශතෛරාක්‍රම්‍ය වික්‍රියතෙ

මුග්ධ ශඨා නාර්‍ය්‍යඃ, (පිටතින්) සුන්දර වූ ද (ඇතුළතින්) කපටි ගති ඇත්තා වූ ද සත්‍රීහු; (තව) රමණං හරන්ති (හි ගේ) වල්ලභයා පැහැර ගනිත් හෙවත් තමන් අයත් කෙරෙත්; වාරිතාඃ, වළක්වන ලද්දෝ ද; නො තිෂ්ඨන්ති, නො නවතිත්; තත්, එහෙයිත්; මූඪා, නිකරුණේ; කිං තාම්‍යසි, කුමකට තැවෙහි ද; කිං ච රෝදිෂි, කුමට හඬයි ද; තාසාම්, ඔවුනට; ප්‍රියම්, ප්‍රියයක්; මා කෘථාඃ, නො කර; (හෙ) කාතරේ, (එම්බා) බැගෑ පත් තැනැත්තිය; කාන්තඃ, (හි ගේ) කාන්තයා; කෙලි රුචිඃ, ක්‍රීඩා රසිකයෙකි; යුවා, තරුණෙකි; සහෘදයඃ, රසික යෙකි; (තස්මාත්, එහෙයින්) තාදෘක් පතිඃ, එබඳු හිමියෙක්; බර්බර කර්කශෛඃ, දූඩි පරුෂ නොහොත් උපහාසාත්මක; ප්‍රියශතෛඃ, සිය ගණන් පිය වදනින්; ආක්‍රම්‍ය, (තමා වෙත) ඇදගෙන; කිං නො වික්‍රියතෙ, කිම විකිණී ගනු නො ලබන්නේ ද?

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

* නාශ්‍යස්තත්ව් හටාත්
§ පුනඃ
† තාදෘක් ප්‍රියඃ
‡ වර්‍කර කර්කශෛඃ

**අපරාධී නායකයකුට නායිකාවක විසින් කරන ලද අතවරයක් :**

9 කොපාත් කොමලලොල බාහු ලතිකා
පාශෙන බද්ධ්වා දෘඪං
නීත්වා වාසනිකෙතනං* දයිතයා සායං † සඛීනාං පුරඃ
භූයො'ප්‍යෙවමිති ස්ඛලත් මෘදුගිරා
සංසූච්‍ය දුශ්චෙෂ්ටිතං
ධන්‍යො හන්‍යත එව නිහ්නුතිපරඃ
ප්‍රෙයාන් රුදත්‍යා හසන්

කොපාත්, කොපිත්; කොමල, මොලොක්; ලොල, සැලෙන; බාහුලතිකාපාශෙන, අත් නමැති ලිය මලපුඩුවෙන්; දෘඪම්, දෘඪ ව; බද්ධ්වා, බැඳ; සායම්, සවස; වාසනිකෙතනම්, වාස භවනයට; නීත්වා, පමුණුවා; සඛීනාං පුරඃ, යෙහෙළියන් අබි මුවෙහි; භූයඃ අපි, නැවත ද; එවං ඉති, මෙසේ ද යි (මෙසේ පරහනත් කරා යෙහි ද යි); ස්ඛලත් මෘදුගිරා, අඩක් උසුරු වන ලද, මොළොක් බසින්; රුදත්‍යා දයිතයා, හඬන බිරිඳ විසින්; දුශ්චෙෂ්ටිතම්, දුසෙට (ඔහු ගේ අයුතු ක්‍රියාව) සංසූච්‍ය, දත්වා; නිහ්නුතිපරඃ, (මම එහි නො ගියෙමි ආදී බසින්) රවටනසුළු; හසන්, සෙන; ධන්‍යඃ, භාග්‍යවත්; ප්‍රෙයාන්, ප්‍රියයා; හන්‍යත, (කෙළි පියුම් ආදියෙන්) පහර දෙන ලදි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**අන් රටකට යාමට අදහස් කළ කෙනෙක් ඒ ගමන අත් හළෙන් එයට හේතු විචාළ කෙනකුට මෙසේ කියති :**

10 යාතාඃ කිං න මිලන්ති සුන්දරි ! පුනශ්චින්තා
ත්වයා මත්කෘතෙ
නො කාර්‍ය්‍යා නිතරාං කෘශාසි කථයත්‍යෙවං
සවාෂ්පෙ මයි
ලජ්ජාමන්තර තාරකෙණ නිපතත්
පීතාශ්‍රුණා ‡ චක්ෂුෂා
දෘෂ්ට්වා මාං හසිතෙන භාවිමරණොත්සාහ-
ස්තයා සූචිතඃ

* මොහනමන්දිරං, කෙලිනිකෙතනම්; † සෙවරං
‡ ධාරාශ්‍රුණා

(හෙ) සුන්දරි, (එම්බා) සොඳුරිය; යාතාඃ, (විදෙස්) ගියෝ; පුනඃ, යළි; න මිලන්ති කිම්, එක් නො වෙත් ද (එක් වෙත් ම ය); මත්කෘතෙ, මා උදෙසා; ත්වයා, තී විසින්; චින්තා නො කාර්‍යා, සිතිවිලි නො කටයුතු; (මක් නිසා ද?) නිතරාම්, බොහෝ සේ; (ත්වම්, තෝ) කෘශා අසි, කෘශ වෙහි; (එබැවිනි) සවාෂ්පමයි, කඳුළු සහිත මා; එවං කථයති, මෙසේ කියන කල; ලජ්ජා, විලියෙන්; මන්ථර, මඳව සැලෙන; තාරකෙණ, නෙත් තරු ඇති; නිපතත් පීතාශ්‍රුණා, හෙන පූ කඳුලෙත් යුත්; (කඳුළු නවතා යු සේ යි.) චක්ෂුෂා, නෙතින්; මාං දෘෂ්ට්වා, මා බලා; හසිතෙන. සිනායෙන්; භාවිමරණෝත්සාහඃ, නිසැක මැරෙන අදහස (මතුවන මරණෝත්සාහ යැ යි ද යෙති.); ත්‍යා, ඈ විසින්; සූචිතඃ, හඟවන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

11 තද්වක්ත්‍රාභිමුඛං මුඛං විනමිතං දෘෂ්ටිඃ
කෘතා පාදයොඃ –
ස්තස්‍යාලාප * කුතූහලාකුලතරෙ ශ්‍රොත්‍රෙ
නිරුද්ධෙ මයා
පාණිභ්‍යාං ච තිරස්කෘතඃ සපුලකඃ
ස්වෙදෙද්ගමො ගණ්ඩයොඃ
සඛ්‍යඃ! කිං කරවාණි යාන්ති ශතධා †
යත්කඤ්චුකෙ සන්ධයඃ

තත් වක්ත්‍රාභිමුඛම්, ඔහු ගේ මුවට අභිමුව වූ; මුඛම්, (මගේ) මුව; මයා, මා විසින්; විනමිතම්, නමන ලදී (ඔහු ගේ මුව දෙස මමුව පහතට හැරවීමි.); දෘෂ්ටිඃ, බැල්ම; පාදයොඃ කෘතා, (ම ගේ) පා දෙසට හෙළන ලදී; තත් සංලාප, ඔහු ගේ සංභාෂණයට; කුතූහල + ආකුලතරෙ, කුහුලින් ඉතා අවුල් වූ; ශ්‍රොත්‍රෙ, දෙකන්; නිරුද්ධෙ, වසන ලදී; ගණ්ඩයොඃ, දෙ කො

---

* තත් සංලාප † මත්කඤ්චුලී සන්ධයඃ

පුලෙහි වූ; සපුලකා, ලොමුදහය ද; ස්වෙද + උද්ගමඃ ච, සෝ දිය නැගුම ද; පාණිභ්‍යාම්, දෙ අතින්; නිරස්තාඃ, වසන ලදී. සඛ්‍යඃ, යෙහෙළියෙනි; යත්, යම් හෙයකින්; කඤ්චුකෙ සන්ධයඃ, කස්සෙහි (හැට්ටෙහි) මැසුම්; ශතධා යාන්ති, බොහෝ සේ පැළීමට යේ ද; (තත්, එහෙයින්) කිං කරවාණි, කුමක් කෙරෙම් ද; (මත් කඤ්චුලී සන්ධයඃ යන පාඨ විසින් මගේ චොලියෙහි = බොඩියෙහි සන්ධිස්ථාන යන අරුත් ගත යුතු.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

පරඟනක වෙත ගිය කාන්තයා තමා ළඟට පැමිණි කල මේ මේ අයුරින් ක්‍රියා කළ යුතු යැ යි යෙහෙළියන් විසින් ශික්ෂිත වූ නායිකාවක් විසින් එය පිහිටිය නො හැකි ව ඔවුන් කී අයුරින් ම ක්‍රියා කළ බව ඔවුනට දක්වන ලද්දෙකි මෙයින් හැඟෙනුයේ.

**මුග්ධාවක් දූර ගමනක් යාමට අදහස් කළ සිය පෙම්වතා මෙසේ වළකයි :**

12 ප්‍රහර විරතෞ මධ්‍ය වාහ්නස්තතො' පි පරෙණ වා*
කිමුත සකලෙ යාතෙ වාහ්නි ප්‍රිය ත්වමිහෛෂ්‍යසි
ඉති දින ශත ප්‍රාප්‍යං දෙශං ප්‍රියස්‍ය සියාස්තො
හරති ගමනං බාලාලාපෛඃ‡ සවාෂ්ප ගලජ්ජලෛඃ

(හෙ) ප්‍රිය, (එම්බා) පෙම්වත; ප්‍රහර විරතෞ, ප්‍රථම ප්‍රහර වශානයෙහි (ප්‍රහරයකට පැය තුනෙකි. මෙහි යාමයක් අදහස් කෙරේ.); ත්වම්, ඔබ; ආගමිෂ්‍යසි, එන්නහු ද; වා, නොහොත්; අහ්නඃ මධ්‍යෙ (එෂ්‍යසි), දිනයා ගේ මැද (මද්දහනෙහි) එන් නහු ද; (අථවා, නොහොත්) තතඃ අපි පරෙණ වා, එයිනුත් පසු ව හෙවත් සවස් කල; (එෂ්‍යසි, එන්නහු ද) වා, නොහොත්; කිමුත, කිම; සකලෙ අග්නියාතෙ (එෂ්‍යසි),

* පරෙථවා ‡ වාක්‍යෛඃ

දවස ගෙවුණු කල එන්නහු ද; ඉති, මෙසේ; බාලා, මුග්ධා තොමෝ; දින ශත ප්‍රාප්‍යං දෙශම්, දින සියයෙකින් යා යුතු රටකට; පියාසතඃ, යනු පිසි වූ; ප්‍රියස්‍ය ගමනම්, ප්‍රියයා ගේ ගමන; ස වාෂ්පගලත්, කඳුළු ගැලීම් සහිත; ජල්පෛඃ ආලාපෛඃ, නො පැහැදිලි (ගද්ගද) බසින්; හරති, දුරු කරයි.

හරිණී වෘත්තය යි

13 ධීරං වාරිධරස්‍ය වාරි කිරතඃ ශ්‍රුත්වා නිශීථෙ ධ්වනිං
දීර්ඝොච්ඡ්වාසමුදශ්‍රුණා විරහිණීං බාලාං චිරංධ්‍යායතා
අධ්වන්‍යෙන විමුක්ත කණ්ඨමඛිලාං රාත්‍රිං තථා ක්‍රන්දිතං
ග්‍රාමීණෛඃ පුනරධ්වගස්‍ය වසතිර්ග්‍රාමෙ නිෂිද්ධා යථා

නිශීථෙ, මැදුම් රැයෙහි; වාරිකිරතඃ, දිය වගුරන; වාරිධරස්‍ය, වලාකුළෙක; ධීරං ධ්වනිං ශ්‍රුත්වා, ගැඹුරු හඬ අසා; දීර්ඝ + උච්ඡ්වාසම්, දික් සුසුම් හෙළන; විරහිණීං බාලාම්, වියෝ වූ (තම) තරුණ බිරිය ගැන; චිරංධ්‍යායතා, බොහෝ වේලාවක් සිතමින් සිටි; උදශ්‍රුණා, කඳුළු පිරි; අධ්වන්‍යෙන, මැගියා විසින්; යථා විමුක්ත කණ්ඨම්, විවට ගෙල යම් ලෙසකින් වී ද; තථා, එසේ; අඛිලං රාත්‍රිම්, මුළු රැය ම; රුදිතම්, හඬන ලදී. ග්‍රාමීණෛඃ (අපි), ගැමියන් විසින් ද; පුනඃ, යළි; අධ්වගස්‍ය, මැගියාට; ග්‍රාමෙ, ගමෙහි; වසති, නවාතැනක්; නිසිද්ධා, නො දෙන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නායකයෙක් මානවත් නායිකාවකට මෙසේ කියයි:**

14 කාතො දූරදෙව සමිත මධුරමභ්‍යුද්ගම විධිඃ
ශිරස්‍යාඥ න්‍යස්තා ප්‍රතිවචනවත්‍යානතිමති *
න දෘෂෙටඃ ශෛථිල්‍යං මිලන ‡ ඉති චෙතො දහති මෙ
නිගූඪාන්තඃ ☽ කොපා කඨිනහෘදයෙ සංවෘතිරියම්

* ප්‍රතිවචනමප්‍යාලපසි ච, ප්‍රතිවචනමුචෛචඃ ප්‍රණමිතම්, ප්‍රතිවචනමම්ලාන විනතිඃ ‡ මිලන ඉව, භජන ඉති

☽ නිගූඪාන්තඃ කොපෙ, නිගූඪාන්තඃ කොපාත්

දූරත් එව, දුරින් ම; සම්ත මධුරම්, සිනායෙන් මිහිරි වූ; අභ්‍යුද්ගම විධිඃ, හුන් අසුනෙන් නැගිටීම ආදි ආචාර විධි; කෘතඃ, කරන ලදී. ප්‍රතිවචනවතී, පිළිතුරු දෙන්නී; ආනති මති, නැමුණු; ශිරසි, හිස්හි; ආඥ, (ම ගේ) අණ; න්‍යස්තා, තබන ලදී; මිලත, (අප දෙදෙනා ගේ) හමු වීමේ දී; දෘෂ්ටඃ, බැල්මෙහි; ශෛථිල්‍යං න, සිහිලෙක් නො වේ; (හෙ) කඨින හෘදයෙ, (එම්බා) දැඩි හදතිය; ඉති, මෙසේ; නිගූඪ + අන්තඃ කොපා, ඇතුළත සැඟවුණු කොප ඇති; ඉයං සංවෘතිඃ, මේ (තිගේ) ආකාරගුප්තිය; මෙ චෙතඃ, ම ගේ සිත; දහති, දවයි.

ශිඛරිණී වෘත්තය යි

**ප්‍රණයකලහානන්තරකාවක් සහචරියට මෙසේ කියයි:**

15 කථමපි සඛි! ක්‍රීඩාකොපාද් ව්‍රජෙති මයොදිතෙ<br>කඨිනහෘදයඃ ශය්‍යාං ☉ ත්‍යක්ත්වා බලාද්ගත එව සඃ<br>ඉති සරභසං ‡ ධ්වස්ත ප්‍රෙමණි ව්‍යපෙතඝෘණෙ ‖<br>සස්පෘහාං<br>පුනරපි හතව්‍රීඩං චෙතඃ කරොති කරොමි කිම්

(හෙ) සඛි, (එම්බා) යෙහෙළිය; ක්‍රීඩා කොපාත්, කෙළි කොපින් (පණ වියගුරෙන්); කථං අපි, දුක සේ; ව්‍රජ ඉති, යා යි; මයි උදිතෙ, මා කී කල; සඃ කඨිනහෘදයඃ, ඒ දැඩි ළයැත්තා; ශය්‍යාං ත්‍යක්ත්වා, යහන හැර; බලාත්, බලයෙන්; ගතඃ එව, ගියේ ම ය; ඉති, මෙසේ; සරභසම්, වහා; ධ්වස්ත ප්‍රෙමණි, නට පෙමැති; ව්‍යපෙත, පහ වූ; ඝෘණෙ, කුළු ණැත්තා කෙරෙහි; පුනඃ අපි, යළිදු; හත ව්‍රීඩාං චෙතඃ, නට විලි ඇති (ම ගේ) සිත; සස්පෘහාං කරොති, ආසා කෙරෙයි; කිං කරොමි, කුමක් කෙරෙම් ද?

හරිණී වෘත්තය යි

---

☉ ත්‍යක්ත්වා ශය්‍යාං

‡ සරභස ධ්වස්ත ප්‍රෙමණි ‖ ව්‍යපෙඛ ඝෘණෙ ජනෙ

**කිවියා ගේ අදහසෙක්:**

16 දම්පත්‍යෝර් නිශි ජල්පතෝ ගෘහ ශුකේනා-
කර්ණිතං යද්ව ච
තත් ප්‍රාතර්ගුරුසන්නිධෞ නිගදිතඃ*
ශ්‍රුත්වෛව තාරං වධූඃ
කර්ණා‡ ලම්බිත පද්මරාග ශකලං වින්‍යස්‍ය
චඤ්ච්වාඃ § පුරෝ
ව්‍රීඩාර්තා‖ ප්‍රකරෝති දාඩිමඵල ව්‍යාජෙන වාග්බන්ධනම්

නිශි, රැයෙහි; ජල්පතෝඃ, බෙණෙන; දම්පත්‍යෝඃ, දම්පතීන් ගේ; යත් වචඃ, යම් වදනක්; ගෘහ ශුකේන, ගෙහි වූ ගිරවා විසින් (ඇතිකරන ගිරවා විසින්); ආකර්ණිතම්, අසන ලද ද; තත්, ඒ වදන්; ප්‍රාතඃ, උදය; ගුරු සන්නිධෞ, දෙගුරු (නැදි මයිලන්) හමියෙහි; තාරම්, උස් හඬින්; නිගදිතඃ, කියන; (තස්‍ය, ඌ ගේ) චඤ්ච්වාඃ පුරඃ, තුඩ ඉදිරියෙහි; ව්‍රීඩාර්තා වධූඃ, විලියෙන් පෙළුණු බිරිඳ; කර්ණ + ආලම්බිත, කනෙහි (කන් අබරණෙහි) එල්ලෙන; පද්මරාගශකලම්, පියුම් රා කැටයක්; දාඩිමඵල ව්‍යාජෙන, දෙළුම් ඇටයක අයුරින්; වින්‍යස්‍ය, තබා; වාග්බන්ධනං ප්‍රකරෝති, වදන් බැඳුම කෙරෙයි; (ගිරවා ගේ කථාව නවත්ව යි යන අදහසි.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නායිකාවක්, සිය වරද සඟවන නායකයකුට නින්දා කෙරෙයි.**

17 අඥනෙන පරාඞ්මුඛීං පරිභවාදශ්ලිෂ්‍යමාං දුඃඛිතාං
කිංලබ්ධං ශඨ! දුර්නයෙන නයතා
සෞභාග්‍යමේතාං දශාම්
පශ්‍යෛතද් දයිතා කුච ව්‍යතිකරෝත්-†
මෘෂ්ටාඞ්ගරාගාරුණං
වක්ෂස්තෙ මලතෛල පඞ්කශබලෛර් ¶
වේණීපදෛරඞ්කිතම්

---

* නිගදිතස්තස්‍යාති මාත්‍රං
§ චඤ්චූපුටෙ
† ව්‍යතිකරාසක්තාඞ්ග
‡ කර්ණාලංකෘති
‖ ව්‍රීඩාර්තා විදධාති
¶ මම තෛල පඞ්ක මලිනෛඃ

(හෙ) ශඨ, (එම්බා) කපටිය; පරිභවාත්, (අන් අඟනන් හා සංගමය නිසා හටගත්) නින්දාවෙන්; දුඃඛිතාම්, දුකට පත්; පරාඞ්මුඛීම්, කලකිරුණු (අනභිමුඛ යනුයෙන් ද අරුත් දෙති.) මාම්, මා; අඥනෙන, අවිචාරයෙන්; ආශ්ලිෂ්‍ය, වැළඳ ගෙන; සෞභාග්‍යං එතාං දශාම්, සුබග මෙවැනි අවස්ථාවකට (අයොග්‍ය අවස්ථාවකට යූ සේ යි.) නයතා, පමුණුවන; දුනී යෙන, දුර්විනයෙන්; කිං ලබ්ධම්, කුමන පලෙක් ලබන ලද ද; (ඒ අවස්ථාව ම විස්තර කෙරෙයි.) දයිත කුව ව්‍යතිකර, (ත ගේ) ඝොර අඹුව ගේ පියවුරු ගැටුමෙන්; උන්මෘෂ්ට, පිසුණු; අධරාග අරුණම්, අහරයෙන් අරුණු පැහැ ගත්; (එසේ ම) මලතෛල පඞ්ක, (හිසෙහි වූ) කුණු හා තෙල් කළුලින්; ශවලෝඃ, කබරවන්; වෙණීපදෙඃ, කෙහෙ රැස ගැටීමෙන්; අඞ්කිතාම්, ලකුණු වූ; එතත් තෙ වක්ෂඃ, මේ ත ගේ ළය; පශ්‍ය, බල; මෙසේ ද අරුත් දෙති. තෙ වක්ෂඃ (වර්තතෙ), ත ගේ ළය අරුණුවන් ව හා කබරවන් ව තිබේ. එතත්, ත ගේ ඒ ක්‍රියාව; පශ්‍ය, බල.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නායිකාවක් අපරාධවත් නායකයකු දුටුව පත් කොපරකි.**

18 ඒකත්‍රාසන* සංස්ථිතිඃ පරිහෘතා
ප්‍රත්‍යුද්ගමාද් දූරත-
ස්තාම්බූලාහරණච්ඡලෙන‡ රභසා
ශ්ලෙෂොʼපි සංවිඝ්නිතඃ
ආලාපොʼපි න මිශ්‍රිතඃ§ පරිජනං
ව්‍යාපාරයන්ත්‍යාන්තිකෙ
කාන්තං ප්‍රත්‍යුපචාරතශ්චතුරයා කොපඃ
කෘතාර්ථී කෘතඃ

---

* ඒකත්‍රාසන සංගතිඃ ‡ තාම්බූලානයනච්ඡලෙන
§ න විශ්‍රුතඃ, න විසම්වෘතඃ

දූරතඃ, දුරින් ම (හිමියා දුර එන කල්හි ම); ප්‍රත්‍යුද්ගමාත්, පෙර මඟට යාමෙන්; එකත්‍ර, එක් තැනෙක වූ; ආසන, අසුනෙකැ; සංස්ථිතිඃ, හිඳුම; පරිහෘතා, දුරලන ලදී. තාම්බූල ආහරණව්‍යාජෙන, බුලත් (හෙප්පුව) ගෙනෙන නියායෙන්; රභසා, වහා; ශ්ලේෂඃ අපි, වැළඳ ගැනුම ද; සංවිඝ්නිතඃ, දුරු කරන ලදී. (වැළඳ ගැනුමට ඉඩ නො දෙන ලදී.); අන්තිකෙ, සමීපයෙහි; පරිජනම්, පිරිවර දනන්; ව්‍යාපාරයන්ත්‍යා, (කට යුතුවල) යොදවන්නිය විසින්; ආලාපඃ අපි, දෙඩුම ද (සංභාෂණය ද); න මිශ්‍රිතඃ, නො යොදන ලදී; (අනෙක ප්‍රකාරෙණ, මේ අයුරින්) චතුරයා, සමත් තැනැත්තිය විසින්; කාන්තං (ප්‍රති), ප්‍රියතමයා උදෙසා; ප්‍රත්‍යුපචාරාත්, සුදුසු උවසරින්; කොපඃ, කොව; කෘතාර්ථිකෘතඃ, සඵල කරන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිවියා ගේ නිමක්**

19 දෘෂ්ට්වෛකාසන සංස්ථිතෙ* ප්‍රියතමෙ
පශ්චාදුපෙත්‍යාදරා -
දෙකස්‍යා නයනෙ‡ නිමීල්‍ය විහිත
ක්‍රීඩානුබන්ධච්ඡලඃ
ඊෂද්වක්‍රිත § කන්ධරඃ සපුලකඃ† ප්‍රේමො -
ල්ලසන් මානසා -
මන්තර්හාස ලසත් කපොල ඵලකාං ධූර්තො'
පරං චුම්බති

එකාසන සංස්ථිතෙ, එක් අසුනෙක හුන්; ප්‍රියතමෙ, පෙම්වතියන් දෙදෙනකු; දෘෂ්ට්වා, දැක; පශ්චාත් උපෙත්‍ය, පිටුපස දෙසින් පැමිණ; විහිත, කරන ලද; ක්‍රීඩානුබන්ධච්ඡලඃ ධූර්තඃ,

* සංගතෙ ‡ නයනෙ පිධාය § තිර්‍යක් වක්‍රිත, ඊෂද්වක්‍රිම
† සපුලකං, සපුලක ප්‍රේමොල්ලසන්

ක්‍රීඩා විලාසයක් ගත් වංචකයා; එකස්‍ය, එකියක ගේ; නයනෙ නිමීල්‍ය, දෙනුවන් (තම අතින්) වසා; ඊෂත් වක්‍රිත කන්ධරඃ, මඳක් වක් කළ කඳට ඇති; සපුලකඃ (සඃ), ලොමු දැහ ගත් හෙ තෙමේ; ප්‍රෙමොල්ලසත්මානසාම්, පෙමින් ඉල්පුණු සිත් ඇති; අන්තර්හාසලසත්, ඇතුළත පහළ වූ සිනායෙන් බබලන; කපොලඵලකාම්, කොපුල් තල ඇති; අපරාම්, අනෙකිය; චුම්බති, සිඹියි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**යෙහෙළියන් ගේ උවදෙසින් මානය උපදවා ප්‍රියයා ගවා පසු ව තැවෙන නායිකාවක ගේ බැගෑ අවස්ථාව කිවියා මෙසේ පවසයි :**

20 චරණ පතන ප්‍රත්‍යාඛ්‍යාන* ප්‍රසාද පරාඞ්මුඛෙ
නිභෘත කිතවාචාරෙත්‍යුක්තෙ‡ රුෂා පරුෂිකෘතෙ
ව්‍රජති රමණෙ නිඃශ්වස්‍යොච්චෛඃ
ස්තනාර්පිත† හස්තයා
නයන සලිලච්ඡන්නා ∂ දෘෂ්ටිඃ සඛීෂු නිපාතිතා ‖

චරණ පතන, පා වැදීම; ප්‍රත්‍යාඛ්‍යාන, බැහැර ලීමෙන් හෙවත් වැළකීමෙන්; ප්‍රසාද පරාඞ්මුඛෙ, නො පහන්; (කිං ච, තව ද) (හෙ) නිභෘත කිතවාචාර ඉති, (එම්බා) සැඟවුණු කපටි සිරිත් ඇති යැ යි; උක්තෙ, කී කල; රුෂා, කොපින්; පරුෂිකෘතෙ රමණෙ, දැඩි බවට පත් රමණයා; ව්‍රජති (සති), යන කල; උච්චෛඃ නිඃශ්වස්‍ය, මහත් සේ සුසුම් ලා; ස්තනාර්පිත හස්තයා, දෙතන මත තැබූ අත් ඇති හෙවත් ලෙහි අත් තැබූ; (නායිකයා, නායිකාව විසින්) නයනසලිලච්ඡන්නා,

---

* ප්‍රත්‍යාඛ්‍යානාත්   ‡ කිතවාචාරෙත්‍යුක්ත්වා
† ස්තනාභිහස්තයා, ස්තනසම්හ හස්තයා
∂ සලිලක්ලින්නා, සලිලව්‍යාජ   ‖ නිවෙශිතා

කඳුලෙන් වැසුණු; දෘෂ්ටි, බැල්ම; සබීජු, යෙහෙළියන් කෙරෙහි; නිපතිතා, හෙළන ලදී.

හරිණී වෘත්තය යි

21 කාඤ්චා්‍යාගාඪතරාවනද්ධ* වසනප්‍රාන්තා
කිමර්ථං පුන -
ර්මුග්ධාක්ෂී ස්වපිතීති තත් පරිජනං
සෛවරං ප්‍රියෙ පෘච්ඡති
මාතඃ† ස්වප්තුමපීහ වාරයති
මාමිත්‍යාහිත ක්‍රොධයා
පර්‍ය්‍යස්‍ය ස්වපනච්ඡලෙන ශයනෙ
දත්තො’ වකාශස්තයා

කාඤ්ච්‍යා, මෙවුලෙන්; ගාඪතර, දැඩි ව; අවනද්ධ, බඳනා ලද; වසන ප්‍රාන්තා, වත් කෙළවර ඇති; මුග්ධාක්ෂී, මනහර ඇස් ඇත්තිය (වාමලොචනාව); කිමර්ථං පුනඃ ස්වපිති ඉති, කුමක් නිසා නිදත්නී ද යි (පුනඃ යනු වාක්‍යාලංකාර නිපාත යි); තත් පරිජනම්, නායිකාව ගේ පිරිවර දනා ගෙන්; ප්‍රියෙ, ප්‍රියයා; සෛවරම්, සෙමින්; පෘච්ඡති සති, විචාළ කල; (හෙ) මාතඃ, (එම්බා) මෑණියෙනි; ඉහ, මෙහි; ස්වප්තුං අපි, නිදා ගැනීමට ද; මාං වාරයති, මට ඉඩ නො දෙයි. (“සුප්තුමපීහ ලුම්පති මම” පාඨ විසින් මෙහි මගේ නිදා ගැන්ම ද දුරු කරයි යන අරුති.) ඉති, මෙසේ; ආහිත ක්‍රොධයා, (බොරුවට) ඇති කර ගත් කොපයින් යුත්; තයා, ඈ විසින්; පර්‍ය්‍යස්‍ය, පෙරළී; ශයනෙ, යහන්හි; අවකාශඃ, ඉඩෙක් (අවසරයෙක්); දත්තඃ, දෙන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

---

* ගාඪතරාවබද්ධ

† මාතඃ සුප්තිමපීහ ලුම්පති මමෙත්‍යාරොෂිත

## කිවියා ගේ සීමක්

22 එකස්මින්ශයනෙ විපක්ෂ රමණී
නාමග්‍රහෙ මුග්ධයා
සද්‍යඃ* කොපපරාඞ්මුඛං ග්ලපිතයා†
චාටූනි කුර්වන්නපි
ආවෙගාදවධීරිතඃ ප්‍රියතමස්තූෂ්ණීං
ස්ථිතස්තත් ක්ෂණාත්
මාභූත්‡ ම්ලාන ඉවෙත්‍ය මන්ද
වලිත ග්‍රීවං පුනර්වීක්ෂිතඃ

එකස්මින් ශයනෙ, එක් යහනෙකැ (දෙදෙනා එක යහනෙක සිට); විපක්ෂ රමණී, සපත්නිය ගේ නොහොත් විරුද්ධ ස්ත්‍රිය ගේ (අන්‍ය පෙම්වතියක ගේ); නාමග්‍රහෙ, නම කියැවුන කල; සද්‍යඃ, එ කෙණෙහි ම; ග්ලපිතයා, මලානික; මුග්ධයා, රමණිය විසින්; චාටූනි කුර්වන් අපි, සැනසිලි බස් කියන්නා දවූ; ප්‍රියතමඃ, පෙම්වතා; ආවෙගාත්, (විපක්ෂ ස්ත්‍රිය ගේ නම කී බැවින් හටගත්) සංභ්‍රමයෙන්; (යථා, යම් සේ) කොප පරාඞ්මුඛං (භවති), කොපයෙන් පරාඞ්මුඛ වේ ද; (තථා, එසේ) අවධීරිතඃ, නින්දා කරන ලද්දේ; (සද්‍යඃ කොප පරාඞ්මුඛ ග්ලපිතයා යන පාඨ විසින් වහා හටගත් කොවින් කලකිරීමට පත් මැලවුණු යනුයෙන් මුග්ධයා යන්නට වෙසෙසුන් කොට අරුත් බිණිය යුතු.) තූෂ්ණීං ස්ථිතඃ, නිහඬ ව සිටියේ ය. තත්ක්ෂණාත්, එකෙණෙහි; (අනන්තරම්, ඉක්බිති) පුනඃ, යළි; ම්ලාන ඉව මාභූත් ඉති, මලානිකයකු බඳු නො වේවා. අමන්දවලිත ග්‍රීවම්, වහා පෙරළන ලද (හරවන ලද) ගෙලැත්ති ව; වීක්ෂිතඃ, බලන ලදී. (ගෙල හරවා බලන ලදී යන අදහසි.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

---

* තත් ක්ෂණං

† කොපපරාඞ්මුඛ ග්ලපිතයා, පරාඞ්මුඛං ශයිතයා, පරාඞ්මුඛං ශඨතයා

‡ මාභූත් සුප්තාඉව, මාභූත් සුප්ත ඉවෙෂ මන්ද

## කිවියා ගේ කිමක්

23 ඒකස්මින්ශයනෙ පරාඞ්මුඛතයා
වීතොත්තරං තාම්‍යතො –
රන්‍යොන්‍යං* හෘදයස්ථිතෙ’ප්‍යනුනයෙ
සංරක්‍ෂතො ගෞරවම්
දම්පත්‍යොඃශනකෛරපාඞ්ග වලනාත්
මිශ්‍රීභවච්චක්‍ෂුෂො –
ර්භග්නො මානකලිඃ† සහාසරභසං
ව්‍යවෘත්ත කණ්ඨග්‍රහඃ

**ඒකස්මින්** ශයනෙ, එක් යහනෙකැ; පරාඞ්මුඛතයා, අනබිමුව බැවින් (දෙදෙනා පිටුපා නිදන බැවින්); වීතොත්තරම්, උතුරු පිළිතුරු රහිත ව; තාම්‍යතඃ, තැවෙන; (එසේ ම) අනුනයෙ, සාන්ත්වය; හෘදය ස්ථිතෙ (අපි), හද සිටියෙ ද; අන්‍යොන්‍යං ගෞරවම්, එකිනෙකා පිළිබඳ ගෞරවය; සංරක්‍ෂතඃ, රක්නා; ශනකෛඃ, සෙමින්; අපාඞ්ග වලනාත්, නෙත් කෙළවර පෙරළුමෙන්; මිශ්‍රීභවත් චක්‍ෂුෂොඃ, එක් වන බැලුමැති (මෙහි චක්‍ෂුෂ යන්නෙන් බැලුම අදහස් කෙරේ.) දම්පත්‍යොඃ, අඹු සැමියන් ගේ; සහාස, සිනා සහිත; රභසම්, වේගවත්; ව්‍යාවෘත්ත කණ්ඨග්‍රහඃ, පෙරළුණු ගෙල වැළඳ ගැනුමැති; මානකලහඃ, ප්‍රණය කලහය; භග්නඃ, බිඳිණි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

---

* අන්‍යොන්‍ය හෘදිස්ථිතෙ

† සහාස රභස ව්‍යාවෘත්ත කණ්ඨග්‍රහම්, සහාස රභසං ව්‍යාසක්ත කණ්ඨ ග්‍රහම්, සහාස රභසං කණ්ඨග්‍රහො’ නු ෂඞිතා

## නායකයකු ගේ කිමක්

24 පශ්‍යාමො මයිකිං ප්‍රපද්‍යත ඉති
ස්ථෛර්‍ය්‍යං * මයා ලම්බිතං
කිං මාං නාලපතීත්‍යයං † ඛලු ශඨඃ
කොපස්තයාප්‍යාශ්‍රිතඃ
ඉත්‍යන්‍යොන්‍ය විලක්ෂ දෘෂ්ටිචතුරෙ
තස්මින්නවස්ථාන්තරෙ
සව්‍යාජං හසිතං මයා ධෘතිහරෝ
වාෂ්පස්තු මුක්තා තයා ‡

මයි, මා කෙරෙහි; (එෂා, මේ තොමෝ) කිං ප්‍රපද්‍යත, කෙබඳු වූ කතා බහක් කරු දැ යි; පශ්‍යාමඃ ඉති, බලමි යි; මයා, මා විසින්; ස්ථෛර්‍ය්‍යම්, තිර බව; ආලම්බිතම්, ගන්නා ලදී. (ස්ථිරභාවයෙහි පිහිටියෙමි.) අයං ඛලු ශඨඃ, මෙ තෙමේ වනාහි කපටියෙකි. කිං මාං නාලපති ඉති, කුමක් හෙයින් මා හා නො බෙණේ දැ යි; තයා, ඈ විසින්; කොපඃ, කොව; ආශ්‍රිතඃ, ඇසුරු කරන ලදී. ඉති, මෙසේ; අන්‍යොන්‍ය, ඔවුනොවුන් ගේ; විලක්ෂ (විලක්ෂ්‍ය?), ලකක් (ඉලක්කයක්) නොමැති; දෘෂ්ටි චතුරෙ, බැලුමෙන් රමණීය; තස්මින් අවස්ථාන්තරෙ, ඒ දසා වෙසෙස්හි; මයා, මා විසින්; සව්‍යාජං හසිතම්, බොරු සිනාවෙක්; (කෘතම්, කරන ලදී.) තයා තු, ඈ විසින්දු; ධෘතිහරඃ, (මා ගේ) දිරිය හරනා; වාෂ්පඃ, කඳුළු; මුක්තඃ, හෙළන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

---

* ස්ථෛර්‍ය්‍යං සමාලම්බිතං
† කිං මාමාලපති
‡ වාෂ්පශ්ච මුක්තස්තයා

**නායකයකු ගේ කිමක්**

25 පරිම්ලානෙ මානෙ මුඛ ශශිනි තස්‍යාඃ කරධෘතෙ
මයි ක්ෂීණෝපායෙ ප්‍රණිපතන මාත්‍රෛක ශරණෙ
තයා පක්ෂ්ම ප්‍රාන්ත ධ්වජපුට නිරුද්ධෙන සහසා
ප්‍රසාදෙ වාෂ්පෙණ ස්තනතට විශීර්ණේන කථිතඃ

ක්ෂීණඋපායෙ, (සාමාදි) පහ වූ උපා ඇති; මයි, මා; ප්‍රණිපතන මාත්‍ර, පිණිපාව පමණක්; එක ශරණෙ (සති), එක ම පිහිට වූ කල; මානෙ, (ඇගේ) මන; පරිම්ලානෙ (සති), ලිහිල් වූ කල; තස්‍යාඃ මුඛ ශශිනි, ඇගේ මුව සඳු; කරධෘතෙ (සති), (ඇ ගේ) අතෙහි පිහිටි කල; පක්ෂ ප්‍රාන්ත ධ්වජපුට නිරුද්ධෙන, ඇසිපිය අග නමැති දදපුටෙන් වැළකූ; ස්තන තට විශීර්ණේන, තන තෙළෙන් විසුරුණු; වාෂ්පෙණ, කඳුළෙන්; ප්‍රසාදඃ, පැහැදීම; කථිතඃ, දක්වන ලදී.

ශිඛරිණී වෘත්තය යි.

**තමා ගේ වරද නිසා කිපුණු නායිකාවක් ඔහු ගේ සාමර්ථ්‍යය හේතු කොට පැහැදවූ නායකයකු ගේ කිමක්:**

26 තස්‍යාඃ සාන්ද්‍ර විලෙපන ස්තන* යුග
ප්‍රශ්ලෙෂ මුද්‍රාඞ්කිතං
කිං වක්ෂශ්චරණානති ව්‍යතිකර
ව්‍යාජෙන ගොපායත්‍යෙ‡
ඉත්‍යුක්තෙ ක්ව තදිත්‍යුදීර්‍ය සහසා
තත් සංප්‍රමාර්ෂ්ටුං මයා
සාශ්ලිෂ්ටා රභසෙන තත් සුඛවශාත්
තස්‍යාශ්ච තද්විස්මෘතම් ‡‡

* ස්තනතට ‡ ගොපායතෙ
‡‡ තත්ව්‍යාපි තද්විස්මෘතම්, තත්ව්‍යාච තද්විස්මෘතම්

තස්‍යාඃ, (තොප ගේ) පෙම්වතිය ගේ; සාන්ද්‍ර, ගන; විලෙපන, විලෙවුන් ඇති; ස්තන යුග, දෙ තන; ප්‍රශ්ලෙෂ, වැළඳ ගැනුම නමැති; මුද්‍රාඞ්කිතම්, මුද්‍රායෙන් සලකුණු වූ; වක්‍ෂඃ, (තොප ගේ) ළය, කිම්, කිම; චරණානති ව්‍යතිකර ව්‍යාජේන, (මා) පා නැමදීම් ව්‍යාජයෙන්; ගොපායතෙ, සඟවනු ලැබේ ද; ඉති, මෙසේ; උක්තෙ, (පෙම්වතිය) කී කල; මයා, මා විසින්; තත්, ඒ ලකුණ; ක්‍ව ඉති, කොහි වේ ද යි; උදීයි, කියා; සහසා, වහා; තත්, ඒ ලකුණ; සංප්‍රමාර්ෂ්ටුම්, පිස දමනු සඳහා; මයා, මා විසින්; රභසෙන, වේගයෙන්; අශ්ලිෂ්ටා සා, වැළඳ ගනු ලැබූ හෝ තොමෝ; තත් සුඛවශාත්, ඒ වැළඳ ගැනීමෙන් ලත් පහස් සුව විසින්; තස්‍යාඃ ච, ඇයට ද; තත්, එය; විස්මෘතං (ආසීත්), නො සිහි විය.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**අනුරංගවත් නායකයකු ගේ වෙහෙටාව කවියා මෙසේ දක්වයි:**

27 ත්‍වං මුග්ධාක්ෂි විනෛව කඤ්චුලිකයා
ධත්සෙ මනොහාරිණීං
ලක්ෂ්මීමිත්‍යභිධායිනි ප්‍රියතමෙ
තද්වීටිකා සංස්පෘශි *
ශය්‍යොපාන්ත නිවිෂ්ට සස්මිත සඛී ‡
නෙත්‍රොත්සවානන්දිතො
නිර්යාතඃ ශනකෛරලීක වචනො-
පන්‍යාසමාලීජනඃ

(හෙ) මුග්ධාක්ෂි, (එම්බා) මනහර ඇසැතිය (විහ්වලාක්ෂියැයි ද යෙති); ත්වම්, තෝ; කඤ්චුලිකයා විනා එව, චෝලිය

* තද්වෙණිකාසංස්පෘශි, තද්වීටිකාං සංස්පෘශී
‡ බහූ, මුඛී

(බොඩිය) රහිත ව සිටි කල ම; මනොහාරිණීම්, මනහර; ලක්ෂ්මීම්, සෝබාවක්; අභිධායිනි ඉති, ධරන්නී යෑ යි; ප්‍රිය තමෙ, පෙම්වතා; තත් වීටිකා සංසපෘශි, ඒ වෝලියෙහි මැහුම් රූහැන (ග්‍රන්ථන පදාර්ථය) පහස්නා කල (අතගාන කල`); ශය්‍යොපාන්ත, යහන් කෙළවරට; නිවිෂ්ට, පැමිණි; සස්මිත, සෙන; සඛී, යෙහෙළිය ගේ (පෙම්වතිය ගේ); නෙත්‍රොත්සව, නයන ප්‍රසාදයෙන්; ආනන්දිතඃ, නැටුමත්; ආලිජනඃ, යෙහෙළියෝ; ශනෛඃ, සෙමින්; අලීකවචන+ උපන්‍යාසම්, අසත් බස් බෙණෙන තැතින්; නිර්‍යාතඃ, ගියෝ;

**මන් කැරුමට යෙහෙළියන් විසින් උවදෙස් දුන් වනිතා වක් එයට අසමත් ව ඔවුනට මෙසේ කියයි:**

28 භ්‍රූභඞ්ගෙ රචිතෙ'පි දෘෂ්ටිරධිකං
සොත්කණ්ඨමුද්වීක්ෂතෙ
රුද්ධායාමපි ζ වාචි සස්මිතමිදං
දග්ධානනං ජායතෙ
කාර්කශ්‍යං ගමිතෙ'පි චෙතසි තනූ
රොමාඤ්චමාලම්බතෙ
දෘෂ්ටෙ නිර්වහණං භවිෂ්‍යති කථං
මානස්‍ය තස්මින්ජනෙ

භ්‍රූභඞ්ගෙ, බැම බිඳුම; රචිතෙ අපි, කළ කල්හිදු; දෘෂ්ටිඃ, නෙත; අධිකම්, බොහෝ සේ; සොත්කණ්ඨඃ, උත්සුක්‍ය සහිත ව (බොහෝ ආසාවෙන්); උද්වීක්ෂතෙ, බලයි; (කිං ච, තව ද) වාචි, වදන්; රුද්ධායාං අපි, නැවත් වූව ද; ඉදං දග්ධානනම්, මේ නටමුව (හත වදන); සස්මිතං ජායතෙ, සිනා වත් වෙයි; චෙතසි, සිතෙහි; කාර්කශ්‍යම්, කැකුළු බව; ගමිතෙ අපි, යෙදවූ කල ද; තනූ, සිරුර; රොමාඤ්චම්, ලොමු දහය;

ζ රුද්ධායමපි වාචි

ආලම්බතෙ, ඇති කෙරේ. (තස්මාත්, එහෙයින්) තස්මින් ජනෙ, ඒ ප්‍රියයා; දෘෂ්ටෙ, දක්නා කල; මානස්‍ය, මානයා ගේ; නිර්වහණම්, ඇති කැරුම; කථං භවිෂ්‍යති, කෙසේ වන්නේ ද; (බැම බිඳුම් ආදී දුෂ්කර ක්‍රියා කළ ද මානය ඇති නො වීය. එහෙයින් මින් පසු එයට උත්සාහ නො කරමි යන අදහසි.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

## කිවියං ගේ කිමක්

29 සා පත්‍යුඃ ප්‍රථමෙ'පරාධ සමයෙ †
සඛ්‍යොපදෙශං විනා
නො ජනාති සවිභ්‍රමාඞ්ග වලනා
වක්‍රොක්ති සංසූචනම්
සවච්ඡෛරච්ඡ කපොලමූල ගලිතෛඃ
පර්‍ය්‍යස්ත නෙත්‍රොත්පලා
බාලා කෙවලමෙව රොදිති
ලුඨල්ලොලොදකෛරශ්‍රුභිඃ ‡

(යා) බාලා, යම් යුවතියක් තොමෝ (බාලා යනුයෙන් සොළොස් විය සත්‍රිහු ගැනෙත්); පත්‍යුඃ, හිමියා ගේ; අපරාධ සමයෙ, අපරාධයක් ඇති කල; සඛ්‍යොපදෙශං විනා, හෙහෙළියන ගේ උවදෙස් නොමැති බැවින්; (යතඃ, යම් හෙයකින්) සවිභ්‍රම + අංග වලනා, සවිලස් අවයව පෙරළි මින් (භ්‍රම සහිත අඞ්ග පරිවර්තනයෙන්); වක්‍රොක්ති සංසූචනම්, කුටිල බයින් අපරාධය හැඟවුමට; නො ජනාති, නො දනී ද; (තතඃ, එහෙයින්) සා බාලා, ඒ යුවතිය; පර්‍ය්‍යස්ත නෙත්‍රොත්පලා, පෙරළුණු නෙතුපුලැත්තී; (වෙමහුපාලයෝ

† ප්‍රාණෙශප්‍රණයාපරාධ සමයෙ
‡ ලොලාලකෛඃ

වාෂ්ප ව්‍යාප්ත නෙත්‍රොත්පල යනුයෙන් ද අර්ජුනවම් දෙවයෝ ලම්බිත පක්‍ෂ්ම ලොචනෙන්දීවරා යනුයෙන් ද අරුත් දෙති.) සවෙෂ්ඨෙඃ, නො කිලිටි; අච්ඡ, පිරිසිදු; කපොලමූල ගලිතෛඃ, කොපුල් කෙළවරින් ගිලිහුණු; ලුඨත්, පෙරළෙන; ලොල, සැලෙන; උදකෝඃ, දියබිඳු ඇති; අශ්‍රුභිඃ, කඳුළෙන්; රොදති එව, හඬා ම ය.

හිමියා ගේ අපරාධයක් දුටු කල යෙහෙළියන් ගේ උපදෙස් නො ලත් බාලාව හැඬීම පමණක් කෙරේ යනු මෙහි සැකෙවි අදහසි. මධ්‍යා ප්‍රගල්භාව කොපයට පිළියම් තමා ම නො දනී. මුග්ධාව උපදෙශ රහිත ව ම කොපයට පිළියම් දනී. මෙය වේමභූපාල මතය යි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**අන් නායිකාවක කෙරෙහි අනුරක්ත නායකයකුට නායිකාවක් මෙසේ කියයි :**

30 භවතු විදිතං ව්‍යර්ථාලාපෛරලං* ප්‍රිය ! ගම්‍යතාං
තනුරපි න තෙ දෙෂො'සමාකං විධිසතු පරාඞ්මුඛඃ
තව යදි තථාරූඪං† ප්‍රෙම ප්‍රපන්නමිමාං දශාං
ප්‍රකෘති තරලෙකානඃ‡ පීඩාගතෙ හත ජීවිතෙ

භවතු, (''මම අපරාධයක් නො කෙළෙමි'' යි ඔබ කියත් ද එය එසේ ම) වේවා; විදිතම්, (ඒ සියල්ල ම) මා විසින් හොඳකාර) දත්නා ලදී. (හෙ) ප්‍රිය, (එම්බා) ප්‍රියය; ව්‍යර්ථ ආලාපෛඃ අලම්, (මා සැනසීමට ඔබ කියන) හිස් බසින් කම් නැත. ගම්‍යතාම්, (ඔබ යම් තැනකට යනු රිසියහු ද එහි ම) යනු ලැබේවා; තනුඃ අපි තෙ දෙෂඃ න, (අප ගේ

---

* ව්‍යර්ථාලාපෛරලං බහු ගම්‍යතාං
† තථාභූතං ‡ ප්‍රකෘති කෘපණෙ

මේ ප්‍රේම වෛශම්‍යයෙහි) මඳ වූ ද ඔබගේ දොසෙක් නො වේ. අස්මාකං විධිඃ තු, අප ගේ දෛවයත්; පරාඞ්මුඛඃ, (අපට) පිටුපෑ ය; තථාරූඪම්, එසේ හටගත්; තව ප්‍රේම, ඔබ ගේ පෙම; ඉමාං දශාම්, මෙ බඳු අවස්ථාවකට; ප්‍රපන්නං යදි, පැමිණියේ නම්; ප්‍රකෘති තරලෙ, පියවියෙන් ම සැලෙන; හත ජීවිතෙ, ව්‍යර්ථ නොහොත් නිෂ්ඵල දිවිය; ගතෙ, ගිය කල; නඃ, අපට; කා පීඩා, මොන දුකෙක් ද?

මා කෙරෙහි බැඳි පෙම අත්හැරුම රිසියහු නම් අත්හළ මැනැවි. මම මගේ දිවිය තොර කර ගනිමි යනු ගම්‍ය මාන අර්ථය සි.

හරිණී වෘත්තය සි

**රාගාතිශය හේතු කොට ගෙන අනුචිත වෙෂයෙකින් ප්‍රියයා සොයා යන නායිකාවකට යෙහෙළියක් මෙසේ කියයි:**

31 උරසි නිහිතස්හාරඃ කෘතා ජඝනෙ ඝනෙ
කලකලවතී කාඤ්චී පාදෞරණත් මනිනූපුරෞ ‡
ප්‍රියමභිසරස්‍යෙවං § මුග්ධෙ! ත්වමාහත ඩිණ්ඩිමා
යදි කිමධික ත්‍රාසොත්කම්පං දිශඃ සමුදීක්ෂසෙ ‖

උරසි, ළයෙහි; තාරඃ හාරඃ, පිරිසිදු මුත්හර; (තාරඃ, යත් තට සැලෙන = පාරිපලව යනු අර්ජුනවර්මදෙව අරුති.) නිහිතඃ, බඳනා ලදී. ඝනෙ ජඝනෙ, දැඩි උකුලෙහි; කලකල වතී, කලකල යන හඬ දෙන; කාඤ්චී, මෙවුල; (කෘතා, කරන ලදී) පාදෞ, දෙපාහි; රණත්, හඬ දෙන; මණි

‡ ඛනත් මණිනූපුරෞ
§ ප්‍රියමභිසරසි මුග්ධෙ ත්වං සමාහත ඩිණ්ඩිමා
‖ පරිවීක්ෂසෙ

නූපුරෞ, මිණීනුරුවලා; (කෘතෞ, කරන ලදී.) (හෙ) මුග්ධෙ, (එම්බා) මෝඩිය; ත්වම්, තෝ, එවම්, මෙසේ; ආහත ඩිණ්ඩිමා, ගසන ලද බෙරත්ති (බෙර ගසාගෙන යන අද හසි); ප්‍රියම්, පෙම්වතා කරා; අභිසරසි යදි, යෙහි නම්; කිම්, කුමක් නිසා; අධික ත්‍රාස, බෝ බියෙන්; උත්කම්පං (භූත්වා), කම්පාව; දිශඃ, දිගුත්; සමුද්වීක්ෂසෙ, බලහි ද;

හරිණී වෘත්තය යි

**හිමියා විදෙස් ගත සත්‍රියක් විරහයෙන් පෙළෙන්නී වැසි වලාවකට මෙසේ කියයි :**

32 මලයමරුතාං ව්‍රාතා වාතා† විකාසිත මල්ලිකා -
පරිමල‡ භරෝ භග්නො ග්‍රීෂ්මස්ත්වමුත්සහසෙ යදි
ඝන! ඝටයිතුං තං නිස්නෙහං ය එව නිවර්තනෙ
ප්‍රභවති ගවාං කිං නශ්ඡින්නං ස එව ධනඤ්ජයඃ

මලය මරුතාං ව්‍රතා, දකුණු දිග වා සමූහයෝ; වාතා, හැමූ; විකාසිත, පිපි; මල්ලිකා පරිමල භරඃ, ඉද්ද මල් සුව දින් බර; ග්‍රීෂ්ම, ගිම් කල; භග්න, ඉක්මිණි. (හෙ) ඝන, (එම්බා) මෙඝය; යඃ එව, යමෙක් ම; ගවාං නිවර්තනෙ, ගව යත් පෙරළා ගෙන ඊමෙහි; ප්‍රභවති, සමත් වේ ද; සඃ එව, හෙ තෙමේ ම; ධනාජයඃ, ධනංජය වේ. (තසමාත්, එ හෙ යින්) ත්වම්, තෝ; තං නිස්නෙහම්, ඒ සනා නැත්තා (විදෙස් ගිය ම හිමියා)ඝටයිතුම්, මා හා එක් කැරුමට; උත්සහසෙ යදි, උත්සාහ කෙරෙයි නම්; (ත්වං අපි, තෝ ද; ධනංජයඃ, ධනං ජය වේ.) කිම්, කිම; නඃ, අප; ඡින්නම්, සුත් ද; (අපි නව ම ජීවත් වෙමු යූ සේ යි.)

හරිණී වෘත්තය යි

† ව්‍රාතාගතාඃ ‡ පරිමලරුචො

**කිපුණු නායිකාවක් අපරාධි නායකයකුට උපහාස කෙරෙයි.**

33 ප්‍රාතඃ ප්‍රාතරුපාගතේන † ජනිතා
නිර්නිද්‍රතා චක්ෂුෂො -
ර්මන්දායා මම ගෞරවං § ව්‍යපගතං
ප්‍රෝත්පාදිතං ලාඝවම්
කිං තන්න කෘතං ත්වයා මරණභීර් ‡
මුක්තා මයා ගම්‍යතාං
දුඃඛං තිෂ්ඨසි ‖ යච්ච පථ්‍යමධුනා
කර්තාස්මි තච්ඡ්‍රොෂ්‍යසි

ප්‍රාතඃ ප්‍රාතඃ උපාගතේන (ත්වයා), උදයක් උදයක් පාසා පැමිණි ඔබ විසින්; මන්දායා මම, භාග්‍ය හීන මා ගේ නො හොත් රෝගී වූ මා ගේ; චක්ෂුෂඃ, නෙත්හි; නිර්නිද්‍රතා, නින්ද වැළැක්ම; ජනිතා, උපදවන ලදී. ගෞරවම්, (මා ගේ) ගෞරවය; ව්‍යපගතම්, පහ විය; ලාඝවම්, සැහැල්ලු බව; උත්පාදිතම්, උපදවන ලදී. ත්වයා, ඔබ විසින්; යත්, යමක්; න කෘතම්, නො කරන ලද ද; තත්, එය; කිම්, කිමෙක් ද; මයා, මා විසින්; මරණභීඃ, මරණ බිය; මුක්තා, දුරු කරන ලදී. ගම්‍යතාම්, (ඔබ රිසි තැනකට) යනු ලැබේවා. ච, තව ද; අධුනා, දැන්; යත්, යමක්; (තෙ, ඔබට) පථ්‍යම්, රුචි ද; (තත්, එය) කර්තාස්මි, කළේ වෙමි. තත්, එය; ශ්‍රොෂ්‍යසි, අසන්නෙහි;

මෙහි මුඛ්‍යාර්ථය හා ධ්වනිතාර්ථය යි දෙ අරුතෙක් වේ. මුඛ්‍යාර්ථය මෙසේ වේ. ඔබ දිනපතා ම අන් ලියක කෙරෙහි

---

† රුපාගතො' සි ජනිතා චොන්නිද්‍රතා
§ ගෞරව ව්‍යපනයනාදුත්පාදිතම්, ගෞරවං ව්‍යපගතං ප්‍රත්‍යාගතම් ‡ කිං මුග්ධෙන මයා කෘතං රමණධී ත්වයා
‖ දුඃඛං තිෂ්ඨසි පශ්‍යා

වැස උදයෙන් ම මෙහි පැමිණීමෙන් මාගේ ගෞරවය නැති වී ලජ්ජා තැනැත්තියක් වීමි. ඔබ කුමක් නම් මට නො කළෙෝ ද? මගේ මරණ බිය ද පහ විය. ඔබ යන තැන කට යනු මැනවි. කිම දුකින් සිටින්නේ? ඔබ රිසියෙන දේ කළහු. මම ද මට රිසියෙන දෙය කරමි. එය පසු ව දත හැක. මෙයින් ඈ තමාගේ ප්‍රාණය ඝාත කර ගන්නා බව හැඟවූ.

ධ්වනිතාර්ථය මෙසේ වේ. මන්‍ද, ගෞරව, ලාඝව, පථ්‍ය යන වදන් දෙ අරුත ගනී. රෝගී වූ මා බැලීමට ඔබ දින පතා උදයේ ම පැමිණෙති. එයින් මගේ දවල් නින්ද දුරු විය. (රෝගියාට රෑයෙහි මිස දවල් කල නිඳ ගැනීම යොග්‍ය නො වේ.) බෙහෙත්වලින් මඳ සුවයක් ඇති වූයෙන් මගේ හිතේ ඇති වූ බර ගතිය පහ ව සිත සැහැල්ලු විය. ඔබ මට කුමක් නො කළහු ද? මගේ ව්‍යාධියට හිතකර හැම දෙයක් ම කළහු. දැන් බියෙක් නො වේ. කුමකට ශොක කරහු ද? රිසි තැනකට යනු මැනැවි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**සඛීන් කෙරෙහි නො ඇලි තැනැත්තෙක් තම අදහස මෙසේ පවසයි:**

34 සා බාලා වයමප්‍රගල්භ මනසඃ
සා ස්ත්‍රී වයං කාතරාඃ
සා පීනොන්නතිමත් පයොධරයුගං
ධත්තෙ සඛෙද වයම්
සාක්‍රාන්තා ජඝනස්ථලෙන ගුරුණා
ගන්තුං න ශක්තා වයං
දෙශෛරන්‍ය‡ ජනාශ්‍රයෛරපටවො
ජාතාඃස්ම ඉත්‍යද්භුතම්

‡ දෙශෛරන්‍ය ජනාශ්‍රිතෛඃ

සා බාලා, හෝ තොමෝ; (අතිශිවනිය) මුග්ධාවකි. වයම්, අපි; අප්‍රගල්භ මනසඃ, නො බුහුටි සිත් ඇත්තෝ වෙමු; (බාලවිය යම් තැනැත්තියක් කෙරෙහි ද නො බුහුටි බව ඒ තැනැත්තිය කෙරෙහි වේ යනු අදහසි. සෙස්සෙහි ද මෙසේ ම සලකත්න.) සා සත්‍රී, හෝ සත්‍රියකි; වයම්, අපි; කාතරාඃ, (ඈ නො ලැබ සිටිය නො හැකි බැවින්) බගැ පත්තෝ වෙමු. (සත්‍රී බව යම් තැනක ද දීන බව එහි ම වේ යනු අදහසි.) සා, හෝ තොමෝ; පීන + උන්නතිමත්, පිරි හිඩි; පයොධර යුගං ධත්තෙ, පියවුර යුගළක් ධරයි. වයම්, අපි; සඛෙද, (ඒ වැළඳ ගැනුමට නො හැක්කෙන්) දුකට පත්තෝ වෙමු. (මහත දෙය බර උසුලයි. එහි දුක වේ.) සා, ඕ තොමෝ; ගුරුණා, මහත් වූ; ජඝන ස්ථලෙන, දුවන් තෙලෙන්; ආක්‍රාන්තා, මිරිකුණි ය. වයම්, අපි; ගන්තුම්, (ඇය ගේ ගමන් ලීලාව සිහි කරන්නේ) යන්ට; න ශක්තා, නො හැක්කෝ වෙමු. (යමෙක් මහ බරින් යුක් ත ද ඔහුට ගමන නො හැකි වේ.) අන්‍යජනාශ්‍රයෛඃ, අන් දනා ඇසුරු කරන; දොෂෛඃ, (යට කී) දොසින්; අපටවඃ ජාතාඃ සම ඉති, අදක්‍ෂ වූමු යි යන; යත්, යමක් වේ ද; (තත්, එය) අද්භුතම්, අසිරිය; (අනුන් ගේ දොස් හේතු කොට ගෙන අප අදක්‍ෂ වීම මහ පුදුමයෙකි යනු අදහසි.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නායිකාවක් තම ජීවිතයට මෙසේ කියයි :**

35 ප්‍රස්ථානං වලයෛඃ කෘතං
ප්‍රියසඛෛරස්‍රෛරජස්‍රං ගතං
ධෘත්‍යා න ක්‍ෂණමාසිතං* ව්‍යවසිතං
චිත්තෙන ගන්තුං පුරඃ
යාතුං නිශ්චිත චෙතසි ප්‍රියතමෙ
සර්වෙ සමං ප්‍රස්ථිතා‡
ගන්තව්‍යෙ සති ජීවිත ! ප්‍රියසුහෘත් සාර්ථඃ
කිමු ත්‍යජ්‍යතෙ‖

* ක්‍ෂණමාස්ථිතම් ‡ සර්වෛඃ සමං ‖ කිමුත්සෘජ්‍යතෙ

ප්‍රියතමෙ, පෙම්වතා; යාතුම්, (විදෙසකට) යාමට; නිශ්චිත චෙතසි (සති), තිර සිතක් ඇති කල; වලයෛඃ, වළලු යෙන්; ප්‍රස්ථානං කෘතම්, ගමන කරන ලදී (විරහ වෙයින් වළලු ගැලවිණි). ප්‍රියසඛෛඃ, පිය මිතුරන් සහ; අශ්‍රෛඃ, කඳුළෙන්; අජස්‍රම්, නිතර; ගතම්, යන ලදී. (ප්‍රිය සඛෛඃ යන පදය වචන විපර්‍යාසයෙන් ධෘත්‍යා යනාදි සෙසු පද හා ද සම්බන්ධ කටයුතු) ධෘත්‍යා, දිරිය විසින්; ක්ෂණං අපි, මොහොතෙකුදු; න ආසිතම්, නො සිටින ලදී. (සතුට මොහොතෙකුදු නො වී යූ සේ යි.) චිතෙතන, සිතින්; පුරඃ පෙරටුව; ගන්තුම්, යන්නට; ව්‍යවසිතම්, උත්සාහ කරන ලදී. (සිත ඉදිරියෙන් ම යන්ට උත්සාහ දැරී යන අදහසි.) (එවම්, මෙසේ) සර්‍වෛඃ සමම්, වළලු ආදි සියල්ල සමග) (යුගපත්, එක විට) ප්‍රස්ථිතා, ගමන ගියහ. ජීවිත, (එම්බා දිවිය; (තව, තොප ගේ) ගන්තව්‍යෙ සති, ගමන යා යුතු කල; ප්‍රිය සුහෘත් සාර්ථඃ, පිය යහළු සමූහයා; කිමු, මක් නිසා ත්‍යජ්‍යතෙ, හරිනු ලැබේ ද;

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිවියා කාමයෙහි එල මෙසේ දක්වයි :**

36 සංදෂ්ටො' ධර† පල්ලවෙ
සචකිතං හස්තාග්‍රමාධුන්වති
මා මා මුඤ්ච ශඨෙති කොප-
වචනෛරානර්තිතා භ්‍රූලතා
සීත්කාරාඤ්චිත ලොචනා සරභසං‡
යෛශ්චුම්බිතා මානිනි
ප්‍රාප්තං තෛරමෘතං ශ්‍රමාය මථිතො
මූඪෛඃ සුරෛඃ සාගරඃ

† සංදෂ්ටාධරපල්ලවා
‡ සපුලකං

අධරපල්ලවෙ, දෙ තොල් පලු; සංදෂ්ටෙ (සති, ඩැහැගත් කල; ස චකිතම්, බිය සහිත ව; හස්තග්‍රාහං අධූන්වති, අතග සොලවන නොහොත් එහි මෙහි විසි කරන; (හෙ) ශඨ, (එම්බා) ධූතීය; මා මා ඇති ඇති නොහොත් එපා එපා; මුක්‍ව ඉති, (මා) අතහරු යනාදි; කොප වචනෛඃ, කිපි වදනින්; ආනර්තිත භ්‍රැලතා, නටවන ලද (චලිත) බැමැති සීත්කාර + අඤ්චිත ලොචනා, සීත් යන හඬ ඇති කරමින් මදක් පියවූ ඇස් ඇති; මානිනී, රමණියක්; යෛඃ, යමකුන් විසින්; සරභසම්, ලා හෙලා; චුම්බිතා, සිඹිනා ලද ද; තෛඃ, ඔවුන් විසින්; අමෘතම්, අමාව; ප්‍රාප්තම්, ලබන ලදි. මූඪෛඃ සුරෛඃ, මෝඩ සුරයන් විසින්; සාගරඃ, සයුර; ශ්‍රමාය, වෙහෙස සඳහා; මථිතඃ, කලඹන ලදි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නායිකාවක් ප්‍රෙමය නිසා කරන ලද ඡෙකිය ක්‍රියාවක් යෙහෙළියකට මෙසේ දක්වයි :**

37 සුප්තො'යං සඛි! සුප්‍යතාමිති ගතාඃ
සඛ්‍යස්තතො'නන්තරං
ප්‍රෙමාවෙශිතයා † මයා සරලයා ‡
න්‍යස්තං මුඛං තන්මුඛෙ
ඥාතෙ'ලීක නිමීලනෙ නයනයො
ර්ධූර්තස්‍ය රෝමාඤ්චතො
ලජ්ජාසීන් මම තෙන සාප්‍යපහෘතා
තත් කාලයොග්‍යෛඃ ක්‍රමෛඃ

(හෙ) සඛි, (එම්බා) යෙහෙළිය; අයම්, මේ තෙමේ (තාගේ පෙම්වතා); සුප්තඃ, නිදන්නේ වේ; (ත්වයා අපි, තා විසිනිදු) සුප්‍යතාං ඉති, නිදනු ලැබේවා යි නොහොත්; (අසමාභිඃ

---

† ප්‍රෙමාවාසිතයා ‡ තරලයා

අපි, අප විසිනිද්‍ර) සුප්‍යතාං ඉති, නිඳ ගත යුතු යැ යි; (මාං උක්ත්වා, මට කියා) සඛ්‍යඃ, යෙහෙළියෝ; ගතාඃ, ගියහ; තතඃ, ඉක්බිති; අනන්තරම්, ඔවුන් ගිය අනතුරු ව; ප්‍රෙමාවෙශිතයා, පෙමින් අවෙස් වූ; සරලයා මයා, නොවක් (ප්‍රාඤ්ජල) මා විසින්; තත් මුඛෙ, ඔහු මුවෙහි; මුඛම්, ම මුව; න්‍යස්තම්, තබන ලදී. (තතඃ, පසු ව) ධූර්තයා, ඒ වංචකයා ගේ; රොමාඤ්චතඃ, ලොමු දහගෙන්; නයනයොඃ, නුවන්හි; අලීක නිමීලනෙ, බොරු නෙත් පියවීම; ඥාතෙ (සති), දත් කල; මම, මට; තෙන, ඒ කරණකොට ගෙන; ලජ්ජා ආසීත්, ලජ්ජාව හට ගති. සා ලජ්ජා අපි, ඒ විළිය ද; තත් කාල යොග්‍යෛඃ, ඒ වේලාවට සුදුසු; ක්‍රමෛඃ, උවකැමින්; අපහෘතා, දුරු කරන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නායකයා ගේ අපරාධයෙකින් කිපි නායිකාවක් ඔහුට මෙසේ කියයි:**

38 කොපො යත්‍ර භ්‍රුකුටිරචනා
නිග්‍රහො† යත්‍ර මෞනං
යත්‍රාන්‍යොන්‍යස්මිත මනුනයො
දෘෂ්ටිපාතඃ‡ ප්‍රසාදඃ
තස්‍ය ප්‍රෙම්ණස්තදිද මධුනා
වෛශසං පශ්‍ය ජාතං
ත්වං පාදාන්තෙ ලුඨසි න ච මෙ
මන්‍යු මොක්ෂඃ ඛලායාඃ

යත්‍ර, යම් පණ වියගුරෙක්හි දී; භ්‍රුකුටිරචනා (එව), බැම හැකිළවීම ම; කොපඃ, කොව වී ද; යත්‍ර, යම් ප්‍රණය කලහ යෙක; මෞනම් (එව), නිහඬ ව ම; නිග්‍රහඃ, නිගාව වී ද;

---

† විග්‍රහො ‡ යත්‍ර දෘෂ්ටිඃ ප්‍රසාදඃ

(විග්‍රහඃ යන පාඨ විසින් කලහය වී ද) යත්‍ර, යම් පණවිය ගුරෙකැ; අන්‍යොන්‍ය ස්මිතං (එව), එකිනෙකා ගේ මඳ සිනාව ම; අනුනයම්, සැනසීම වී ද; (යත්‍ර, යම් ප්‍රණය කලහයෙකැ) දෘෂ්ටිපාතඃ (එව), බැල්ම ම; ප්‍රසාදඃ, පැහැදීම වී ද; (එ බඳු වූ) තස්‍ය ප්‍රෙම්ණඃ, ඒ පෙමේ; අධුනා, දැන්; වෛශම්ම්, විසම බවක් නොහොත් හානියක්; ජතම්, ඵය! තත් ඉදම්, ඒ මේ වෙනස; පශ්‍ය, බල; (දැන් ඒ වෙනස විස්තර කරයි.) ත්වම්, තෝ; පාදනෙත, (මා) පා සමීපයෙහි; ලුඨසි, පෙරළෙහි; (තථාපි, එසේ වුව ද) බලාසා. දුෂට; මෙ, මා ගේ; මන්‍යු මොක්ෂඃ, කොපය දුරු වීම; න ච, නො වේ.

මන්දාක්‍රාන්ත වෘත්තය යි

**කිපුණු නායිකාව සනසන නායකයකු ගේ සපිතිය කිව්‍යා මෙසේ දක්වයි:**

39 සුතනු! ජහිහි මෞනං [1] පශ්‍ය පාදනතං මාං
න ඛලු තව කදාචිත් කොප එවං විධො’ භූත්
ඉති නිගදති නාථෙ තිර්‍යගාමී ලිතාක්ෂ්‍යා
නයනජලමනල්පං මුක්තමුක්තං න කිඤ්චිත්

(හෙ) සුතනු, (එම්බා) මනහර සිරුරැතිය; මෞනම්, නිහඬ බව; ජහීහි, හරු; පාදනතං මාම්, (ති ගේ) පා වදින මා; පශ්‍ය, බල; එවංවිධඃ කොපඃ, මෙ බඳු කොපයක්; ඛලු, එකාන්තයෙන්; ඛලු නිපාතය අනුනයයෙහියැයි කෙනෙක් කියති) තව, තිට; න අභූත්, නො වී; ඉති, මෙසේ; නාථෙ, හිමියා; නිගදති (සති), කියන කල; තිර්‍යක්, සරසට; ආමීලිත, මඳක් හකුළුවන ලද; අක්ෂ්‍යා, නෙතින්; අනල්පම්, බොහෝ;

[1] කොපං

නයන ජලම්, නෙත් දිය (කඳුළු); මුකතම්, මුදන ලදී (හැඬූ යු සේ යි). කිඤ්චිත්, මඳක් හෝ බස්; න උක්තම්, නො කියන ලදී.

මාලිනී වෘත්තය යි

**කිසි යම් විදග්ධ වියොගී නායකයෙක් සුරත විමෘදිත ප්‍රියාව ගේ අවස්ථාවක් ගැන සිතමින් මෙසේ ශොක කෙරෙයි :**

40 ගාඪාලිඞගන වාමනීකෘත කුච
ප්‍රොඤ්ඡත † රෝමොද්ගමා
සාන්ද්‍ර ස්නෙහ රසාතිරේක
විගලච්ඡ්‍රීමන්නිතම්බාම්බර ‡
මා මා මානද! මාති මාමලමිති-
ක්ෂාමාක්ෂරොල්ලාපිනී
සුප්තා කිං නු මෘතා නු කිං මනසි § කිං
ලීනා විලීනා නු කිම්

ගාඪාලිඞගන, දැඩි සේ වැළඳ ගැනීමෙන්; වාමනීකෘත, මිටි බවට පත් කළ (කුඩා බවට පත් කළ); කුච, පියවුරන්හි; ප්‍රොද්භින්න, පහළ වූ; රෝමොද්ගමා, ලොමු දැහගත්; සාන්ද්‍ර ස්නෙහ රසාතිරේක, දැඩි ඉබොහෝ සනා රෙසෙන් (අති ශය ප්‍රෙම ප්‍රවාහයෙන්); විගලත්, වැගිරෙන; ශ්‍රීමත් නිතම්බාම්බරා, සිරියෙන් යුත් නිතඹෙහි වූ වසත්‍ර ඇති; (කාඤ්චී ප්‍රදෙශාම්බරා යනු ද එම අරුති.) (හෙ) මානද, (එම්බා) මාන දුරලන්න (මාන ඛණ්ඩනය); මා මා, ඇති ඇති නො හොත් එපා එපා; මාම්, මට; අති, වැඩියක්; මා, නො කර; අලං ඉති, සෑහේ යැ යි; ක්ෂාමාක්ෂර, දුබල අකුරෙන්

† ප්‍රොද්භින්න ‡ කාඤ්චීප්‍රදෙශාම්බරා
§ මනසිමෙ ලීනා

(කෘශාක්‍ෂරයෙන්); උලලාපිනී, බෙණෙන්නිය; සුප්තා කිං නු, නිදි ද; මෘතා කිං නු, මළා ද (මූර්ඡිත ද යන මතයෙකි.); මනසි, ම ගේ සිතෙහි; ලීනා කිම්, ඇළුණී ද; විලීනා නු කිම්, දියව ගියා ද;

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**නව සංගමයෙහි දී විලියෙන් ආකුල නායිකාවක ගේ දශාවක් කිවියා මෙසේ දක්වයි :**

41 පටාලග්නෙ පත්‍යෞ නමයති මුඛං ජාතවිනයා
හඨාශ්ලෙෂං වාඤ්ඡත්‍ය පහරති ගාත්‍රාණි නිභෘතම්
න ශක්තොත්‍යාඛ්‍යාතුං† සමිතමුඛ සඛී දත්ත නයනා
හ්‍රියා තාම්‍යත්‍යන්තඃ ප්‍රථම පරිහාසෙ නවවධූඃ

පත්‍යෞ, හිමියා; පටාලග්නෙ (සති), වස්ත්‍රය ගත් කල; ජාත විනයා, (කුල පාලික ජනයනට සුදුසු) හටගත් හික්මීමෙන්; මුඛං නමයති, මුව නමයි; හඨාශ්ලෙෂම්, බලාත්කාර වැළඳ ගැන්ම; වාඤ්ඡති (සති). රිසි කල; ගාත්‍රාණි, අවයව; නිභෘතම්, නිශ්චල ව; අපහරති, ඇදගනී. ච, නව ද; ආඛ්‍යාතුම්, කීමට; න ශක්තා, නො හැකි වූවා; සමිත මුඛ, සිනා මුහුණැත්තී; සඛී දත්ත නයනා (භවති), යෙහෙළියට දුන් ඇසැත්තී වෙයි (යෙහෙළිය දෙස බලයි). (එවම්, මෙසේ) ප්‍රථම පරිහාසෙ, පළමු වන නර්ම ව්‍යාපාරයෙහි; නවවධූඃ, නවොඪාව; හ්‍රියා, හිරියෙන්; අන්තඃ, ඇතුළ; තාම්‍යති, තැවෙයි.

ශිඛරිණී වෘත්තය යි

---

† අශක්තා වාඛ්‍යාතුං

**කිවියා ගේ කීමක්:**

42 නාපෙතො' නුනයෙන යඃ ප්‍රිය-
සුහෘද්වාක්‍යෛ ර්නී යඃ සංහෘතො.
යො දීර්ඝං දිවසං විෂහ්‍ය විෂමං †
යත්නාත් කථංචිද්ධෘතඃ
අන්‍යොන්‍යස්‍ය හෘතෙ මුඛෙ
නිහිතයොඃස්තිර්‍යක්කථංචිද්දෘශො ‖
ස ද්වාභ්‍යාමතිවිස්මෘත ව්‍යතිකරෙ ‡
මානො විහස්‍යොජ්ඣිතඃ

යඃ (මානඃ), යම් මානයෙක්; අනුනයෙන, (යෙහෙළියන් ගේ) පැතුමෙන්; න + අපෙතඃ, පහ නො වී ද; යඃ, යම් මානයෙක්; ප්‍රිය සුහෘත් වාක්‍යෛඃ, පිය යෙහෙළියන් ගේ බසින්; න සංහෘතඃ, අවසන් නො වී ද; යඃ, යම් මානයෙක්; දීර්ඝං විෂමං දිවසම්, දිගු විසම දින ගණනක්; විෂහ්‍ය, ඉවසා; යත්නාත්, උත්සාහයෙන්; කථංචිත්, කෙසේ හෝ නො හොත් දුකින්; ධෘතඃ, ධරන ලද්ද ද; (හෘදයෙ යන පාඨ විසින් හදෙහි දරන ලද්ද යන අරුති.) සඃ මානඃ, ඒ මානය; අන්‍යොන්‍යස්‍ය, එකිනෙකා ගේ; හෘතෙ මුඛෙ, අකෘෂට මුඛයෙහි; කථංචිත්, කෙසේ හෝ; දෘශො නිහිත යොඃ (සති), දෙනෙත් පිහිට වූ කල; ද්වාභ්‍යාම්, දෙදෙනා විසින්; අති විස්මෘත ව්‍යතිකරඃ, බොහෝ සේ නො සිහි කළ අවුලැතියේ; විහස්‍ය, සිනාසී; උජ්ඣිතඃ, දුරු කරන ලදී.

හරිණී වෘත්තය යි.

† හෘදයෙ ‖ විහිතයො
‡ සාබන්ධෙ සපදි ස්මිත ව්‍යතිකරෙ

**නායකයා ගේ අවමනට කලකිරුණු නායිකාවක් මෙසේ කියයි:**

43 ගතෙ ප්‍රෙමාබන්ධෙ † ප්‍රණය බහුමානෙ විගලිතෙ
නිවෘත්තෙ සද්භාවෙ ජන ඉව ජනෙ ගච්ඡති පුරඃ
තදුත්ප්‍රෙක්ෂ්‍යොත්ප්‍රෙක්ෂ්‍ය ප්‍රියසඛි!
ගතාංස්තාංශ්ච දිවසාන්
න ජානෙ කො හෙතු ර්දලති ශතධා යන්න හෘදයම්

(හෙ) ප්‍රියසඛි, (එම්බා) පිය යෙහෙළිය; ප්‍රෙම + අනුබන්ධ, පෙම් බැඳුම; ගතෙ, පහ වී; ප්‍රණය බහුමානෙ, පෙම් බුහුමන (අන්‍යොන්‍ය ගුණ වශීකරණ ගෞරවය); විගලිතෙ, ගිලිහුණු කල; සද්භාවෙ, සුදන බව (සෞජන්‍යය); නිවෘත්තෙ, නැවති කල; (තස්මින්) ජනෙ, (එබඳු) ජනයා කෙරෙහි; ජන ඉව, සාමාන්‍ය ජනයකු මෙන්; පුරඃ, ඉදිරියෙන්; ගච්ඡති, යෙයි; තත්, ප්‍රියයා කළ ඒ අවමානය ද; ගතාන්, ඉක්මුණු; තාන් දිවසාන් ච, ඒ දිනයන් ද; උත්ප්‍රෙක්ෂ්‍ය උත්ප්‍රෙක්ෂ්‍ය, සිහි කර සිහි කර; (මම) හෘදයම්, මහද; ශතධා, සියක් කඩකට; න දලති ඉති, නො පැලේ ද යන; (අත්‍ර, මෙහිලා) කඃ හෙතුඃ (ඉති), කවර හේතුවෙක් දැ යි; න ජානෙ, නො දනිමි.

ශිඛරිණී වෘත්තය යි

**කිවියා ගේ කිමක්**

44 චිර විරහිණොරත්‍යුත්කණ්ඨා‡ ශ්ලථීකෘත ගාත්‍රයො–
ර්නවමිව ජගජ්ජාතං භූයශ්චිරාදභිනන්දතොඃ
කථමිව දිනෙ දීර්ඝෙ යාතෙ නිශාමධිරූඪයොඃ
ප්‍රසරති කථා බහ්වී යූනොර්යථා න තථා රතිඃ

---

† ප්‍රෙමාවෙශෙ
‡ විරහිණොරුත්කණ්ඨාථ, විරහිණොරුත්කණ්ඨාතිශ්ලථී

චිරඃ චිරතිණඃ, බොහෝ කලක් වියෝ වූ; අති උත්කණ්ඨා, ඉබොහෝ උකටලියෙන්; ශලථීකෘත ගාත්‍රයොඃ, දුබල බවට පත් අවයවැති; භූයඃ, යළි; (සමාගමෙන, එක් වීමෙන්) අභිනන්දතොඃ, තුටු වන; යූනොඃ, තුරුණු පුමතිරි දෙදෙනකුට; චිරාත්, බොහෝ කලෙකින්; ජගත්, ලොව; නවං ඉව ජාතම්, අළුත් එකක් බඳු වේ; (තතඃ, දෙදෙනා ගේ සමාගමයෙන් පසු) දීර්ඝා දිනෙ, දිග දහවල; කාථම්ව යාඃත, දුක සේ ගිය කල; නිශා අධිරූඪයොඃ (තයොඃ), රැයට පත් ඔවුන් ගේ; බහ්වී කථා බොහෝ කථා (සංභාෂණ); යථා, යම් සේ; ප්‍රසරති, පවතී ද; තථා, ඒ අයුරෙන්; රතිඃ, රතිය; න (ප්‍රසරති), නො ද පවතී.

හරිණී වෘත්තය යි

## කිවියා ගේ කිමක්

45 දීඝා වන්දනමාලිකා විරචිතා
දෘෂ්ටේ‍යව නෙන්දීවරෛඃ
පුෂ්පාණාං ප්‍රකරඃ ස්මිතෙන රචිතො
නෙ: කුන්දජාත්‍යාදිභිඃ
දත්තඃ† සේවදමුචා පයොධරභ-
රේණාඝීං‡ න කුම්භාම්භසා
සෛවරේවාවයවෛඃ ප්‍රියස්‍ය විශතස්තන්ව්‍යා
කෘතං මඞ්ගලම්

දීඝා, දික්; වන්දනමාලිකා, තොරණෙහි වූ මල් මාලාව; දෘෂ්ට්‍යා එව, බැල්මෙන් ම; විරචිතා, කරන ලදී. න ඉන්දීවරෛඃ, නිලුපුලෙන් නො වේ. පුෂ්පාණාං ප්‍රකරඃ, මල් ඉසුම; ස්මිතෙන රචිතඃ, මඳ සිනායෙන් කරන ලදී. න කුන්ද ජාත්‍යාදිභිඃ, කොඳ හා දෑසමන් ආදියෙන් නො වේ.

† දත්තං ‡ පයොධරයුගෙනාඝ්‍යං

සෙවද මුවා, සෝදිය පහල වූ; පයොධර හරෙණ, පියොවුරු බෙරෙන්; අඞ්ඃ, පුදපිදිය (උපචාර විශෙෂය); දත්තඃ, දෙනලදී; න කුම්භාම්භසා, කුඹු දියෙන් නො වේ; (එවම්, මෙ සේ;) තන්ව්‍යා, තුනුවඟ විසින්; විශතඃ ප්‍රියස්‍ය, (ගෙට) පිවිසෙන පෙම්වතාට; සෙවඃ අවය වෛඃ එව, සිය අවයව යන් ගෙන් ම; මංගලා කෘතම්, මංගලය කරන ලදි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**ධූර්ත නායකයකු විසින් කරන ලද වංචාව නායිකාවක් තම යෙහෙළියට මෙසේ දක්වයි.**

46 කාන්තෙ සාගසි † ශාපිතෙ ප්‍රියසඛී
 වෙෂං විධායාගතෙ
භ්‍රාන්ත්‍යාලිඞ්ග්‍ය මයා රහස්‍ය මුදිතං
 තත් සංගමාකාඞ්ක්‍ෂයා
මුග්ධෙ! ‡ දුෂ්කරමෙත දිත්‍යතිතමා
 මුද්දාම හාසං බලා –
දශ්ලිෂ්‍ය ව්ජලිතාස්මි තෙන
 කිතවෙනාද්‍ය ප්‍රදෛෂාගමෙ

සාගසි කාන්තෙ, අපරාධවත් කාන්තයා; ශාපිතෙ, (ඉදින් මගේ ගෙට අවහොත් අසවල් ශපථයැයි,) නිවාරිත කල; (යාපිතෙ යන පාඨ විසින් යැවූකල) ප්‍රියසඛී වෙෂං විධාය, (ඒ වල්ලභයා නායිකාවගේ) පිය යෙහෙළිය ගේ වෙස ගෙන; ආගතෙ, ගෙට ආකල; මයා, මා විසින්; භ්‍රාන්ත්‍ය (මගේ යෙහෙළියය යන) මුළාවෙන්; ආලිඞ්ග්‍ය, (ඔහු) වැළඳගෙන; තත් සඞ්ගම + ආකාඞ්ක්‍ෂයා, ඔහු ගේ සංගම රිසි ඇති; මයා, මා විසින්; රහස්‍යම්, රහස; උදිතම්, කියන ලදී;

---

† යාපිතෙ; ශායිතෙ

‡ දුෂ්කරමෙතදිත්‍යතිතරාමුක්ත්වා සහාසං බලාද ලිඞ්ග්‍ය; දුෂ්කරමෙතදිත්‍යතිතරාමුච්ජම්‍ය හාස්‍යං බලාද ලිඞ්ග්‍ය

හෙ මුග්ධ, (එම්බා,) අඥ තැනැත්තිය;එතත්, ඒ කටයුත්ත; අතිතරාම්, බොහෝසේ; දුෂ්කරං ඉති, දුකර යැයි (අමාරු යයි); උක්ත්වා, කියා; උද්දාම හාසම්, (කෑවා,) මහත්සේ නොහොත් ගඩනඟා සිනාසී; බලාත් ආලිඞ්ග්‍ය, බලයෙන් වැළඳගෙන; තෙන කිතවෙන, ඒ කපටියා විසින්; අද්‍ය ප්‍රදෙෂ සමයෙ, අද සවස්කල; (අහම්, මම;) ඡලිතාසම්, රවටනු ලැබුවෙමි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**වියෝගියෙක් මානිනිය ගේ මාන වෘත්තාන්තය සිහි කරයි.**

47 ආශඞ්ක්‍ය ප්‍රණතිං පරාන්ත පිහිතෞ
පාදෞ කරොත්‍යාදරා
ද්ව්‍යාජෙනාගතමාවෘණෝති හසිතං න
ස්පෘෂ්ට මුද්වීක්‍ෂතෙ
මය්‍යා ලාපවති † ප්‍රතීප වචනා
සඛ්‍යා සහා භාෂතෙ
‡ තන්ව්‍යාඃස්තිෂ්ඨතු නිර්හර ප්‍රණයිතා
මානො' පි රම්‍යොදයඃ

ප්‍රණතිම්, වැදුම; ආශඞ්ක්‍ය, සැකකොට (මොහු මට වඳිතියි සිතා); ආදරාත්, අදරින්; පාදෞ, දෙපා; පටාන්ත පිහිතෞ කරොති, වත් කෙළවරින් වසයි; ආගතං හසිතම්, ආ සිනාව; ව්‍යාජෙන, මිථ්‍යාවෙන්; ආවෘණොති, වසයි; ස්ප ෂ්ටම්, පැහැදිලිව (ව්‍යක්තලෙස); න උද්වීක්‍ෂතෙ, නො බලයි; මයි, මා; ආලාපවති, කථාකරන කල; සඛ්‍යා සමම්, යෙහෙළිය සමග; ප්‍රතීපවචනම්, විරුද්ධ බස් (ප්‍රතිකූල වචන); භාෂතෙ, කියයි; තන්ව්‍යාඃ, තුනුවග ගේ; නිර්හර ප්‍රණයිතා,

† ප්‍රතීපවචනා සඛ්‍යා සමං භාෂතෙ
‡ තස්‍යාස්තිෂ්ඨතු

දූති අදර බව; තිෂ්ඨතු, තිබේවා; මානඃ අපි, ඇගේ කොපයද; රමෙය්‍යාදයඃ, මනහර උදුවෙකි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තයයි.

**කිවි යා ගේ කීමක්.**

48 †යාවන්තේ‍යව පදන්‍යලීක වචනෛ
රාලී ජනෛඃ පාඨිතා
තාවන්තේ‍යව කෘතාගසො ද්‍රුතතරං
‡ සංලප්‍ය පත්‍යුඃ පුරඃ
§ ප්‍රාරෙභෙ පරතො යථා මනසිජ
ස්‍යෙච්ඡා තථා වර්තිතුං
ප්‍රේම්ණො මෞග්ධ්‍ය විභූෂණස්‍ය සහජඃ
කො'ප්‍යෙෂ කාන්තඃ ක්‍රමඃ

අලීජනෛඃ, යෙහෙළියන් විසින්; අලීක වචනෛඃ, නො සස් බසින්; යාවන්ති එව පදනි, යම් පමණක් ම වචන; පාඨිතා, උගන්වන ලදද; (සා නායිකා, ඒ නායිකා තොමෝ;) කෘත + අගසඃ, කරනලද අපරාධ ඇති; පත්‍යුඃ පුරඃ, හිමියා ඉදිරියෙහි; තාවන්ති එව (පදනි); ඒ උගන්වන ලද වචන පමණක් ම; ද්‍රුතතරම්, වහා; සංලප්‍ය, කියා; පරතඃ, එයිනික්බිති; මනසිජස්‍ය, මනයොනා ගේ; ඉච්ඡා යථා, රිසිය යම්සේ ද; තථා, එසේ; වර්තිතුම්, පවත්නට; ප්‍රාරෙභෙ, පටන්ගතු; මෞග්ධ්‍ය විභූෂණස්‍ය, සුන්දරබව අබරණ කොට ඇත්ත හු ගේ, (නො බුහුටිය හු ගේ යනු වෙමහුපාල අරුති.); ප්‍රේම්ණඃ, ප්‍රේමයාගේ; එෂඃ, මේ; සහජඃ, සවභාවික; කාන්තඃ, මනහර; කඃ අපි ක්‍රමඃ, යම්කිසි අයුරෙකි.

සාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

† සා යාවන්ති ‡ ව්‍යාහෘත්‍ය § ප්‍රාරබ්ධා

**අපරාධවත් හිමියා දෙස ඉතිරිය හෙළන විවිධ බැලුම් කිවියා මෙසේ දක්වයි.**

49 දූරාදුත්සුකමාගතෙ විවලිතං
සංභාෂිනී ස්ඵාරිතං
සංශ්ලිෂ්‍යත්‍යරුණං ගෘහීත වසනෙ‖
කොපාඤ්චිත භ්‍රූලතම්
මානින්‍යාශ්චරණානතිව්‍යතිකරෙ ද්
වාෂ්පාම්බු පූර්ණේක්ෂණං
චක්ෂුර්ජාතමහො ප්‍රපඤ්ච චතුරං
ජාතාගසි ප්‍රෙයසි

ජාතාගසි ප්‍රෙයසි, අපරාධවත් ප්‍රියතමයා; දූරාත්, දුරින්; (සිටිතෙ සති, සිටිකල;) උත්සුකම්, උකටලිය ද; ආගතෙ (සති), ආකල; විවලිතම්, විවර්තිතය ද; සංභාෂිණී, බෙණෙන කල; ස්ඵාරිතම්, විස්තාරිය ද; සංශ්ලිෂ්‍යති, වැළඳ ගන්නා කල; අරුණම්, රක්තවර්ණය ද; ගෘහිත වසනෙ, ගත් වත (වස්ත්‍රය) ඇතිකල; කොප, කොපින්; අඤ්චිත භ්‍රූලතම්, හකුළුවන ලද බැමලිය ද; චරණ + ආනති ව්‍යති කරෙ, පාද ප්‍රණාම සම්බන්ධයෙහි; වාෂ්පාම්බු පූර්ණ, කඳුළු පිරි; ඊක්ෂණම්, නෙත ද ඇති; මානින්‍යාඃ; මානවතිය ගේ; චක්ෂුඃ, ඇස; ප්‍රපඤ්ච චතුරං, (ජාතම්) උත්සුකාදි බහුප්‍රකාර රූප ගැනීමෙහි සමත් වී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිවියා ගේ කීමක්.**

50 අඞ්ගානාමති† තානවං කුත ඉදං ‡කස්මාදකස්මාදිදං
මුග්ධෙ! පාණ්ඩු කපොලමානනමිති
ප්‍රාණෙශ්වරෙ පෘච්ඡති

---

‖ සංකුඤ්චිත භ්‍රූලතම්; කිඤ්චිනානත භ්‍රූලතම්; කිඤ්චා ඤ්චිත භ්‍රූලතම් ද් වාෂ්පාම්බු පූර්ණේක්ෂණාත්

† තානවං කථමිදං

‡ කාමපශ්ච කස්මාදයං;

තත්ව්‍යා සර්ව්මිදං ස්වභාවත ඉති
ව්‍යාහෘත්‍ය පක්ෂ්මාන්තර-
ව්‍යාපී වාෂ්ප භරස්තයා * වලිතයා නිඃ
ශ්වස්‍ය මුක්තො'න්‍යතඃ

(හෙ) මුග්ධෙ, (එම්බා) සොඳුරිය; අඞ්ගානාම්, අවයවයන්ගේ; ඉදං අතිතානවම්, මේ ඉතා දුබල බව (කෘශත්වය;) කස්මාත්; කවර හේතුවෙකින්; කුතඃ, කෙසේ විද; ඉදම්, මේ; පාණ්ඩු, පඬු පැහැ; කපොල, කොපුල් ඇති; ආනනම්, මුහුණ; කස්මාත් ඉති, කෙසේ වී දැයි; (කම්පශ්ච කස්මාදයං යන පාඨ විසින් අයං කම්පශ්ච, මේ කම්පාව ද; කස්මාත්, කෙසේ වී දැයි යනු අරුති.) ප්‍රාණෙශ්වරෙ පෘච්ඡති, ප්‍රියතමයා විචාරණ කල; තන්ව්‍යා, තුනුවඟ විසින්; ඉදං සර්ව්ම්, මේ සියල්ල; ස්වභාවතඃ ඉති, නිසග සිදුවීම් යැයි; ව්‍යාහෘත්‍ය, කියා; වලිතයා තයා, මුව ඉවත හරවන ලද ඈ විසින්; නිඃශ්වස්‍ය, සුසුම් ලා; පක්ෂ්මාන්තර ව්‍යාපී, ඇසිපිය අතර පැතුරුණු; වාෂ්පභරඃ, කඳුළු බර (අශ්‍රුපූරය); අන්‍යතඃ, අන් දෙසකින්; මුක්තඃ, මුදන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිපුණු නායිකාවක පැහැදවීමට යෙදූ උපාය නිශ්ඵලව තමාට ඇඟෙන් ලද අතවරයක් කිසියම් නායකයෙක් තම යහළුවකුට මෙසේ දක්වයි.**

51 පුරස්තන්ව්‍යා ගොත්‍රස්ඛලන චකිතො'හං නතමුඛඃ
ප්‍රවෘත්තො වෛලක්ෂ්‍යාත් කිමපි ලිඛිතුං දෛවහතකඃ
ස්ඵුටො රෙඛාන්‍යාසඃ කථමපි ස තාදෘක් පරිණතො
ගතා යෙන ව්‍යක්තිං පුනරවයවෛඃ සෛව තරුණී

* දයිතයා; වලිතයා

52 නතශචාභිඥය ස්ඵුරදරුණ ගණ්ඩස්ථල රුචා
මනස්විත්‍යා රුඪ ප්‍රණය සහසොද්ගද්ගදගිරා
අහො චිත්‍රං චිත්‍රං ස්ඵුටමිති නිගද්‍යාශ්‍රුකලුෂං
රුෂා බ්‍රහ්මාස්ත්‍රං මෙ ශිරසි නිහිතො වාමචරණඃ,

(යුගලම්)

තන්ව්‍යාඃ පුරඃ, තුනු වග ගේ ඉදිරියෙහි; ගොත්‍රස්ඛලන, ගොත් පැකුළුමෙහි;චකිතඃ, බියපත්; දෛවහතකඃ, අභාග්‍ය වත්; අහම්, මම; වෛලක්‍ෂ්‍යාත්, විලියෙන්; නතමුඛඃ, නමන ලද මුහුණැත්තේ (මුහුණ නමා යන අදහසයි). කිමපි, කිසිවක්; ලිඛිතුම්, අඳිනට; ප්‍රවෘත්තඃ, පටන් ගතිමි; (තතඃ, ඉක්බිති); යෙන, යම් ඉරි ඇඳුමෙකින්; පුනඃ, යළි; අවයවෛඃ, අවයවයන් ගෙන්; සා එව තරුණී, (මගේ අන්‍ය පෙම්වතියක්වූ) ඒ තුරුණුවිය ම; ව්‍යක්තිං ගතා, ප්‍රකාශයට ගියා ද; සඃ, ඒ; ස්ඵුටඃ, පැහැදිලි; රේඛාන්‍යාසඃ, ඉරි ඇඳුම; තාදෘක්, එබඳු වූ; පරිණතඃ (ගතඃ), පරිපාකයට ගියේය.

තතඃ, ඉක්බිති; අභිඥය, (ඒ රුව) හැඳින; ස්ඵුරත්, සැලෙන; අරුණ, රතුවන්; ගණ්ඩස්ථල රුචා, කොපුල් තල පැහැති; මනස්විත්‍යා, මානිනිය විසින්; රූඪ, හටගත්; ප්‍රණය සහසොද්ගද්ගද ගිරා, කොපයෙන් වහා පහලවූ ගද්ගද බසින්; අහො, අහ; චිත්‍රං චිත්‍රම්, (මේ සිතුවම) විසිතුරුය විසි තුරුය; ස්ඵුටං ඉති; පැහැදිලියැයි; අශ්‍රුකලුෂම්, කඳුලෙන් කිලිටි; රුෂා, රොසින්; නිගද්‍ය, කියා; බ්‍රහ්මාස්ත්‍රං (ඉව), බඹ අවිය බඳු; වාම චරණඃ; වම්පය; මෙ ශිරසි, මහිස; න්‍යස්තඃ, පිහිටවී.

**විස්තර:**

අන් අඟනක හා විස්වස් පෙම්වතෙකි. ඔහු ගේ පෙම්වතිය ද මෙ බව හොඳකාර ම දනියි. දිනක් හෙතෙමේ පෙම්වතිය වෙත පැමිණියේය. එහෙත් සංභාෂණයට කැමැත්තෙක් ඔහුට නොවී. ඒ ඔහු ගේ දෙ වන පෙම්වතිය ගේ නම කියවෙති යි යන බිය නිසා ය. එහෙයින් හෙතෙමේ කිසි ම කතා බහක් නැතිව හටගත් විලියෙන් බිම බලා ගෙන පා ඇඟිලිවලින් බිම ඉරි අඳින්ට පටන්ගති. රේඛා අඳින අතර සිහියට නැහෙනුයේ ඔහු ගේ ඒ දෙවන පෙම්වතියයි. රේඛා ඇඳ අවසන් වූ විට කදිම ස්ත්‍රී රූපයෙක් විය. මෙරුව දුටු දයිතාව එය තම සපත්නිය ගේ රුව බැවින් ඉමහත් කොපයට පත් "අහා කදිම චිත්‍රයෙකැ" යි කියා දයිතයා ගේ හිසට වම්පයින් පහරක් දුන්හ.

සිඛරිණී වෘත්තය යි.

**කිසි යම් නායිකාවක් සමාසොක්තින් ගෙන් සනසයි.**

53 කඨින හෘදයෙ ! මුඤ්ච භ්‍රාන්තිං ව්‍යලීක § කථාශ්‍රිතාං
පිශුනවචනෛර් දුඃඛං නෙතුං න යුක්තමිමං ජනම්
කිමිදමථවා සත්‍යං මුග්ධෙ ! ත්වයාද්‍ය විනිශ්චිතං
යදභිරුචිතං තන්මෙ කෘත්වා ‡ ප්‍රියෙ සුඛමාස්‍යතාම්

(හෙ) කඨින හෘදයෙ, (එම්බා) දැඩි සිතැත්තිය; ව්‍යලීක කථාශ්‍රිතාම්, නොසස් කතා ඇසුරු කළ; භ්‍රාන්තිම්, නොසස් මතය(මිථ්‍යා බුද්ධිය;) මුඤ්ච, හරු; පිශුන වචනෛඃ, කේලාම් බසින්; ඉමං ජනම්, මෙ දනා (මා); දුඃඛං නෙතුම්, දුකට හෙලන්ට; න යුක්තම්, යුතු නො වේ; අථවා, නොහොත්; (හෙ) මුග්ධෙ, (එම්බා) මුග්ධාව; ත්වයා, තී විසින්; අද්‍ය, අද; ඉදම්, මෙ කරුණ; සත්‍යං කිම්, සැබෑදැයි; විනිශ්චිතම්, නිශ්චය කරන ලද දැ;

---

§ කථාශ්‍රයාම් ‡ මුග්ධෙ ත්වයා විනිශ්චිතම්.

(හෙ) ප්‍රියෙ, (එම්බා) ප්‍රියාව; යත්, යමක්; අභිරුචිතම්, (හිට) රිසි ද; තත්, එය; මෙ, මට; කෘත්වා, කොට; සුඛංආසස්‍ව තාම්, සුවසේ සිටිත්න.

**අදහස**:

එම්බා දූෂි සිතැත්තිය අසල්වැසි කේලමුන් ගේ බස් අදහා තොප ගත් බොරු මතය අතහරු. ඔවුන් ගේ කීම් අසා මට දුක් දීම නුසුදුසුය. කිම තොපි මෙහි සත්‍යාසත්‍යතාව නිශ්චය කළහු ද? යමක් තොපට රිසි ද එය මට කර සුව පත් වෙව.

හරිණී වෘත්තය යි.

**කිවියා ගේ කීමක්:**

51 රාත්‍රෞ වාරිභරාලසාම්බුද රවො
　　ද්විග්නෙන ජාතාශ්‍රුණා
පාන්ථේනාත්ම වියොග දුඃඛ පිශුනං
　　ගීතං තථොත්කණ්ඨයා
ආස්තාං ජීවිත හාරිණඃ ප්‍රවසනා
　　ලාපස්‍ය සංකීර්තනං
මානස්‍යාපි ජලාඤ්ජලිඃ සරභසා
　　ලොකෙන දත්තා යථා

රාත්‍රෞ, රැයෙහි; වාරිභරාලස, ජලබරින් බර; අම්බුරද රව, ගනකුළු ගැජුමෙන්; උද්විග්නෙන, තැතිගත්; ජාතා ශ්‍රුණා, හටගත් කඳුළු ඇති; පාන්ථේන, මැඟියකු විසින්; ආත්ම වියොග දුක්ඛ, තම වියෝ දුක; පිශුනම්, පැවසීම; යථා (භවති), යම් සේ වේ ද; උත්කණ්ඨයා, උකටලියෙන්; තථා, එසේ; ගීතම්, ගයනලදී; ජීවිත හාරිණඃ, දිවිය හරනා; ප්‍රවසන ආලාපස්‍ය, ප්‍රවාස කථාවේ; සංකීර්තනම්, පැවසීම (උච්චාරණය); ආස්තාම්, තිබේවා; ලොකෙන. ලොකයා විසින්; සරභසම්, වහා; මානස්‍යාපි, මානයටද; ජලාඤ්ජලිඃ, දියැදිලිය (නිවාපය;) දත්තඃ, දෙනලදී;

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිසියම් නායකයෙක් මත්වූ නායිකාවක ගේ ප්‍රණය මානය මෙසේ සිහිකරයි.**

55 ඝවං දෘෂ්ට්වා කරජක්‍ෂතං මධුමදක්‍ෂීබා විචාර්යේර්ෂ්‍යයා
ගච්ඡාමි ක්ව නු ගච්ඡසීති විධෘතා
බාලාපටාන්තෙ මයා
ප්‍රත්‍යාවෘත්තමුඛී සවාෂ්පනයනා ‖ මාං
මුඤ්ච මුඤ්චෙති සා
† කොපා ප්‍රස්ඵුරිතාධරා යදවදත්
තත් කෙන ‡ විස්මාර්යතෙ

බාලා, තුනුවිය; මධුමදක්‍ෂීබා, මී මෙදෙන් මත්වූවා; ඝවම්, තමා ගේ (ඇවිසින් මා සිරුරෙහි කරන ලද;) කරජක්‍ෂතම්, නිය පහර; දෘෂ්ට්වා, දැක; අවිචාර්‍ය, (කරුණු) නො පිරික්සා; ඊර්ෂ්‍යයා, ඉසියෙන් (කොපයෙන්); ගච්ඡාමි, යන්නීය; ක්වනු ගච්ඡසි ඉති, කොහි යෙහිදැයි; මයා, මා විසින්; පටාන්තෙ, වත් කෙළවරෙහි; විධෘතා, ගන්නා ලදී; ප්‍රත්‍යාවෘත්තමුඛි, ආපසු හැරවූ මුවැති; සවාෂ්ප නයනා, කඳුළෙන් යුත් නෙතැති; සා, හෝ තොමෝ; මාම්, මා; මුඤ්ච මුඤ්ච ඉති, අතහරුව අතහරුවයි; කොප, කොපින් ; ප්‍රස්ඵුරිත අධරා, සැලෙන තොලැත්තී; යත්, යමක්; අවදත්, කී ද; තත්, එය; කෙන, කවරකු විසින්; විස්මාර්‍ය්‍යතෙ, නො සමරනු ලැබේ ද. (සිහිකෙරේමය.)

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

---

‖ සාමුඤ්ච මුඤ්චතිමාං

† කොපප්‍රස්ඵුරිතාධරම්; කොපාත්

‡ විස්මාර්‍යතෙ

**යෙහෙළියක් යම්කිසි මානවතියකට මෙසේ හික්මවයි.**

56 චපල හෘදයෙ ! කිං සවාතන්ත්‍ර්‍යාත්තථා ගෘහමාගත
ශ්චරණ පතිතඃ ප්‍රේමාර්ද්‍රාර්ද්‍රඃ ප්‍රියඃ සමුපෙක්ෂිතඃ
තදිදමධුනා යාවජ්ජීවං නිරස්ත සුඛොදයා
රුදිත ශරණා ‼ දුජ්නානාං සහස්ව රුෂාං ඵලම්

(හෙ) චපල හෘදයෙ, (එම්බා) චංචල සිතැත්තිය; ප්‍රේමාර්ද්‍රා ර්ද්‍රඃ, අතිශයින් පෙම්වත්; තථා, ඒ අයුරෙන් (සංගමාපෙක්ෂා වෙත්); ගෘහං ආගතඃ, ගෙට ආ; චරණ පතිතඃ, (තොප ගේ) පා වඳනා; ප්‍රියඃ, ප්‍රියයා; කිම්, මක්නිසා; සවාතන්ත්‍ර්‍යාත්, (මා නොවිචාරා) සිය රිසිය සේ නොහොත් සිය කැමැත්තෙන්; සමුපෙක්ෂිතඃ, උපෙක්ෂිත ද (නින්ද කරන ලද ද); තත්, එහෙයින්; අධුනා, දැන්; යාවජ්ජීවම්, දිවිතෙක්; නිරස්ත සුඛොදයා, දුරුකළ සුවැත්තී; රුදිත ශරණා, හැඬුම පිහිට කොට ඇත්තී; දුර්ජනානාම්, දුදනන් ගේ; රුෂාං ඵලම්, රොසේ පල; සහස්ව, ඉවසව.

හරිණී වෘත්තය යි.

**නායිකා නායක දෙදෙනකුගේ ප්‍රශ්නොත්තර මාලාවක්**

57 බාලෙ ! නාථ ! විමුඤ්ච මානිනි ! රුෂං
රොෂාන්මයා කිං කෘතං
ඛෙදෙස්මාසු න මෙ' පරාධ්‍යති
භවාන් සර්වේ'පරාධා මයි
තත් කිං රොදිෂි ගද්ගදෙන වචසා
කස්‍යාග්‍රතො රුද්‍යතෙ
නන්වෙතන්මම කා තවාස්මි දයිතා
නාස්මීත්‍යතො රුද්‍යතෙ

‼ දුර්ජනීනාම්

**නායකයා**:– (හෙ) බාලෙ, (එම්බා) මුඞ්ධාව;

**නායිකාව**:– (හෙ) නාථ, (එම්බා) හිමිය;

**නායකයා**:– (හෙ) මානිනි, (එම්බා) මානවතිය; රුෂම්, රොස; මුඤ්ච, හරු;

**නායිකාව**:– රොෂාත්, රොසින්; මයා, මා විසින්; කිං කෘතම්, කුමක් කරන ලද ද;

**නායකයා**:– අස්මාසු, අප කෙරෙහි; ඛෙදඃ, දුක; (කෘතඃ, කරන ලදී; අපට දුක් දෙන ලදී යන අදහසයි.)

**නායිකාව**:– භවාන්, භවත් තෙමේ; මෙ, මට; න අපරාධ්‍යති, අපරාධ නොකරයි; සර්වේ අපරාධාඃ, සියලු අපරාධ යෝ; මයි, මා කෙරෙහි වේ; (ඔබ මට වරදක් නො කළහ. වරද කළේ මවිසිනි යන අදහසි).

**නායකයා**:– තත්, එසේ නම්; ගද්ගදෙන වචසා, ගද්ගද බසින්; කිං රොදිෂි, කුමට හඬහිද;

**නායිකාව**:– කස්‍යාග්‍රතඃ, කාවරහු ගේ හමියෙහි; රුදන්‍යතෙ, හඬනු ලැබේද;

**නායකයා**:– එතත්, ඒ හැඬුම; නනු මම අග්‍රතඃ, මා හමියෙහි නො වේ ද;

**නායිකාව**:– තව, ඔබට; කා අස්මි, (මම) කවරියක් වෙම් ද;

**නායකයා**:– දයිතා, මගේ අඹුව වේ;

**නායිකාව**:– නාස්මි ඉති අතඃ, නොවෙමියි යන කරුණෙන්; රුදන්‍යතෙ, හඬනු ලැබේ;

ප්‍රශ්නොත්තර අලංකාරයයි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිම්යා වරදක් කළහයි සිතා බහු බැහැර කර පසුව තැවෙන නායිකාවක්**

58 ශ්ලිෂ්ටඃ කණ්ඨේ කිමිති න මයා මූඪයා ප්‍රාණනාථ-
ශ්චුම්බත්‍යස්මින් ⁋ වදන විනතිඃ
කිං කෘතා කිං න දෘෂ්ටඃ
නොක්තඃ කස්මාදිති නවවධූ චෙෂ්ටිතං චින්තයන්ති
පශ්චාත්තාපං වහති තරුණී ප්‍රේම්ණි ජාතෙ රසඥ

තරුණී, යුවතිය; ප්‍රේම්ණී ජාතෙ, පෙම (ප්‍රණය) උපන් කල; රසය දත්ති (සංභොග සුඛය වෙසෙසින් දත්ති;) මූඪයා මයා, අඥ වූ මා විසින්; ප්‍රාණනාථඃ, පෙම්වතා; කිමිති, කුමක් හෙයින්; කණ්ඨේ, ගෙලෙහි; න ශ්ලිෂ්ඨඃ, නො වැළඳ ගන්නා ලද ද; අස්මින් චුම්බම් (සති), මපෙම්වතා (මා) සිඹිනා කල; කිම්, කුමක් නිසා; වදන විනතිඃ කෘතා, ම මුව නැමුම කරන ලද ද; (කිංච, තව ද;) කිං න දෘෂ්ටඃ; (ම පෙම්වතා මා විසින්) මක් නිසා නො බලන ලදද; කස්මාත්, කුමක් හෙයින්; න උක්තඃ, නො බෙණෙන ලදදු සි; ඉති, මෙ සේ; නව වධූ-චෙෂ්ටිතං චින්තයන්ති, (තමා ගේ) නවොඪා ව්‍යාපාරය ගැන සිතන්නී; පශ්චාත්තාපං වහති, පසුතැවිල්ල උසුලයි.

**සෙහෙළියන් විසින් මන් කැරුමට උවදෙස් දුන් නායිකාවක් එයට තමාගේ අසමත් බව ඔවුනට මෙසේ දක්වයි.**

59 ශ්‍රුත්වා † නාමාපි යස්‍ය ස්ඵුට ඝන පුලකං‡
ජායතෙ'ඞ්ගං සමන්තාද්
දෘෂ්ට්වා යස්‍යානනෙන්දුං භවති වපුරිදං
චන්ද්‍රකාන්තානුකාරි

⁋ වදන විහාතිඃ

† නාමප්‍රියස්‍ය ‡ ජායතෙ යත්

තස්මිත්‍නාගතඃ ? කණ්ඨග්‍රහනිකට
පදස්ථායිනි ප්‍රාණනාථෙ
භග්නා ‖ මානස්‍ය චින්තා භවති * මයි
පුනර්වජ්‍රමයස්‍යාං ¶ කදාචිත්

යස්‍ය, යම් පෙම්වතකු ගේ; නාමාපි, නම පවා; ශ්‍රැත්වා, අසා; සමන්තාත්, හාත්පසින්; ස්ඵුට, පැහැදිලි; ඝන පුල කම්, ගන ලොමුදහ ඇති; අඞ්ගම්; (මගේ) සිරුර; ජායතෙ, පහළ වේ ද (උපදී ද); යස්‍ය, යමකු ගේ; ආනන ඉන්දුං දෘෂ්ට්වා, මුව සඳ දැක; ඉදං වපුඃ, මේ සිරුර; චන්ද්‍රකාන්තානු කාරී භවති, සඳකාන්ත්මිණක අයුරු වේ ද; (මුළු සිරුරෙහි ඩහ උපදී යු සේ යි.) තස්මින් ප්‍රාණනාථෙ, (එබඳු වූ) ඒ පණ්සුරු; ආගතෙ, අවුත්; කණ්ඨග්‍රහ, ගෙල ගැනුමේ; නිකට පදස්ථායිනි (සති), ළඟ තැනැ සිටිකල; (ගෙල වැළඳ ගැනුමට හැකිවන සේ සමීපස්ථානයෙක සිටිකල යන අදහසි.) කදාචිත්, කිසි කලෙක; වජ්‍රමයස්‍යාං මයි, විදුරුමය වූ මා කෙරෙහි; (ඉතා දැඩි යන අදහසි;) මානස්‍ය චින්තා, මත් කැරුමේ අදහස; භග්නා භවති, බිඳුණේ වේ.

ස්‍රග්ධරා වෘත්තයයි.

**කිවියාගේ නිමක්:**

60 ලාක්‍ෂාලක්ෂ්ම ලලාටපට්ටමභිතඃ කෙයූරමුද්‍රා ගලෙ
වක්ත්‍රෙ කජ්ජල මාලිමා
නයනයොස්තාම්බූලරාගො’පරඃ
දෘෂ්ට්වා කොපවිධායි මණ්ඩනමිදං ප්‍රාතශ්චිරංප්‍රෙයසො
ලීලාතාමරසොදරෙ මෘගදෘශඃ ශ්වාසාඃ සමාප්තිං ගතාඃ

---

? කණ්ඨග්‍රහණ සරභස ස්ථායිනි
‖ භග්නා තො මාන චින්තා
* මම ¶ කදානු, කථඤ්චිත්

ප්‍රාතඃ, උදය; ප්‍රෙයසඃ, පෙම්වතා ගේ; ලලාට පට්ටමභිතඃ, නළල්තල කෙළවරෙහි; ලාක්‍ෂා ලක්‍ෂම, ලතු ලකුණ ද; ගලෙ, ගෙලෙහි; කෙයූර මුද්‍රා, අගුපලඳනා ලකුණද; වක්ත්‍රෙ, මූවෙහි; අපරඃ, අන්‍යවූ; තාම්බූලරාගඃ, බුලත් පැහැය ද; අපරඃ, අන්‍යවූ සංභොග චිහ්න ද යන; කොපවිධායි, කොපය ඇතිකරන; ඉදං මණ්ඩනම්, මේ ලකුණු; දෘෂ්ටවා, දැක; මෘගදෘශඃ, මියුලැසිය ගේ; සඩාසාඃ, සුසුම්හු; ලීලාතාමර සොදරෙ, කෙළිපියුම් ගබහි; සමාප්තිං ගතාඃ, නිමාවට ගියහ.

ශාර්දූල වික්‍රීඩිතය යි.

**නායිකාවක් දිවිය තොරකර ගන්නා බව වක්‍රොක්තිය කින් විදෙසකට යන ශිසිය ඇති හිමියා ගේ ඒ ගමන නවත්වයි.**

61 ‖ ලොලෛලෝචන වාරිභිඃ සශපථෛඃ
පාද ප්‍රණාමෛඃ ප්‍රියෛ
† රන්‍යාසතා විනිවාරයන්ති කෘපණාඃ
ප්‍රාණෙශ්වරං ප්‍රස්ථිතම්
‡ පුණ්‍යාහං ව්‍රජ මංගලං * සුදිවසඃ ප්‍රාතඃ ප්‍රයාතස්‍ය තෙ
යත් ස්නෙහොචිතමීහිතං ⸸ ප්‍රිය! මයා
තන්නිගීතඃ ශ්‍රොෂ්‍යසි

ලොලෛඃ, ගලන (ඣලජ්ඣලායමාන;) ලෝචන වාරිභිඃ, කඳුලෙන්ද; සශපථෛඃ, දිවිරීම් සහිත; පාද ප්‍රණාමෛඃ, පා වැඳීමෙන් ද; ප්‍රියෛඃ, අන්‍යවූ ඉටු කරුණු වලින්ද; අන්‍යාඃ, අන්‍ය ස්ත්‍රීහු; ප්‍රස්ථිතං ප්‍රාණෙශ්වරම්, ගමන් ඇරඹූ පෙම්වතා; විනිවාරයන්ති, නවත්වති; තාඃ, ඔවුහු; කෘපණාඃ, දීන තැනැත්තියෝය; අහම්, මම; ධන්‍යා, වාසනාවන්තියක්මි;

‖ වාශෛනතඃ † අශෛන්‍යඃ ‡ ධන්‍යාහං; ධන්‍යාසතාඃ
* සුදිවසං ⸸ ප්‍රියතමත්වං නිගීතඃ

ප්‍රයාතස්‍ය තෙ, යන්නාවූ ඔබට; ප්‍රාතඃ, උදයෙහි: මඞ්ගලම්, මාඞ්ගල්‍යකාරී; සුදිවසඃ, ශොභන දවසෙකි; (හෙ) ප්‍රිය, (එම්බා) ප්‍රියය; ව්‍රජ, යව; මයා, මා විසින් කළ යුතු; ස්නෙහ උචිත, සනාවට සුදුසු; යත්ර්ජසිතම්, යම් කරුණෙක් වේද; තත්, එය; නිශීතඃ, (ගමන) පිටත්වූයේ; ශ්‍රොෂ්‍යසි, අසන්නෙහිය.

**අදහස**:

වෙන සත්‍රිහු හිමියා විදෙසකට යාමට අදහස් කරන කල හඬති. හිමියා ගේ පා වඳිති. ඔවුහු දින තැනැත්තියෝ මම වාසනාවන්තියක්මි. ආදරවන්තය ඔබට යහපත් දවසෙක් වේවා.

ඔබ ගිය පසු ඔබට මගේ ඇති ආදරයට කළයුතු යමක් ඇද්ද එය ඔබට අසන්ට ලැබේ. (ඇ මැරෙන බව කියා ඔහු ගේ ගමන නැවැත් වූ බව මෙයින් හැගේ.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිසි යම් යෙහෙළියක් නායිකාවකගේ අභිමතාර්ථ සිද්ධිය අන් යෙහෙළියකට මෙසේ පවසයි.**

62 ලග්නානාංශුකා පල්ලවෙ භුජලතා න
　　　　ද්වාර දෙශෙ' ‖ ර්පිතා
නො වා † පාදයුගෙ සවයං නිපතිතං
　　　　තිෂ්ඨති නොක්තං වචඃ
කාලෙ කෙවලමම්බුදලීමලිනෙ
　　　　ගන්තුං ප්‍රවෘත්තඃ ශඨ
ස්තත්ව්‍යා වාෂ්පජලෞඝ කල්පිත නදී
　　　　පූරෙණ ‡ රුද්ධඃ ප්‍රියඃ

‖ සපිතං　　† පාදගලෙතයා නිපතිතං; පාදයුගෙ තයා නිපතිතං　　‡ බද්ධඃ

අංශුක පල්ලවෙ, වත් කෙළවරෙහි; භුජලතා, (ඇ ගේ) බාහු ලතාව; න ලග්නා, නො ඇළුණේය; ද්වාර දෙශෙ, දොර දෙසෙහි න අර්පිතා, (අත) නො තබන ලදී; වා, නොහොත්; පාද යුගෙ, දෙපාහි; ස්වයම්, තමාම; න පතිතම් නො වැටුණි; තිෂ්ඨ ඉනි, සිටුව යන; වචඃ, බස; න උක්තම්, නො කියන ලදී; අම්බුදලී මලිනෙ කාලෙ, මේඝ පටලයෙන් සම්වත් කාලයෙහි; ගන්තුම්, යන්නට; ප්‍රවෘත්තඃ, උත්සාහ වත්; ශඨඃ, කපටි; ප්‍රියඃ, ප්‍රියයා; තන්ව්‍යා, තුනුවඟ විසින්; කෙවලම්, හුදෙක්; වාෂ්පජලෞඝ, කඳුළු ගෙණෙන්, කල්පිත, සැපයූ; නදීපූරෙණ, ගංගා ප්‍රවාහයෙන්; රුද්ධඃ; නවතන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

**සිය අදහස ප්‍රියයාට දන්වනුවට අසමත් නායිකාවක් ඒ අදහස මෙ සේ කිරි මවට කියයි.**

63 ආස්තාං විශ්වසනං සඛීෂු විදිතාභිප්‍රායසාරෙ ජනෙ
තත්‍රාප්‍යපීඩිතුං දෘශංදි සුරචිතාං ශක්තොමි න ව්‍රීඩයා
†ලොකො'ප්‍යෙෂ පරොපහාස චතුරඃ
සූක්ෂ්මෙඞ්ගිතඥො'ප්‍යලං
මාතඃ! කං ශරණං ව්‍රජාමි හෘදයෙ*ජීර්ණො'නුරාගානලෙ,

සඛීෂු, යෙහෙළියන් කෙරෙහි; විශ්වසනම්, විස්වස; ආස්තාම්, තිබේවා (ඔවුන් විශ්වාසකල නොහැක.) විදිත අභිප්‍රායඃසාරෙ, දන්නා ලද අදහස් තතු ඇති; ජනෙ (සති,) දනා ඇතිකල, තත්‍ර, එහි (ඔහු කෙරෙහි;) සුරචිතාං දෘශංඅපි, මනාව කරන ලද බැල්ම ද; අපීඩිතුම්, පිහිටුවන්නට; ව්‍රීඩයා, හිරිය නිසා; න ශක්තොමි, නොහැකිවෙමි; එෂඃ ලොකඃ අපි, මේ ලෝ වැස්සාද; පරොපහාස චතුරඃ, පරුපවාදයෙහි සමත්හ; අලම්, අතිශයින්; සූක්ෂ්මඉඞ්ගිතඥඃ අපි, සියුම් ඉඟි දන්නේ ද වේ; (සැඟවුණු අදහස් දන්නෝ වෙතිඃයන අදහසයි.)

‡ සුලලිතාං; සුරුචිරම් ශකොතාමි නො ලජ්ජයා
† ලොකො හේ‍යෂ
* දීර්ණො'නුරාගානලඃ

(හෙ) මානඃ, (එම්බා) මෑණියෙනි; කං ශරණං ව්‍රජාමි, කවරකු පිහිටකොට යෙම් ද; අනුරාග අනලඃ, නුරාගිත්න; හෘදයෙ ජීර්ණඃ, හදතුළ දිරුවේය.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**"තෝ අප ඉදිරියෙහි හුදෙක් මානය ගැනම කියයි. නායකයා හමියෙහි අන් ලෙසක් පවසයි" යනුයෙන් යෙහෙළියන් විසින් ඉදස් නගන ලද නායිකාවක් සිය වරද මෙසේ පහකෙරෙයි.**

64 න ජානෙ සම්මුඛායාතෙ ප්‍රියාණි වදති ප්‍රියෙ
සර්වාණ්‍යඞ්ගානි කිං යාන්ති නෙත්‍රතාං කිමු කර්ණතාම්

ප්‍රියෙ, ප්‍රියාය; සම්මුඛ ආයතෙ, මා හමුවට එන කල; (එසේම) ප්‍රියාණි වදති, පිය බස් කියන කල; සර්වාණි අඞ්ගානි, සියලු අවයවයෝ; නෙත්‍රතාං යාන්ති කිම්, නෙත්බවට යෙත් ද; කර්ණතාං යාන්ති කිමු, (ඉති,) කන්බවට යෙත් දැයි; න ජානෙ, නොදනිමි.

අනුෂ්ටුප් වෘත්තය යි.

65 අනල්පචින්තා භර මොහ නිශ්චලා
විලොක්‍යමානෛව කරොති සාධ්වසම්
ස්වභාවශොභානතිමාත්‍ර භූෂණා
තනුස්තවෙයං බත කිං නු සුන්දරි!

66 ඉති ප්‍රියෙ පෘච්ඡති මානවිහ්වලා
කථංචිදන්තර්ධෘත වාෂ්ප ගද්ගදම්
න කිංචිදිත්‍යෙව ජගාද යද්වධූඃ
කියන්න තෙනෛව තයාස්‍ය වර්ණිතම්

(යුග්මම්)

(හෙ) සුන්දරි, (එම්බා) සොඳුර; අනල්ප චින්තා භර මොහ නිශ්චලා, අපමණ සිතිවිලි බරින් වූ මූලායෙන් නිසලවූණු; ස්වභාව ශොභා, නිසගින්ම හොබනා නොහොත් සොඳුරුවූ; නතිමාත්‍ර භූෂණා, අවනතියම අබරණ කොටගත්; තව ඉයං තනුඃ, නි ගේ මේ සිරුර; විලොක්‍යමානා එව, බලනු ලබත් තේම; සාධ්වසං කරොති කිං නු, බිය උපදවන්නේ කිම් ද; බත, (එය) දුකෙකි.

ඉති, මෙසේ; ප්‍රියෙ පෘච්ඡති, ප්‍රියයා විචාරන කල; මාන විග්වලා, මතින් අවුල්වූ; (සා, හෝ තොමෝ;) කථඤ්චිත්, දුකසේ; අනතඞීන වාෂ්ප ගද්ගදම්, ඇතුළත රඳවන ලද කඳුළු නිසා ගද්ගද සවරත්ති; කිඤ්චිත් එව (උත්තරම්,) කිසියම් පිළිතුරක්; න ජගාද ඉති, නො කී ද යන: යත්, යම් කරුණෙක් වේ ද; තෙන එව, එයින් ම (පිළිතුරු නොදී මෙන් ම;) තස්‍ය, ඈ විසින්; තස්‍ය, ඔහුට (ඇගේ ප්‍රියයාට;) කියන් න වර්ණිතම්, සවල්පයක් (තම දුක) නො කියන ලදී; (තමා ගේ දුක බොහෝ සේ හැඟවී යන අදහසයි.)

වංශස්ථ වෘත්තය යි.

**එක්සේ දූතියක් ප්‍රණයයෙන් අමනානිත නායකයකු මෙසේ අවබෝධ කරවයි.**

67 විරහ විෂමඃ කාමො ද් වාමසතනු කුරුතෙ තනුං
දිවස ගණනා ‖ දක්ෂ ශවායං ව්‍යපෙත ඝෘණො යමඃ
තවම් අපි වශගො මානව්‍යධෙර් විචින්තය නාථ ! හෙ
කිසලය මෘදුර් ජීවෙදෙවං කථං ප්‍රමදා ජනඃ

වාමඃ, ප්‍රතිකූල; කාමඃ; අනඟා; විරහ විෂමඃ, වියෝහි විසම වූයේ (සංභොගයෙහි යළි අනුකූලවූයේ;) තනුම්, සිරුර; තනු කුරුතෙ, දුබල කෙරෙයි; අයං යමඃ ච, මේ යමයා ද; ව්‍යපෙත ඝෘණඃ, පහවූ කුලුණැත්තේ; දිවස ගණනා ද ක්‍ෂඃ, දවස් ගිණුමෙහි සමත්ය; හෙ නාථ, එම්බා සවාමිය; තවං අපි, ඔබ ද; මාන ව්‍යාධිඃ, (දෙහ දුබල බැවින් හා සංභොග පරිහාරයෙන් හටගත්) කොපය නමැති ව්‍යාධි යට; වශගඃ, වශහය; (මාන ව්‍යාධිය ශමනයට නොහැකිය යුසේයි.) එවම්, එසේ කල; කිසලය මෘදු; ලපලු බඳු මොළොක්, ප්‍රමදා ජනඃ; පමා දෙනෙ, කථං ජීවෙත්; කෙසේ දිවිය ගෙනයයි ද; චින්තය, (එය) සිතව.

හරිණී වෘත්තය යි.

---

ද් කාමං තනුං කුරුතෙ තනුං; වාමසතනුං කුරුතෙ තනුං
‖ දක්ෂඃ සෛවරං, දක්ෂශවාසෙං

**සම්කිසි යෙහෙළියක් ප්‍රියයාගේ මානොපශමනය අන් තැනැත්තියකට මෙසේ දක්වයි.**

68 පාදසක්තෙ සුචිරමිහ තෙ වාමතා *ත්වෙව මුග්ධෙ
මන්‍යුරමෙහ ප්‍රණයිනි ජනෙ †කො'පරාධොපරොධඃ
ඉත්‍ථං තස්‍යාඃ ‡පරිජන කථා කොමලෙ කොපවෙගෙ
වාෂ්පොද්‍රහෙදෙස්තදනු සහසා න සජිතං ද්‍රිතප්‍රවෘත්තම්

(හෙ) මුග්ධෙ, (එම්බා) සොඳුරිය; සුචිරම්, බොහෝ වේලාවක්; පාදසක්තෙ, පයෙහි ඇළුණු (පාවැදි;) ඉහ, මේ කාන්තයා කෙරෙහි; කාළුව මාමතා, මොනවක් බවෙක් ද; මන්‍යුරම්හෙ, ශාන්ත උපක්‍රම ඇති නොහොත් පැහැදවීම බලාපොරොත්තු වන; ප්‍රණයිතිජනෙ, පෙම්වත් ජනයා කෙරෙහි; අපරාධ, අපරාධයා ගේ; කඃ උපරොධඃ, කවර නැවැත්මෙක්ද; ඉත්‍ථම්, මෙසේ; පරිජන කථා, පිරිවර දනා ගේ කතායෙන්; කොපවෙගෙ, කෝ වෙය (කොපොද්‍රෙකය;) කොමලෙ (සති,) මොළොක් වූ කල නොහොත් ලිහිල් වූ කල; තදනු, ඉක්බිති, සහසා, වහා; වාෂ්ප උද්හෙදෙ, කඳුළු හටගැනුමෙන්; නසජිතම්, ස්පිතිය නොවී; න ප්‍රවෘත්තම්, පැවැත්ම නො වී; (කඳුළු ඉනීම හෝ ගැලීම නොවීයත අහසි.)

මන්‍දක්‍රාන්ත වෘත්තය යි

**මානවතියක් පෙම්වතාට මෙසේ දෙස් පවරයි.**

69 ‖තථාභූදස්මාකං * ප්‍රමථ මවිභක්තා තනුරියං
ද්‍රිතතො න ත්වං ප්‍රෙයානහමපි හතාශා ප්‍රියතමා
ඉදනීං නාථස්ත්වං වයමපි කලත්‍රං කිමපරං
‡මයාප්තං ප්‍රාණානාං කුලිශ කඨිනනාං ඵලමිදම්

---

* ත්‍වෙව කාන්ත; ත්වෙව කාන්තෙ
† කොපනො කො පරාධඃ
‡ පරිජන ගිරා කොපවෙගෙ ප්‍රශාන්තෙ; පරිජන කථා කොපවෙගොපශාන්තෞ ද්‍රි න ප්‍රයාතම්
‖ පුරා * ප්‍රථමමවිභිත්තා ද්‍රි තතොනුත්වං ප්‍රෙයාන් වයමපි හතාශාඃ ප්‍රියත්මාඃ; 'තතො'නුත්වං ප්‍රෙයානහමපි හතාශා ප්‍රියතමා ‡ හතානාං

අස්මාකම්, අප ගේ; ඉයං තනුඃ, මේ සිරුර; තථා, එසේ (නොකියහැකි අයුරෙකින්); අවිභක්තා අභූත්, නො බෙදෙන ලද්දේවිය; (එකම සිරුරක් වී යන අදහසි.) තතඃ, ඉක්බිති; ත්වම්, ඔබ; න ප්‍රේයාන්, ප්‍රියතමයෙක් නොවූ; අහං අපි, මම ද; හතාශා, නට ආසා ඇත්තියකවීම්; න ප්‍රියතමා, පෙම්වතියක් නොවීමි; ඉදානීම්, දැන්; ත්වම්, ඔබ; නාථඃ, පතියෙකි; වයං අපි, අපිදු; කලත්‍රම්, කලතුරු (භාර්‍යා) වෙමි; අපරං කිම්, අන් කිමෙක් ද; (තෙන, එහෙයින්;) මයා, මා විසින්; වජ්‍ර කඨිනානාම්, විදුරුමෙන් දැඩි; ප්‍රාණානාම්, ප්‍රාණ යන් ගේ; ඉදංඵලම්, (අඹුසැමි යන) මේ ඵලය; ආප්තම්, ලබන ලදී.

ශිඛරිණී වෘත්තය යි.

70 මුග්ධෙ මුග්ධතයෛව නෙතු†මඛිලඃ
කාලඃ කිමාරභ්‍යතෙ
මානං ධත්ස්ව ධෘතිං බධාන ඍජුතාං
දූරෙ කුරු ප්‍රෙයසි
සඛ්‍යෛවං ප්‍රතිබොධිතා ප්‍රතිවචස්තාමාහ භීතානනා
නීචෛඃ ශංස හෘදි ‡ස්ථිතො හි * නනු මෙ
ප්‍රාණෙශ්වරඃ ශ්‍රොෂ්‍යති

(හෙ) මුග්ධෙ; (එම්බා) බාලාව; මුග්ධතයා එව, මෝඩ කමින් ම; අඛිලඃ කාලඃ, මුළු කාලය; නෙතුම්, ගෙවන්ට; කිං ආරභ්‍යතෙ, කුමට අරඹනු ලැබේ ද; ප්‍රෙයසි, පෙම්වතා කෙරෙහි; මානං කුරු, මන උපද වව; ධෘතිං බධාන, දිරිය වඩ; ඍජුතාම්, ඍජුබව; දූරේ කුරු, දුරහරුව; සඛ්‍යා, යෙහෙළිය විසින්; එවම්, මෙසේ; ප්‍රතිබොධිතා (සා), උවදෙස් දෙන ලද හෝ තොමෝ; භීතානනා, බියපත් මුහුණැත්ති; තාම්, ඇයට; ප්‍රතිවචඃ, පිළිතුරක්; ආහ, (මෙසේ) කීය; (හෙ සඛි, එම්බා යෙහෙළිය;) නීචෛඃ ශංස, හෙමින් කථාකරව;

† මඛිලංකාලං ‡ ස්ථිතොයමධුනා * නනු ස මෙ

හි, යම් හෙයකින්; මෙ භාදිඝ්පිතඃ, මා හදතුළ සිටිනා: ප්‍රාණේශ්වරඃ, පණීසුරු; නනු ශ්‍රොෂ්‍යති, අසත්තේ නො වේද; (එහෙයිනි.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**මහලු අබිසරු ලියක් නව අබිසරු ලියකට මෙසේ කියයි.** (දෙබසෙකි)

71 ක්‍ව ප්‍රස්ථිතාසි කරභොරු! ඝනෙ නිසීථෙ
† ප්‍රාණාධිකො වසති යත්‍ර ජනඃ ප්‍රියො මෙ
එකාකිනී‡බත කථං න බිභෙෂි බාලෙ
නන්වස්ති පුඞ්ඛිතසරො මදනඃ සහායඃ

**මැහැල්ල**– (හෙ) කරභොරු, (එම්බා) අත්කරට බඳු කලවා ඇත්තිය; ඝනෙ නිසීථෙ, දූඩි මහරුයෙහි (තද අඳුර ඇති මැදි රුයෙහි); ක්‍ව, කොහි; ප්‍රස්ථිතාසි, යෙහිද;

**තුරුණුවිය**– ප්‍රාණාධිකඃ, පණට ද වඩා අධික; මෙ ප්‍රියඃ ජනඃ, ම ප්‍රියයා; යත්‍ර, වසති, යම් තැනෙක වෙසේ ද; (තත්‍ර ගච්ඡාමි, එහියෙමි;)

**මැහැල්ල**– (හෙ) බාලෙ, එම්බා දරුව (කෙල්ලේ ; බත, දුකෙකි; එකාකිනී (තනිවම්) හුදෙකලා තෝ; කථං න බිභෙෂි, කෙ සේ නම් බිය නොවෙහි ද;

**තුරුණුවිය**– පුඞ්ඛිත ශරඃ, (දුන්නෙහි) හිය යෙදූ; මදනඃ සහායඃ, අනඟ සහචරයා; නනු අස්ති, ඇත්තේ නොවේද නොහොත් ඇත්තේමය.

වසන්තතිලකා වෘත්තය යි.

---

† ප්‍රාණේශ්වරෝ වසති යත්‍ර මනඃ ප්‍රියො මෙ ‡ වද

**කිවියා ගේ කිමක්**

72 ලීලාතාමරසාහතෝ’න්‍ය ‖ වනිතා නිඃශඞ්ක දෂ්ටාධරඃ
†කශ්චිත් කෙසර දූෂිතෙක්‍ෂණ ඉව
ව්‍යාමීල්‍ය නෙත්‍රෙ ස්ථිතඃ
‡ මුග්ධා ¿ කුඞ්මලිතානනෙන්ඳු දදතී
වායුං ස්ථිතා * තත්‍රසා
භ්‍රාන්ත්‍යා ‡ ධූර්තතයාථවා නතිමෘතෙ
තෙනානිශං චුම්බිතා

අන්‍ය වනිතා, අන් ලියක විසින්; නිඃශඞ්ක, නිසැකව; දෂ්ට, ඩහනාලද; අධරඃ, තොලැති; කශ්චිත්, කිසිවෙක් (යම් කාමුකයෙක්;) ලීලා තාමරස ආහතඃ, කෙළි පියුමෙන් පහර දෙන ලදුයේ; කෙසර දූෂිතෙක්‍ෂණ ඉව, පියුම් රෙහෙණු යෙන් වැසුණු නෙත් ඇත්තකු මෙන්; නෙත්‍ර ව්‍යාමීල්‍ය, දෙනෙත් පියා; ස්ථිතඃ, සිටියේය; තත්‍ර, ඒ අවසරයෙහි; සා මුග්ධා, ඒ මුග්ධාව; භ්‍රාන්ත්‍යා, (මා දුන් පහරින් පියුම් රේණු ඇසවැටී පිඩා විඳිතියි යන) සැකයෙන්; අථවා, නොහොත්; ධූර්තයා, සොර බැවින් (වෛරභාවයෙන්;) කුඞ්මලිත, ආනන ඉඳු, මුකුලිත මුව සඳුගෙන් (මුව උල්සාර යන අදහසි;) වායුං දදතී, සුළඟ දෙමින් (මුවෙන් නෙතට පිඹි මින්;) ස්ථිතා, සිටියාය; (තතඃ, ඉක්බිති) තෙන, ඔහු විසින්; නතිං ඍතෙ, වැඳුම නැතිවම; අනිශම්, නිතර (වරින්වර;) චුම්බිතා, සිඹින ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**නායිකාවක් යෙහෙළියකට මෙසේ කියයි.**

73 ස්ඵුටතු හෘදයං කාමඃ කාමං කරොතු ‖ තනුං තනුං
න සඛි! † චපලප්‍රෙම්ණා කාර්‍ය්‍යං පුන දීයිතෙන මෙ

‖ වනිතයා † ප්‍රෙයාත් ‡ කාන්තා ¿ කුඞ්මලිතාන
නෙන දධතී * තස්‍යසා ‡ ධූර්තතයා කපොලඵලංක
‖ කාශං තනුං † චපලප්‍රෙම්ණා;

ඉති සරභසං † මානාවෙගාදුදීර්‍ය වචස්තයා
රමණ පදවී සාරඞ්ගාක්ෂ්‍යා ‡ නිරන්තරමීක්ෂිතා

(හෙ) සඛි, (එම්බා) යෙහෙළිය; කාමඃ, අනඞ්ගයා; කාමම්, රිසිසේ; තනුම්, සිරුර; තනුං කරොතු, දුබල (කෘශ) කෙරේවා; මෙ, මට; චපල ප්‍රේම්ණා, චපල පෙමැති; දයිතෙන, පෙම්වතා සමග; පුනඃ, යළි; කාපි න, කටයුත්තෙක් නො වේ; (ඔහුගෙන් මට පලෙක් නො වේ යන අදහසි.) ඉති, මෙසේ; මානාවෙගාත්, කොප වෙගයෙන්; වචඃ, බස්; සරභසම්, වහා; උදීර්‍ය, කියා; තයා සාරඞ්ගාක්ෂ්‍යා, ඒ මියුලැසිය විසින්; රමණ පදවීම්, රමණයා ගිය මග; නිරන්තරම්, නිතර; ඊක්ෂිතා, බලනලදි.

හරිණී වෘත්තය යි.

**කාන්තාවක් යෙහෙළියකට මෙසේ කියයි.**

74 †ගාඪාශ්ලෙෂ විශීර්ණ චන්දනරජඃ‡පුඤ්ජප්‍රකීර්ණාදියං
ශය්‍යා සම්ප්‍රති කොමලාඞ්ගි!
§ පරුෂෙත්‍යාරොප්‍ය මාං වක්ෂසි
ගාඪෞෂ්ඨග්‍රහ†පූර්ණමාකුලතයා පාදග්‍රසංදංශකෛ
න්‍යාකෘෂ්‍යාම්බරමාත්මනො යදුචිතං
ධූර්තේන තත් ප්‍රස්තුතම්

(හෙ) කොමලාඞ්ගි, (එම්බා) මුදු සිරුරැතිය; ගාඪාශ්ලෙෂ, දැඩි ලෙස වැළඳ ගැනුමෙන්; විශීර්ණ, විසිරුණු; චන්දනරජඃ පුඤ්ජ ප්‍රකීර්ණාත්, සඳුන් සුණු බොහොවින් (සඳුන් සුනුරැස බොහෝ ඇති බැවින්;) ඉයං ශය්‍යා, මෙ යහන; සම්ප්‍රති, දැන්; පරුෂා ඉති, රළුයැයි; මාම්, මා; වක්ෂසි ආරොප්‍ය, ළයමත තබා; ගාඪ, දැඩිසේ; ඔෂ්ඨග්‍රහ පූර්ණ, තොල ගැනුම

† මානාටොපාත් මානොද්‍රෙකාත්; ‡ සශංකිතමීක්ෂිතා; සසම්භ්‍රමමුදීක්ෂිතා † පශ්‍යාශ්ලෙෂ ‡ පුඤ්ජප්‍රසඞ්ගාත්
§ කඨිනෙ † පීඩනාකුලතයා

පෙරටුකොට ඇති; ආකුලතයා, අවුලින් (කාමාකුලයෙන්); පාදග්‍රසංදංශකෙන, පයග නමැති අඬුවෙන්; අම්බරම්, (මගේ) වස්ත්‍රය; ආකෘෂ්‍ය, ඇද; (පහකොටයුසේයි.) ධූතේන, (ඒ) කපටියා විසින්; ආත්මතඃ, තමහට; යත්, යමක්; උචිතම්, රිසිවිද; තත්, එය; ප්‍රස්තුතම්, කරන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තයයි

**කිවියා ගේ කිමක්.**

75 කථමපි කෘත † ප්‍රත්‍යාඛ්‍යානෙ ප්‍රියෙ ස්ඛලිතොත්තරෙ
විරහකෘශයා කෘත්වා ව්‍යාජං ප්‍රකල්පිතමශ්‍රුතම්
අසහන සඛී ‡ ශ්‍රොත්‍ර ප්‍රාප්ති ප්‍රමාද සසංභ්‍රමං
§ විගලිතදෘශා ශූන්‍යෙ ගෙහෙ සමුච්ඡ්වසිතං පුනඃ

කථමපි, කෙසේ හෝ; ප්‍රියෙ, (අපරාධවත්) ප්‍රියයා; කෘත, කරන ලද; ප්‍රත්‍යාඛ්‍යානෙ (සති) නිරාකරණය ඇතිකල; (තස්‍ය, ඔහුගේ;) ස්ඛලිත උත්තරෙ, ප්‍රස්ඛලිත උත්තරාවසර යෙහිදී (ගොත් පැකුළුමෙහි); විරහකෘශයා (නායිකයා), විරහයෙන් කෘශ නායිකාව විසින්; ව්‍යාජං කෘත්වා, ව්‍යාජයක් කොට; අශ්‍රුතං කල්පිතම්, නො ඇසීම කරනලදී; අසහන සඛී ශ්‍රොත්‍ර; නො ඉවසන යෙහෙළියන ගේ කනට; ප්‍රාප්ති, පැමිණීමෙන්; සසංභ්‍රමම්, අවුල් සහිත බව; (යථා භවති, යම් සේ වේද; තථා, එසේ;) විගලිත දෘශා, කඳුලැති නෙතින්; ශූන්‍යෙ ගෙහෙ, විජන ගෘහයෙහි; පුනඃ, යළි; සමුච්ඡ්වසිතම්, සුසුම් ලන ලදී.

හරිණී වෘත්තය යි.

† ප්‍රත්‍යාවෘතෙනෞ, ප්‍රත්‍යාවෘතෙන ‡ ශ්‍රොත්‍ර ප්‍රාප්තිං විශඞ්ක්‍ය § විචලිතදෘශා; ප්‍රචලිතදෘශා; විචලිතදෘශා

## මැඟියකුගේ විරහ බිරියක ගැන කිමක්:

76 ආදෘෂ්ටි ‖ ප්‍රසරාත් ප්‍රියස්‍ය පදවීමුද්වීක්‍ෂ්‍ය † නිර්විණ්ණයා
‡ විච්ඡින්නෙෂු පථිෂ්වහඃ පරිණතෞ
ධ්වාන්තෙ § සමුත්සර්පති
දත්වෛකං සශුචා ගෘහං ප්‍රති පදං
පාන්ථස්ත්‍රියාස්මින් ක්‍ෂණෙ
† මාභූදගත ඉත්‍යමන්ද වලිත ග්‍රීවං පුනර් ‡ වීක්‍ෂිතම්

ආදෘෂ්ටි ප්‍රසරාත්, දසුන ඇතිතාක්; ප්‍රියස්‍ය, පෙම්වතා ගේ; පදවීම්, මඟ; උද්වීක්‍ෂ්‍ය, බලා; නිර්විණ්ණයා, (පෙම්වතාගේ නොඊම නිසා) දුකට පත්; අහඃ පරිණතෞ, දවස අවසනැ; ධ්වාන්තෙ, අඳුර; සමුත්සර්පති, පැතිරෙණ කල; පථිෂු, මඟ; විච්ඡින්නෙෂු, හිස්කල (මාගී සංචාරය රහිත කල); සශුචා, සොවටපත්; පාන්ථස්ත්‍රියා, මැඟියා ගේ ඉතිරිය විසින්; ගෘහං ප්‍රති, ගෙය කරා; එකං පදං දත්වා, එක් පියවරක් තබා අස්මින් ක්‍ෂණෙ, එ කෙණෙහිම; ආගතඃ මා භූත් ඉති, (හිමියා) නො ආහයි; අමන්දවලිත ග්‍රීවම්, වහා හරවන ලද කඳට ඇතිව; (වහා ගෙල හරවා යන අදහසි.) පුනඃ, යළි; වීක්‍ෂිතම්, බලන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

## කිවියා ගේ කිමක්

77 ආයාතෙ දයිතෙ මනොරථශතෛර්
නීත්වා කථංචිද්දිනං
§ වෛදග්ධ්‍යාපගමාජ්ජඩෙ පරිජනේ දීර්ඝාං කථාංකුර්වති
† දෂ්ටාස්මීත්‍යභිධාය සත්වරපදං § ව්‍යාධූය චීනාංශුකං
තන්වඞ්ග්‍යා රතිකාතරෙණ මනසා නීතඃ ප්‍රදීපඃ සමම්

‖ ප්‍රසරං † නිර් පිසමයා ‡ විශ්‍රාන්තෙෂු § සමුත්මීලති
† සොහුදගත ‡ වීක්‍ෂිතඃ § ගත්වා වාස ගෘහං
† දෘෂ්ටාමීත්‍ය § ව්‍යාධූනායත්‍යම්බරං

දයිතෙ, ප්‍රියයා; ආයාතෙ, ආකාල; මනොරථ ශතෛඃ, අදහස් සිය ගණනින් (බොහෝ අභිලාෂයන් ගෙන්); දිනම්, දහවල; කථංචිත්, දුකසේ; නීතා, ගෙවා; වෛදග්ධ්‍යාපගමාත්, (අප විසින් කුමක් කටයුතුද) අද කටයුතු නොකටයුතු පිරික්සුමෙහි අසමත් බැවින්; ජඩෙ, නුනුවණ; පරිජනෙ, පිරිවර දනා; දීර්ඝාං කථාම්, දිග කතා; කුර්විති (සති), කරන කල; රතිකාතරණෙන, රති විෂයයෙහි අධිර; මනසා, සිතැති; තන්වඞ්ග්‍යා, තුනුවඟ විසින්; දෂ්ටාසම් ඉති, (මම ගෝනුසු ආදී කිසියම් සපකු විසින්) ඩසිනු ලදිමියි; සත්වර පදම්, බිය ගෙන දෙන බස; අභිධාය, කියා; චීනාංශුකාංචාද්ධුය, පටවස්ත්‍රය සොලවා; ප්‍රදීපඃ, පහන; ශමං නීතඃ, නිවන ලදී;

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිසියම් විරහියෙක් පෙම්වතිය සිහි කෙරෙයි.**

78 ආලම්බ්‍යාඞ්ගණ ද්‍රීවාටිකා පරිසරෙ චූතද්‍රැමෙ මඤ්ජරිං
සර්පත් සාන්ද්‍ර පරාග ලම්පට † රටද්
භෘඞ්ගාඞ්ගනා ශොභිනිම්
‡ මන්‍යෙ ස්වාං තනුමුත්තරීය
ශකලෙනාවෙෂ්ට්‍ය බාලා ස්ඵුරත්
ද්‍රී කණ්ඨ ධ්වාන නිරොධ කම්පිත
කුචශ්වාසොද්ගමා රොදිති

අඞ්ගන වාටිකා පරිසරෙ, ගෙමිදුලෙහි වූ උයන සමීපයෙහි; චූතද්‍රැමෙ, මී අඹ රුකෙහි; සර්පත්, විසිරෙණ; සාන්ද්‍ර, ගන; පරාග ලම්පට, මල් රොනට ලොබින්; රටද්, නාදකරන; භෘඞ්ගාඞ්ගනා, බමරඟනන් ගෙන්; ශොභිනීම්, හොබනා; මඤ්ජරිම්, මල්කැන; ආලම්බ්‍ය, එල්බ (අල්ලාගෙන); බාලා, මුඬාව; ස්වාං තනුම්, සිය සිරුර; උත්තරීය ශකලෙන,

---

ද්‍රී වාපිකා † රණත්; පතද් ‡ තන්වෙෂා තනු
ද්‍රී කණ්ඨ ධ්වානනිරොධි කම්පිතකුච ශ්වාසොද්ගමං

උතුරුසළුවේ කොටසෙකිත්; ආචජ්ාද්‍ය, වස්‍ා; ස්ඵුරත්, පහලවන; කණ්ඨ ධ්වාන, කටසන (උගුරුහඩ); නිරොධ, නැවැත්වීමෙන්; කම්පිත කුච, කැපිකුසැත්තී (සැලෙන පියොවුරැත්තී); ශ්වාසොද්ගමා, සුසුම්ලත්නි; රොදති (ඉති), හඬතියි; මන්‍යෙ, හඟිමි; (පියොවුරු කම්පාකෙරෙමින් සුසුම් ලමින් හඬතියි සිතමි යන අදහසි.)

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිසියම් ප්‍රොෂිත භර්තෘකාවක් තමාට ම නින්‍දා කෙරෙයි.**

79 යාස්‍යාමීති සමුද්‍යතස්‍ය ගදිතං විස්‍රබ්ධමාකර්ණිතං
ගච්ජන් දූරමුපෙක්ෂිතො මුහුරසෞ
ව්‍යාවෘත්‍ය තිෂ්ඨන්නපි
තච්ඡූන්‍යෙ පුනරාශ්‍රිතාස්මි භවනෙ
ප්‍රාණාස්ත එතෙ දෘඪාඃ
සඛ්‍යස්තිෂ්ඨත ජීවිත ව්‍යසනිනී දම්භාදහං රොදිමි

සමුද්‍යතස්‍ය, (විදෙසකට යාමට) උත්සාහවත් මහිමියා ගේ; යාස්‍යාමි ඉති ගදිතම්, යෙමියි කී බස; විස්‍රබ්ධම්, විස්වස්ව; ආකර්ණිතම්, අසන ලදී; ගච්ජන්, යන; අසෞ, මෙතෙමේ (මහිමියා); මුහුඃ, වරින්වර; ව්‍යාවෘත්‍යා (මා අපෙක්ෂාවෙන්) හැරී; තිෂ්ඨන් අපි, සිටින්නේද; දූරං උපෙක්ෂිතඃ, දුර ගියේය; පුනඃ, යළි; තත් ශූන්‍යෙ භවනෙ, ඒ හිස් ගෙයි; ආශ්‍රිතාස්මි, සිටියෙමි (ගෙයි වසමි); එතෙ ප්‍රාණාඃ, (මගේ) මේ ප්‍රාණයෝ; දෘඪාඃ, දැඩියහ; සඛ්‍යඃ, යෙහෙළියෙනි; තිෂ්ඨත, (තොපි) සිටිවූ; ජීවිතව්‍යසනිනී, දිවි විපත රකිනු රිසි (ජීවිතාපෙක්ෂිණී); අහම, මම; දම්භාත්, ව්‍යාජයෙන් (බොරුවට); රොදිමි, හඬමි.

සාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**යෙහෙළියන් නායිකාව නියකොට කොපය දුරලවයි.**

80 අනාලොච්‍ය ප්‍රෙම්ණඃ පරිණතිමනාදෘත්‍ය සුහෘද-
ස්ත්වයාකාණ්ඩෙ මානඃ කිමිති†සරලෙ ! සංප්‍රති කෘතඃ
සමාකෘෂ්ටා හ්‍යෙතෙ ‡ ප්‍රලය දහනොද්භාසුර ශිඛාඃ
ස්වහස්තෙනාඞ්ගාරාඃ තදලමධුනාරණ්‍යරුදිතෛඃ

ප්‍රෙම්ණඃ, පෙමෙහි; පරිණතිම්, මිහිකිරීම (පරිපාකය); අනාලොච්‍ය, නොවිමසා නොහොත් නො පිරික්සා; සුහෘදඃ, යෙහෙළියනට; අනාදෘත්‍ය, අනදරකොට (ඔවුන් ගේ වචන නොපිළිගෙන); (හෙ) සරලෙ, (එම්බා) උදර තැනැත්තිය; (තරලෙයන පාඨ විසින් චපල තැනැත්තිය); ත්වයා, තී විසින්; සංප්‍රති, දැන්; කිමිති, මක්නිසා; මානඃ කෘතඃ, මානය කරන ලද්ද; හි, යම් හෙයකින්; ප්‍රලය දහන, කපණ ගින්න බඳු; උද්භාසුර, බබළන; ශිඛාඃ, ගිනිදළු ඇති; එතෙ අඞ්ගාරාඃ, මේ අඟුරු; ස්වහස්තෙන, සිය අතින්; සමාකෘෂ්ටාඃ, අදනාලද ද; තත්, එහෙයින්; අධුනා, දැන්; අරණ්‍ය රුදිතෛඃ, හිස් හැඬුමෙන්; අලම්, පලෙක් නොවේ;

ශිඛරිණී වෘත්තය යි

**නායකයෙක් නායිකාව සනසයි.**

81 කපොලෙ පත්‍රාලී කරතල නිරොධෙන මෘදිතා
නිපීතො නිඃශ්වාසෛරයමමෘත හෘද්‍යො'ධරරසඃ
මුහුඃ කණ්ඨෙ ලග්නස්තරලයති වාෂ්පඃ †ස්තනතටං
ප්‍රියො මන්‍යුර්ජාතස්තව නිරනුරොධෙ ! න තු වයම්

කපොලෙ, කොපුලෙහි; පත්‍රාලී, පතලේ (පත්‍ර රචනා); කරතල නිරොධෙන, අත්තල පීඩනයෙන්; මෘදිතා, මැකිණි; නිඃශ්වාසෛඃ, සුසුමෙන්; අයම්, මේ; අමෘත හෘද්‍යඃ, අමා බඳු

† තරලෙ; සරලෙ ප්‍රෙයසි ‡ විරහ දහනො
† ස්තනතටිං

මිහිරි; අධරරසඃ, තොල් රසය; නිරිතඃ, බොහලදී (වියලිණි යන අදහසි); වාෂ්පඃ, කඳුළු; කණ්ඨේ ලග්නඃ, ගෙලෙහි (උගුරෙහි) ලැගුණේ; ස්තන තටම්, පයොධර තටය (සනන ප්‍රාන්තය); මුහුඃ, වරින්වර; තරලයති, කම්පා කොරෙයි; (එවම්, මෙසේ); මනසුඃ, කොපය; තව, නිට; ප්‍රියඃ ජනඃ, වල්ලභයා විය (ප්‍රියයා විය); (හෙ) නිරනුරොධෙ, (එම්බා) නො අනුකූල තැනැත්තිය; වයා තු, අපි වනාහි; (ප්‍රියඃ) න, නිට වල්ලභ නොවෙමු; (මෙහි වයම් යන බුහු බසින් විෂාදය හඟවයි.)

ශිඛරිණී වෘත්තය යි

**කිවියා ගේ නිමක්:**

82 ශූන්‍යං වාසගෘහං විලොක්‍ය ශයනා
දුත්ථාය කිංචිච්ඡනෛර්
නිද්‍රාව්‍යාජමුපාගතස්‍ය සුචිරං නිර්‍ණ්‍ය පත්‍යුර්මුඛම්
විස්‍රබ්ධං පරිචුම්බ්‍ය ජාතපුලකාමාලොක්‍ය ගණ්ඩස්ථලිං
ලජ්ජා නම්‍රමුඛී ප්‍රියෙණ හසතා † බාලාචිරං චුම්බිතා

ශූන්‍යං වාස ගෘහම්, විවික්ත ක්‍රීඩා භවනය; විලොක්‍ය, බලා; ශයනාත්, යහනින්; කිඤ්චිත් උත්ථාය, මඳක් නැගිට; ව්‍යාජ නිද්‍රා උපගතස්‍ය, බොරු නින්දට පත්; පත්‍යුඃ, හිමියා ගේ; මුඛම්, මුහුණ; සුචිරං නිර්‍ණ්‍ය, බෝ කලක් බලා; (හොඳට පිරික්සා යූ සේයි.) විස්‍රබ්ධං පරිචුම්බ්‍ය, නිසැකව සිඹ; ජාතපුලකාම්, හටගත් ලොමුදහ ඇති; ගණ්ඩස්ථලිම්, කොපුල; ආලොක්‍ය, දැක; ලජ්ජා, විලියෙන්; නම්‍රමුඛී, නැමි මුවැති; බාලා, මුග්ධාව; හසතා ප්‍රියෙණ, සිනාසෙන හිමියා විසින්; චිරම්, බෝකලක්; චුම්බිතා, සිඹින ලදු.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

† බාලාභවච්චුම්බිතා

**නායිකාව විසින් නායකයාට නොයන ලෙස කියන ලද අන්‍ය නායිකාවක වෙත ගිය නායකයා ගේ චරිතය හා එයින් කිපි නායිකාව ගේ ව්‍යාපාරය කිවියා මෙසේ දක්වති.**

83 § ලොලද් භ්‍රෑලතයා විපක්ෂ
දිගුපන්‍යාසෙ † විධූතං ශිර–
ස්තද්වෘත්තාන්ත නිරීක්ෂණෙ කෘත
නමස්කාරො විලක්ෂඃ ස්ථිතඃ
‖ කොපාත් තාම්‍ර කපොල භිත්තිනි මුඛෙ
දෘෂ්ට්‍යා ‡ ගතඃ පාදයො–
රුත්සෘෂ්ටො ගුරුසන්නිධාවපි
විධිර්ද්වාභ්‍යාං න කාලොචිතඃ

ලොලත්, සැලෙන; භ්‍රෑලතයා, බැමලියෙන්; විපක්ෂ රමණී දිග්, සපත්නිය ගේ (ගෙය පිහිටි) දිග; උපන්‍යාසෙ (සති), දක්වූ කල; (නායිකයා, නායිකාව විසින්); ශිරඃ, හිස; අවධූතම්, සොලවන ලදී; (නායකඃ අපි, නායකයා ද); තත්වෘත්තාන්ත නිරීක්ෂණෙ, ඒ හිස සෙලවීම දැකීමේ දී; විලක්ෂඃ ස්ථිතඃ, කුමක් කටයුතුදැයි නොදත්තේ නොහොත් විලියට පත්ව සිටියේ; නමස්කාරඃ, ප්‍රණාමය; කෘතඃ, කරන ලද්දේ ය; කොපාත්, කොපින්; තාම්‍ර කපොලභිත්තිනි, තඹ පැහැ කොපුල් තලැති; මුඛෙ (සති), (ඇගේ) මුව ඇති කල; දෘෂ්ට්‍යා, බැල්මෙන්; පාදයොඃ, දෙපාමුල; ගතඃ, වැටුණේය; (දෙපාමුලට බැල්ම හෙළී යුසේයි.) ගුරුසංනිධෞ අපි, නැදිමයිල් හමුවෙහි ද; ද්වාභ්‍යාම්, දෙදෙනා විසින්; කාලොචිතඃ විධිඃ, තැනට සුදුසු කිස; න උත්සෘෂ්ටඃ, අත් නොහරන ලදී.

---

§ ලොලභ්‍රෑලතයා † විධූතං ‡ ඊෂත් තාම්‍ර කපොල කාන්තිනි ‖ නතඃ

**යෙහෙළියන් විසින් මානය ඉපැදවීමට උවදෙස් දුන් නායිකාවක් එහි නො පිහිටිය හැකිව බවුනට මෙසේ කියයි.**

84 ජාතා නොත්කලිකා තනෞ න ලුලිතෞ
ගාත්‍රං න රෝමාඤ්චිතං
වක්ත්‍රං † ස්වෙදකණාන්විතං න
සහසා යාවච්ඡලේනාමුනා
දෘෂ්ටෙ නෛව මනො හෘතං ධෘතිමුෂා
ප්‍රාණේශ්වරේණාද්‍ය මෙ
‡ තත්කෙනාත්‍ර නිරූප්‍යමාණ නිපුණො
මානඃ සමාධීයතාම්

උත්කලිකා, උත්කණ්ඨාව; න ජාතා, නොවී; තනෞ, දෙතන; න ලුලිතෞ, කම්පා නොවී (නොසැලුණි); ගාත්‍රම්, අවයව; න රෝමාඤ්චිතම්, ලොමුදහ නොවී; වක්ත්‍රම්, මුව; න ස්වෙද කණාන්විතම්, සෝ දියෙන් යුක්ත නොවී; (එහෙත්) යාවත්, යම් හෙයකින්; ධෘතිමුෂා, ඳිරිය පැහැර ගන්නා; ඡලේන, කපටි; අමුනා ප්‍රාණේශ්වරේණ, මේ පණිසුරා විසින්; මනඃ, මගේ සිත; දෘෂ්ටෙන එව, බැල්මෙන් ම; හෘතම්, පැහැර ගන්නා ලදී; තත්, එහෙයින්; අත්‍ර, මෙහිලා; නිරූප්‍යමාණ නිපුණඃ, කාර්‍යසිද්ධියෙහි සමත්; මානඃ, කොපය; කෙන, කවරකු විසින්; සමාධීයතාම්, පිහිටවනු ලැබේ ද.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

85 ‖ දෘෂ්ටඃ කාතර නෙත්‍රයා චිරතරං බද්ධාඤ්ජලිං යාචිතඃ
† පශ්චාදංශුක පල්ලවෙන විධෘතො නිර්ව්‍යාජමාලිඞ්ගිතඃ
‡ ඉත්‍යාක්ෂිප්‍ය යදා සමස්තමඝෘණො
ගන්තුං ප්‍රවෘත්තඃ ශඨඃ
පූර්වං ප්‍රාණ පරිග්‍රහො දයිතයා මුක්තස්තතො වල්ලභඃ

---

† ස්වෙදකණාඤ්චිතං ‡ තත් කෙනාත්‍ර නිරූප්‍යශංස නිපුණෙ මානඃ සමාධීයතෙ
‖ දෘෂ්ටඃ කාතරසා දෘශා ද්‍රුතතරම් † පශ්චාදංශුක පල්ලවෙ
‡ ඉත්‍යාක්ෂිප්‍ය සමස්ත එවමඝෘණො

කාතර නෙත්‍රයා (නායිකාවා), දීන නෙත් ඇති (නායිකාව විසින්); චිරතරම්, බෝකලක්; දෘෂ්ටඃ, අවලෝකනය කරන ලදී; (තතඃ, ඉක්බිති); බද්ධාඤ්ජලීම්, ඇඳිලි බැඳ; යාචිතඃ, අයැදනා ලදී; පශ්චාත්, පසුව; අංශුක පල්ලවෙන, වත් කෙළවරින් (වස්ත්‍ර ප්‍රාන්තයෙන්); විධෘතඃ, ගන්නා ලදී; (තතඃ, එයට පසු); නිර්ව්‍යාජම්, ව්‍යාජ රහිතව; ආලිඞ්ගිතඃ, වැළඳගන්නා ලදී; ඉති, මෙසේ; සමස්තම්, දශීනාදි සියල්ල; ආක්ෂිප්‍ය, බැහැර ලා; යදා, යම් කලෙක; අකාරුණ්‍යා, දයා විරහිත; ශඨඃ; කපටි හිමියා; ගන්තුං ප්‍රවෘත්තඃ, යාමට උත්සාහවත් වීද; (තදා, එකල;) දයිතයා, බිරිඳ විසින්; ප්‍රථමම්, පළමුව; ප්‍රාණ පරිග්‍රහඃ, ජීවිතාශාව; මුක්තඃ, දුරු කරන ලදී; (අනන්තරම්, ඉක්බිති); වල්ලභඃ මුක්තඃ, හිමියා දුරුකරන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිසියම් වියෝගියෙක් දයිතාංවගේ වියෝදුක සිහි කෙරෙති.**

86 තප්තෙ මහා විරහ වහ්නි ශිඛාවලීහි -
රාපාණ්ඩුරස්තනතටෙ හෘදයෙ ප්‍රියායාඃ
‖මන්මාගී වීක්ෂණ නිවෙශිත දීන දෘෂ්ටෙ-
‡ර් නූනං ඡමච්ඡමිති බාෂ්පකණාඃ පතන්ති

විරහ වහ්නි ශිඛාවලීහිඃ, වියෝගිනිදලු වැළින්; ආපාණ්ඩු රස්තන තටෙ, මඳක් පඬුවත් පියොවුරු තලැති; ප්‍රියායාඃ, පෙම්වතිය ගේ; තප්තෙ, තැවුණු; හෘදයෙ, හදෙහි; මත්, මාගේ; මාගී වීක්ෂණ නිවෙශින, මග බැලීමට පිහිටුවන (යොදන); දීන දෘෂ්ටෙඃ, බැගෑ නෙතින්; ඡමච්ඡමිති, ඡම ඡමයන හඬැති; බාෂ්පකණාඃ, කඳුළු බිඳුහු; නූනම්, එකාන්ත යෙන්; පතන්ති, වැටෙත්.

වසන්තතිලකා වෘත්තය යි.

---

‖ රථ්‍යාලි වීක්ෂණ නිවෙශිත ලොල දෘෂ්ටෙඃ
‡ නූනං ඡනච්ඡනිති

**යෙහෙළියක් මාිනියක ගේ පවත් අන් යෙහෙළියකට මෙසේ පවසයි.**

87 ‖විනතා මොහ විනිශ්චලෙන මනසා
මෞනෙන පාදනතා
†ප්‍රත්‍යාඛ්‍යාන පරාඞ්මුඛඃ ප්‍රියතමො
ගන්තුං ‡ ප්‍රවෘත්තො’ ධුනා
සව්‍රීඩෛරලසෛර් නිරන්තර
ලුඨද්බාෂ්පාකුලෛරීක්ෂණෛඃ
ශ්වාසොත්කම්පිතකුචං නිරීක්ෂ්‍ය
සුචිරං * ජීවාශයා වාරිතඃ

විනතා මොහ, (පහදී ද නොපහදී ද යන) යිතිවිලි මූලායෙන්; විනිශ්චලෙන මනසා, දෙගිඩියා සිතින් යුත්; මෞනෙන, කිසිවක් නො බිණීමෙන්; පාදනඃ, පා වැදී; ප්‍රත්‍යඛ්‍යාන පරාඞ්මුඛඃ, නිරාකරණයෙන් විමුඛ වූ: අධුනා, දැන් ගන්තුං ප්‍රවෘත්තඃ, යාමට උද්‍යුක්ත වූ; ප්‍රියතමඃ, පෙම්වතා; ජීවාශයා (තයා); දිවියෙහි ආසා ඇති ඈ විසින්; සව්‍රීඩෛඃ, විළිඇති; අලසෛඃ, මන්‍දසංචාරී; නිරන්තර ලුඨත්, නිතර ගලන; බාෂ්ප + ආකුලෛඃ, කඳුලෙන් යුත්; ඊක්ෂණෛඃ, නෙතින්; ශ්වාසොත්කම්පිත කුචම්, සුස්මෙන් සෙලවෙන පියවුරු ඇතිව; සුචිරම්, බෝ වේලාවක්; නිරීක්ෂ්‍ය, බලා; වාරිතඃ, නවත්වන ලදී.

---

‖ විනතා මොහ තිබධ්‍ය මාන මනසා † ප්‍රත්‍යාඛ්‍යාන
‡ ප්‍රවෘත්තඃ ශඨඃ ☉ තත්‍වඞ්ගත්‍යා ස ප්‍රතසතයා තරලයා තත්‍රාන්තරෙවාරිතඃ; ශ්වාසොත්කම්ප කුචං
* ජීවේශයා

**වෙමතුපාලයන් ගේ අරුත් පැවසිම මෙයට වෙනස් වේ. ඔහු ගේ ශ්ලෝකය හා අරුත් මෙහි පහත පළවේ.**

චින්තා මෝහ නිබද්ධමාන මනසා මෞනෙන පාදානතඃ
ප්‍රත්‍යාඛ්‍යාත පරාඞ්මුඛඃ ප්‍රියතමෝ ගන්තුං ප්‍රවෘත්තඃ ශඨඃ
සව්රීඩෛරලසෛර් නිරන්තර
ලුලිතද්බාෂ්පාකුලෛරීක්ෂණෛ-
ස්තත්වඞගයා ස පුනස්තයා තරලයා තත්‍රාන්තරෙ වාරිතඃ

ශඨඃ ප්‍රියතමඃ, කපටි පෙම්වතා; පාදානතඃ (සන්), පාවැඳි යේ; චින්තා මෝහ, විචාරයෙන් හටගත් මෝහයෙන්; නිබද්ධ මාන මනසා, බැඳුණු සිත් ඇති; තයා තත්වඞගයා, ඒ තුනු වඟ විසින්; මෞනෙන, නො බිණීමෙන්; ප්‍රත්‍යාඛ්‍යාතඃ, නිරස්ත; සඃ, හෙතෙමේ; පරාඞ්මුඛඃ (භූත්වා), විමුඛ වී; ගන්තුම්, යන්නට; ප්‍රවෘත්තඃ, උත්සාහවත් වි; තත්‍රාන්තරෙ, ඒ අවසර යෙහි; තරලයා (තයා),අධීරවූ ඈ විසින්; ස ව්‍රීඩෛඃ, ලජ්ජා සහිත; අලසෛඃ, මන්ද සංචාර ඇති; නිරන්තර ලුලිතද්, නිතර ගලන; බාෂ්පාකුලෛඃ, කඳුලෙන් කලුෂ වූ; ඊක්ෂණෛඃ, බැල්මෙන්; පුනඃ, යළි; වාරිතඃ, නවත්වන ලදී.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**විදෙස් ගතයෙක් පෙරළා පැමිණි සිය පෙම්වතිය හා ලත් සමාගමය මෙසේ පවයසි.**

88 ම්ලානං පාණ්ඩු කෘශං ‖ වියෝග
විධුරං † ලම්බාලකං සාලසං
භූයස්තත්ක්ෂණ ජාත කාන්ති ‡ රභස
ප්‍රාප්තෙ මයි ප්‍රෝෂිතෙ
සාටෝපං රතිකෙලි ∂ කාලසරසං රම්‍යං කිමප්‍යාදරා-
ද්‍යත් * පීතං සුතනෝර්මයා ‖ වදනකං
වක්තුං න තත් පාර්‍යතෙ

‖ විලාස විධුරං † ලම්බාලකාන්තෙන මයා ‡ මධුරං
∂ දන්ත රසසං * පීතයත් ‖ මුඛවිදං තත් කෙන
විසමාපීතෙ

(පූර්වම්, පෙර); ම්ලානම්, මැලවුණු; පාණ්ඩු, පඬුපැහැ; කෘශම්, කෙට්ටු; වියෝග විධුරම්, වියෝවින් දුකට පත්; (වියෝගයත්න ම්ලාන ආදී සෙසු පද හාද සම්බන්ධ කටයුතු). ලම්බාලකම්, විසුරුණු කෙස් ඇති; සාලසම්, අලසවත් (ජඩ්‍ය); (තතඃ, ඉක්බිති); ප්‍රොෂිතෙ, විදෙස් ගිය; මයි, මා; රහස, වහා; ප්‍රාප්තෙ (සති), පැමිණි කල; භූයඃ, යළි; තත් ක්‍ෂණ, එකෙණෙහි; ජාත කාන්ති, හටගත් පැහැ ඇති; සාටොපම්, සගර්ව (එඩිවත්); රතිකෙලිකාලසරසම්, රති ක්‍රීඩා සමයයෙහි ආර්ද්‍රවත්; රම්‍යම්, මනහර; සුතනොඃ, මනා සිරුරැතිය ගේ; යත් වදනකම්, යම් සිහිනි වුවනක්; මයා, මා විසින්; කිමප්‍යාදරාත්, ඉමහත් අදරෙකින්; පීතම්, (සිඹීම් අයුරෙන්) බොන ලදද; තත්, එය; වක්තුම්, කියන්නට; න පාර්‍ය්‍යතෙ, නොහැකි වේ.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

69 සෛවාහං ප්‍රමද † නෘණාමධිගතාවෙතෞ

ච තෞ නූපුරා-

වෙෂාසම්‍ාසා‡මවෘත්තිරෙව සහජව්රීඩාධනඃ සත්‍රීජනඃ

ඉත්‍ථං ලජ්ජිතයා සම්‍ෘතෙරුපගමෙ ¿ මත්‍වා

තනුං සංභ්‍රමාත්

පුංභාවඃ ප්‍රථමං රතිව්‍යතිකරෙ මුක්‍තස්‍තතො වල්ලභඃ

සා එව අහං ප්‍රමදා, ඒ මම ම ප්‍රකෘෂට මද ඇත්තියක් වීමි; නෘණාං අධිගතා, මිනිසුන් විසින් දත් තැනැත්තියක් වීමි; එතෞ ච තෞ නූපුරෞ, මේ ඒ පාවලලු ද වේ; එෂා, මෙය; අසම්‍ංකම්, අපගේ; වෘත්තිඃ එව, වෘත්තිය ම වේ; සත්‍රීජනඃ, ස්ත්‍රීහු; සහජ ව්රීඩා ධනඃ, පියව්යෙන් විලිය ධන කොට

† නෘණාමනුචිතාවෙතෞ යතො ‡ මවෘත්තිරෙෂ ¿ සවාමෙව මත්‍වා තනුං

ඇත්තෝ වෙති; ඉතළම්, මෙසේ; රතිව්‍යති කරෙ, පුරුෂාසිත යෙහි දී; සම්‍යතෙඃ උපගමෙ, සිහිපත් කල; ලජ්ජිතයා (තයා); විලිපත් ඈ විසින්; සංභ්‍රමාත්, අවුලින් (පයිාකුලතායෙන්); තනුං මත්වා, තුනුව දැන; ප්‍රථමම්, පළමුව; පුංභාවඃ මුක්තඃ, පුරුෂ භාවය මුදන ලදී; තතඃ, පසුව; වල්ලභඃ මුක්තඃ, හිමියා මුදන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිවියාගේ කිමක්**

90 කර කිසලයං ධූත්වා ධූත්වා † විමාගීති වාසසී
ක්ෂිපති සුමනො මාලාශෙෂං ප්‍රදීපශිඛාං ප්‍රති
ත්‍යගයති මුහුඃ පත්‍යුනේත්‍රං විහස්‍ය සමාකුලා
‡ සුරත විරතා රම්‍යා තන්වී මුහුර්මුහුරීක්ෂතෙ

සුරත විරතා, රතිය අවසන් කළ; රම්‍යා තන්වී, රමණීය තුනුවහ; කරකිසලයම්, අත් ලිය (පාණි පල්ලවය; ධූත්වා ධූත්වා, සොලවමින්; වාසසී, වත (වස්ත්‍රය); විමාගීයති, (අඳිනු සඳහා) සොයයි; සුමනො මාලා ශෙෂම්, සමන් මල් මාලාවෙන් කොටසක්; දීපශිඛාං ප්‍රති, පහන් දැල්ලට; ක්ෂිපති, (පහන නිවන පිණිස) හෙළයි; විහස්‍ය, සිනාසී; සමාකුලා (විලියෙන්) කලබල වූවා; මුහුඃ, වරින්වර; පත්‍යුනේත්‍රම්, හිමියා ගේ නෙත; ත්‍යගයති, වසයි; මුහුඃ මුහුඃ, වරින් වර; ඊක්ෂතෙ, (හිමියා දෙස) බලයි.

හරිණී වෘත්තය යි.

---

† විලම්බිත මෙඛලා පුනඃ පුනරීක්ෂතෙ

‡ සුරත විරතෞ රම්‍යං තන්වී

**කිසියම් යෙහෙළියක් මානවත් නායිකාවක බිය ගන්වා නායකයා සමීපයට යවයි.**

91 සන්ත්‍යෙවාත්‍ර ගෘහෙ ගෘහෙ යුවතයස්තාඃ
පෘච්ඡ ගත්වාධුනා
ප්‍රෙයාංසඃ ප්‍රණමන්ති කිං තව පුනර්දසො
යථා වර්තතෙ
ආත්ම ද්‍රොහිණි ! † දුර්ජනෛඃ ප්‍රලපිතං
කර්ණෙතිශං මා කෘථා
ශ්ජින්න ස්නෙහ රසා භවන්ති පුරුෂා
‡ දුඃඛානුවර්ත්‍යාඃ පුනඃ

අත්‍ර, මේ නගරයෙහි නොහොත් ගමෙහි; ගෘහෙ ගෘහෙ, ගෙයක් ගෙයක් පාසා; යුවතයඃ සන්ති, යුවතිහු වෙති; තව (ප්‍රෙයාත්) පුනඃ, ති ගේ ප්‍රියතමයා වනාහි; දසඃ යථා වර්තතෙ, දසකු මෙන් පවති (දසකු මෙන් කිට වදියි); ප්‍රෙයාංසඃ, (මෙහි වෙසන සෙසු) පෙම්වත්හු; ප්‍රණමන්ති කිම්, (ඔවුන් ගේ පෙම්වතියනට) වදිත් දැයි; අධුනා, දැන්; ගත්වා, ගොස්; තාඃ, ඔවුන්; පෘච්ඡ, විචාරව; ආත්ම ද්‍රොහිණි, තමහටම සැතිරියක් වන්නිය; දුර්ජනෛඃ ප්‍රලපිතම්, දුදනන් විසින් කියන ලද බස්; කර්ණෙ, කනෙහි; අතිශම්, නිතර; මා කෘථා නොකර; (මක්තිසාද ?) ජින්න සෙනහරසා පුරුෂාඃ, සුන් සනා රසැති පුරුෂයෝ; පුනඃ, යළි; දුඃඛානුවර්ත්‍යාඃ භවන්ති, දුකට අනුව පවතිත්; එහෙයිනි).

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

---

† දුර්ජන ප්‍රලපිතං කර්ණේ භාශං; කර්ණේ විෂම්

‡ දුඃඛානුවෘත්‍යා යතඃ

**යෙහෙළියන් ගේ උවදෙසින් මන් උපදවා නායකයා දුරුකොට පසුව තැවෙන නායිකාවක ගේ කිමක්**

92 නිඃශ්වාසා වදනං දහන්ති හෘදයං නිර්මූල ‖මුන්මථ්‍යතෙ
නිද්‍රා නෛති න දෘශ්‍යතෙ ප්‍රියමුඛං නක්තං දිවං රුද්‍යතෙ
† අඞ්ගං ශොෂමුපෛති පාද පතිතඃ
ප්‍රෙයාංස්තදෙ පෙක්ෂිතඃ
සඛ්‍යඃ! කං ගුණමාකලය්‍ය දයිතෙ
මානං ‡ වයං කාරිතාඃ

පාදපතිතඃ, (මා) පාවැදි; ප්‍රෙයාන්, පෙම්වතා; තදා, එදින; උපෙක්ෂිතඃ, අවමන් කරන ලදී; (තෙන, එහෙයින්); නිඃ ශ්වාසා, සුසුම්හු; වදනම්, මුවන; දහන්ති, දවති; හෘදයම්, හද; නිර්මූලම්, මුළුමනින්ම; උන්මථ්‍යතෙ, මඩිනු ලැබේ; නිද්‍රා නෛති, නින්ද නොඑයි; ප්‍රියමුඛම්, පියමුහුණ; න දෘශ්‍යතෙ, නොදක්නා ලැබේ; නක්තං දිවම්, රෑ දෙවෙහි; රුද්‍යතෙ, හඬනු ලැබේ; අඞ්ගම්, සිරුර; ශොෂම්, වියැළුමට; උපෙති, පැමිණේ; (හෙ) සඛ්‍යඃ, (එම්බා) යෙහෙළියෙණි; කං ගුණං ආකලය්‍ය, කවර නම් ප්‍රයෝජනයක් සලකා; වයම්, අපි; දයිතෙ, පෙම්වතා කෙරෙහි; මානං කාරිතාඃ, (තොප විසින්) මානය කරවන ලද්දෙම් ද.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිසියම් මානනියක් තම පෙම්වතාගෙන් යළි වියොවීම ගැන මෙසේ දුක්වෙයි.**

93 *අද්‍යාරභ්‍ය යදි ප්‍රියෙ පුනරහං මානස්‍ය වා’න්‍යස්‍ය වා
†ගෘහ්ණීයාං ශඨදුර්නයෙන
මනසා නාමාපි සංක්ෂෙපතඃ

‖ උන්මූල්‍යතෙ † කණ්ඨඃ ශොෂම් ‡ තථොපෙක්ෂිතඃ
* අද්‍යාරභ්‍ය න හි ප්‍රියෙ පුනරහං මානස්‍ය වා භාජනම්
† ගෘහ්ණීයාං විෂ රූපිණඃ ශඨමතෙ නාමාපි

‡තත් තෙනෛව විනා ⁋ ශශාඞ්ක ධවලාඃ
¿ සපෂ්ටාට්ටහාසා නිසා
†එකො වා දිවසඃ පයොද මලිනො
යාසාන්මම ප්‍රාවෘෂි

යදි, ඉදින්; අන්‍යූරභ්‍ය, අදසිට; පුනඃ, යළි; අහම්, මම; ප්‍රියෙ, වල්ලභයා කෙරෙහි; කොපස්‍ය වා, කොපයෙහි හෝ; අන්‍යස්‍ය වා, (පරිචරණ ප්‍රසාදදි) අන් දෙයක හෝ; ශඨ දුර්නයෙන මනසා, කපටි දූර්නය සිතෙකින්; (බොරු දෙස් පැවැරීමෙකින් යන අදහසි); නාමාපි, ඒ නමක්වත්; ග්‍රාහ් ණීයාම්, ගත්තෙම් නම්; තත්, ඒ හෙතුකොට ගෙන; සංක්‍ෂෙපතඃ, සැකෙවින් (ඉතා අඩුනරමින්); තෙන විනා එව, ඔහුගෙන් වෙන්වම; ශශාඞ්ක ධවලාඃ, සඳින් සුදුවූ (සඳ රසින් සුදුවූ); ස්පෂ්ටහාසා (ඉව), පැහැදිලි සිනාවක් බඳුවූ; නිසා, යාමිනීහු; (යානතු, යෙත්වා; අත එව, එසේම); මම, මට; පයොදමලිනාඃ, ගනකුළෙන් අඳුරුවූ; එකො වා දිවසඃ, එකම දිනයක් හෝ; යාසාත්, යේවා.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

**යෙහෙළියක් පෙර තමාට පුරුදු විත්ත වෙදනාවෙකින් නව මානිනියකට කරුණු අවබොධ කරවයි.**

94 ඉදා නාශණා නාශ්ණා ප්‍රියතම ⁋ තනු ශෙවතමථ කිං
† ගමිස්‍යාමො යාමො භවතු ගමනෙනාථ භවතු
පුරා යෙනෛවා මෙ චිරමනුසෘතා චිත්තපදවී
ස එවානෙ‍ය්‍යා ජනඃ සඛි ! ‡ පරිචිතාඃ කස්‍ය පුරුෂාඃ

---

‡ කිං තෙනෛව ⁋ ශශාඞ්ක කිරණ ස්පෘෂ්ට
¿ ස්පෂ්ටාට්ට හාසාඃ † නෛකො වා
⁋ නාභිශෙවතමථ කිං † ගමිස්‍යාමො භද්‍රෙ භවතු
ගමනෙනාලමනිශම් ‡ පරිචිතඃ කස්‍ය පුරුෂඃ

හෙ) ප්‍රියතම, (එම්බා) පෙම්වත; ඉදං කාෂ්ණම්, මෙය කළුය; (සඃ ආහ, හෙතෙම කිය); කෘෂ්ණම්, (ඔව්) කළුයි; නනු ශෛවතම්, සුදු නොවේද; (සඃ ආහ, හෙතෙමේ කීහ); අථ කිම්, ඉතින් කිම; ගමිෂ්‍යාමඃ, යමු; (සඃ ආහ, හෙතෙමේ කීහ); යාමඃ, යමු; භවතු ගමනෙන, ගමනින් වැළෙක් නොවේ; (සඃ ආහ යනු සබඳි) අථ භවතු, එහෙනම් එසේ වේවා; පුරා, පෙර; යෙන, යමකු විසින්; චිරම්, බෝ කලක්; මෙ, මාගේ; චිත්ත පදවී, සිතෙහි වූ අදහස්; අනුසෘතා, අනුව යන ලද්දේ ද; (හෙ) සඛි, (එම්බා) මිතුරිය; සඃඑව, හෙතෙමේ ම; අන්‍යඃ ජනඃ, (දැන්) අනිකෙක් විය; පුරුෂාඃ, පුරුෂයෝ; කස්‍ය, කවරකුට; පරිචිතාඃ, ළැදි වෙත් ද; (ඔවුහු කිසිවකුට ළැදි නොවෙත්).

සෙහෙළිය මගේ පෙම්වතා පෙර මා කී කී දෙය එසේම බාරගති. දැන් හෙතෙමේ එසේ නොවේ. දැන් වෙනස් කෙනෙකි; හැම මිනිස්සු ම ඔබඳු වෙති. කවරකුට නම් ළැදිවෙත් ද ඔවුහු තොප ප්‍රියයා කෙරෙහි තොප ගේ වරදෙක් විය හැක. එබැවින් මානය හරුව යනු මෙහි අදහසයි.

ශිඛරිණී වෘත්තය යි.

**නායිකාවක් හදත දුනු කොපය ක්‍රියාවෙහි නොයොදවා එහිම රඳවයි.**

95 චරණ පතනං † සඛ්‍යාලාපා මනොහර චාටවඃ
කෘශතරතනො ගාඪාශ්ලෙෂො හඨාත් පරිචුම්බනම්
‡ඉති හි චපලො මානාරම්භස්ත*ථාපි හි නොත්සහෙ
*හෘදයදයිතඃ කාන්තඃ කාමං කිමත්‍ර කරොම්‍යහම්

(සාසාලාපා මනොහර චාටවඃ යන පාඨ විසින් හැඬුම් බස් හා ඉමහත් පියබස් යන අරුති). කෘශතර තනොඃ, ඉතා කෙට්ටු සිරුරේ; ගාඪාශ්ලෙෂ්‍ය, දැඩි වැළඳ ගැන්ම;

† සාස්‍රාලාපාඃ; සාන්ත්වාලාපාඃ ‡ ඉති බහුළලො; ඉතිච බහුලො * තථාපිච * හෘදය දයිතා කාන්තා

(හිමියා විසින් මා ගේ දුබල සිරුර වැලඳ ගැනුම යන අදහසයි.) හඨාත්, බලයෙන්; පරිචුම්බනම්, සිඹුම; ඉතිහි, මේ අයුරු නොහොත් මෙසේ; මානාරම්භඃ, මන් ඇරඹුම; චපලඃ, චපලය; (සඵලඃ යන පාඨ විසින් මන් ඇරඹුමේ මෙබඳු පලවේ.) තථාපිහි, එසේවුවත්; න උත්සහෙ, (එයට) උත්සාහ නොකෙරෙමි; (මක්නිසාද ?) කාන්තඃ, හිමියා; කාමම්, නිසැකින්ම; හෘදය දයිතඃ, හෘදය ස්වාමීය; (එබැවිනි.) අත්‍ර, මෙහි ලා; අහම්, මම; කිං කරොමි, කුමක් කෙරෙම් ද

වෙමභූපාලයෝ මෙය "මානය කරව. එහි ගුණ බොහෝ වෙති" යි ශෙහෙළියන් විසින් උවදෙස් දුන් නායිකාවක ගේ කිමෙකැයි යෙති.

හරිණ් වෘත්තය යි

**නායකයෙක් තම විරහෝත්කණ්ඨිතා නායිකාව ගැන මෙසේ සිතයි.**

96 තත්වඞ්ගයා ගුරු සන්නිධෞ නයනයො
ර්යද්වාරි සංස්තම්භිතං
තෙනාන්තර්ගලිතෙන මන්මථ ශිඛී
‖ සිත්කොතා වියොගොද්භවඃ
මන්‍යෙ තස්‍ය නිරස්‍යමාන කිරණස්‍යෙෂා
† මුඛෙනොද්ගතා
‡ශ්වාසායාස සමාකුලාලිසරණී ව්‍යාජෙන ධූමාවලී

තත්වඞ්ගයා, තුනුවග විසින්; නයනයොඃ, දෙනෙත්හි; යත් වාරි, යම් දියෙක් (කඳුළු) වී ද; (තත්, එය;) ගුරු සන්නිධෞ, දෙගුරුන් හමියෙහි; සංස්තම්භිතම්, නවත් වන ලදී; අන්තර්ගලිතෙන තෙන, ඇතුළෙහි පැතුරුණු ඒ දියෙන්; වියොගොද්භවඃ, වියොවින් හටගත්; මන්මථ ශිඛී,

‖ සිත්කොතානුෂඞ්ගොද්භවඃ; සිත්කානස්‍ය † මුඛාදුද්ගතා
‡ ශ්වාසාමොද සමාකුලාලි නිකර ව්‍යාජෙන ධූමාවලී

අනඝ ගිත්න; සික්තඃ, තෙමන ලදී; තස්‍ය තිරස්‍යමාන කිරණඃ, ඒ පිටවෙන ගිත්තේ; ධූමාවලිඃ, දුම්වැල; ශ්වාසායාස, සුසුම් වෙසින්; සමාකුල, අවුල්වූ (එහි මෙහි විසුරුණු); අලිසරණී ව්‍යාජෙන, බමර ගණ අයුරින්; මුඛෙන + උද්ගතා (ඉති), මුවෙන් පිටවීයැයි; මන්‍යෙ, හඟිමි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**මාන කැරුමට යෙහෙළියන් උපදෙස් දුන් නායිකාවක් බවුනට මෙසේ කියයි.**

97 භ්‍රූභෙදෙ ගුණිතශ්චිරං නයනයොරභ්‍යස්තමාමීලනං
රොද්ධුං ශික්ෂිතමාදරෙණ හසිතං
මෞනෙඅභියොගඃ කෘතඃ
ධෛර්‍ය්‍යං † කර්තුමපි ස්ථිරීකෘතමිදං
චෙතඃ කථංචින්මයා
‡ බද්ධො මානපරිග්‍රහෙ පරිකරඃ
සිද්ධිස්තු දෛවෙ ස්ථිතා

භ්‍රූභෙදඃ, බැම බිඳුම්; චිරම්, බෝ වේලාවක්; ගුණිතඃ, පවත්වන ලදී; නයනයොඃ, දෙනෙතේ; අමිලනම්, මදක් හැකිළීම; අභ්‍යස්තම්, කරනලදී; ආදරෙණ, අදරින් (හටගත්); හසිතම්, මඳසිනාව; රොද්ධුම්, නවතනුවට; ශික්ෂිතම්, හික්මවන ලදී; (සිනාව නවතාගතිමි යුසේයි.) මෞනෙ, මුනිවතෙහි (ගොළු බවෙහි); අභියොගඃ, උත්සාහය (ආස්ථාව); කෘතඃ, කරන ලදී; ඉදං චෙතඃ අපි, මේ සිත ද; ධෛර්‍ය්‍යං කර්තුම්, දිරි වඩනට; ස්ථිරීකෘතම්, තිරබවට පමුණු වන ලදී; (එවම්, මෙසේ;) මයා, මා විසින්; මාන පරිග්‍රහෙ, මත් ඉපයුමෙහි; පරිකරඃ, ඇමසි කරුණු (කොපය ඇති කැරුමට උවමනා සියල්ල); කථඤ්චිත්, දුකසේ (ඉතා

† කතීමපීහිතං ධෘතමිදං ‡ සජ්ජො

අමාරුවෙන්); බද්ධඃ, බඳනාලදී (කරනාලදී); සිද්ධිස්තු, එහි සිද්ධිය වනාහි; දෛවෙ සපිතා, භාග්‍යයෙහි පිහිටියේය; (මානය කැරුමට උවමනා සියල්ල කෙළෙමි. මානය ඉපදුනා ද නැද්ද යනු මම නො දනිමි යනු අදහසි).

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

**නායකයකු විසින් ප්‍රලොභිත නායිකාවක් යෙහෙළියකට මෙසේ කියයි.**

98 අහං තෙනාහූතා කිමපි කථයාමීති විජනෙ
සමීපෙ චාසීනා ‡ සරස හෘදයත්වාදවහිතා
තතඃ කර්ණෝපාන්තෙ කිමපි වදතාඝ්‍රාය වදනං
† ගෘහීතා ධම්මිල්ලෙ සඛි ! ස ච මයා ගාඪමධරෙ

(හෙ) සඛි, (එම්බා) යෙහෙළිය; අහම්, මම; තෙන, ඒ කපටියා විසින්; විජනෙ, රහස්හි (දනා නැති තැනෙක); කිමපි කථයාමි ඉති, කිසිවක් කියමියි; ආහූතා, කැඳවන ලද්දෙම්; සමීපෙ, (ඔහු) ළඟ; ආසීනා ච, හුන්නිද; සරස හෘදයත්වාත්, නොවක් හඳුති බැවින්; අවහිතා (සමි), අවධාන සහිතව සිටියෙමි; තතඃ, ඉක්බිති; කර්ණෝපාන්තෙ, කනග; කිමපි, කිසිවක්; වදතා, කියන්නාවූ; (තෙන, ඔහු විසින්;) වදනං ආඝ්‍රාය, මූව සිඹ; ධම්මිල්ලෙ, මුහුලෙහි; ගෘහීතා, ගන්නා ලද්දෙමි; (හුදෙක් එපමනු නොවේ.) මයා ච, මා විසිනුදු; සඃ, හෙතෙමේ; ගාඪම්, දැඩිව; අධරෙ, තොලෙහි; (ගෘහීතඃ, ගන්නා ලද්දේය.)

(ගෘහිත්වා ධම්මිල්ලං මම සඛි නිපීතො'ධර රසඃ" යනු යෙන් වෙමභූපාලයෝ සතර වන පාදය ගනිති. මම

‡ සරලහෘදයත්වාත්
† ගෘහිත්වා ධම්මිල්ලං මම සඛි නිපීතො'ධර රසඃ

ධම්මිල්ලං ගෘහීත්වා, ම ගේ මුහුළු ගෙන; අධර රසඃ, තොල් රසය; නිපීතඃ බොනලදී යනු එහි අරුති.)

ශිඛරිණී වෘත්තය යි.

**කිවියං ගේ කීමක්**

99 දෙශෛරන්තරිතා ශතෛශ්ච
සරිතාමුර්වීභෘතාං කානනෛ-
ර්‍යත්නෙනාපි න යාති ලොචනපථං
කාන්තෙති ජානන්නපි
උද්ග්‍රීව ⁑ ශ්චරණාර්ධරුද්ධ වසුධඃ
† ප්‍රොන්මෘජ්‍ය සාස්‍රෙ දෘශෞ
තාමාශාං පථික ‡ ස්තථාපි කිමපි
ධ්‍යායන් ⁂ පුනර් වීක්ෂිතෙ

දෙශෛඃ, දෙස්වලින් ද; සරිතාම්, ගංගා හා; උර්වී භෘතාං ශතෛඃ, කඳු සිය ගණනින් ද; කානනෛඃ, වනයන් ගෙන්ද; අන්තරිතා, මුවහ වූ; කාන්තා, කත (තම බිරිඳ); යත්නෙන අපි, උපායෙනුදු; ලොචන පථම්, නෙත් මගට; න යාති ඉති, නොයෙති යි; ජානන් අපි, දන්නාද වූ; පථිකඃ, මැඟියා; උද්ග්‍රීවඃ, ඔසොවන ලද ගෙලැතිව; චරණාර්ධ රුද්ධ වසුධඃ, පා අඟින් වළකන ලද බිමැතිව (පා ඔසොවා) ඇඟිලි වලින් සිට උස්ව; සාස්‍රෙ දෘශෞ, කඳුළෙන් යුත් ඇස්; ප්‍රොන්මෘජ්‍යා, පිස; තථාපි, ඒ සිටි අයුරෙන්; කිමපි ධ්‍යායන්, යමක් සිතමින්; තාං ආශාම්, (තම ආශාව බඳු) එ දිග; පුනඃ, යළි; වීක්ෂතෙ, බලයි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

---

⁑ චරණාග්‍ර † කෘත්වාශ්‍රු පූර්ණේ දෘශෞ; කෘත්වාශ්‍රුපූර්ණෝ දෘශම් ‡ තථෛව ⁂ මුහුර් වීක්ෂතෙ මුහුඃ ක්ෂීයතෙ; චිරං වීක්ෂතෙ

**නායකයෙක් සඟයකුට මෙසේ කියයි.**

100 ‡ චක්‍ෂුඃ ප්‍රීතිප්‍රසක්තෙ මනසි පරිචයෙ
චින්තාඃමානාභ්‍යුපායෙ
දූ රාගෙ යාතෙ'තිභූමිං විකසති සුතරාං
ගොචරෙ දූතිකායාඃ
ආසතාං * දූරෙණ තාවත් සරභස දයිතා
ලිඞ්ගනානන්ද ලාභ-
සතද්ගෙහොපාන්ත රථ්‍යා භ්‍රමණමපි පරාං
නිර්වෘතිං දූසංතනොති

චක්‍ෂුඃ, ඇස; ප්‍රීති ප්‍රසක්තෙ, ප්‍රීතියට පත්කල; මනසි පරිචයෙ, සිත පුරුදුවූකල (අභ්‍යාසවත් කල); චින්තාඃමා නාභ්‍යුපායේ, උපා සිතනු ලබන කල; රාගෙ, නුරාව; අති භූමිං ගතෙ, ප්‍රකර්ෂයට පත්කල; දූතිකායාඃ, දූතිය ගේ; ගොචරෙ, ගොචරය; සුතරාම්, බොහෝසේ; විකසති, විස්තාර වන කල; (යාවත්, යම්තාක් කල්;) තත් ගෙහො පාන්ත රථ්‍යා, ඇගේ ගෙය අසල වීථියෙහි; භ්‍රමණං අපි, ගමන ද; පරාම්, බොහෝ සේ; නිර්වෘතිම්, සතුට; සංතනොති, දේ ද; තාවත්, ඒ තාක්කල්; සරභසා, වහා; දයිතාලිඞ්ගන, කිරිඳ වැළඳ ගැනුමේ; ආනන්ද ලාභඃ, ප්‍රීති ලාභය; දූරෙණ, දුරින්; ආස්තාම්, වේවා; (ඈ වැළඳ ගැනුම මදකට තිබේවා. ඈ වසන ගෙය අසල ඇවිදීම ද සතුට ගෙන දේ යනු අදහසි.)

ශෘඞ්ගාර වෘත්තය යි.

---

‡ චක්‍ෂුඃ ප්‍රීත්‍යා නිෂඞ්ගෙණෙ මනසි පරිචයාච්චින්ත්‍යමානෙ' භ්‍යුපායෙ; චක්‍ෂුඃ ප්‍රීති ප්‍රසඞ්ගෙ

දූ යාතෙ රාගෙ විවෘද්ධිං ප්‍රවිසරති ගිරාං විස්තරෙ

* දූරෙ ස තාවත්  දූ සන්ධාති

**කොප හිමියා කෙසේ රමණය කෙරේදැයි යෙහෙළියන් විසින් පිළිවිසු නායිකාවක් මෙසේ කියයි.**

101 කාන්තෙ තල්පමුපාගතෙ විගලිතා නීවිස්වයං† බන්ධනා-
‡ ද්වාසො විශ්ලථ මෙඛලා ගුණ ධෘතං
කිඤ්චිත් නිතම්බෙ ස්ථිතම්
එතාවත් සඛි! වෙද්මි * සාංප්‍රතමහං
තස්‍යාඞ්ගසඞ්ගෙ පුනඃ
කො’යං කාස්මි ‡ රතං නුවා කථමිති
ස්වල්පාපි මෙ න ස්මෘතිඃ

කාන්තෙ, හිමියා; තල්පං උපාගතෙ, යහනට ආකල; නීවී, නෙරිය; ස්වයම්; තමා ම; බන්ධනාත්, බැඳුමෙන්; විගලිතා, ගිලිහිණී; ශ්ලථ, බුරුල්වූ; මෙඛලා ගුණ ධෘතම්, මෙවුල්දම් හුයෙහි රැඳි; වාසඃ, වත; නිතම්බෙ, නිතඹෙහි: කිඤ්චිත්, මඳක්; ස්ථිතම්, රැඳිණි; (හෙ) සඛි, (එම්බා) යෙහෙළිය; එතාවත්, මෙපමණක් ම; වෙද්මි, දනිමි; සාම්ප්‍රතම්, දැන්; තස්‍ය අඞ්ග සඞ්ගෙ, ඔහු ගේ සිරුරු පහස්හි; පුනඃ, යළි; අයං කඃ, මොහු කවරෙක් ද; කාස්මි, මම කවරියක් ද; රතං නු වා කථං ඉති, රතිය හෝ කෙ සේ දැයි; ස්වල්පා අපි; මඳෙකුදු; මෙ, මට; න ස්මෘතිඃ, සිහියෙක් නො වී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**වියෝ වූවෙක් මෙසේ සිතයි.**

102 ප්‍රාසාදෙ සා දිශි දිශි ච සා පෘෂ්ඨතඃ සා පුරඃ සා
පර්‍ය්‍යඞ්කෙ සා පථි පථි ච සා තද්වියොගාතුරස්‍ය
හංහො චෙතඃ ප්‍රකෘතිරපරා නාස්ති මෙ කාපි සා සා
සා සා සා සා ජගති සකලෙ කො’යමද්වෛත වාදඃ

† තත් ක්ෂණාත් ‡ තද්වාසඃ * කෙවලමහං
‡ රතං තු කිං කථමපි

තත් වියෝග ආතුරස්‍ය මෙ, ඇගෙන් වූ වියොව නිසා රොගී වූ මට; ප්‍රාසාදෙ, පහයෙහි; සා, හෝ නොමෝ; දිශි දිශි ච, දිගක් දිගක් පාසා ද; සා, හෝ වේ; පෘෂ්ඨතඃ සා, (මගේ) පිටු පසින් හෝ නොමෝ වේ; පුරඃ සා, (මා) ඉදිරිපිට හෝ නොමෝ වේ; පර්‍ය්‍යඞ්කෙ සා, යහනෙහි හෝ නොමෝ වේ; පථි පථි ච සා, මඟක් මඟක් පාසා ද හෝ නොමෝ වේ; හංහො චෙතඃ, අහෝ චිත්තය; මෙ, මට; අපරා ප්‍රකෘතිඃ, අන් පිය වියෙක්; නාස්ති, නැත; සා සා කාපි, ඕ ඕ කවරියක් ද; සකලෙ ජගති, මුළු ලොව ම; සා සා සා සා, ඕ ඕ ඕ ඕ ම වේ; අයං කඃ අද්වෛත වාදඃ, මේ කවර නම් අද්වෛතවාද යෙක්ද; (ප්‍රියාවගෙන් වියෝවූවහුට හැම තැනම ඈ දක්නට ලැබේ යනු සාමාන්‍ය අදහසි.)

මන්දාක්‍රාන්තා වෘත්තය යි.

**අර්ජුනවර්මදෙවයන් ගේ මතය අනුව මෙතෙකින් අමරුශතකය නිමාවට යෙයි.**

---

## පහත පළවන්නේ අන්‍ය සංස්කරණයන් ගේ ශ්ලෝකයෝ වෙති.

**නායකයකු ගේ කිමක්.**

103 නභසි ජලද ලක්ෂ්මීං ‖ සාස්‍රයා වීක්ෂ්‍ය දෘෂ්ට්‍යා
† ප්‍රවසසි ‡ යදි කාන්තෙත්‍යර්ධමුක්ත්වා කථංචිත්
මම පටමවලම්බ්‍ය ප්‍රෝල්ලිඛන්ති ධරිත්‍රීං
යදනු කෘතවතී සා තත්‍ර වාචො නිවෘත්තාඃ

නභසි, අහස්හි; ජලද ලක්ෂ්මීම්, මේ සිරිය; සාස්‍රයා, කඳුළු සහිත; දෘෂ්ට්‍යා, නෙතින්; වීක්ෂ්‍ය, බලා; (හෙ) කාන්ත, (එම්බා) හිමිය; ප්‍රවසසි යදි, විදෙසකට යෙහි නම්; ඉති, මෙ සේ; අර්ධම්, අඩක්; කථංචිත්, දුකසේ (ඉතා අමාරුවෙන්);

---

‖ සංසෘතාං    † ප්‍රසරසි    ‡ යත්‍ර

උක්තවා, කියා; මම පටං අවලම්බ්‍ය, මා ගේ වත ගෙන; ධරිත්‍රිම්, පොළොව; ප්‍රෝලලිඛන්ති, හාරත්නී (පාගිලියෙන් බිම හාරමින්); අනු, පසුව; සා, ඕ තොමෝ; යත් කෘතවතී, යම් ක්‍රියාවක් කළා ද; තත්‍ර, ඒ ක්‍රියාවෙහි; වාචඃ, කීම; නිවෘත්තාඃ, නැවැත්තේය;

මාලිනී වෘත්තය යි.

**කිවියාගේ කිමක්:**

104 සමරරස නදී පූරේණෝඪාඃ පුනර්ගුරුසෙතුභි-
ර්‍යදපි විධෘතාස්තිෂ්ඨන්ත්‍යාරාදපූර්ණ මනොරථාඃ
තදපි ලිඛිත ප්‍රඛ්‍යෛරඞ්ගෛඃ පරස්පරමුන්මුඛා
නයන නලිනී නාලානීතං පිබන්ති රසං ප්‍රියාඃ

ප්‍රියාඃ, පෙම්වත්හු; සමර රස, අනඟ රස නමැති (කාම රාගය නමැති); නදී පූරේණ, ගංවතුරෙන්; ඌඪාඃ, ගෙනි යන ලද්දේ තොහොත් උල්පවන ලද්දේ; පුනඃ, නැවත; යත්, යම් හෙයකින්; ගුරුසෙතුභිඃ, දෙ ගුරු දනා නමැති සෙතුයෙන් (ඒදඬුයෙන්); විධෘතාඃ, නවත්වන ලද්දෝ; ආරාත්, (ඒ දෙගුරුන් ගේ) සමීපයෙහි; අපූර්ණ මනොරථාඃ, නොසිදු මනදෙළ ඇත්තෝව (කාමාශා ඉටු නොවී); තිෂ්ඨන්ති, සිටිත්; තදපි, එසේ වුවද; ලිඛිත ප්‍රඛ්‍යෛඃ අඞ්ගෛඃ, සිත්තමෙක බළ අවයවයන් ගෙන්; පරස්පර උන්මුඛාඃ, ඔවුනොවුන් අභිමුඛවූවෝ; නයන නලිනීනාල, බැල්ම නමැති පියුම් දඬුයෙන්; ආනීතං රසම්, ගෙනෙන ලද රස; පිබන්ති, බොති.

හරිණී වෘත්තය යි.

**තම නායකයා ගෙනෙනුවට යැවූ දූතිකාව ආපසු පැමිණිවිට ඇගේ සිරුරෙහි වූ චිහ්න දුටු නායිකාවක් ඈයට මෙසේ කියයි.**

105 නිඃශෙෂ ච්‍යුත චන්දනං ස්තනතටං
නිර්මෘෂ්ටරාගො'ධරෝ
නෙත්‍රෙ දූරමනඤ්ජනෙ පුලකිතා තන්වී තවෙයං තනුඃ
මිථ්‍යාවාදිනි දූති ! බාන්ධවජනස්‍යාඥත පීඩාගමෙ
වාපීං ස්නාතුමිතො ගතාසි න
පුනස්තස්‍යාධමස්‍යාන්තිකම්

නිඃශෙෂම්, ඉතිරි නොවී; ච්‍යුත, පහවූ; චන්දනම්, සඳුන් අලෙව් ඇති; ස්තන තටම්, තන තල ද; නිම්ෘෂ්ට, මකන ලද; රාගඃ, ලතු හෝ බුලත් පැහැය ද; දූරම්, පහවූ; අඤ්ජනෙ, අඳුනැති; නෙත්‍රෙ, දෙනෙත් ද ඇති; තන්වී, තුනු; (කොමල යනු ද සමහරුන් ගේ අරුති.) තව ඉයං තනුඃ, ති ගේ මේ සිරුර; පුලකිතා, ලොමුදහ ඇත්තේ වේ; මිථ්‍යාවාදිනි, අසස් බස් බෙණෙන; බාන්ධව ජනස්‍ය, මිතුරු දනා ගේ; අඥත, නොදත්; පීඩාගමෙ, දුක් ඇති; (මිතුරියන් ගේ දුක නොදන්නා යන අරුති.) (හෙ) දූති, (එම්බා) දූතිය; අතඃ, මෙතැනින්; ස්නාතුම්, නෑමට; වාපිං ගතාසි, වැවට ගියෙහි ද; පුනඃ, යළි; තස්‍ය අධමස්‍ය සන්තිකම්, ඒ නිචයා ගේ හමුවට; න (ගතාසි), නො ගියෙහි ද.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

**නායකොක්තියක්.**

106 ආයස්තා කලහං පුරෙව කුරුතෙ න
ස්‍රංසනෙ වාසසො
භග්න භ්‍රූරතිඛණ්ඩ්‍යමානමධරං
ධත්තෙ න කෙශග්‍රහෙ
අඞ්ගාන්‍යර්පයති ස්වයං භවති නො
වාමා හඨාලිඞ්ගනෙ
තන්ව්‍යා ශික්ෂිත එෂ සංප්‍රති පුනඃ
කොපප්‍රකාරො’පරඃ

ආයස්තා, (ඉසි කොපින්) වෙහෙසට පත්වූවා; පුරෙව, පෙරමෙන්; වාසසඃ, වත (වස්ත්‍රයා ගේ); ස්‍රංසනෙ, ගිලිහි මෙහි දී; කලහං න කුරුතෙ, කලහ නො කෙරෙයි; කෙශ ග්‍රහෙ, කෙහෙ ඇදුමෙහි ලා; (පුරෙව, පෙරමෙන්;) භග්න භ්‍රූඃ, බිඳි බැමැත්තී; (බැම බිඳ යන අදහසි.) අතිඛණ්ඩ්‍යමාන, බොහෝසේ වසනා ලද; අධරම්, තොල; න ධත්තෙ, නො දරයි; හඨා ලිඞ්ගනෙ, බලයෙන් වැළඳ ගැනීමේ දී; (පුරෙව, පෙර මෙන්;) වාමා නො භවති, වක් නොවෙයි; ස්වයම්,

තමාම; අඞ්ගානි, අවයව; අර්පයති, දෙයි; සාම්ප්‍රති පුනඃ, දැන් වනාහි; තත්ව්‍යා, තුනුවග විසින්; එෂඃ, මේ; අපරඃ කොප ප්‍රකාරඃ, අන් කොප අයුරෙක්; ශික්ෂිතඃ; ඉගෙන ගන්නා ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිවියා ගේ කිමක්.**

107 ක්වචිත් තාම්බූලාක්තඃ ක්වචිදගුරු පඞ්කාඞ්ක මලිනඃ
ක්වචිච්චූර්ණෝද්ගාරී ක්වචිදපි ච සාලක්තකපදඃ
වලීභඞ්ගාභොගෛරලක පතිතෛඃ ශීර්ණ කුසුමෛඃ
ස්ත්‍රියො නානාවස්ථං ප්‍රථයති රතං ප්‍රච්ඡදපටඃ

ක්වචිත්, කිසි තැනෙක; තාම්බූලාක්තඃ, බුලත් පැහැයෙන් ලකුණුව තිබේ; ක්වචිත්, කිසි තැනෙක; අගුරු පඞ්කාඞ්ක, අගිල් කලල් සලකුණෙන්; මලිනඃ, කිලුටුව තිබේ; ක්වචිත්, කිසි තැනෙක; චූර්ණෝද්ගාරී, කපුරු ආදී සුනු වැගිරීම වේ; ක්වචිදපි ච, කිසි තැනෙක්හි ද; සාලක්තක පදඃ, ලතු ගෑ පා ලකුණු වේ; වලිභඞ්ග ආභොගෛඃ, රැලි බිඳුම් විතරින් ද; අලක පතිතෛඃ, කියඹුයෙන් වැටීමෙන් ද වූ; ශීර්ණ, විසුරුණු; කුසුමෛඃ, මලින් යුත්; ප්‍රච්ඡද පටඃ, ඇතිරිල්ල; ස්ත්‍රියාඃ, ඉතිරිය ගේ; නානාවස්ථං රතම්, ඒ ඒ අවස්ථාවන්හි කරන ලද රතිය; ප්‍රථයති, පළකෙරෙයි හෙවත් දක්වයි.

. . ශිඛරිණී වෘත්තය යි.

**කිවියා ගේ කිමක්**

108 පුෂ්පොද්භෙදමවාප්‍ය කෙලිශයනාද්
දූරස්ථයා චුම්බනෙ
කාන්තෙන ස්ඵුරිතාධරෙණ නිභෘතං
භ්‍රූසංඥයා යාචිතෙ
ආවජ්ඣාද්ධසමිත පූර්ණ ගණ්ඩ ඵලක
වෙලාඤ්චලෙනානනං
මඤ්ජුඤ්ජිත කුණ්ඩලස්තබකයා තත්ව්‍යාවධූතං ශිරඃ

පුෂ්පෝද්භේදං අවාප්‍ය, ඔසප් බවට පැමිණ; කෙලිශයනාත්, කෙළි යහනින්; දූරස්ථයා, දුර සිටිය බිරින්දගෙන්; ස්ඵුරිතාධරේණ කාන්තෙන, සැලෙන තොලැති හිමියා විසින්; භ්‍රූසංඥයා, බැම ලකුණෙන්; නිගෘහතම්, රහසේ; චුම්බනෙ යාචිතෙ, සිඹුම ඉල්ලූකල; ස්මිත පූර්ණ ගණ්ඩ ඵලකම්, සිනායෙන් පිරි කොපුල් තල ඇති; ආනනම්, මුහුණ; චේලාඤ්චලෙන, වත් කොනකින් (වස්ත්‍ර ප්‍රාන්තයෙන්); මන්ද, මඳව; ආස්ඵාලිත, සැලෙන; කුණ්ඩලස්තබකයා, කොඩොල් නමැති මල් පොකුරැති; තන්ව්‍යා, තුනුවග විසින්; ශිරඃ විධූතම්, හිස සොලවන ලදි; (හිමියා ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී යන අදහසි.)

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**නායිකාවක් නායකයකුට නින්දා කෙරෙයි.**

109 ශඨාන්‍යස්‍යාඃ කාඤ්චී මණි රණිතමාකර්ණ්‍ය සහසා
යදාශ්ලිෂ්‍යන්නෙව ප්‍රශිථිල භුජග්‍රන්ථිරභවඃ
තදෙතත් ක්වාචක්ෂ්‍ව ඝෘත මධුමයත්වද්බහුවචො-
විෂේණා ඝූර්ණන්ති කිමපි න සඛී මෙ ගණයති

(හෙ) ශඨ, (එම්බා) කපටිය; අන්‍යස්‍යාඃ, අන් පෙම්වතියක ගේ; කාඤ්චී මණි රණිතම්, මෙව්ලේ මැණික් රව; ආකර්ණ්‍ය, අසා; ආශ්ලිෂ්‍යන් එව, (මා) වැළඳ ගන්නේම; (මා වැළඳ ගෙන සිටිද්දීම යන අදහසි.) සහසා, වහා; ප්‍රශිථිල, ලිහිල් කරන ලද; භුජ ග්‍රන්ථිඃ අභවත් (ඉති), බාහු බන්ධනයෙක් වේ ද යන; යත්, යම් කරුණෙක් ද; තත් එතත්, ඒ මේ කරුණ; ක්ව, කොහි; ආචක්ෂ්‍ව, කියම් ද; ඝෘත මධුමයත්වා වත්, ගිතෙල් හා මී වැනි; බහු වචඃ විෂේණ, බෝ බස් විසෙන්; ඝූර්ණන්ති, (මත්වී) බමන; මෙ සඛී, මගේ යෙහෙළිය; කිමපි න ගණයති, (ඔබ විසින් කියන ලද) කිසිවක් වත් විශ්වාස නො කරයි.

ශිඛරිණී වෘත්තය යි.

**දූතියක් නායකයකුට නින්දා කෙරෙයි.**

110 අචජ්ඣානා නයනාම්බු බන්ධුෂු කෘතං
චින්තා ගුරුෂ්වර්පිතා
දත්තං දෛන්‍යමශෙෂතඃ පරිජනෙ
තාපඃ සඛීෂ්වාහතඃ
අද්‍ය ශ්වඃ පරනිර්වෘතිං භජති සා
ශ්වාසෛඃ පරං ඛිද්‍යතෙ
විස්‍රබ්ධො භව විප්‍රයොග ජනිතං
දුඃඛං විභක්තං තයා

අචජ්ඣානම්, නිතර; නයනාම්බු, කඳුළු; බන්ධුෂු, නෑයන් කෙරෙහි; කෘතම්, දෙන ලදී; චින්තා, සිතිවිලි; ගුරුෂු, දෙ ගුරුන් කෙරෙහි; අර්පිතා, පිහිටුවන ලදී; දෛන්‍යම්, බැගෑ බව; පරිජනෙ, පිරිවර දනා කෙරෙහි; අශෙෂතඃ, ඉතිරි නොකොට; දත්තම්, දෙනලදී; තාපඃ, තැවුල; සඛීෂු, යෙහෙළියන් කෙරෙහි; ආහතඃ, දමන ලදී; (එවම්, මෙසේ;) තයා, ඈ විසින්; විප්‍රයොග ජනිතම්, වියොවින් හටගත්; දුඃඛම්, දුක; විභක්තඃ, (ඒ ඒ තැනැත්තන් කෙරෙහි) බෙදන ලදී; සා, ඕ තොමෝ; ශ්වාසෛඃ, සුසුමෙන්; පරම්, බොහෝසේ; ඛිද්‍යතෙ, දුක් විඳියි; (තස්මාත්, එහෙයින්;) අද්‍ය, අද හෝ; ශ්වඃ, හෙට හෝ; පරනිර්වෘතිං භජති, උතුම් නිවුම (සැනසීම) භජනය කෙරෙයි; විස්‍රබ්ධො භව, (මෙය) විශ්වාසකර.

1. **පරනිර්වෘතිම්:**- මෙයින් මරණය හැඟවේ.
2. **විස්‍රබ්ධොභව:**- මෙයින් නින්දාව හැඟේ මෙහි වැනුයේ මූර්ච්ඡා නම් දශා විශෙෂයයි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**පළමුව පෙම් බැඳ සිට පසුව හැරදමූ නායිකාවක් තමාගේ මල් වත්තට අහඹුයෙන් පත් නායකයකුට නින්ද කෙරෙයි.**

111 රොහනෙතෟ ප්‍රථමං මමොරසි තව
ප්‍රාපෙතෟ විවෘද්ධිං තනෞ
සංලලාපාස්තව වාක්‍යභඞ්ගි මිලනාන්
මෛඝ්‍ය්‍යං පරං ත්‍යාජිතාෘ
ධාත්‍රිකණ්ඨමපාස්‍ය බාහු ලතිකෙ
කණ්ඨෙ තවාසඤ්ජිතෙ
නිර්දාක්ෂිණ්‍ය ! කරොමි කිං නු
විශිඛාපෙ‍්‍යෂා න පඤ්චාස්තව

ප්‍රථමම්, පළමුව; මම උරසි, මා ළයෙහි; රොහනෙතෟ, වැඩෙන; තනෞ, දෙතන; තව (උරසි), තගේ ළයෙහි; විවෘද්ධිං ප්‍රාප්තෞ, වැඩීමට පත්විය; (මම) සංල්ලාපාඃ, (මගේ) සංභාෂණයෝ; තව, තගේ; වාක්‍ය භඞ්ගි මිලනාත්, වචන රීති මිශ්‍රණයෙන්; පරංමෛඝ්‍ය්‍යම්, අතිශය මූසතාව; ත්‍යාජිතාඃ, අත් හළහ: බාහු ලතිකෙ, (මා) අත්ලිය; ධාත්‍රිකණ්ඨං අපාස්‍ය, කිරි මව ගේ ගෙල හැර දමා; තව කණ්ඨෙ, ත ගේ ගෙලෙහි; ආසඤ්ජිතෙ, ඇලිණි.

(හෙ) නිර්දාක්ෂිණ්‍ය, (එම්බා) නො අනුකූල තැනැත්ත; (අඳෙන පරවෙතොනු වතීනය යනු වෙමහුපාල අරුති.) එෂා විශිඛාපි, මේ වීපිය ද; තව පඤ්චඃ න, තට මහ නො වේ; කිං නු කරොමි, කුමක් කෙරෙම් ද.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**කිවියං ගේ කිමක්:**

112 පරුෂ් කොපෙන ස්ඵුට කපට මුද්‍රා මුකුලිතා
ප්‍රවිශ්‍යාඞ්ගනාඞ්ගං ප්‍රණයිනි පරිරම්භචතුරෙ
ශනෛර් නීවිබන්ධං ස්පෘශති සහය ව්‍යාකුල කරං
විධතෙන සංකොච ග්ලපිතමවලග්නං වරතනුඃ

කොපෙන, පණ්‍ය වියගුරෙන් පරාඞ්මුඛව; ස්ඵුට, පැහැදිලි සේ; කපට මුද්‍රාමූකුලිතා, බොරු නින්දෙන් නෙත් පියවූ; චරතනුඃ, තුනුවගිය; අඬෙගන, සිරුරෙන්; අඞගම්, (තම) සිරුරට; ප්‍රවිශ්‍ය, පිවිස; පරිරම්භ වතුරෙ, වැළඳ ගැනුමෙහි සමත්; ප්‍රණයිනි, පෙම්වතා; නීවිබන්ධම්,වස්ත්‍ර ග්‍රන්ථිය; සභය, බිය සහිතව; ව්‍යාකුල කරම්, සැලෙන අතැතිව; ශනෛඃ, සෙමින්; ස්පෘශති (සතී), අල්ලන කල; අවලග්නම්, සිරුරේ මධ්‍ය භාගය; සංකොච ග්ලපිතං විධතෙන, හැකිළී මෙන් තුනිබව ඇති කළාය.

ශිඛරිණී වෘත්තය යි.

**නායකයා තමා වෙත ගෙනෙනුවස් යැවූ දූතිය ගේ සංභොග ලකුණු දුටු නායිකාව හා ඈ අතර වූ දෙබසක්.**

113 ස්විත්‍නං කෙන මුඛං දිවාකරකරෙසො
රාගිණී ලොචනෙ
රොෂාත් තද්වචනොදිතාද්විලුලිතා
නීලාලකා වායුනා
භ්‍රෂ්ටං කුඞ්කුමමුත්තරීය කෂණාත්
ක්ලාන්තාසි ගත්‍යාගතෛ-
රුක්තං තත් සකලං කිමත්‍ර වද
හෙ දූති ! ක්‍ෂතස්‍යාධරෙ

**නායිකාව:-** (හෙ) දූති, එම්බා දූතිය; කෙන, කවර හෙයකින්; මුඛම්, (නිගේ) මුව; ස්වින්නම්, සෝ දියෙන් යුත් වීද;

**දූතී:-** දිවාකරකරෛඃ, හිරුරසිනි;

**නායිකාව:-** තෙ, නි ගේ; ලොචනෙ, දෙනුවන්; රාගිණී, (කවරහෙයකින්) රතු පැහැවී ද;

**දූතිය:-** තත් වචනොදිතාත් රොෂාත්, (තොප) නායකයා කී බසින් හටගත් රොසිනි;

**නායිකාව**:- නිලාලකා, නිල් කියඹුව; විලුලිතා, (කවර හෙයකින්) අවුල්වී ද;

**දූති**:- වායුනා, සුළඟිනි;

**නායිකාව**:- කුඞ්කුමම්, කොකුම්; භ්‍රෂ්ටම්, (කවරහෙයකින්) පිසිණි ද;

**දූතිය**:- උත්තරීය ක්ෂනාත්, උතුරු සළුව ගැටීමෙනි;

**නායිකාව**:- ක්ලාන්තාසි, (කවරහෙයින්) මැළැවිණී ද;

**දූතිය**:- ගත්‍යාගතෛඃ, යාම්ඊමෙනි (ගමනිනි);

**නායිකාව**:- හෙ දූති, එම්බා දූතිය; උක්තම්, නි විඝින් කියන ලද; තත් සකලාම්, ඒ සිල්ල; (යුක්තම්, සුදුසුය;) අත්‍ර වද, මෙහි ලා කියව (මේ පැනයට උත්තර දෙව.) අධරෙ, තොලෙහි; ක්ෂතස්‍ය, වණයට; කිං (කාරණම්), කවර හෙතුවෙක් ද.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

**කිඩියා ගේ කිමක්.**

114 නානත්ඃ ප්‍රවෙශමරුණ ද්විමුඛි න චාසී-
දචෂ්ට රොෂ පරුෂාණි න චාක්ෂරාණි
සා කෙවලං සරල පක්ෂමභිරක්ෂිපාතෛඃ
කාන්තං විලොකිතවති ජනනිර් විශෙෂම්

සා, ඕ තොමෝ; (නායකස්‍ය, නායකයා ගේ;) අන්තඃ ප්‍රවෙශම්, තම ගෙතුළට පිවිසීම; න අරුණත්, නො වැළැක් වූ; විමුඛි ච න ආසීත්, පරාඞ්මුඛ ද නොවූ; රොෂ පරුෂාණි, රොස් පරොස්; අක්ෂරාණි ච, වචන ද; න ආචෂ්ට, නො කිහ; සරල පක්ෂ්මභිඃ, සෘජු ඇසිපියැති; අක්ෂිපාතෛඃ, බැලුමෙන්) කාන්තම්, පියයා; ජනනිර්විශෙෂම්, දන වෙසෙසක් නොමැතිව; (වෙන ජනයා ලෙස බලන්නාක් මෙන් යන අදහසි.; කෙවලම්, හුදෙක්; විලොකිතවතී, බැලූ.

වසන්තතිලකා වෘත්තය යි.

**කිවියා ගේ කිමක්**

115 ප්‍රියකෘත පටසෙනය ක්‍රීඩාවිලම්බන විහ්වලාං
කිමපි කරුණාලාපාං තත්වීමුදීක්‍ෂ්‍ය සසංභ්‍රමම්
අපි විගලිතෙ ස්කන්ධාවාරෙ ගතෙ සුරතාහවෙ
ත්‍රිභුවන මහා ධන්වී ස්ථානෙ න්‍යවතීත මන්මථඃ

ප්‍රිය කෘත, ප්‍රියයා විසින් කරන ලද; පටසෙනය ක්‍රීඩා විඩම්බන, වත සොරකම් කිරීමේ කෙළි විනොදයේ පමාව කරණ කොට ගෙන; විහ්වලාම්, ව්‍යාකුල වූ; කිමපි කරුණාලාපාම්, කිසි යම් බැගෑ බසක් කියන; තත්විං උදීක්‍ෂ්‍ය, තුනුවිය බලා; ත්‍රිභුවන මහා ධන්වී, තිලොව මහ දුනුවායා වන; මන්මථ, අනඟා; සුරතාහවෙ, සුරත යුදය; ගතෙ (සති), ඉක්මුණු කල; ස්කන්ධාවාරෙ, කඳවුර; විගලිතෙ අපි, ගිලිහුණ ද; සසංභ්‍රමම්, වහා; ස්ථානෙ, සුදුසු තන්හි; න්‍යවතීත, නැවතුණේය.

හරිණී වෘත්තය යි.

**කිවියා ගේ කිමක්.**

116 සාලක්තකෙන නව පල්ලව කොමලෙන
පාදෙන නූපුරවතා මදනාලසෙන
යස්තාඩ්‍යතෙ දයිතයා ප්‍රණයාපරාධාත්
සො'ඞ්ගීකෘතො භගවතා මකරධ්වජෙන

මදනාලසෙන දයිතයා, අනඟ ලැසි බැවින් යුත් දයිතයා, ප්‍රියාවක් විසින්, ප්‍රණයාපරාධාත්, පණ වියගුර හෙතු කොට ගෙන; සාලක්තකෙන, ලතු සහිත; නවපල්ලව කොමලෙන, ළපලු බඳු මොලොක් වූ; පාදෙන, පයින්; යඃ තාඩ්‍යතෙ, යමෙක් පහරදෙනු ලැබේ ද; සඃ, හෙතෙමේ; භගවතා මකරධ්වජෙන, භගවත් අනඟා විසින්; අඞ්ගීකෘතඃ, පිළිගනු ලැබේ; (පයින් ගසන ලදුයේ ද පසුව නොයෙක් උපචාර ගත් ගෙන් හෙතෙමේ සනසනු ලැබේ.)

වසන්තතිලකා වෘත්තය යි.

117 ප්‍රයච්ඡාහාරං මෙ යදි තව රහො වෘත්තමඛිලං
මයා වාච්‍යං වොඪුරිති ගෘහශුකෙ ජල්පති ශනෛඃ
වධූර්වක්ත්‍රං ව්‍රීඩාභර නමිතමන්තර් විහසිතං
හරත්‍යර්ධොන්මීලන් නලින මිවාවර්ජිතමිව

මෙ, මට; ආහාරම්, අහර; ප්‍රයච්ඡ, දෙව; යදි, ඉදින්; (න දස්සි, නොදෙන්නෙහි නම්; තදා, එකල;) තව, ඔබගේ; අඛිලම්, සියලු; රහො වෘත්තාන්තම්, රහස් තොරතුරු; මයා, මා විසින්; උච්චෛඃ, උස්හඬින්; වාච්‍යම් ඉති, කිය යුතු යැයි; ගෘහශුකෙ, ගෙයි ඇතිකරන ගිරවා; ශනෛඃ, සෙමින්; ජල්පති (සති), කියන කල; වධූඃ, බිරිය; ව්‍රීඩාභර, විලි බරින්; නමිත, නැමි; අන්තර් විහසිතම්, ඇතුළත සිනාඇති (සැඟවුණු සිනා ඇති); වක්ත්‍රම්, මුව; අර්ධ උන්මීලන්, අඩක් පිපි; නලිනම්, පියුමක්; අනල ආවර්ජිතං ඉව, සුළඟින් නැමුනක් බඳු (ආකාර); හරති, ගනී; (මුහුණ නමාගනී යන අදහසි.)

ශිඛරිණී වෘත්තය යි

**වර්ෂා වර්ණනාවක්.**

118 කිඤ්චිත් මුද්‍රිත පාංසවඃ ශිඛිගණෛරුත්පක්ෂ
(රූර්ධ්වාක්ෂ) මාලොකිතා
ජීර්ණාවාසරුදද් දරිද්‍ර ගෘහිණී ශ්වාසානිලෛර්ජර්ජරිතාඃ
එතෙ තෙ නිපතන්ති නූතන ඝනාත්
ප්‍රාවෘඩ්ගරාණඤ්ජිනො
විච්ඡායී කෘත විප්‍රයුක්ත වනිතා වක්ත්‍රෙන්දවො බින්දවඃ

කිඤ්චිත් මුද්‍රිත පාංසවඃ, (මදක් දූලි පහකළ යන අරුති.) ශිඛිගණෛඃ, මොනර ගණා විසින්; ඌර්ධ්වාක්ෂම්, උඩු දෙසට යෙදූ ඇසැතිව; ආලොකිතාඃ, බලන ලද; ජීර්ණාවාස රුදත්, දිරූ ගෙවල හිඳ හඬන; දරිද්‍ර, දිළිඳු; ගෘහිණී ශ්වාස, ගෘහිණියන් ගේ සුසුමෙන්; ජර්ජරිතාඃ, දුදුරුවූ; විප්‍රයුක්ත වනිතා, වියෝගිනියන් ගේ; වක්ත්‍රෙන්දවඃ, මුහුණු නමැති චන්ද්‍රයන්: විච්ඡායී කෘත, සිලිටිකළ; ප්‍රාවෘඩ්භරාණඤ්ජිනඃ,

වැසිකාල පැමිණි හෙයින් තුටුමත්; නූතන ඝනාත්, නව මේ කුලෙන්; එතෙ තෙ බිඥවඃ, ඒ මේ දිය බිඳුහු; නිපතන්ති, වැටෙත්.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**හෙමන්ත වායු වර්‍ණනාවක්.**

119 † නිකෝ‍වෛචෛර් වික්‍ෂිපන්තඃ කෘත
තුහිනකණාසාරසඞ්ගාත් පරාගා-
‡ නාමොදනන්දිතාලීනතිතර සුරභීන්
භූරිශො දිඞ්මුඛෙෂු
එතෙ තෙ කුඞ්කුමාඞ්ක ස්තන කලශ
භරාස්ඵාලනාදුච්ඡලන්තඃ
පීත්වා සීත්කාර වක්ත්‍රං හරින ශිශු දෘශාං
හෛමනා වාන්ති වාතාඃ

කෘත, හටගත්; තුහින කණාසාර සඞ්ගාත්, තුසර බිඳු හා එක්වූ; පරාගානාම්, මල් රොනේ; ආමොද ආනන්දිත, සුව දින් ලොල්වූ; අතිතර සුරභීන්, ඉතා සුවඳවත්; අලීන්, බිඟුන්; නීත්වා, ගෙන ගොස්; භූරිශඃ, බොහෝසේ; දිඞ්මුඛෙෂු, දිග්මුවෙහි; උච්චෛඃ, උස්ව; වික්‍ෂිපන්තඃ, දමනා; හරිණ ශිශු දෘශාම්, මියුලැසියන් ගේ; කුඞ්කුමාඞ්ක, කොකු මෙන් සලකුණු වූ; ස්තන කලශභරාස්ඵාලනාත්; තන කලස බරින් තැළීම හෙතු කොට ගෙන; උච්ඡලන්තඃ, උඩ නැඟෙන; (එසේ ම ඒ ඉතිරි යන් ගේ) සීත්කාර වක්ත්‍රම්, සීත් යන හඬ දෙන මුව; පීත්වා, ස්පර්‍ශකොට; එතෙ තෙ හෛමනා වාතාඃ, මේ ප්‍රසිද්ධ හෙමන්ත වාතයෝ; වාන්ති, හමත්.

ස්‍රග්ධරා වෘත්තය යි.

---

† ක්‍ෂිපේත්වාචෛචෛඃ ‡ කෞන්දනන්දිතාලීනතිශයා

120 පීතස්තුෂාර කිරණෝ මධුනෛව සා'ර්ධ-
මන්තඃ ප්‍රවිශ්‍ය චෂකා ප්‍රතිබිම්බවර්ති
† මානාකරං මනසි මානවතී ජනස්‍ය
නූනං බිභේද යදසෞ ප්‍රසසාද සද්‍යඃ

තුෂාර කිරණඃ, සඳු; චෂකා ප්‍රතිබිම්බවර්ති, මධු පාත්‍ර යෙහි පිළිබුවට පත්වූයේ; මධුනා එව සාර්ධම්, මධුව සමග; පීතඃ, (ඒ පිළිබිඹුව ද) පානය කළේ; අන්තඃ ප්‍රවිශ්‍ය, (ස්ත්‍රීන් ගේ) හද තුළට පිවිස; මානවතී ජනස්‍ය, මානවත් ස්ත්‍රී ජනයා ගේ; මනසි, සිත්හි; මානාකරම්, මන් උපදින තැන; නූනම්, ඒකාන්තයෙන් ම; බිභෙද, බින්දේය; (එය කෙසේ දත්තේ ද ?) යත්, යම් හෙයකින්; අසෞ, මේ මානිනී ලොකයා; සද්‍යඃ, වහා; ප්‍රසසාද, පැහැදීමට පත්විද; (එහෙයිනි.)

**විස්තර**:- කාමිනීහු සඳ රැසින් සුදුවත් රැයෙහි මධුව පානය කෙරෙති ඔඩමෙහි මධුව වුව එහි සඳෙහි පිළිබිඹුව ද වෙයි මධුව නොමැත පිළිබිඹුව නොවෙයි. කවියා එය මෙසේ උත්ප්‍රෙක්ෂා කෙරෙයි සඳ ඔඩමෙහි වූ ඔහු ගේ පිළිබිඹුව හා ස්ත්‍රීන් ගේ මානය උපදින ස්ථානය ද විනාශ කළහ යනු යෙන්. මධුපානයෙන් පසු ස්ත්‍රීන් ගේ මානය නො වේ. බඳුනෙහි මධුවද නො වේ.

වසන්තතිලකා වෘත්තය යි.

## ග්‍රීෂ්ම කාලයෙහි රාත්‍රිකාලීන වායු වර්ණනාවක්.

121 ලලනා ලොලධම්මිල්ල මල්ලිකාමොද වාසිතාඃ
වාන්ති රාත්‍රෞ රතක්ලාන්ත කාමිනී සුභාදෙ'නිලාඃ

ලලනා, ඉතිරින් ගේ; ලොල, සැලෙන; ධම්මිල්ල, මුහු ලෙහි වූ; මල්ලිකා ආමොද වාසිතාඃ, ඉද්ද මල් සුවඳින් සුවඳ වත්; රති ක්ලාන්ත, රතියෙන් වෙහෙසට පත්; කාමිනී

† මානාන්ධකාරමපි

සුභගාදිඃ, කාමිනී දනාගේ යහළුවූ; අනිලාඃ, වාතයෝ; රාත්‍රෞ, (ගිම්) රැයෙහි; වාන්ති, හමත්; (ඉද්දමල් ගිම්කාල ඇතිවන බැවින් මේ ගිම්කාල සුළඟ වේ.)

අනුෂ්ටුප් වෘත්තය යි.

**ශරත්කාල වායු වර්ණනාවක්.**

122 වාන්ති කල්හාර සුභගාඃ සප්තච්ඡද සුගන්ධයඃ
වාතා නවරති ම්ලාන වධූ සංගම මන්ථරාඃ

කල්හාර සුභගාඃ, හෙල්මැලියෙන් මනහර; සප්තච්ඡද සුගන්ධයඃ, සත්පත්රුක් සුවඳින් සුවඳවත්; නවරති ම්ලාන, නවසංභොගයෙන් වෙහෙසට පත්; වධූ, කාමිනියනාගේ; සංගම මන්ථරාඃ, සංගමසුඛයෙහි අලසවත්; වාතාඃ, (ශරත් කාලීන) වාතයෝ; වාන්ති, හමත්.

අනුෂ්ටුප් වෘත්තය යි

**වසන්ත කාලීන මාරුත වර්ණනාවක්.**

123 රාමාණාං රමණීය වක්ත්‍ර ශශිනඃ
සොවෙද බින්දුප්ලුතො
ව්‍යාලොලාමලකාවලීං ප්‍රචලයං
ශ්චුම්බඳ්නිතම්බාංශුකම්
ප්‍රාතර්‍ජාති මධෞ†විකාඝට විකසද්‍රාජීව රාජීරජො
ජාලාමොද මනොහරො රතිරස
ග්ලානිං හරන්මාරුතඃ

රාමාණාම්, කමනීය කාමිනීන් ගේ; රමණීය, මනහර; වක්ත්‍ර ශශිනඃ, මුවසඳු ගේ; සොවෙදබින්දු ප්ලුතඃ, සෝදිය බිඳුවෙන් යුත්; (තාසාම්, ඒ ඉතිරියන් ගේ;) අලකාවලීම්, කියඹු වැල; ප්‍රචලයන්, සොලවමින්; (එසේම ඔවුන් ගේ) නිතම්බාංශුකම්, නිතඹෙහි රැඳිවත; චුම්බන්, ස්පර්ශකරමින්;

† රතග්ලාන වධූ ගමන
ද්‍ධ නිතම්බාම්බරම් † ප්‍රකාම විකාසන්

විකසත්, පිපෙන; රාජීව රාජීරජස්ජාලා, පියුම් රොදේ රොන් සුමුහේ; මනොහරඃ ආමොදඃ, මනහර සුවඳ; විකාෂට, ඇඳ; රතිරස ග්ලානිම්, (කාන්තාවන් ගේ) රතිරෙසෙන් වූ වෙහෙස (සංභොග ශක්ති ශ්‍රමය); හරන්, පහ කෙරෙමින්; මධෞ, වසත් කල; ප්‍රාතඃ, උදය කල; මාරුතඃ, සුළඟ; වාති, හමයි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

## ග්‍රීස්මකාල සන්ධ්‍යා වර්ණනාවක්.

124 අඞ්ගං චන්දන පාණ්ඩු පල්ලව
මෘදුස්තාම්බූලතාම්‍රෝ'ධරෝ
ධාරායන්ත්‍ර ජලාභිෂෙක කලුෂෙ
ධෞතාඤ්ජනෙ ලොචනෙ
අන්තඃ පුෂ්ප සුගන්ධි රාජි කබරී සර්වාඞ්ග ලග්නාම්බරං
කාන්තානාං කමනීයතාං † විදධතෙ
ග්‍රීෂ්මෙ'පරාහ්ණාගමෙ

ග්‍රීෂ්මෙ, ගිම්කල; අපරාහ්ණාගමෙ, සවස්කල; කාන්තානාම්. කතුන්ගේ; චන්දන පාණ්ඩු අඞ්ගම්, සඳුනෙන් සුදුවත් සිරුර; පල්ලව මෘදුඃ, ළපලු හා සම මොළොක්; තාම්බූල තාම්‍ර, බුලතින් රතුවත්; අධරඃ, තොල; ධාරා යන්ත්‍ර ජල, ජල යන්ත්‍ර දියෙන්; අභිෂෙක කලුෂෙ, නෑමෙන් රතුවත්; ධෞතාඤ්ජනෙ ලොචනෙ, සේදුණු අඳුනැති නෙත්; අන්තඃ; මැද පිහිටි; පුෂ්පගන්ධිරාජ, මල් සුවඳ ඇති; කබරී, මුහුළ; සර්වාඞ්ග ලග්නාම්බරම්, සියලු සිරුරෙහි රැඳි වත යනමේවා; කමනීයතං විදධතෙ, රමණීය බව කෙරෙයි.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

125 වරමසෞ දිවසො න පුනර් නිශා
නනු නිශෛව වරං න පුනර් දිනම්
උභයමෙතදපි ව්‍රජතු ක්‍ෂයා
ප්‍රියතමෙන න යත්‍ර සමාගමඃ

† ප්‍රකාරූතෙ

එක් යෙහෙළියක් මෙසේ කියයි:- (හෙ සඛි, එම්බා යෙහෙළිය;) අසෞ දිවසඃ වරම්, මේ දවල්කල උතුම් වේ.

දෙවැන්නිය මෙසේ කියයි:- (හෙ සඛි, එම්බා යෙහෙළිය;) නනු නිශෛව වරම්, රැයම නොවේද උතුම්; න පුනඃ දිවසම්, දවල්කල නො වේ.

තුන්වැන්නිය ද මෙසේ කියයි:- යත්‍ර, යම් කාලෙක; ප්‍රියතමෙන, ප්‍රියයා සමග; න සමාගමඃ, සමාගම යෙක් නො වේ ද; (යම් රැයක හෝ දවාලෙක පෙම්වතා සමග එක් වීමෙක් නොවේ ද යන අදහසි.) (තර්හි, එකල;) එතත් උභයං අපි, ඒ දෙකලම; ක්ෂයං ව්‍රජතු, විනාසට යේවා; (ඒ දෙකලම නැතිවේවා.)

ද්‍රැතවිලම්බිත වෘත්තය යි.

**වර්ෂාරම්භ වර්ණනාවක්.**

126 මන්දං මුද්‍රිත පාංසවඃ පරිපතත්‖ ඣංඣාභිසාරා මරු-
ද්වේග ධ්වස්ත කුටීරකාග්‍ර නිපතච්ඡිද්‍රෙෂු ලබ්ධාන්තරාඃ
කර්ම ව්‍යග්‍ර කුටුම්බිනී කුචභර ස්වෙදච්ඡිදඃ ප්‍රාවෘෂඃ
ප්‍රාරම්භෙ ‡ මදයන්ති කන්දල
දලොල්ලාසාඃ පයෝ බින්දවඃ

ප්‍රාවෘෂඃ ප්‍රාරම්භෙ, වැසිකල ඇරඹීමේ දී; මන්දම්, මඳව; මුද්‍රිත පාංසවඃ, පහකළ දූවිලි ඇති; පරපතත්, පැමිණ; ජාත, හටගත්; ඣංඣාකාරඃ, දඬුරැති; මරුත් වෙග, වා වෙසින්; ධ්වස්ත, පහකළ; කුටීරකාග්‍ර නිපතත්, කිළි අග (පැල්පත් අග) ඇතිවන; ඡිද්‍රෙෂු, සිදුරුවල; ලබ්ධාන්තරාඃ, ලත් පිවිසුම් ඇති; කර්ම ව්‍යග්‍ර, කටයුතුවල යෙදෙන (ඒ ඒ ක්‍රියාවන්හි යෙදී සිටින); කුටුම්බිනී කුචභර, ගැහැනුන් ගේ (ගෘහස්ථ කාමිනීන් ගේ) පයවුරු යුගලෙහි වූ; ස්වෙදඃ ඡිදඃ, සෝ දිය දුරුකරන; කන්දල දලොල්ලාසාඃ, කඳළපත් බබලවන; පයොද බින්දවඃ, දියබිඳුහු; මදයන්ති, තුටු කොරෙත්; (නිපතන්ති, යන පාඨ විසින් වැටෙත් යන අරුති.)

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

‖ ඣාකාරි ඣඤ්ජාමරුත් ‡ නිපතන්ති

**කිසි යම් නායකයෙක් නායිකාවක දුක රාගාතිශයෙන් ඇගේ දෙස් නො තකා මෙ සේ කියයි.**

127 ඉයමසෞ තරලායත ලොචනා
ගුරු සමුන්නත පීන පයොධරා
පෘථු නිතම්බ භරාලස ගාමිනී
ප්‍රියතමා මම ජීවිත හාරිණී

තරල ආයත ලොචනා, සැලෙන දිගු නෙතැති; ගුරු සමුන්නත පීන පයොධරා, මහත් උස් පිත් පියොවුරැති; පෘථු නිතම්බ භර අලස ගාමිනි, මහත් නිතඹ බර නිසා ලැසිව ගමන් යන; ඉයං අසෞ, ඒ මේ; ප්‍රියතමා, පෙම්වතිය; මම, මගේ; ජීවිත හාරිණී, දිවිය තුටු කෙරෙයි;

දෘතවිලම්බිත වෘත්තයයි.

**කිපි නායිකාවක් නායකයකු ගේ හිසට පා පහරක් දෙයි.**

128 සාලක්තකං ශතදලාධික කාන්ති රම්‍යං
රත්නෞඝ සවධාම නිකරාරුණ නූපුරාඞ්කම්
ක්ෂිප්තං භෘශං කුපිතයා තරලායතාක්ෂ්‍යා
සෞභාග්‍ය චිහ්නමිව මූර්ධ්නි පදං විරේජේ

භෘශම්, බොහෝ සේ; කුපිතයා, කිපි; තරලායතාක්ෂ්‍යා, සැලෙන නෙතැත්තිය විසින්; රත්නෞඝ, රුයෙක; (කශ්චිත් නායකස්‍ය, කිසි යම් නායකයකු ගේ;) මූර්ධ්නි, හිසෙහි, සාලක්තකම්, ලතු සහිත; ශතදලාධික, පියුම් පෙතිවලට ද වඩා; කාන්ති, පැහැයෙන්; රම්‍යම්; සිත්කලු; සවධාම නිකර, සවකීය ආයතන සමූහය; අරුණ, රත් පැහැ කරන; නූපුරාඞ්කම්, නූරුවලයෙන් සලකුණ වූ; පදම්, පිය; ක්ෂිප් තම්, දෙනලදී; (තම්, එය;) සෞභාග්‍ය චිහ්නං ඉව, සුබග බව ඇති කරන ලකුණක් මෙන්; විරේජේ, බැබලී.

වසන්තතිලකා වෘත්තය යි.

129 ශ්‍රුත්වා’කස්මාත් නිශීථෙ නව ඝන රසිතං
විශ්ලථාඞ්ගං පතන්ත්‍යා
ශය්‍යායා භූමිපෘෂ්ඨේ කරතල ධෘතයා
දුඃඛිතාලී ජනෙන
සොත්කණ්ඨං මුක්ත කණ්ඨං කඨින
කුචතටොපාන්ත ද දීර්ණ’ශ්‍රු බින්දු
සම්ෘත්වා සම්ෘත්වා ප්‍රියස්‍ය ස්ඛලිත
මෘදුවචො රුද්‍යතෙ පාන්ථවධ්වා

නිශීථෙ, අඩරැයෙහි; අකස්මාත්, හදිසියෙන් (අහඹුයෙන්); නව ඝන රසිතම්, නව ගනකුළෙක් හඬ; ශ්‍රුත්වා, අසා; විශ්ලථාඞ්ගම්, ලිහිල් අවයවැති; ශය්‍යායාඃ, යහනින්; භූමිපෘෂ්ඨේ, බිමට; පතන්ත්‍යා, වැටෙන; දුඃඛිත ආලිජනෙන, දුකට පත් යෙහෙළි දනා විසින්; කරතල ධෘතයා, අත්තලින් අල්ලා ගන්නා ලද; පාන්ථවධ්වා, මැගියකු ගේ අඹුව විසින්; සොත්කණ්ඨම්, උකටලි සහිතව; මුක්තකණ්ඨම්, මිදූ ගෙලැතිව; කඨින, දූඩි; කුචතටොපාන්ත, පියවුරු මත වැටුණු; දීර්ණ අශ්‍රුබින්දු, විසුරුණ කඳුළු බිඳු ඇතිව; ප්‍රියස්‍ය, හිමියා ගේ; ස්ඛලිත, පැකිළි; මෘදුවචඃ, මුදු බස; සම්ෘත්වා සම්ෘත්වා, සිහි කරමින්; රුද්‍යතෙ, හඬනු ලැබේ.

ස්‍රග්ධරා වෘත්තයයි.

**නායකයෙක් දූතියකට මෙසේ කියයි.**

130 පීතො යතඃ ප්‍රභෘති කාමපිපාසිතෙන
තස්‍යා මයාධර රසඃ ප්‍රචුරඃ ප්‍රියායාඃ
තෘෂ්ණා තතඃ ප්‍රභෘති මේ ද්විගුණත්වමෙති
ලාවණ්‍යමස්ති බහු තත්‍ර කිමත්‍ර චිත්‍රම්

යතඃ ප්‍රභෘති, යම් දිනෙක සිට; කාම පිපාසිතෙන මයා, කම් පවසින් යුත්’ මා විසින්; තස්‍යාඃ ප්‍රියායාඃ, ඒ ප්‍රියාව ගේ;

---

ද ශීර්ණාශ්‍රු

ප්‍රචුරඃ, බොහෝ වූ; අධර රසඃ පීතඃ, අදර රසය බොන ලද ද; තතඃ ප්‍රභෘති, එතැන් සිට; මෙ තෘෂ්ණා, මාගේ තෘෂ්ණාව; ද්විගුණත්වං එති, දෙගුණ බවට පැමිණෙයි; අත්‍ර, මෙහි; කිං චිත්‍රම්, මොන පුදුමයෙක් ද; තත්‍ර, එහි; බහු ලාවණ්‍යම්, බෝ සිරියෙක්; අස්ති, ඇත;

වසන්තතිලකා වෘත්තය යි.

131 ග්‍රාමෙස්මින් පථිකාය පාන්ථ වසති
නෛවාධුනා දීයතෙ
රාත්‍රාවත්‍ර විවාහ මණ්ඩපතලෙ පාන්ථඃ ප්‍රසුප්තො යුවා
තෙනොත්ථාය ඛලේන ගර්ජති ඝනෙ
ස්මෘත්වා ප්‍රියාං තත් කෘතං
යෙනාද්‍යාපි කරඞ්ක දණ්ඩපතනා ශඞ්කී ජනඃ තිෂ්ඨති

පාන්ථ, මැඟිය; අධුනා, දැන්; අස්මින් ග්‍රාමෙ, මේ ගමෙහි; පථිකාය, මැඟියකුට; වසතිඃ, නවාතැනක්; න දීයතෙ, දෙනු නො ලැබේ; අත්‍ර විවාහ මණ්ඩපතලෙ, මේ මගුල් මඩුවේ; රාත්‍රෞ, රැයෙහි; (කඃ අපි) යුවා පාන්ථඃ, (කිසි යම්) තුරුණු මැඟියෙක්; ප්‍රසුප්තඃ, නිදාගත්තේය; ඝනෙ ගර්ජති, වැසිවලාව ගුගුරන කල; තෙන ඛලෙන, ඒ දුෂ්ටයා විසින්; ප්‍රියාං ස්මෘත්වා, ප්‍රියාව සිහිකොට; තත්කෘතම්, එය කරන ලදී; යෙන, යම් හෙයකින්; අද්‍යාපි, අදතෙක්; කරඞ්ක දණ්ඩ පතනාශඞ්කී, මරණය වෙතියි යන සැක ඇති; ජනඃ, ජන තෙමේ; තිෂ්ඨති, සිටී ද; (එහෙයිති.)

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**විදෙසකට යාමට අදහස් කළ තැනැත්තකු ගේ හා ඔහු ගේ බිරිය අතර සංවාදයක්.**

132 කාන්තෙ කත්‍යපි වාසරාණි ගමය ත්වං මීලයිත්වා දෘශෞ
ස්වස්ති ස්වස්ති නිමීලයාමි නයනෙ යාවන්න ශූන්‍යා දිශඃ
ආයාතා වයමාගමිෂ්‍යසි සුහෘද්වර්ගස්‍ය භාග්‍යොදයෛඃ
සංදෙශො වද කස්තවාභිලෂිතස්තීර්ථෙෂු තොයාඤ්ජලිඃ

**සැමියා:-** (හෙ) කාන්‍තෙ, (එම්බා) ප්‍රියාව; තම්, තෝ; දෘශෞ මීලයිත්වා, දෙනෙත් පියා; කත්‍යපි වාසරාණි, දින කීපයක්; ගමය, ගතකරව;

**බිරිය:-** සවස්ති සවස්ති, (ඔබට) යහපතෙක් වේවා යහප තෙක් වේවා; යාවත්, යම්තාක් කල්; දිශඃ, දික්හු; ශූන්‍ය න, හිස් නොවෙත් ද; (තාවත්, ඒතාක් කල්; නයනෙ, දෙ නුවන්; නිමීලයාමි, පියා ගනිමි; (ඔබ නොපෙනී ගිය කල සදහට ම නෙත් පියමි යු සේයි.)

**සැමියා;-** වයම්, අපි; ආයතා, පැමිණීයෙමි;

**බිරිය:-** සුභෘත් වර්‍ගීස්‍ය, යහළු වගෙහි; භාග්‍ය උදයෙයඃ, වාසනා උදවෙත්; ආගමිෂ්‍යසි, එත්නෙහි;

**සැමියා:-** සංදෙශඃ වද, සදෙස කියව; තව අභිලෂිතඃ කඃ, නි ගේ අදහස කුමක් ද;

**බිරිය:-** නිවේෂු, පිත්නොවුහි; තොයාඤ්ජලිඃ, දලැදිල්ලෙකි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**නායකයෙක් නායිකාව ගේ මානය මෙ සේ පහකරයි.**

133 කොපස්ත්වයා හෘදි කෘතො යදි පඞ්කජාක්‍ෂි
සො'ස්තු ප්‍රියස්තව කිමත්‍ර විධෙයමන්‍යත්
ආශ්ලෙෂමර්පය මදර්පිත පූර්‍වමුච්චෛඃ
මහ්‍යං සමර්පය මදර්පිත චුම්බනං ච

(හෙ) පඞ්කජාක්‍ෂි, (එම්බා) පියුමැසිය; යදි, ඉදින්; ත්වයා, නි විසින්; හෘදි (නි ගේ) හදෙහි; කොපඃ, කොව; කෘතඃ, කරන ලද නම්; සඃ, එය; තව, තිට; ප්‍රියඃ අස්තු, පිය වේවා; අත්‍ර, මෙහි ලාඃ; අන්‍යත් විධෙයං කිම්, අන් කුමක් කළයුතු ද; පූර්‍වම්, පෙර; මත් අර්පිත, මා (තිට) දුන්; ආශ්ලෙෂම්, වැළඳ ගැනුම; අර්පය, (මට) දෙව; මත්අර්පිත චුම්බනං ච, මා විසින් (තිට) දෙන ලද සිඹුම ද; මහ්‍යං සමර්පය, මට දෙව;

වසන්තතිලකා වෘත්තයයි.

### වියොවුවකු ගේ සිතිවිල්ලක්.

134 හාරො ජලාද්‍රවසනං නලිනිදලානි
ප්‍රාලෙය ශිකරමුචස්තුහිනාංශු භාසඃ
යස්‍යෙන්ධනානි සරසානි ච චන්දනානි
නිර්වාණමෙෂ්‍යති කථං ස මනොභවාග්නිඃ

හාරඃ, මුතුහර; ජලාද්‍රවසනම්, තෙත් වත; නලිනී දලානි, පියුම් පත්; ප්‍රාලෙය ශිකරමුචඃ, හිම දියබිඳු; තුහිනාංශු භාසඃ, සඳරැස්; සරසානි, තෙත්; චන්දනානිච, සඳුන් ද යන මේවා; යස්‍ය, යමකුගේ; ඉන්ධනානි, දරවෙත් ද; (තර්හි, එකල;) කථම්, කෙ සේ; සඃ මනොභවාග්නිඃ, ඒ මදන ගින්න; නිර්වාණං එෂ්‍යති, නිවුමට යේ ද.

වසන්තතිලකා වෘත්තය යි.

### ස්ත්‍රියක ගේ මුඛ වර්ණනාවක්.

135 තන්වි ශරත්ත්‍රිපථගා පුලිනෙ කපොලෙ
ලොලෙ දෘශෞ රුචිර චඤ්චල ඛඤ්ජරීටෞ
තද්බන්ධනාය සුවිරුර්පිත සුභ්‍රූචාප-
චාණ්ඩල පාශයුගලාවිව ශූන්‍යකර්ණෞ

තන්වී, තුනුවතිය; ශරත් ත්‍රිපථගා, ශරත්කාලින ගංගාවෙකි; කපොල, (ඇගේ) දෙ කොපුල; පුලිනෙ, (ඒ ගඟෙහි වූ) වැලිතලා දෙකෙකි; ලොලෙ දෘශෞ, සැලෙන දෙ ඇස්; රුචිර, මනහර; චඤ්චලා සැලෙන; ඛඤ්ජරීටෞ, එනම් පක්ෂීහු (වෙරලවටු?) දෙ දෙනෙකි; ශූන්‍ය කර්ණෞ, හිස් ආකාර වූ දෙකන්; තත් බන්ධනාය, ඒ ඛඤ්ජරීට පක්ෂීන් බඳනා පිණිස; සුභ්‍රූචාප, මනහර දෙ බැම නමැති දුනුවල; සුවිරුර්පිත, මොනවට පිහිටවූ; චාණ්ඩාල පාශ යුගලං ඉව, කාමයා ගේ මල පුඩු දෙකක් මෙනි.

වසන්ත තිලකා වෘත්තය යි.

**නායකයෙක් නායිකාව ගැන මෙසේ සිතයි.**

136 පාදඞ්ගුෂ්ඨේන භූමිං කිසලය රුචිනා
සාපදේශං ලිඛන්ති
භූයො භූයඃ ක්ෂිපන්ති මයි ශිත ශවලෙ
ලොචනෙ ලොලතාරෙ
වක්ත්‍රං හ්‍රීනම්‍රමීෂත් ස්ඵුරදධරපුටං
වාක්‍යගර්භං දධානා
යන්මාං නොවාච කිංචිත් ස්පිතමපි
හෘදයෙ මානසං තද්දුනොති

කිසලය රුචිනා, ලපලු පැහැති; පාදඞ්ගුෂ්ඨේන, පය මාපටැඟිල්ලෙන්; සාපදෙශම්, අපදෙශ සහිතව; (සකාරණව) ලිඛන්ති, බිම ඉරි අඳින; භූයඃ භූයඃ, වරින්වර; ශිත ශවලෙ, සුදු කබරවන්; ලොලතාරෙ, සැලෙන නෙත්තරු ඇති; ලොචනෙ, දෙනුවන්; මයි, මාකෙරෙහි; ක්ෂිපන්ති, හෙලන; හ්‍රීනම්‍රම්, විලියෙන් නැමුණු; ඊෂත් ස්ඵුරන්, මඳක් සැලෙන; අධරපුටම්, තොලැති; වාක්‍ය ගර්භම්, වැකි ගබ්කොට ඇති; වක්ත්‍රම්, මුව; දධානා, ධරන්තිය; යත්, යම් හෙයකින්; හෘදයෙ ස්පිතං, හදතුලවූ; කිංචිත් අපි, මඳක් හෝ; නො වා ච, නො කී ද; තත්, එහෙයින්; මානසම්, (මගේ) සිත; දුනොති, තවයි.

ස්‍රග්ධරා වෘත්තය යි.

**අළුත විවාහයට පත් යුවතියක ගේ වර්ණනාවක්**

137 ඌරූද්වයං මෘගදෘශඃ කදලස්‍ය කාණ්ඩෞ
මධ්‍යං ච වෙදිරතුලං ස්තනයුග්මමස්‍යාඃ
ලාවණ්‍ය වාරි පරිපූරිත ශාතකුම්භ-
කුම්භෞ මනොජ නෘපතෙරභිෂේචනාය

මෘගදෘශඃ, මියු ලැසිය ගේ; ඌරූද්වයම්, දෙකලවා; කදලස්‍ය කාණ්ඩෞ, කෙසෙල් කඳන් දෙකෙකි; මධ්‍යං ච, මැද පෙදෙසද (ඉඟ); අතුලම්, අතුල්‍ය; වෙදිඃ, පිල් කඩෙකි; අස්‍යාඃ,

ඇය ගේ; ස්තන යුග්මම්; දෙතන; මනොජ නෘපතෙඃ, අනං ගරජයාගේ; අභිෂේචනාය, අබිසෙස සඳහා ගත්; ලාවණ්‍ය වාරි පරිපූරිත, සිරුරැ සිරිය නමැති දිය පිරි; ශාතකුම්භ කුම්භෞ, රන් කළ දෙකකි.

වසන්ත තිලකා වෘත්තය යි.

**කාමියකු ගේ වර්ණනාවක්.**

138 හාරෝ'යං හරිණාක්ෂීණාං ලුඨති ස්තන මණ්ඩලෙ
මුක්තානාමප්‍යවස්ථෙයං කෙ වයං ස්මර කිඞ්කරාඃ

අයං හාරඃ, මේ මුත්හර; හරිණාක්ෂීණාම්, මියු ලැසියන් ගේ; ස්තන මණ්ඩලෙ, තන මඬලෙහි; ලුඨති, පෙරළෙයි. මුක්තානාං අපි, මුතුවල ද නොහොත් මිදුණවුන් ගේ ද; ඉයං අවස්ථා, මේ අවස්ථාවයි; වයං කෙ, අපි කවරහු ද; ස්මර කිඞ්කරාඃ, අනඞ්ග සෙවකයෝ ද;

අනුෂ්ටුප් වෘත්තය යි.

**යෙහෙළියක් නායිකාවක ගෙන් මෙසේ විචාරයි.**

139 අන්‍යොන්‍ය ග්‍රථිතාරුණාඞ්ගුලි නමත්
පාණිද්වයස්‍යොපරි
න්‍යස්‍යොච්ඡ්වාස විකම්පිතාධර දලං
නිශ්චේද ශූන්‍යං මුඛම්
ආමීලන්නයනාන්ත වාන්ත සලිලං
ශ්ලාඝ්‍යස්‍ය නිත්‍ද්‍යස්‍ය වා
කස්‍යෙදං දූඪ් සෞභාද්‍රං ප්‍රතිදිනං
දීනං ත්වයා ස්මර්‍යතෙ

අන්‍යොන්‍ය, එකිනෙක; ග්‍රථිත, ගෙතූ (පටලවාගත්); අරුණාඞ්ගුලි, රතැඟිලි; නමත්, නමන ලද; පාණි ද්වයස්‍ය උපරි, අත් දෙක මත; න්‍යස්‍ය, තබා; උච්ඡ්වාස, සුසුමින්, විකම්පිත අධරම්, සැලෙන තොලැති; නිශ්චේද ශූන්‍යං මුඛම්

කලකිරීමෙන් සුත් මූවැති (උදාසීන මුවැති); ආමීල, මදක් පියවූ; නයනාන්ත, නෙත'ගින්; වාන්ත සලිලම්, ගලන කඳුළු ඇති; ප්‍රතිදිනම්, දිනපතා; ඉදම්, මේ; කස්‍ය, කවරකු සම්බන්ධ; දීනම්, බැගෑ; දෘඪ සෞභාග්‍යදම්, දෘඪ සුහද බව; ශ්ලාඝ්‍යස්‍ය, පැසසුමට හෝ; නින්ද්‍යස්‍ය වා, නින්දාවට හෝ; ත්වයා, තී විසින්; ස්මයීතෙ, සිහිකරනු ලැබේ ද.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**යෙහෙළියක් මානවතියකට මෙසේ කියයි.**

140 අසද්වෘත්තො නායං න ච ඛලු ගුණෛරෙෂ රහිතඃ
ප්‍රියො මුක්තාහාරස්තව චරණමූලෙ නිපතිතඃ
ගෘහාණෛමං මුග්ධෙ ! ව්‍රජතු නිජකණ්ඨෙ ප්‍රණයිතා-
මුපායො නාස්ත්‍යන්‍යස්තව හෘදය සන්තාප ශමනෙ

(හෙ) මුග්ධෙ, (එම්බා) බාලාව; අයම්, මෙය; අසද්වෘත්තඃ න, අයහපත් නො වේ (මෙය හොඳ මුතුහරෙකි); ච, තවද; ඛලු, නියතින්ම; එෂඃ, මෙය (මුතුහර); ගුණෛඃ, හුයෙන්; රහිතඃ න, රහිත නො වේ (මෙහි මුතු ඇමුනූ හුයද තිබේ ); ප්‍රියඃ, පිය; මුක්තාහරඃ, මුතුහර; තව, තිගේ; චරණ මූලෙ, පාමුල; නිපතිතඃ, වැටී තිබේ; ඉමම්, මෙය; ගෘහාණ, ගනුව; නිජ කණ්ඨෙ ප්‍රණයිතා ව්‍රජතු, සිය ගෙලෙ පැලැඳීමට යේවා; තව, තිට; හෘදය සන්තාප ශමනෙ, හද තැවුල හරනට; අන්‍යඃ උපායඃ, අන් උපායෙක්; නාස්ති, නො වේ.

**දෙවන පසට:-**

(හෙ) මුග්ධෙ, (එම්බා) බාලාව; අයම්, මේ තොපගේ පෙම් වතා; අසත් වෘත්තඃ න, නොමනා ගති ඇත්තෙක් නො වේ; ච, තව ද; ඛලු, නියතින් ම; එෂඃ, මෙ තෙමේ; ගුණෛඃ, ගුණෙන්; රහිතඃ න, තොර ද නො වේ; ප්‍රියඃ මුක්තාහාරඃ, (තොප ගේ පෙම්වතා නොගත් අහරැත්තේ; තව චරණ

මූලෙ, තොප ගේ පාමුල; නිපතිතඃ, වැටී සිටී; (තොපගේ පා වදී යන අදහසි.) ඉමම්, මොහු; ගෘහාණ, ගනුව; නිජ, සිය; කණ්ඨෙ, ගෙලෙහි; ප්‍රණයිනා ඩූජතු, විස්වස් බවට යේවා; නව හෘදය සන්තාප ශමන, තොප ගේ හද නැවුල නිවුමට; අන්‍යඃ උපායඃ න, අන් උපාවෙක් නො වේ;

ශිඛරිණී වෘත්තය යි.

**මැගියකු ගේ සිතිවිල්ලක්.**

141 ආලොකයන්ති පයොධරමුපමන්දිරමහි
නවාම්බුහර නිලම්
දයිතා රචිත චිතානල ධූමොද්ගම
ශඞ්කයා පථිකඃ

පථිකඃ, මැගියෙක්; උපමන්දිරං අහි, කෙළිමැදුර ඉදිරියෙ නවාම්බුධර නිලම්, නව දියෙන් නිල්වන්; පයොධරම්, ගන කුළ; දයිතා රචිත; බිරිය උදෙසා කරන ලද; චිතා නල, දර සෑයේ ගින්හෙන්; ධූමොද්ගම ශඞ්කයා, හටගත් දුමිය යන සැකයෙන්; ආලොකයති, බලයි.

ආර්‍යා වෘත්තය යි.

**උසස් අඹුසැමි දෙදෙනකු ගේ ස්වරූපයක්.**

142 ආශ්ලිෂ්ටා රහසාද්විලීයන
ඉවා ක්‍රාන්තාප්‍යනඞ්ගන යා
යස්‍යාඃ කෘත්‍රිම චණ්ඩ වසතු
කරණාකුතෙෂු බිත්‍යාං මතඃ
කො යං කාහමිති ප්‍රවෘත්ත සුරතා
ජානාති යා නාන්තරං
රන්තුඃ සා රමණී ස එව රමණඃ
ශෙෂෞ තු ජායාපතී

යා, යම් ස්ත්‍රියක්; අනඞ්ගන, අනඟා විසින්; ආක්‍රාන්තා අපි, මඩනා ලද ද; විලීයන ඉව, (හිමියා ගේ ඇඟට) ඇලු නාක් මෙන් නොහොත් දියවුණාක් මෙන්; රහසාත්,

වෙසින්; ආශ්ලිෂ්ටා, වැළඳ ගත්තී ද; කෘත්‍රිම, බොරු; චණ්ඩ වස්තුකරණ, සැඩගති ඇති කරන; ආකූතෙෂු, කායික ව්‍යාපාරයන්හි; යස්‍යාඃ, යම් තැනැත්තියක ගේ; මනඃ, සිත; බිත්නම්, බැඟැපත් වේද; - ප්‍රවෘත සුරතා යා, පටන් ගත් සුරතවත් යම් ලියක් (සුරතයෙහි යෙදුණු ස්ත්‍රියක්); අයං කඃ, මොහු කවරෙක් ද; අහං කා ඉති, මම කවරියක් දැයි යන; අන්තරම්. වෙනස; න ජානාති, නො දනීද; රන්තුඃ, රමණය කරන්නාට; සා රමණී; ඕ රමණියෙකි; සඃ එව රමණඃ, (රමණය කරන්නියට) ඔහුම රමණයෙකි; ශෙෂෙෂු, සෙසු යුවල වනාහි; ජයාපතී, (සිරිතට අනුව විවාපත්) දම්පතීහු වෙති.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිසියම් නායිකාවක ගේ ජන විමොහනකාරී ප්‍රභා වර්ණනාවක්.**

143 කිං බාලෙ මුග්ධතෙයං ප්‍රකෘතිරියමථො
රෞද්‍රතා කිං නු කොපඃ
කිං වා චාපල්‍ය මුච්චෛර්වූතමුත
කිමු තෙ යෞවනාරම්භ දපීඃ
යත් කෙශාලාප වක්ත්‍ර ස්මිත ලලිත
කුච භ්‍රැවිලාසාවලග්නෛඃ
සවසෙථා ලොකස්තවදීයෙ මීනසි
විනිහිතෛදීහ්‍යතෙම්භිරුයීඃ

(හෙ) බාලෙ, (එම්බා) බාලාව; ඉයම්, මේ; මුග්ධතා, බොළඳ බව; කිම්, කිම; ඉයම්, මේ; ප්‍රකෘතිඃ, පියවි ගතියෙක් ද; අථ, නොහොත්; රෞද්‍රතා, රළු බවෙක් ද; කිං නු, කිම; කොපඃ, කොවෙක් ද (කොපයෙක් ද); කිං වා, කිම; උච්චෛඃ, උස්වූ; චාපල්‍යම්, චපල බවෙක්ද; උත, නොහොත්; ව්‍රතම්, වතෙක් ද; කිමු, කිම; යෞවනාරම්භ දපීඃ, යොවුන උදුවෙන් ඇතිවන එඩියෙක් ද; යත්, යම්හෙයකින්; ත්වදී යෛඃ, තා පිළිබඳවූ; කෙශ, කෙස්, ආලාප, බස්; වක්ත්‍ර, මුව; ස්මිත, සිනාව; ලලිත, මනහර නොහොත් ලෙළදෙන; කුච,

පියවුරු; භ්‍රූ, බැම; විලාස, ආකාල්පය නොහොත් භ්‍රූවිලාස (බැම නගන ලීලාව) යන; අම්භිඃ, මෙයින්; අවලග්නෙ, ඇලීමෙන්; මනසි විනිහිතෙඃ, සිත් වර්ණකර ගැනීමෙන්; සවසථඃ, සුවපත්; ආසීලොකඃ, ශ්‍රෙෂ්ඨ ලොකයා; දහ්‍යතෙ, දවනු ලබන්නේ ද;

ස්‍රග්ධරා වෘත්තය යි.

**දෙගුරුන් හමුවෙහි කරන ලද පෙම්වතුන් දෙදෙනකු ගේ ශෘඞ්ගාර චෙෂ්ටා වර්ණනාවක්.**

144 ගච්ඡත්‍යූත්‍යානතයා භ්‍රූවෙව ගදිතං
මන්දං වලන්ත්‍යා නයා
තෙනාප්‍යාඤ්චිත ලොචන ද්වය
පුටෙනාඥ ගෘහිතා ශනෛඃ
සංකෙතාය චලද්දෘශා පිශුනිතා
ඥතා ච දීක් ප්‍රෙයසා
ගූඪඃ සංගම නිශ්චයො ගුරුපුරොඃ
ප්‍යෙවං යුවභ්‍යාං කෘතඃ

මන්දම්, මඳව; වලන්ත්‍යා, සැලෙන; උත්‍යානතයා, උස්; භ්‍රූවෙව බැමෙන් ම; නයා, ඈ විසින්; ගච්ඡ ඉති, යවයි; ගදිතම්, (පෙම්වතාට) කියන ලදී; තෙන අපි, ඔහු විසින් ද; අඤ්චිත, හකුළන ලද; ලොචන ද්වය පුටෙන, දෙ නෙත් පුටෙන්; ආඥා, අණ; ශනෛඃ, සෙමින්; ගෘහිතා, ගන්නා ලදී; සංකෙතාය, සලකුණු තැන උදෙසා; චලත් දෘශා, සැලෙන ඇසින්; පිශුනිතා, දක්වන ලද; දීක්, දිග; ප්‍රෙයසා, පෙම්වතා විසින්; ඥතා ච, දන්නා ලද මය; එවම්, මෙසේ; ගුරු පුරඃ අපි, දෙ ගුරුන් ඉදිරියෙහි පවා; යුවභ්‍යාම්, ඒ දෙ දෙනා විසින්; ගූඪඃ, සැඟවුණු; ස ගම නිශ්චයඃ, සංගම නිශ්චය; කෘතඃ, කරන ලදී; (පෙම්වතුන් දෙදෙනකු ගුරුන් ඉදිරියෙහි බැමින් කළ ඉඟියෙන් අදහස් හුවමාරු කරගත් බවක් කියයි.)

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**සිහිවිල්ලෙහි යෙදී සිටින නායිකාවක ගෙන් යෙහෙළි යක් මෙසේ පිළිවිසිනි.**

145 චටුල නයනෙ ශූන්‍යා දෘෂ්ටිඃ කෘතා බලු කෙන තෙ
ක ඉහ සුකෘතී දෘෂ්ටව්‍යානාමුච්‍යාහ ධූරං පරම්
යම් ලිඛිත ප්‍රබෝ්‍යරඛෙඩෙ න මූඪසි වෙතසා
වදන කමලං පාණෞ කෘත්වා නිමීලිත ලොචනා

(හෙ) චටුල නයනෙ, (එම්බා) සසල නෙතැත්තිය; කෙන, කවරකු විසින්; තෙ දෘෂ්ටිඃ, තිගේ දෑක්ම; ශූන්‍යා කෘතා බලු, හිස්වූවක් කරන ලද ද; ඉහ, මෙහි; දෘෂ්ටව්‍යානාම්, දෑකිය යුතු දේවල් පිළිබඳ; පරාංධූරම්, උසස් පදවිය; කඃ සුකෘතී, කවර පිනැත්තෙක්; උවාහ, ඉසිලී ද; අභිලිඛිත ප්‍රබෝ්‍යඃ, අලෙව්පටෙක බඳු; අඛෙඩඃ, සිරුරු අවයවයන් ගෙන් යුතුව; වදන කමලම්, මුව පියුම; පාණෞ කෘත්වා, අත්ලෙහි තබා; නිමීලිත ලොචනා, පියවූ නෙතැති; වෙතසා, සිතින්; යම්, යමකු; න මූඪසි, නො මූදහි ද.

හරිණී වෘත්තය යි.

**මානය අත් නො හරින නායිකාවක්**

146 වලතු තරලා ධෘෂ්ටා දෘෂ්ටිඃ බලා සඛි ! මෙබලා
ස්ඛලතු කුචයොරුත්කම්පාත් මෙ විදීර්‍යතු කඤ්චුකම්
තදපි න මයා සංභාව්‍යොසෞ පුන දීයිතඃ ශඨඃ
ස්ඵුටති හෘදයං මානෙනාන්ත නීමෙ යදි තත් ක්‍ෂණම්

(හෙ) සඛි, (එම්බා) යෙහෙළිය; තරලා, සැලෙන; ධෘෂ්ටා, බුහුටි නොහොත් දයා රහිත; (මෙ) දෘෂ්ටිඃ, මා ගේ ඇස; වලතු, සැලේවා; මෙබලා, මෙවුල; ස්ඛලතු, ගිලිහේවා; කුචයොඃ උත්කම්පාත්, දෙපියවුරන් ගේ කම්පනයෙන්; මෙ කඤ්චුකම්, මගේ සැට්ටය; විදීර්‍යතු, ඉරේවා; තදපි, එසේ වුවත්; තත් ක්‍ෂණම්, එ කෙණෙහි; (ඇතිවන; මානෙ න, මතින්; මෙ, ම ගේ; අන්තඃ හෘදයම්, ඇතුළු හද; ස්ඵුටති

යදි, පැලීයේ නමුත්; පුනඃ, යළි; මයා, මා විසින්; අශෙෂ ශඨඃ, මෙ කපටි; දයිතඃ, හිමියා; න සංභාව්‍යඃ, නො පිළිගත යුතුය.

හරිණී වෘත්තය යි.

**නායක නායිකා දෙ දෙනකු ගේ එක් අවස්ථාවක්.**

147 තෛස්තෛශ්චාටුභිරාඥයා කිල තයා
ව්‍යාතෙන රති ව්‍යත්‍යයෙ
ලජ්ජාමන්ථරයා තයා නිවසිතෙ
භ්‍රාන්ත්‍යා මදීයාංශුකෙ
තත් පට්ටාංශුකමුද්වහන්නහමපි
ස්මිත්වා යදුක්තො ධුනා
වෙෂො යුජ්‍යත එෂ එව හි
තවෙත්‍යතන්න විස්මාර්‍යතෙ

තෛඃ තෛඃ චාටුභිඃ, ඒ ඒ චාටු බසින්; ආඥයා, ඇණවීමෙන්; තයා කිල, ඇ විසින්; රතිව්‍යත්‍යයෙ, පුරුෂායිතය; ව්‍යාතෙන, පටන් ගත් කල; ලජ්ජාමන්ථරයා තයා, හිරියෙන් ලැසිගත් ඇ විසින්; භ්‍රාන්ත්‍යා, බැමුමෙන් (වැරදීමෙන්); මදීයාංශුකෙ, මා ගේ වත; නිවසිතෙ, හැඳගත් කල; අහං අපි, මම ද; තත් පට්ටාංශුකම්, ඇගේ පටවත; උද්වහන්, දරමින්; ස්මිත්වා, සිට; අධුනා, දැන්; තව, තොප ගේ; එෂඃ එව වෙෂඃ, මේ වෙස ම; යුජ්‍ය ත ඉති, හොඳය යැ; යත්, යමක්; උක්තඃ, කියන ලදුයෙම් ද; එතත්, එය; න විස්මාර්‍යතෙ, අමතක නොවේ.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

148 පත්‍රං න ශ්‍රවණෙ'ස්ති වාෂ්ප ගුරුණෝර්
නෙත්‍රයොඃ කජ්ජලං
රාගඃ පූර්වං ඉවාධරෙ චරණයො
ස්තත්ව්‍යා න වා ලක්තකඃ
වාතෝච්ඡිත්තිෂු නිෂ්ටුරෙති භවතා
මිථ්‍යෙව සංභාව්‍යතෙ
සා ලෙඛං ලිඛතු ච්‍යුතොපකරණා
න්‍යායෙන කෙනාධුනා

තත්ව්‍යා, තුනුවන ගේ; ශ්‍රවණෞ, කනෙහි; පත්‍රං න අසාති, කන් පත නොවේ; වාෂ්ප ගුරුණෞ, කඳුළු පිරි; නෙත්‍රයොඃ. දෙ නෙත්හි; කජ්ජලං න, අඳුන් නො වේ; පූර්වං ඉව, පෙර මෙන්; අධරෙ, තොලෙහි; රාගඃ න, රත් පැහැය නො වේ; චරණයොඃ ච, දෙ පාහිද; අලක්තකඃ න, ළතු නො වේ; වාතීා උච්ඡිත්තිෂු, තොරතුරු සිඳුම්හි ලා (නො කීමෙහි); භවතා, ඔබ විසින්; (සා, හෝ තොමෝ;) නිෂ්ඨුරා ඉති, රළු යැ යි; මිථ්‍යා එව සංභාව්‍යතෙ, නො සැබෑවක් ම කියනු ලැබේ; ච්‍යුත උපකරණා සා, උපකරණ රහිත හෝ; අධුනා, දැන්; කෙන න්‍යායෙන, කවර අයුරෙකින්; ලෙඛං ලිඛතු, ලියුම ලියන්නි ද.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි

149 යදි විනිහිතා ශූන්‍යා දෘෂ්ටිඃ කිමු සථිර කෞතුකා
යදි විරචිතො මෞනෙ යත්නඃ කිමු ස්ඵුරිතො'ධරඃ
යදි නියමිතං ධ්‍යානෙ චෙතඃ කථං පුලකොද්ගමඃ
කෘතමභිනයෛර්දෘෂ්ටො මානඃ ප්‍රසීද විමුච්‍යතාම්

යදි, ඉදින්; ශූන්‍යා දෘෂ්ටිඃ, හිස් බැල්ම; විනිහිතා, යෙදුයේ නම් (කළේ නම්); සථිර කෞතුකා, තිර කුහුල; කිමු, කිමැ (කෙ සේ වී ද;); මෞනෙ, නිහඬ බවෙහි; යත්නඃ, උත්සාහය; විරචිතඃ යදි, කරන ලද නම්; (එසේ කල) ස්ඵුරිත අධරඃ, සැලෙන තොල; කිමු, කිමැ; ධ්‍යානෙ, දැහැනෙහි; චෙතඃ, සිත; නියමිතං යදි, යෙදුයේ නම්; පුලකොද්ගමඃ, ලොමුදහය; කථම්, කෙ සේ වී ද; ප්‍රසීද, පහදුව; අභිනයෛඃ, ඉංගිතාදියෙන්; කෘතම්, කරන ලද; දෘෂ්ටඃ මානඃ, දක්නාලද මානය; විමුච්‍යතාම්, හරිනු ලැබේවා.

හරිණී වෘත්තය යි.

**දෙගුරුන් හමුයෙහි දම්පතීන් ගේ ශෘඞ්ගාර චෙෂ්ටා වර්ණනාවක්.**

150 යද්‍රාත්‍රෞ රහසි ව්‍යපෙත විනයං
වෘත්තං රසාත් කාමිනො-
රන්‍යොන්‍යං ශයනීයමීහිතරසා වාප්ති
ප්‍රවෘත්ත ස්පෘහම්
තත් සානන්ද මිලද්දෘශොඃ කථමපි
ස්මෘත්වා ගුරූණාං පුරො
හාසොද්භෙද නිරොධ මන්ථර මිලත්
තාරං කථංචිත් ස්මිතම්

කාමිනොඃ, කාමීන් ගේ (පෙම්වතුන් දෙ දෙනා ගේ); රාත්‍රෞ, රෑයෙහි; රහසි, රහස්හි; ශයනීයම්, යහනෙහි දී; අන්‍යොන්‍යම්, ඔවුනොවුන් පිළිබඳ; ඊහිත, කැමතිවන ලද; රසාවාප්ති, රස ප්‍රාප්තියෙහි; ප්‍රවෘත්ත ස්පෘහම්, පැවැති ආශා ඇති; යත් ව්‍යපෙත විනයම්, යම් පහවූ විනයෙක්; වෘත්තම්, වී ද; තත්, එය; සානන්ද, අනඳ සහිත; මිලත් දෘශොඃ, එක්වූ නෙත් ඇතියනට; කථමපි, කෙ සේ හෝ; ස්මෘත්වා, සිහිවී; ගුරූණාං පුරඃ, දෙ ගුරුන් හමුවෙහි; හාසොද්භෙද නිරොධ, සිනාව වළකා ලීමෙන්; මන්ථර, ලැසි ගත්; මිලත්තාරම්, එක්වූ පිංගිති ඇතිව; කථංචිත්, දුකසේ (ඉතා අපහසුවෙන්); ස්මිතම්, සිටියේයි.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**රත්‍යුත්කණ්ඨිත නායිකාවක ගේ සුන්දර වර්ණනාවක්.**

151 යාතෙ ගොත්‍ර විපර්යයෙ ශ්‍රුතිපථං
ශය්‍යාගතායාශ්චිරං
නිධ්‍යාතං පරිවර්තනං හෘදි පුනඃ
ප්‍රාරබ්ධමඞ්ගීකෘතම්

හ්‍රියස්තාත් ප්‍රකෘතං කෘතං ච වලිත
ක්ෂිප්තෛක දෛලෛබයා
මානිත්‍යා න තු පාරිතඃ ස්තනභරෝ
නෙතුං ප්‍රියස්‍යෝරසඃ

ශය්‍යා ගතායාඃ, යහන්පත්තිය ගේ; ශ්‍රැති පථම්, කන් මහට; ගොත්‍ර විපර්‍යයෙ, (සැමියා විසින් කියන ලද) අන් ඉතිරියක ගේ නමක්; යා තෙ, පැමිණි කල (ඇසුණු කල); චිරම්, බෝ වේලාවක්; නිධ්‍යාතම්, (ඈ විසින් ඒ ගැන) සිතන ලදී; පුනඃ, යළි; හෘදි, ළෙහි; පරිවර්තිනං (කෘතම්,) වෙනසෙක් කරන ලදී; (ඒ ගැන කල්පනාව අත්හරින ලදී යන අදහසි.) ප්‍රාරබ්ධම්, පටන්ගත් ක්‍රියාව; අඞ්ගීකෘතම්, ස්වායත්ත කරන ලදී (පිළිගන්නා ලදී.); හ්‍රියඃ තව ද; තත්, එය (තම අදහස); ප්‍රකෘතං කෘතං ච, පළමු තත්වයට හෙවත් පළමු සිති විල්ලට පමුණුවන ලදී; (එසේ කොට) වලිත ක්ෂිප්තෛක දෛලෛබයා, අඩ සඳවත් අයුරෙන් දෙ අත් තබාගත්; මානිත්‍යා, මානිනිය විසින්; ස්තනභරඃ, (තම) පියොවුරු බර; ප්‍රියස්‍ය උරසඃ, පෙම්වතා ගේ ළයට; නෙතුම්, පමුණුවන්නට; න තු පාරිතඃ, නො සමත්වන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**කිසි යම් නායිකාවක කෙරෙහි අනුරක්තයකු ගේ ශෝක අවස්ථාවක්.**

152 සා යෞවන මදෝන්මත්තා වයමස්වස්ථ චේතසඃ
තස්‍යා ලාවණ්‍යම්ඞෙඟෂු දහො'ස්මාසු විජෘම්භතෙ

සා, හෝ තොමෝ; යෞවන මද, යොවුන් මෙදෙන්; උන්මත්තා, උමතු වූවකි; වයම්, අපි; අස්වස්ථ චේතසඃ, නො සුව සිතැත්තෝ වෙමු; තස්‍ය, ඇය ගේ; ලාවණ්‍ය මඞෙඟෂු; රූසිරින් යුත් සිරුරු අවයවයන්හි; අස්මාසු, අප කෙරෙහි; දහඃ, දැවීම; විජෘම්භතෙ, පවතී.

අනුෂ්ටුප් වෘත්තය යි

**කමනීය කාමිනියක නැති කල ලොව අඳුරෙන් වැසුණක් බව මෙ පද දක්වයි.**

153 සති ප්‍රදීපෙ සත්‍යාග්නෞ සත්සු තාරමණීන්දුෂු
විරමෙ මෘගශාවක්ෂ්‍යා තමොභූතමිදං ජගත්

ප්‍රදීපෙ සති, පහන් ඇති; අග්නෞ සති, ගිනි ඇති; තාර, තරු; මණි, මැණික්; ඉන්දුෂු, සඳු යන අඳුර දුරලන මේවා; සත්සු, ඇති; මෘග ශාවක්ෂ්‍යාඃ විරමෙ, මුව ලැසියන් නැති; ඉදංජගත්, මෙලොව; තමොභූතම්, අන්ධකාරමය වේ.

අනුෂ්ටුප් වෘත්තයයි.

**ශෘංගාරයෙහි සුන්දර වර්ණනාවක්.**

154 සුරත විරතෞ ව්‍රීඩාවෙශ ශ්‍රමශ්ලථ හස්තයා
රහසි ගලිතං තන්ව්‍යා ප්‍රාප්තුං න පාරිත මංශුකම්
රතිරස ජඩෛරඞ්ගෛරඞ්ගං පිධාතු මශක්තයා
ප්‍රියතම තනෞ සර්වාඞ්ගීණං ප්‍රවිෂ්ට මධෘෂ්ටයා

සුරත විරතෞ, රතිය අවසනැ; ව්‍රීඩාවෙශ ශ්‍රම ශිථිල හස්තයා, විලිඝෙන් හා වෙහෙසින් ලිහිල් වූ අත් ඇති; තන්ව්‍යා, තුනුවක විසින්; රහසි ගලිතම්, එකත්හි ගිලිහුණු; අංශුකම් (ඇ හැඳි) වත; ප්‍රාප්තුම්, ගඳනට; න පාරිතම්, නොහැකි වන ලදී; රතිරස ජඩෛඃ, රති රසෙන් ජඩ වූ (ක්‍රියා විරහිත වූ); අඞ්ගෛඃ, අවයවයන් ගෙන්; අඞ්ගම්, අවයවයක්; පිධාතුම්, වසනට; අශක්ත යා, නො හැකි; අධෘෂ්ටයා, නො බුහුටි නැනැත්තිය විසින්; ප්‍රියතම තනෞ, හිමියා ගේ ඇඟෙහි; සර්වාඞ්ගීණං ප්‍රවිෂ්ටම්, සියලුම ඇඟ පිවිසවන ලදී.

හරිණී වෘත්තය යි.

**වශගවූ නායිකාවක් අපරාධවත් පෙම්වතා ගැන යෙහෙළියනට කියයි.**

155 සඛ්‍යස්තානි වචාංසි යානි බහුශො
ධිතානි යුෂ්මන් මුඛා
ද්වක්ෂ්‍ය'හං බහුශික්ෂිතා ක්ෂණමිති
ධ්‍යාත්වාපි මෞනං ශ්‍රිතා
ධූර්තේනෛත්‍ය ච මණ්ඩලීකෘත කුචං
ගාඪං පරිෂ්වජ්‍ය මාං
පීතාන්‍යෙව සහාධරේණ හසතා
වක්‍රස්ථිතාන්‍යෙව මෙ

(හෙ) සඛ්‍යඃ, (එම්බා) යෙහෙළියෙනි; යුෂ්මත් මුඛාත්, තොප ගේ මුවින්; යානි වචාංසි, යම් වදන්; බහුශඃ, බොහෝසේ; අධිතානි, ඉගෙන ගන්නා ලද ද; බහු ශික්ෂිතා අහම්, බෙහෙවින් උගත් මම; තානි (වචාංසි), ඒ වදන්; වක්ෂ්‍ය ඉති, (පෙම්වතාට) කියමි යි; ක්ෂණං ධ්‍යාත්වා අපි, මොහොතක් කල් සිතා බලා ද; මෞනං ශ්‍රිතා, මුනිවත ඇසුරු කෙළෙමි; ච, තව ද; ධූර්තේන, කපටියා විසින්; එත්‍ය, පැමිණ; මණ්ඩලී කෘත කුචම්, මඬුලු කරන ලද කුසැති (පියවුරු ඇති); මාම්, මා; ගාඪං පරිෂ්වජ්‍ය, දැඩිසේ වැළඳ ගෙන; හසතා, සෙත්නහු විසින්; වක්ත්‍රස්ථිතානි එව, මුව තුළෙහි වූම; (තානි වචාංසි, තොප ඉගැන්නූ ඒ වචන;) මෙ, මගේ; අධරේණ සහ, තොල සමග; පීතානි එව, බොන ලද්දේමය.

අපරාධයක් කළ පෙම්වතා තමා වෙත පැමිණි කල "මේ මේ වචන ඔහුට කියව"යි නායිකාවක ගේ යෙහෙළියෝ ඇයට ඉගැන්වූහ. ඒ අවවාදයෙහි නොපිහිටි බව ඔවුනට දක්වන අයුරෙකි මෙහි දැක්වෙන්නේ.

ශාර්දූලවික්‍රීඩිත වෘත්තය යි

**මානය ඉපදවීමට නායිකාවකට යෙහෙළියන් දුන් උප දෙශයෙහි සිටුමට නො හැකිවූ බව මෙ සේ දක්වයි.**

156 උත්කම්පො හෘදයෙ ස්ඛලන්ති
වචනාන්‍යාවෙගලොලං මනො
ගාත්‍රං සීදති චක්ෂුරශ්‍රුකලුෂං
විනතා මුඛං ශුෂ්‍යති
සඛ්‍යෙෂා සඛි පූර්වරඞ්ග රචනා
මානඃ සමුකෙනා මයා
වන්ද්‍යාසතා අපි යොෂිතඃ
ක්ෂිතිතලෙ යාසාමයං සංමතඃ

(යස්‍යාඃ, යමක ගේ ; හෘදයෙ, හදෙහි; උත්කම්පඃ, (රාග යෙන් හටගත්) කම්පනය වේ ද; වචනානි, වදන්හු; ස්ඛලන්ති, පැකිළෙත් ද (ගොතගසමින් කතා කරයි ද); මනඃ, සිත; ආවෙග ලොලම්, ඉක්මනින් සැලේ ද නොහොත් කැලඹේ ද; ගාත්‍රම්, සිරුර; සීදති, අවසන්න වේ ද; චක්ෂුඃ, ඇස; අශ්‍රුකලුෂම්, කඳුළෙන් කිලිටි වේද (ඇසෙහි කඳුළු පිරේ ද); විනතා, සිහිවිල්ල; මුඛං ශුෂ්‍යති, මුව වියළෙද; (හෙ) සඛි, (එම්බා)යෙහෙළිය; යස්‍යාඃ, යම් තැනැත්තියකට; එෂා, මේ; පූර්වරඞ්ග රචනා, ප්‍රස්තාවනාවක් වී ද (නාට්‍යාරම්භයක් වී ද); මයා, මා විසින්; සඃ මානඃ, ඒ මානය; මුක්තඃ, හැරදමන ලදී; ක්ෂිතිතලෙ, මෙලොවෙහි; යාසාම්, යම් තැනැත්තියනට; අයම්, මේ මතය; සම්මතඃ, අභිමත ද; තා අපි, ඔවුහු ද; වන්ද්‍යාඃ, වැඳියයුත්තෝ වෙති.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**මානිනියක ගේ මනොවිතර්කයෙහි සුන්දර වැනුමක්.**

157 මානව්‍යාධි නිපීඩිතාහමධුනා
ශක්නොමි තස්‍යාන්තිකං
නො ගන්තුං න සඛි ජනො'ස්ති
චතුරො යො මාං බලාත් නෙෂ්‍යති
මානී සො'පි ජනො න ලාඝව
භයා දභ්‍යෙති මාතඃ ස්වයං
කාලොයාති චලංච ජීවිතමිති
ක්ෂුණ්ණං මනශ්චින්තයා

මාන ව්‍යාධි, මත් නමැති ලෙඩින්; නිපීඩිත අහම්, පෙළුණු මම; අධුනා. දූත්; තස්‍ය, ඔහු ගේ; අනතිකම්, හමුවට; ගන්තුම්, යන්නට; න ශක්නොමි, නො හැකිවෙමි; චතුරඃ, සමත්; යඃ, යම් යෙහෙළි ජනයෙක්; මාම්, මා; බලාත්, බල යෙන්; නෙෂ්‍යති, පමුණුවාද (එබඳු වූ); සඛී ජනඃ (අපි), යෙහෙළි ජනයෙකුදු; න අස්ති, නො මැත; සඃ අපි ජනඃ, ඒ දන තෙමේ ද (ම ගේ ප්‍රියයා); මානි, මානවත්ය; අතඃ, එහෙයින්; ස්වයම්, තෙමේම; ලාඝව හයාත්, (තමා) ලඝු කෙනකු වෙති යි යන බියෙන්: මා අභ්‍යෙති, (මා කරා) නො එයි; කාලඃ, කාලය; යාති, යෙයි; ජීවිතං ච, ජීවිතය ද; චලං ඉති, නොතිරය යන; චින්තයා, සිතුවිලියෙන්; මනඃ, සිත: ක්ෂුණ්ණම්, සුන්විය.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**නායිකාවක ගේ රමණීය විරහ වර්ණනාවක්.**

158 කාන්තෙ කථඤ්චිද් ගදිත ප්‍රයාණෙ
ක්ෂණං විනම්‍රා විරහාර්ද්‍රිතාඞ්ගි
තතස්තමාලොක්‍ය කද ගතො'යි
ත්‍යාලිඞග්‍ය මුග්ධා මුදමාසසාද

කාන්තෙ, හිමියා; කථඤ්චිත්, කොසේ හෝ නොහොත් දුකින්: ගදිත, කියන ලද; ප්‍රයාණෙ (සති), විදෙස් ගමන ඇතිකල (විදෙසකට යෙමි යි කීකල); ක්ෂණම්, මොහොතක් කල්; විනම්‍රා, නැමුණු; විරහාර්දිතාඞ්ගී මුග්ධා, වියොවින් පෙළෙන අවයවැති බාලාව; තතඃ, ඉක්බිති; තං ආලොක්‍ය, ඔහු දෙස බලා; කද ආගතඃ අයි, කවරද ආයෙහි දැයි නො හොත්; කද ගතඃ අසි, කවර ද ගියෙහි දැ; ඉති, මෙ සේ (කියා); ආලිඞග්‍ය, (ඔහු) වැළඳ ගෙන; මුදම්, සතුටට; ආසසා ද පැමිණියාය.

උපජාති වෘත්තය යි.

**අදහසः-**

ප්‍රියයා විදෙසකට යන බව ප්‍රියාවට දන්වයි. මෙ ඇසූ ප්‍රියාව මතුවන වියොව සලකා දූවෙන සිරුරත්ති ඒ ගමන නවතනුවට අදහස් කෙරෙයි එ සේ සිතා මද වෙලාවක් හිමියා දෙස බලා සිට හා ඔබ කවරදා ද විදෙසට ගොස් ආවේ නොහොත් කවරදා ද විදෙස් ගතවත්තේ කියා වැළඳ ගෙන ප්‍රිතියට පත්වූවාය. (මෙයින් ගමන නැවැත් වූ බව හැඟවී.)

**යෙහෙළිය විසින් කියන ලද මානය දක්විමට නොහැකි බව නාඩිකාවක් මෙ සේ දක්වයි.**

159 යද්ගම්‍යං ගුරු ගෞරවස්‍ය සුහෘදෙ
යසමින් ලභනෙත’න්තරං
යද්දාක්ෂිණ්‍ය වශාද්භයාච්ච
සහතෙ මන්‍යෙපචාරාන’පි
යල්ලජ්ජා නිරුණද්ධි යත්‍ර
ශපථෛරුත්පාද්‍යතෙ ප්‍රත්‍යය
ස්තත් කිං ප්‍රෙම ස උච්‍යතෙ
පරිචයස්තත්‍රාපි මානෙන කිම්

යත්, යමක්; ගුරු ගෞරවස්‍ය, ගුරු දනා ගේ ගෞරවයට; ගම්‍යම්, අනුගමනය කටයුතු ද; යස්මින්, යමෙක; සුහෘදඃ, යහළුවෝ; අනන්තරං ලභනෙත, වෙනස ලබත් ද; යත්, යමක්; දාක්ෂිණ්‍ය වශාත්, අනුකූල භාවයෙන්ද; භයාත් ච, බියෙන්ද; මන්‍යෙපචාරාන් අපි, මද උපචාරයන් පවා (නිග්‍රහ?); සහතෙ, උසුලා ද (ඉවසා ද); යත්, යමක්; ලජ්ජා, විලිය; නිරුණද්ධි, වසා ද; යත්‍ර; යමෙකැ; ශපථෛඃ, දිවිරීමෙන්; ප්‍රත්‍යයඃ, විශ්වාසය; උත්පාද්‍යතෙ, උපදවා ද; කිම්, කිම; ස ප්‍රෙම උච්‍යතෙ, එය ප්‍රෙමයැයි (අනුරාගය) කියනු ලැබේ ද; තත්, එය; පරිචයඃ, පුරුද්දයි; තත්‍රාපි, එහි ද; මානෙන කිම්, මානයෙන් කවර පලෙක් ද.

ශාර්දූල වික්‍රිඩිත වෘත්තය යි.

**නායකයෙක් නායිකාවක සතුටු කැරුමට සාමෝපාය යොදයි.**

160 දෘෂ්ටෙ ලොචනවන්මනාක් මුකුලිතං
පාර්ශ්වස්ථිතෙ වක්ත්‍රවත්
න්‍යග්භූතං බහිරාසිතං පුලකවත්
ස්පර්ශං සමාතන්වති
නීවීබන්ධවදාගතං ශිථිලතාං
සම්භාෂමාණෙ ක්ෂණාත්
මානෙනාපසෘතං හ්‍රියෙව සුදෘශඃ
පාදස්පෘශි ප්‍රෙයසි

ප්‍රෙයසි, ප්‍රියයා; දෘෂ්ටෙ, දුටුකල; ලොචනවත්, නෙත් මෙන්; මනාක්, මදක්; මුකුලිතම්, (මානිනිය විසින්) හැකිළෙන ලදී; පාර්ශ්වස්ථි තෙ, (ප්‍රෙයසි යනු වාක්‍යයක් පාසා සම්බන්ධයි) පසෙක සිටිකල; වක්ත්‍රවත්, මුවමෙන්; න්‍යග්භූතම්, ඉවත හැරෙන ලදී; ස්පර්ශං සමාතන්වති, පහස්නා කල; පුලකවත්, ලොමුදහය මෙන්; බහිරාසිතම්, පිටත හිඳිනා ලදී; සංභාෂමාණෙ, තෙපුල් පවසත් ම; ක්ෂණාත්, වහා; නීවී බන්ධවත්, නෙරිපට මෙන්; ශිථිලතාං ආගතාම්, ලිහිල් බවට පැමිණෙන ලදී; සුදෘශඃ පාදස්පෘශි, මනා නෙතැතිය ගේ පා පහසිත් ම; හ්‍රියා එව, විලියෙන් මෙන්; මානෙන, මතින්; අපසෘතම්, පහවෙන ලදී.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**විලක පිහිනන ස්ත්‍රියක ගේ වර්ණනයක්.**

161 ලලිතමුරසා තරන්ති
තරල තරඞ්ගෞඝ චාලිත නිතම්බා
විපරීත රතාසක්තෙව
දෘශ්‍යතෙ සරසි කාසඛ්‍යා

ලලිත, මනහර (ලීලොපෙත); උරසා, ළෙහින්; සරසි, විලෙහි; තරන්ති, පිහිනන; තරල, සැලෙන; තරඞ්ගෞඝ,

රළ සුමුහෙන්; චාලිත, සෙලවූ; නිතම්බා, නිතඹ ඇති; සා, ඕ තොමෝ; සබ්‍යා, යෙහෙළිය විසින්; විපරිත රත, විපරිත රතියෙහි; ආසක්තා ඉව, ඇලුණු (යෙදුණු) නැනැත්තියක මෙන් දෘශ්‍යතෙ, දක්නා ලැබේ.

ආර්‍යාවෘත්තය යි.

**වියොවූවකු ගේ ශොකයක් මෙසේ දක්වති.**

162 කාන්තාමුඛං සුරතකෙලි විමර්දඛෙද
සංජාත ඝර්මකණ විච්ඡුරිතං රතාන්තෙ
ආපාණ්ඩුරං විලස දර්ධ නිමීලිතාක්ෂං
සංස්මෘත්‍ය හෙ හෘදය ! කිං ශතධා න යාසි

සුරත කෙළි, සුරත් කෙළි; විමර්ද ඛෙද, මැඬුම් (මර්දන) වෙහෙසින්; රතාන්තෙ, රතිය අවසනැ; සංජාත, හටගත්; ඝර්ම කණ, සෝදියෙන්; විච්ඡුරිතම්, වැසුණු (ඝගදියෙන් ගැවසුණු); ආපාණ්ඩුරම්, මදක් පඬුවත්; අර්ධනිමීලිතාක්ෂම්, අඩක් පියවුණු නෙත් ඇති; කාන්තාමුඛම්, ස්ත්‍රිය ගේ මුහුණ; සංස්මෘත්‍ය සිහිකොට; (හෙ) හෘදය, (එම්බා) හද; කිම්, මක්නිසා; ශතධා න යාසි; සියක් කඩකට නො පැලෙහි ද.

වසන්තතිලකා වෘත්තය යි.

**අන්දෙසකට යාමට අදහස් කළ පෙම්වතකු ගේ ජ ගමන පෙම්වතියක් මෙසේ වළක්වයි.**

163 ගන්තව්‍යං යදි නාම නිශ්චිතමහො
ගන්තාසි කො'යං ත්වරා
ද්විත්‍රාණ්‍යෙව පදානි තිෂ්ඨතු භවාන්
පශ්‍යාමි යාවත් මුඛම්
සංසාරෙ ඝටිකා ප්‍රණාල
විගලද්ධාරා සමෙ ජීවිතෙ
කො ජානාති පුනස්ත්වයාසහ මම
ස්‍යාද්වා න වා සඞ්ගමඃ

යදිනාම, ඉදිත් සැබවින්ම; ගන්තව්‍යම්, ගමන; නිශ්චිතම්, ස්ථිරතම්; අහො, අනේ; ගන්තා අසි, යන්නෙහි; කා ඉයං ත්වරා, මේ ඉක්මණ කිමෙක් ද; යාවත්, යම්තාක්; මුඛම්, (ඔබගේ මූව; පශ්‍යාමි, බලම් ද; (තාවත්, ඒතාක්;) භවාන්, ඔබ; ද්විත්‍රාණි එව පදානි, දෙතුන් පියවරක් (ගොස්) සිටීවා; ඝටිකා ප්‍රණාලෙ, දිය නලෙකින්; විගලන්, ගලන; ධාරා සමෙ ජීවිතෙ, දිය දහරකට සම දිවිය ඇති; සංසාරෙ, සසරෙහි; පුනඃ, යළි; ත්වයා සහ, ඔබ සමග; මම, ම ගේ; සංගමඃ, එක්වීමෙක්; ස්‍යාද්වා, වේ ද; න වා, නො වේ දැයි; කඃ ජානාති, කවරෙක් දනී ද.

1 ස්‍යාද්වා න වා සංගමඃ:- මෙයින් ප්‍රියයා ගෙන් වියෝ වූව ප්‍රාණ ත්‍යාග කරන බව හැඟවූ එයින් ගමන නිෂේධය ස්ඵුටය.

ශාර්දූල වික්‍රීඩිත වෘත්තය යි.

**මෙතෙකින් අමරුශතකය නිමියේය.**



